# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ නිකිණි පුර පසළොස්වක පෝදා 2021 අගෝස්තු 22 ඉරිදා BUDUSARANA SUNDAY AUGUST 22, 2021

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 56 වන කාණ්ඩය, 9 වන පත්‍රය, පිටු 36 ආරම්භය 1965-06-13 මිල රු. 40.00



# ප්‍රථම ධර්ම සංගායනාව ඇරඹි නිකිණි පෝදා

**ශාසනික වශයෙන් සදඅනුස්මරණීය ඓතිහාසික සිදුවීම් කිහිපයක් ම නිකිණි පොහොය දිනෙක ආරම්භ වී තිබේ. ප්‍රථම ධර්ම සංගායනාව ආරම්භ කිරීම. ආනන්ද හිමි රහත්භාවයට පත්වීම, පෙරවස් මඟ හැරී ගිය භික්ෂූන් වහන්සේලා පසුවස් එළඹෙන දිනයවීම, බුදුරදුන් ගේ ලලාට ධාතු නිධන් කර සේරුවාවිල දාගැබ තැනවීම ආරම්භ කිරීම, පුරාතන අරියවංස දේශනා උත්සවය සිදුකිරීම හා මහනුවර ඇසළ මහා පෙරහරේ අවසන් රන්දෝලි මහා පෙරහර වීථි සංචාරය කිරීම යන කරුණු ඒ අතර ප්‍රධානය.**



### ආජීවකයාගේ පිළිතුර

විනය පිටකයෙහි චුල්ලවග්ග පාලියෙහි පංචසතිකක්ඛන්ධකයෙහි ප්‍රථම ධර්ම සංගායනාව පිළිබඳ වූ වාර්තාව හමු වෙයි. එහි සඳහන් වන පරිදි මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. ඇවැත්නි, මම එක් සමයෙක පන්සියයක් පමණ භික්ෂූන් වහන්සේලා ද සමඟ පාවා නුවරින් කුසිනාරා නුවර කරා දිවෙන දීර්ඝ මාර්ගයට පිවිසුනෙමි. ඉක්බිතිව මම මඟින් ඉවත්ව ගසක් මුල හුන්නෙමි.

එහිදී එක්තරා ආජීවකයෙක් මදාරා මලක් අතින් ගෙන කුසිනාරා නුවර සිට පාවා නුවර කරා දිවෙන මෙකී මාර්ගයට ම පිවිසියේ ය. පැමිණෙන්නා වූ එම ආජීවකයා මම දුරදීම දුටුවෙමි. දැක මෙසේ කීමි. ඇවැත්නි. අප ගේ ශාස්තෘන් වහන්සේ දන්නෙහිද? එසේ ය. දනිමි. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පිරිනිවී අදට සත් දවසෙකි.ම විසින් මෙම මදාරා මල එතැනින් ගන්නා ලදී.

### අවීතරාගීන්ගේ හැසිරීම

ඇවැත්නි, එහි සිටි භික්ෂු සමූහයා අතර ඇතැමෙක් අවීතරාගීහු (මාර්ගඵල නොලැබූ) වූහ. ඒ අතරින් ද ඇතැමෙක් "ඉතා ඉක්මනින් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ සේක. ඉතා ඉක්මනින් සුගතයන් වහන්සේ පිරිනිවන් පෑ සේක. ඉතා ඉක්මනින් ලෝකයෙහි ඇස අතුරුදහන් වූයේ යැ"යි, කියමින් හිසෙහි අත් බැඳ හඬති. සිඳලූ දෙයක් බිමට වැටෙන්නාක් මෙන් වැටෙති. ඉදිරියට පෙරළෙති. පසුපසට පෙරළෙති. එහි සිටි වීතරාගී භික්ෂූන් වහන්සේලා සංස්කාරයෝ අනිත්‍යය හ. සංස්කාරයන්ගේ ස්ථිර පැවැත්මක් කොහි ලැබිය හැකි දැයි, සලකා මනා සිහියෙන් හා නුවණින් යුතුව මෙම සිදුවීම ඉවසූහ. අනතුරුව මම එකී භික්ෂු සමූහයාට මෙසේ කීමි.

ඇවැත්නි, කම් නැත. ශෝක නොකරවු. නො වැළපෙවු. ප්‍රියමනාප වූ සියල්ලෙන්ම වෙනස්වීම වෙන්වීම. වෙනත් ආකාරයක දෙයක් සිදුවීම වන්නේ ය. යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ නොවේද? යමක් උපන්නේ ද හට ගත්තේ ද ලෞකික වූයේ ද නැසෙනසුලු වේ ද එය ඒකාන්තයෙන් නො නැසේවා යි, යන මෙය කොහි ලැබිය හැකි වේද? ලැබිය හැකි නොවේ ම ය.

ඇවැත්නි, එසමයෙහි සුභද්‍ර නම් මහලුව පැවිදි වූවෙක් එම පිරිස අතර සිටියේ ය. ඉක්බිති එම පැවිද්ද එම භික්ෂු පිරිසට මෙසේ කීය.

ඇවැත්නි, කම් නැත. ශෝක නොකරවු. නො වැළපෙවු. අපි ඒ මහා ශ්‍රමණයා ගෙන් මනාව මිදුණෝ වෙමු. මෙය තොපට කැප ය. මෙය තොපට නො කැප යයි කීමෙන් උපද්‍රවයට ද පත් කරන ලද්දෝ වෙමු. දැන් අපි යමක් කැමති නම් එය කරන්නෙමු. යමක් නොකැමැත්තෙමු නම් එය නො කරන්නෙමු.

එබැවින් ඇවැත්නි, අපි අධර්මය බැබළීමටත් ධර්මය බැහැර කරනු ලැබීමටත් පෙර, අවිනය බැබළීමටත් විනය බැහැර කරනු ලැබීමටත් පෙර, අධර්මවාදීන් බලවත් වීමටත්, ධර්මවාදීන් දුබලවීමටත් පෙර, අවිනයවාදීන් බලවත් වීමටත්. විනයවාදීන් දුබල වීමටත් පෙර ධර්මය ද විනය ද සංගායනා කළ යුතු වෙමු'යි මහාකාශ්‍යප මහ තෙරුන් වහන්සේ වදාළහ.

### රජගහනුවර තෝරා ගැනීම


මහතෙරුන් වහන්ස, එසේ නම් ඔබ වහන්සේ භික්ෂූන් තෝරාගන්නා සේක්වා. ඉක්බිති මහා කාශ්‍යප මහරහතන් වහන්සේ එක් නමක් අඩු පන්සියයක් රහතන් වහන්සේලා තෝරා ගත්හ. භික්ෂූහු මහා කාශ්‍යප මහ තෙරුන් වහන්සේට මෙසේ කීහ. මහ තෙරුන් වහන්ස, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ වීතරාගී නොවුණත් ඡන්දයෙන්, ද්වේෂයෙන්, මෝහයෙන්, භයින් අගතියට නො යති. උන්වහන්සේ විසින් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බොහෝ ධර්මය ද, විනය ද උගන්නා ලද්දේ ය. එබැවින් ආනන්ද ආයුෂ්මතුන් වහන්සේ ද මීට තෝරා ගන්නා සේක්වා

රජගහ නුවර වනාහි මහා ගොදුරු ගම් ඇත්තේය. බොහෝ සෙනසුන් ඇත්තේ ය. අපි රජගහ නුවර වස් වසමින් ධර්මය ද විනය ද සංගායනා කරන්නෙමු නම් ඉතා මැනවි. වෙනත් භික්ෂු නමක් රජගහනුවර වස් නොවසන්නේ නම් යෙහෙකි.

පසුව මහාකාශ්‍යප තෙරුන් වහන්සේ භික්ෂූන්ට මෙසේ දැන්වූහ. ඇවැත්නි, සංඝයා මාගේ බස් අසත්වා. ඉදින් රජගහ නුවර වස් වසමින් ධර්මය ද විනය ද සංගායනා කිරීමට සංඝයා මෙම පන්සියයක් භික්ෂූන් සම්මත කර ගන්නේ ය. අනෙක් භික්ෂූන් රජගහනුවර වස් නො විසිය යුතුය. මේ ප්‍රඥප්තිය යි. මෙසේ තෙවරක් දැනුම්දීමෙන් පසු මහාකාශ්‍යප මහ තෙරුන් වහන්සේ "මෙය සංඝයාට රුචි වෙයි. එබැවින් නිහඬ ය. මෙය මෙසේ ක්‍රියාත්මක කරමි"යි තීරණය කළහ.

### පිළිසකර කිරීම්

පසුව පන්සියයක් භික්ෂූන් වහන්සේ ධර්මය ද විනය ද සංගායනා කිරීමට රජගහ නුවරට වැඩියහ. එහි දී උන් වහන්සේලාට මෙම අදහස පහළ විය. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් බිඳුණු පැලුණු තැන් පිළිසකර කිරීම වර්ණනා කරන ලදහ. එබැවින් අපි පළමු මාසය බිඳුණු පැලුණු තැන් පිළිසකර කරමු. මධ්‍යම මාසයෙහි රැස්ව ධර්මය ද විනය ද, සංගායනා කරන්නෙමු. ඒ අනුව භික්ෂූන් වහන්සෙලා පළමු මාසය බිඳුණු පැලුණු තැන් පිළිසකර කර වූහ.



ඌරුගමුවේ
අස්සජී හිමි

### ආනන්ද හිමි

ඉක්බිති ආනන්ද තෙරණුවෝ මෙසේ කල්පනා කළ හ. "හෙට සංගායනාව ය. මම රහත් නොවූයේ සංගායනාවට යන්නෙමි නම් එය මට නිසි නො වෙයි" යන මෙම කරුණ සලකා බලා රාත්‍රියෙහි බොහෝ වේලාවක් කායගතාසතිය හෙවත් කය පිළිබඳ වූ සිහියෙන් ගතකොට රාත්‍රිය පහන්වන වේලාවෙහි සැතපෙමි යි, සිතා ශරීරය හැර වූහ. එහෙත් හිස ද කොට්ටයට නො පැමිණියේ ය. පාදයෝ ද පොළොවෙන් මිදුණහ. මේ අතරෙහි සිත උපාදාන නො කොට ආශ්‍රවයන් ගෙන් මිදුණේ ය. ඉන්පසුව ආනන්ද තෙරුන් වහන්සේ රහත් භාවයට පත් වූවාහු ම සංගායනාවට වැඩම කළ සේක.

### උපාලි තෙරුන්ගේ පිළිතුරු

රජගහ නුවර වේභාර පර්වත ප්‍රාන්තයෙහි සප්තපර්ණී ගුහාද්වාරයට රැස් වූ මහරහතන් වහන්සේලා ධර්ම සංගායනාවට සූදානම් වූහ. එහිදී මහාකාශ්‍යප මහතෙරුන් වහන්සේ මෙසේ දැන්වූහ. "ඇවැත්නි. මාගේ බස් අසත්වා. ඉදින් මම දැන් ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේගෙන් විනය පිළිබඳ විමසන්නෙමි. එහි දී උපාලි මහ තෙරුන් වහන්සේද භික්ෂූන්ට මෙසේ දැන්වූහ. භික්ෂූන් මාගේ බස් අසාත්වා. ඉදින් මම දැන් මහාකාශ්‍යප මහතෙරුන් වහන්සේ විසින් විනය විමසන ලද්දේ නම් විසඳන්නෙමි.

ඉක්බිති. මහාකාශ්‍යප මහ තෙරණුවෝ උපාලි තෙරණුවන්ට මෙසේ කීහ. "ඇවැත්නි, උපාලි ස්ථවිරයන් වහන්ස, පළමු පාරාජිකාව කොහිදී පනවන ලද ද?

තෙරුන් වහන්ස, වේසාලියේ දී ය. කවරෙකු අරබයා ද, සුදින්න කලන්ද පුත්‍ර අරබයා ය. කිනම් කාරණයක් නිසා ද? මෛථුන ධර්මයෙහි ය.

පසුව මහා කාශ්‍යප මහ තෙරණුවෝ උපාලි තෙරුන්ගෙන් ප්‍රථම පාරාජිකාවෙහි සිදුවීම ද නිදාන කතාව ද, පුද්ගලයා ද ඒ හා අදාළ පැනවීම් ද, පසුව පැනවීම් ද එම වරදට පත්වන්නා හා පත් නොවන්නා පිළිබඳව ද විමසූහ. මේ ක්‍රමයෙන් ම සෙසු පාරාජිකාවන් සේ ම උභතො විභංගය ඇසූහ. ඇසූ ඇසූ දේ උපාලි තෙරණුවෝ විසඳූ හ.

### ධර්මය විමසීම

ඉක්බිතිව ධර්මය විමසූයේ ආනන්ද තෙරුන් වහන්සේ ගෙනි. "ඇවැත්නි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, බ්‍රහ්මජාල සූත්‍රය කොහි දී දේශනා කරන ලද ද? තෙරුන් වහන්ස, රජගහ නාලන්ද දෙනුවර අතර අම්බලට්ඨිකා නමැති උයනෙහි රජු පිණිස කරවන ලද ගෙහි දී ය. කවරෙකු අරබයා ද? සුප්පිය පරිබ්‍රාජකයා සහ බ්‍රහ්මදත්ත මානවකයා අරබයා ය. ඉක්බිතිව මහාකාශ්‍යප මහ තෙරණුවෝ බ්‍රහ්මජාල සූත්‍රයෙහි නිදානය හා පුද්ගලයා ද ඇසූහ. මෙම ක්‍රමයෙන් ම නිකාය පසම ඇසූහ. ඇසූ ඇසූ දේ ආනන්ද තෙරණුවෝ විසඳූ හ. ඊළඟට සිදු වූයේ ඛුද්දානුඛුද්දක සික්ඛාපද කථාව සහ බ්‍රහ්මදණ්ඩ කථාවයි. සංගායනාව අවසානයේ දී ස්ථාවර කරගත් ධර්මය මතු අනාගතය සඳහා කටපාඩමින් සුරක්ෂිත කර ගැනීම භික්ෂු පරම්පරාවනට පවරා දුනි. බුදු දහම චිරාත් කාලයක් පවත්වාගෙන යාම සඳහා මෙම කාර්යය උපස්ථම්භක වූ බව ශාසන ඉතිහාසයෙන් පෙනේ.

# සිහි නුවණ තිබේ නම් රෝග උවදුරෙන් වැළකිය හැකියි

**සමස්ත ලෝකයම රෝග හා මරණ යන බිය දෙකකින් වෙළී තිබේ. එහි බලපෑමට හසු නොවූ ලෝකයක් කිසිදු රටක්, සමාජයක්, පුද්ගලයෙක් දක්නට නොලැබේ.**

ලොව පාලකයන් මෙන්ම පාලිතයන් ද පුද්ගලික මට්ටමෙන් මෙන්ම ගෝලීය මට්ටමෙන් ද මෙම උවදුරෙන් මිදීමට විවිධ පිළියම් සොයමින් වෙහෙසෙනු පෙනේ. එහෙත් එය එතරම් පහසු කටයුත්තක් නොවන බව දසතින් ලැබෙන විවිධ පුවත්වලින් අනාවරණය වේ. මෙවන් පසුබිමක ජීවිත ආරක්ෂාව සලසා ගන්නේ කෙසේ ද? එසේම මනස ශක්තිමත්ව තබා ගන්නේ කෙසේ ද? සාධුගුණ රැක ගන්නේ කෙසේද? යන්න බොහෝ දෙනෙකු ඉදිරියේ පවතින ප්‍රධානතම ගැටලු ය. මෙවැනි වසංගතවලින් බේරී ඉහතින් දැක්වූ ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙන උපදෙස් රැසක් බුදුරදුන්ගේ අනුශාසනාවෙහි අන්තර්ගත ව තිබේ.

බුදුරදුන් වදාළ නිරෝගීකම උතුම්ම ලාභයයි (ආරෝග්‍ය පරමාලාභා)" යන වචනයෙහි හරය හා අගය බොහෝ දෙනකුට දැනෙන්නේ විවිධ ලෙඩ රෝගවලින් පීඩාවට පත්වන අවස්ථාවල දී ය. තමා නීරෝගීයැයි නිතර සිතන පුද්ගලයෙකුට මෙහි වටිනාකම නොදැනෙනු ඇත.

එහෙත් ඔහු හෝ ඇය රෝගී වූ විටෙක එහි අගය සිහියට නැඟෙනු ඇත. නීරෝගීකම උතුම්ම ලාභය යන්න හා බැඳී පවතින අනෙක් බුද්ධ වචනය නම් සතුට ය (සන්තුට්ඨී පරමං ධනං). සියල්ල අත්පත්කර ගත්ත ද වසංගතය හමුවේ ලොව සියල්ලෝ ම අසතුටෙන් කාලය ගතකරති. මෙම විශේෂ වංසගත හමුවේ නීරෝගීකම මෙන්ම සතුට මිනිස් ජීවිත වලින් පලාගොස් ඒ වෙනුවට රෝග බිය හා අසතුට ඇසුරට වැටී තිබේ. මෙය එක් පුද්ගලයකුට පමණක් සීමා වූවක් නොවේ. එය වනාහි දුටු දුටු තැන ඇසූ ඇසූ තැන පවතින සත්‍යයි. මෙම උවදුරෙන් මිදෙන්නේ කෙසේද? වෛද්‍ය උපදෙස් පිළිපැදීම හැර වෙනත් විකල්පයක් නොමැති බව නුවණැති කවරකුට වුව වැටහෙන සත්‍යයකි.

බුදුරදුන් පෙන්වා වදාළ පරිදි ලෙඩ රෝග ආදි උවදුරුවලින් පීඩිතව සිටින මෙම අවස්ථාවෙහි යෝනිසෝ මනසිකාර හෙවත් නුවණින් මෙනෙහි කිරීම හා සිහිය හා නුවණ නිරන්තරයෙන් ම ප්‍රගුණකළ යුතු ධර්මයකි. සතිපට්ඨාන සූත්‍රයේ දැක්වෙන පරිදි සතර ඉරියව්වේ ම සිහිය පිහිටුවීම මේ උවදුරෙන් මිදීමට අනුගමනය කළ හැකි එක් මාර්ගයකි. සමාන්‍ය එදිනෙදා ජීවිතයේ බොහෝ දෙනකු කටයුතු කරන්නේ පුරුද්දට අනුව ය. පුරුද්ද විසින් යම් යම් දෑ කරනු මිස මානසික අවධානයකින් යුතුව කිසිවක් සිදු නොවන බව කවුරුත් පිළිගන්නා සත්‍යය යි.


32 පිටුවට...



කොළඹ විශ්වවිද්‍යාලයේ
බෞද්ධ අධ්‍යයන අංශයේ
අංශාධිපති
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
රාජකීය පණ්ඩිත ආචාර්ය
**උඩුහාවර ආනන්ද හිමි**

මීළඟ බුදුසරණ කලාපය නිකිණි අව අටවක පෝද අගෝස්තු 30 සඳුදා

පාණදුර - ගොරකාන ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරස්ථ පුණ්‍ය භූමියේ ඉදිකෙරෙන



ශ්‍රී ලංකාවේ ගර්භය තුළට පිවිසිය හැකි ප්‍රථම, චෛතිහාසික

ගොරකාන "සීවලි මහා සෑයට" ඔබත් දයක වන්න.

පින්වත් ඔබගේ පුණ්‍යාධාර "සීවලි මහා සෑය අරමුදල" නමින් පහත ඇති බැංකු ගිණුමකට බැර කළ හැකිය. එලෙස බැංකු ගිණුමකට ඔබේ පුණ්‍යාධාරය බැර කොට ඇති බව සනාථ කිරීම පිණිස එම බැංකු ලදුපත හෝ එහි පැහැදිළි පිටපතක් සමග, ඔබේ නම, ලිපිනය සහ දුරකථන අංකය පැහැදිළි අකුරින් ලියා පහත ලිපිනයට තැපැල් කරන්න. එහි විනිවිදභාවය සඳහා පුණ්‍යානුමෝදනා පතක් තැපැල් මගින් ඔබ වෙත එවනු ලැබේ. විහාරස්ථානයට පැමිණෙන පින්වතුන් හට "සීවලි මහා සෑය අරමුදල - කායභීලයය" ට පුණ්‍යාධාර ලබාදිය හැක.

*තෙරුවන් සරණයි !*


ගිණුමේ නම : සීවලි මහා සෑය අරමුදල

සම්පත් බැංකුව ගිණුම
1151 6100 4890

මහජන බැංකුව ගිණුම
148-2-001-6-0038551

ලංකා බැංකුව ගිණුම
8 5 5 7 7 4 3 9

සෙලාන් බැංකුව ගිණුම
0400-13126762-101





සියලු විමසීම් :
ගරු සභාපති, පූජ්‍ය ලියන්ගහවත්තේ නන්ද ස්ථවිර,
සීවලි මහා සෑය අරමුදල,
ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරය, ශ්‍රී ධම්මානන්ද මාවත, ගොරකාන, කෙහෙල්වත්ත 12550.

විහාරස්ථානය : ☎ -038 22 97 914
සභාපති හිමි : 071 250 44 46

ස්වාමීන්වහන්සේ පමණක් (බොහෝවිට) පන්සලේ වැඩවසන බැවින් බැහැරට වැඩසිටින අවස්ථාවලදී දුරකථන ඇමතුම් ලබාදීමේදී සැලකිලිමත් වීමට කාරුණික වන්න.

# දුක් කරදර බොහොමයි එහෙත් ටික කාලයයි



බළංගොඩ ශ්‍රී ධර්මානන්ද පිරිවෙන් විහාරාධිපති
**කරගොඩ උයන්ගොඩ මෛත්‍රී මූර්ති මහ නා හිමි**

**රිදීවන් දිය දහරින් ගලා යන ගංගාවක දර්ශනය සිතට මොනතරම් සුවයක් ගෙන දෙනවා ද? මහවැසි ඇදහැලී ගලායන ඒ ගංගාවේ ම ජල කඳ අපට මොනතරම් භයක් ගෙන දෙනවා ද? සිතට මොනතරම් වේදනාවක් ද? ජීවිතයත් හරියට ගඟක් වගෙයි.**

කඳු බෑවුම් අතරින් පෙණ පිඬු නගමින් ගලන ගඟ වාගේ ජීවිතයත් විටෙක ලස්සන වෙනවා. දුකක් නැහැ. සිත් රිදුමක් නැහැ. මුහුද සොයා යන ගමනේ දී නිහඬව නිසලව ගලා ගිය ගඟ අතර මඟ ඇති නොයෙකුත් සිරවීම් ආදිය නිසා වතුර පිටාර ගලමින් මිනිසුන්ට නොයෙකුත් ප්‍රශ්න ඇති කරනවා. ඒ ගඟ වන දුර්ග, ගිරිදුර්ග පසුකරමින් මහා ජලකඳක් සෙයින් ගස් වැල් උදුරාගෙන, කුණු කසළ දරාගෙන තල්ලු වී යනවා.

මේ අතර මේ ගංගාවේ දිය අපිරිසුදු කරන අයත් ඉන්නවා. ගඟෙන් දිය බී මුහුදට ආ වඩන අයත් ඉන්නවා. මේ හැල හැප්පිලි රිදුම් අමාරුකම්, අපහසුකම් තිබුණත් සියලු අභියෝගයන්ට මුහුණ දෙමින් ඒ ජල කඳ මුහුද වෙත ම ගමන් කරනවා.

ජීවිතයත් මේ වගෙයි. දුක් කරදර බොහොමයි. ඒත් ටික කාලයකටයි. ඒ දුක වෙනස් වෙනවා. නැවැතත් සතුට ලැබෙනවා. ඒවුණත් මේ සතුට ලැබෙන්නේ ටික කාලයකටයි. ආයෙත් දුක් උපදිනවා. කරත්ත රෝදයක් වගේ කර කැවෙනවා. මුලින් සිටි තැනට ම එනවා. ආයෙත් වෙනස් වෙනවා. මේ ලෝක ස්වභාවයයි.

මනුෂ්‍යයෙකුට මුහුණ දෙන්න සිදුවන ධර්මතා අටක් "අට ලෝ දහම" යනුවෙන් ධර්මයෙහි සඳහන් ව ඇත. ලාභ, අලාභ, යස, අයස, නින්දා, ප්‍රශංසා, දුක - සැප යනු ඒ අටයි. නිත්‍ය නොවීම, ස්ථිර නොවීම, විපරිනාමයට පත්වීම ඒ ධර්මයන්ගේ ස්වභාවයයි.

මේ ධර්මතාවන් නිසා සිත කම්පාවට පත් නොකර ගත යුතු බව, ඒ අනුව ශෝකයට, කනගාටුවට ලතැවීමට පත් නොවිය යුතු බව අප තේරුම් ගත යුතුයි. ඒ ඒ අවස්ථාවල දී එය දරා ගන්නට අප පුරුදු පුහුණු විය යුතුයි. අභියෝගයන්ට මුහුණ දෙන්න බැරි සිත කැළඹෙනවා. කළයුතු දේ නොකළ යුතු දේ හිතාගන්නට නොහැකියි. සමහර අය ලාභයේ දී හිස උදුම්මා ගන්නවා. දුකේ දී කලින් තමා ඇසුරුකළ අය අමතක කරනවා. කතාවෙන් ක්‍රියාවෙන් පහර ගසනවා. අවඥවෙන් බලනවා. දුකට කන්දීමක් නැහැ.

අලාභයේ දී නිතර නිතර කඩා වැටෙනවා. සමීපතමයන් තමා අතහැර යන්නට පුළුවන්. ගින්නෙන්, ජලයෙන්, සුළඟින්, උන්හිටිතැන් විනාශ වන්නට පුළුවන්. විවිධ ප්‍රශ්න නිසා තමා දැරූ තනතුරු නැතිවන්නට පුළුවන්.

මෙවැනි තැනක දී සිත කඩා වැටුණොත් ධෛර්ය ගිලිහුණොත් ජීවිතය ගොඩනගා ගැනීම අපහසුයි. ස්වභාව ධර්මයට මුහුණ දීමේ ශක්තිය අප තුළ තිබිය යුතු යි. ධෛර්යවත් විය යුතුයි.

අපට වැරදුනු තැන, අපගේ හැසිරීම් රටාවේ ඇති වරද හඳුනාගෙන නිවැරැදි වන්නට උත්සාහ කළ යුතුයි. සමහර විට නරකඇසුර, අනවශ්‍ය වියදම්, අරපිරිමැස්මක් නැතිකම, සැලසුම් සහගත ජීවිත ගමනක් නැතිකම අපේ වැටීමට හේතු වන්නට ඇත.

වැරැදි හදාගෙන ඉදිරියට යා යුතුයි. සහෝදර සහෝදරියන්ගේ සැලකීමක් නැහැ. මවුපියන්ගේත් ඇල්ම බැල්ම නැති වන්නට පුළුවන් . හදිසියට උදව්වක් උපකාරයක් නැති වෙන්නට පුළුවන්. මෙයට ද නිර්භය ව මුහුණ දෙන්නට අවශ්‍යයි. තනිවම හෝ නැඟී සිටින්නට උත්සාහ කළ යුතුයි.

සැප සම්පත් ඇති තැන නෑයෝ හිතමිතුරෝ බොහොමයි. ලෙඩට දුකට පිහිට වෙනවා, උදවුවට ඉන්නවා. මේ යසසයි. එහෙත් මේ සියලු හිතවත්කම් ධන ධාන්‍ය කීර්තිය තිබෙනතුරු පමණයි. ජීවිතය යනු වෙනස්වන දෙයක්. අද ධනයෙන් ආඪ්‍ය කෙනා හෙට දිළින්දෙක් වෙන්නට පුළුවන්. එවිට ළඟ සිටි නෑදෑයෝ හිතමිතුරෝ මගහරිනවා. නින්දා ගෙන දෙනවා. දෝෂාරෝපණය කරනවා. ඇතැම් විට චරිත ඝාතනය කරන්නටත් පුළුවන්. කටකතා පතුරුවනවා. මේ සියල්ල ටික කාලයයි. එයත් වෙනස් වෙනවා.

බුදුරජාණන් වහන්සේ වදාළේ මේ ලෝකයේ නින්දා නොලබන කෙනෙක් නොමැති බවයි. උන්වහන්සේටත් මාගන්දියා බැමිණිය වැනි අය නින්දා කළා. රජවරු මැති ඇමැතිවරු ප්‍රශංසා කළා. බුදුරදුහු ඒ සියල්ලට ම සමසිතින් නිහතමානීව මුහුණ දුන්නා.නිහතමානී යන වචනය අප සමාජයේ භාවිත කළාට එය සුදුසු සියලු කෙලෙස් ප්‍රහීන කළ අයටයි.

නිහතමානී යනු මානය සහමුලින් නැතිකළා යන අරුතයි. සමාජයේ ජීවත්වන අප තුළ බොහෝ විට වැරැදි දෙයක් වන්නට පුළුවන්. එනම් අත්තුක්කංසනය හා පරවම්භනයයි. මෙහි අදහස තමා උසස් කොට සැලකීම හා අන්‍යයන් පහත් කොට සැලකීමයි. මානය තුන් ආකාරයකින් සිදුවන බව ධර්මයෙහි සඳහන් කර ඇත. සෙය්‍යමාන, සදිසමාන, හීනමාන යනු ඒ තුන් ආකාරයයි. සෙය්‍යමාන යනු සමාජය තුළ සිටින ශ්‍රේෂ්ඨ අය ගැන සිතා තමා ඒ අයටත් වඩා උසස් අයෙකු, ශ්‍රේෂ්ඨයකු ලෙස සිතීමයි. "සදිසමාන" යනු සමාජයේ ඉන්නා ශ්‍රේෂ්ඨ පුද්ගලයන් ගැනසිතා තමා ද ඒ හා සමාන අයකු ලෙස සිතීමයි. හීනමාන යනු සමාජයේ සිටින ශ්‍රේෂ්ඨ පුද්ගලයන් ගැන සිතා තමා ඒ අයට වඩා පහත් අයෙකු යැයි සිතීමයි.

සමහරු තමා ගේ රූපසෝභාව නිසාත්, සමහරු තමන්ගේ උගත්කම නිසාත්, සමහරු තමන්ගේ ධනවත්කම නිසාත් මාන්නය ඇතිකර ගනිති. තමාගේ නිරෝගීකම, තමන්ගේ කුලවත් භාවය, තමන්ගේ තාරුණ්‍යය, තමාගේ මාන්නයට හේතුවක් කර ගන්නවා. තම ශරීරයේ ශක්ති සම්පන්න බව, තම ජවය, තමන් දරන තිල තල හා තරුණ මදය ද මාන්නයට හේතු කර ගන්නා අවස්ථා සමාජය තුළ දී සමහර විට අපට දැකගන්න පුළුවන්.

සමාජය තුළ ඇති විවිධාකාර මේ පිම්බීම්, මානයන් තාවකාලික බව තේරුම් ගන්නා පුද්ගලයා අනතිමානී ගුණයෙන් යුක්ත බව අප වටහා ගත යුතුයි.

සමාජයේ සිටින සමහරු වංක ගති පැවතුම්වලින් යුක්ත අය වන්නට පුළුවන. නමුත් අප අවංක විය යුතුයි. අප සිතන සිතිවිල්ල, කරන ක්‍රියාව, කරන කතාව, නිවැරැදි විය යුතුයි. වංක කියන්නේ ඇද ගතියට, අවංක කියන්නෙ ඇද නැති ගතියට, වංක යන්න ක්‍රම තුනකින් සිදුවන බව ධර්මයෙහි සඳහන් . එනම් මනෝවංක, වචීවංක හා කායවංක යන තුනයි.

සිතිවිලිවල ඇද ගතිය මනෝවංක ලෙසත්, වචන තුළ ඇති ඇද ගතිය වචී වංක ලෙසත්, ක්‍රියාකාරකම්වල ඇදගතිය කායවංක ලෙසත් සඳහන් කළ හැකියි.

සමහර අය සිතින් සිතන දේ ප්‍රකාශ කරන්නේ නැහැ. සිතින් සිතන දේට ඉඳුරාම පටහැනි දෙයක් ප්‍රකාශ කරනවා. සමහරු කියන දේ නෙවෙයි කරන්නේ. ඊට සහමුලින් ම වෙනස් දෙයක්.

> **"මුහුණ පියුමක් වගේ හරි ලස්සනයි. කතා කරන වචන සඳුන් වගේ සිසිලයි. දිවඟ මී පැමිණී බේරෙනවා වගේ. ඒ වුණාට හදවත තුළ හලාහල විසයි පවතින්නේ. ඊර්ෂ්‍යාවෙන්, මසුරුකමින්, කපටිකමින් යුත් පුද්ගලයා ලස්සන ශරීර වර්ණයෙන් යුක්ත වූවත් හොඳ යහපත් මිනිසකු වන්නේ නැහැ."**

මුඛං පද්ම අලංකාරං
වාචා චන්දන සීතලං
මධූ තිෂ්ඨති ජිව්හාග්‍රේ
හෘදයෙකු හලාහලං

මේ පැරණි කියමනටඅනුව මුහුණ පියුමක් වගේ හරි ලස්සනයි. කතා කරන වචන සඳුන් වගේ සිසිලයි. දිවඟ මී පැමිණී බේරෙනවා වගේ. ඒ වුණාට හදවත තුළ හලාහල විසයි පවතින්නේ. ඊර්ෂ්‍යාවෙන්, මසුරුකමින්, කපටිකමින් යුත් පුද්ගලයා ලස්සන ශරීර වර්ණයෙන් යුක්ත වූවත් හොඳ යහපත් මිනිසකු වන්නේ නැහැ.

මෙබඳු ගති පැවැතුම් ඇති සමාජයක් තුළයි අප ජීවත් වෙන්නේ. සමාජය අප තේරුම් අරගෙන මානසික පීඩාවට පත් නොවී ආත්ම ශක්තියෙන් යුක්ත ව සියල්ලට ම මුහුණ දීමේ ශක්තිය අප තුළ වර්ධනය කරගත යුතුයි. තවත් විදියකින්, කියනවා නම් මේ ලෝක ස්වභාවය, විපරිනාමය අප අවබෝධ කරගත යුතුයි. බාධක මැඩගෙන ඉදිරියට ගමන් කළ හැකි පෞරුෂයක් ගොඩනඟා ගන්නා තැනැත්තා ජයකණුව කරා යනු ඒකාන්තයි.



# භික්ෂූන් වහන්සේ රැක ගනිමු

**අප අද ජීවත් වන්නේ වෙන කවරදාටත් වඩා භික්ෂූන් වහන්සේගේ සංඛ්‍යාව අඩුවෙමින් පවතින කාල වකවානුවක යි‘ ඉතින් ඒකටත් බරපතළ හේතුවක් පෙනී යනවා. ඒක තමා පසුගිය කාලයේ අප විසින් අනුගමනය කරපු වැරදි පිළිවෙතක්.**

**ඒ කාලයේ, ඒ කියන්නේ දැනට වසර 40 කට පමණ පෙර කාලවකවානුවක් තිබුණා. මේ රටේ බරපතළ උපත් පාලනයක්.**

ඒ වගේම වඳ සැත්කම කර ගන්නා පුරුෂ පක්ෂයේ උදවියට රු. 500.00 දීමනාවකුත් දුන්නා. ඉතින් ඒ කාලේ බොහෝ තරුණයෝ අර රු.500.00 ට ගිජුකමක් ඇති කර ගෙන එම සැත්කම් පෝලිමේ ගිහින් කර ගත්තා. ඒ විතරක් නොවේ. රාජ්‍ය සේවය පිණිසයි යන ශීර්ෂය ඇති රජයේ ලියුම් කවරවල පුංචි පවුල රත්තරන් කියා දැන්වීම් ශීර්ෂ පාඨයක් යොදමින් ජනතාව අතර ප්‍රචාරයක් ගෙන ගියා උපත් පාලනය සම්බන්ධ ව.

ඉතින් මේ කරුණු නිසාත් තවත් ආර්ථික වශයෙන් පවුලේ දරු සංඛ්‍යාව වැඩවන නිසා පීඩනයට පත්වීම යන කරුණ නිසාත් පවුලේ දරුවන්ගේ සංඛ්‍යාව ශීඝ්‍රයෙන් පහළ යන්නට පටන් ගත්තා.

අද මේ වෙනකොට එහි භයානක අද්දැකීම් භික්ෂූන් වහන්සේලා වශයෙන් අප භුක්ති විඳිනවා. මේ නිසා ඇති වී තිබෙන කනගාටුදායක ප්‍රතිපලය තමා සිංහල බෞද්ධ ජනගහනය ශීඝ්‍රයෙන් පහළට යාම. ඒ විතරකුත් නොවේ. මේ හේතුවෙන් වෙහෙරවිහාරස්ථානවල වැඩ සිටිය යුතු භික්ෂූන් වහන්සේලාගේ විශාල අඩුවක් පවතී . තවත් පැත්තකින් තරුණ භික්ෂූන් වහන්සේලා සම්බන්ධ ඇතැම් සුළු සුළු කාරණා සමාජය තුළ ඉස්මතු වීමෙන් තරුණ භික්ෂූන් වහන්සේ වාර්ෂිකව දහස් ගණනින් භික්ෂු ජීවිතයෙන් සමුගෙන ගිහි බවට පත් වීම.

මෙයින් අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ භික්ෂූන් වහන්සේලාගේ සංඛ්‍යාව ශීඝ්‍ර වශයෙන් පහළට කඩා වැටීම හා විහාරස්ථාන භික්ෂූන් වහන්සේගෙන් හිස්වීම. කිසිම භික්ෂූන් වහන්සේ නමක් නොමැති විහාරස්ථාන සිය ගණනක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ම සොයා ගත හැකි වෙනවා.

ඉතින් අද දවසේ ජීවත් වන අප විසින් දැනට පැවිදි ජීවිත ගත කරන අපේ තරුණ පොඩි හාමුදුරුවරු ආරක්ෂා කරගෙන, අවශ්‍ය තැනදි නිසි පිළිවෙළකට දැනමුතුකම් ලබා දී පුත්‍ර ස්නේහයෙන් යුක්තව එම පිරිස රැකගතයුතු වෙනවා. එය අප කාගේත් බරපතල යුතුමක් බවට පත් වී තිබෙනවා.

ඉතින් එදා බුදුරජාණන් වහන්සේ දවස උන්වහන්සේ දඹදිව ඉන්දියාවේ එක් කාලයක චාතුමා නුවර නෙල්ලි වනයේ වැඩ වාසය කරන අවස්ථාවක ඇති වූ සිදුවීමක් මෙහි දී සිහිපත් කරදීම අතිශයින් වැදගත් වෙනවා.

මෙය ගිහි පැවිදි අප දෙපක්ෂයටම වැදගත් වන්නේ මේ අපේ ගරු කටයුතු මහා සංඝරත්නය වෙතින් කෙතරම් අඩුපාඩු අප නොයෙක් විට දුටුවත් උන්වහන්සේලා ගිහි පැවිදි අප දෙපක්ෂය විසින් ම මහත් සෙනෙහසින් කරුණු කියා හෝ රැක ගත යුතු පිරිසක් වන බව මැනවින් ප්‍රකාශ වන නිස යි.

ඉතින් දවසක් දා ඇති වූ සිදුවීමක් මෙහි දී දැක්වෙනවා. බුදුරජාණන් වහන්සේ චාතුම නුවර නෙල්ලි වනයේ වාසය කරන කාලයේ සැරියුත් හා මුගලන් මහරහතන් වහන්සේලා දෙනමත්. උන්වහන්සේලාගේ ගෝලයෝ පන්සියයක් පමණ භික්ෂු පිරිසකුත් දුර බැහැරක වැඩමවා සිට ආපසු මෙම නෙල්ලි වනයේ වැඩ ඉන්න බුදුරජාණන් වහන්සේ දකින්නට වැඩියා.

මේ පන්සියයක් භික්ෂු පිරිස අලුත පැවිදිවුණු පිරිසක් නිසා ඒ අය මෙයට පෙර කවදාවත් අපේ බුදුරජාණන් වහන්සේ දැකලා තිබුණෙත් නැහැ. ඒ නිසා බුදුරජාණන් වහන්සේ දකින්නට හරි ඕන කමකුත්. ආශාවකුත් තිබුණා. ඉතින් මේ පිරිස බුදුහාමුදුරුවෝ වැඩ වාසය කරන මේ ස්ථානයට ඇවිත් තමන්ට ඒ දවසේ කාලය ගත කරන්නට ලබා දුන්නු අවාස ගෙවල් ඇතුළට ගිහින් තම තමන්ගේ සයනාසන, කොට්ට, මෙට්ට, ඇඳ ඇතිරිලි තෝරා ගන්නට, වෙන් කරගන්නට, ඒ අය ඔවුනොවුන් ශබ්ද නගමින්, කෑගහමින් තරගකාරී ව හොඳ හොඳ සයනාසන ආදිය වෙන් කර ගන්නට පටන් ගත්තා.

ඉතින් මෙතන මහ සද්ද බද්ද ඝෝෂා බුදුහාමුදුරුවන්ට ඇහුණා. බුදුහාමුදුරුවෝ කවදත් නිශ්ශබ්දතාව ප්‍රිය කළ උතුම් ශාස්තෘවරයෙක්.

ඒ ගැන එදා දඹදිව ඉන්දියාවේ අන්‍යාගමික පිරිස් අතර පවා ලොකු කීර්තියකුත් තිබුණා "ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ නිශ්ශබ්දතාව ප්‍රියකරන ශාස්තෘවරයෙක්" යන රාවය නිසා ඒ ආගමික ශාස්තෘවරුන් බුදුරදුන් හමු වන්නට ආවෙත් බොහොම නිහඬ පිළිවෙතක් අනුගමනය කරමිනු යි.

මෙය ධර්මයේ හැඳින් වන්නේ ආර්ය නිශ්ශබ්දතාව කියල යි. "අරියො වා තුණ්හීභාවො". ඒ කියන්නේ උන්වහන්සේ නිකරුණේ කාලය ගත කරන්නේ නැහැ. කිසියම් විවේකයක් ලදෙත් උන්වහන්සේ ඵලසමවතට සම වැදී විමුක්ති සුවය විඳිමිනුයි කාලය ගත කරන්නේ. අනිත් හැම වේලාවක ම මොනවා හෝ පරහිත පිණිස හේතුවන ක්‍රියාවකයි උන්වහන්සේලා යෙදී වැඩ ඉන්නේ.

ඉතින් මේ නවක එහෙම නැතිනම් ළඟ දී පැවිදි වූ නිසා ඒ තරුණ භික්ෂූන් වහන්සේලාගේ අර ගිහි ගතිය තවමත් ඇකී මැකී නොගිය නිසා ම මේ ඝෝෂාවෙන් බුදුරජාණන් වහන්සේ කිසියම් දැඩි ස්වරූපයක් ඇති ව.

"කවුද ආනන්ද එය මාලු දැලක් ගොඩට අදින තැනක වගේ උස් හඬින් මහහඬින් කෑ මොර දෙන්නේ?" කියා විමසුවා. ඒ වෙලාවේ උන්වහන්සේට දැන ගන්නට ලැබුණා මේ අග්‍රශ්‍රාවක දෙනම සමඟ ආ නවක භික්ෂු පිරිසක් තමන්ට ඕන ඕන විදියට සෙනසුන් ආසන තෝරා ගැනීමේ දී ඇති වූ ඝෝෂාවක් බව. බුදුරජාණන් වහන්සේ ඒ අයට පණිවුඩයක් යවලා ගෙන්වා ගෙන "වහාම පිට වී මේ සීමාවෙන් යන්න" කියා නියම කළා. මෙයින් මහත් කම්පාවට පත් භික්ෂු පිරිස තමන්ගේ පාත්‍ර සිවුරු හැරගෙන ආපසු පිටත්ව යන විට අතරමග දී හමු වූ ගිහි දායක පිරිසක් විමසා සිටියා

"ආපයින් ම ආපසු යන්නේ ඇයි?" ඇයි කියලා.

ඉතින් සිද්ධිය සිදු වූ ආකාරයෙන් ම ඒ අයට මේ භික්ෂු පිරිස දැනුම් දුන්නා. ඉතින් මෙයින් මහත් කම්පාවට පත් දායක පිරිස "මෙහෙම ගියොත් අපිට අපේ හාමුදුරුවරු මහණකම ගැන කළකිරිලා සිවුරෙන් ඉවත් වේවි. ඒ නිසා බුදුරජාණන් වහන්සේට කරුණු කියලා මේ නවක හාමුදුරුවරුන්ට සමාව ලබා දෙන්නට ඕන කියලා හිතාගෙන ඒ භික්ෂු පිරිස ආපසු අඬ ගහගෙන නෙල්ලි වනයට ගිහින් බුදුහාමුදුරුවන්ට කරුණු කීවා.

ඔවුන් කියා සිටියේ මෙන්න මේ විදියට. "ස්වාමීනි. මේ හාමදුරුවරු ළඟදී මහණ වුණු අය. මේ අයට මෙම නිශ්ශබ්දතාව රැකීම පිළිබඳ තවම අදහස් වැඩි දියුණු වෙලා නැහැ. ඔබවහන්සේ දැකල යන්නට යි දුර සිට වැඩලා තියෙන්නේ. ඉතින් ඉස්සරත් භාග්‍යවත් බුදුරාණන් වහන්ස. ඔබ වහන්සේ මෙවැනි කරුණුවලට ආපසු සමාව දුන්නා අපට මතක යි. දැනුත් මේ අයගේ මේ නවක ගතිසිරිත් ගැන තදබල නො වී අනුකම්පා කර සමාව දෙනු මැනවි.

"දෙන දිහාවට වේගයෙන් ඇදෙන වසුපැටවුන්ට දෙන සොයා ගත නොහැකි වුණොත් බලවත් දුකට පත් වෙනවා, වතුර අවශ්‍ය වෙන වේලාවට වතුර නොලැබුණොත් බීජ වේළී යනවා. පැළ හට ගන්නේ නැහැ.

ඒ වගේ ම මේ හාමුදුරුවරු ඔබ වහන්සේ දැක ගන්නට ආශාවෙන් පැමිණ ඒ අපේක්ෂාව සුන් වෙනකොට කායික හා මානසික ලෙස බලවත් දුකට පත් වෙනවා. දුර්වල වෙනවා. මේ හාමුදුරුවරු එතකොට අපේ සම්බුදු සසුන පවත්වාගෙන යන්නට අපට නැති වෙනවා.කියලා

මේ වෙලාවේ ම මේ විපත දුටු සහම්පති මහාබ්‍රහ්මයා ත් බුදුරදුන් හමුවට පැමිණ මේ විදියටම ඉල්ලීම් කර තිබුණා.

මේ කරුණු කියාපෑමෙන් බුදුරජාණන් වහන්සේ මේ කරුණ පිළිබඳ මධ්‍යස්ථ වී ඒ අයට ආපසු පැමිණ තමන් වහන්සේ හමුවීමට අවසර දීමට තීරණය කළා. ඒ අවස්ථාවේ මුගලන් මහරහතන් වහන්සේ ඒ භික්ෂු පිරිසට ආපසු එන ලෙස පණිවුඩ යැව්වා.

මේ අවස්ථාවේ මෙතනට සැරියුත් තෙරුන් වහන්සේ වැඩියා. බුදුරජාණන් වහන්සේ පළමුවෙන් ම සැරියුත් හුමුදුරුවන්ගෙන් විමසා සිටියා .

ඈ සාරිපුත්ත. මේ නවක භික්ෂූන් වහන්සේලා ට තමන් වහන්සේ දැකීමට අවස්ථාව නො දී පළවා හැරියායින් පස්සේ ඔබ වහන්සේට මොකද හිතුණේ ? කියලා. ඒ වෙලාවේ සැරියුත් හාමුදුරුවෝ පවසනවා ස්වාමිනි. භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ නිරෝධ සමාපත්තියට සම වැදිලා විවේකව කල් යවනවා වගේ ම මම ත් ඒ විදියට නිරෝධ සමාපත්තියෙන් ගත කිරිම සුදුසු යි කියා සිතුවා කියලා.

ඒ පිළිතුරට බුදුරජාණන් වහන්සේගේ මනාපයක් ඇති වුණේ නැහැ.. ඊළඟට මුගලන් හාමුදුරුවෝ දෙස බලා උන්වහන්සේගෙන් බුදුහාමුදුරුවෝ විමසා සිටියා.

මොග්ගල්ලාන, ඔබට ඒ වෙලාවේ කුමක් සිතුණේ ද? මුගලන් හාමුදුරුවෝ ප්‍රකාශ කරනවා. ස්වාමිනි, භාග්‍යවතුන් වහන්ස. ඔබ වහන්සේ විවේකී ව නිරෝධ සමාපත්තියට සමවැදිලා සිටින අවස්ථාවේ සැරියුත්, මුගලන් අප දෙදෙනා වහන්සේ හරි හරියට එකතු වෙලා මේ හැදෙන වැඩෙන අපේ මේ භික්ෂු පිරිස රැකබලා ගෙන කටයුතු කරනවා කියා සිතට ගත්තා කියලා.





අස්ගිරිමහාවිහාරයෙහි උපාධ්‍යාය, කාරක සංඝසභික,වයඹ පළාතේ ප්‍රධාන සංඝනායක මහාචාර්ය

**තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නාහිමි**

32 පිටුවට...



# බෝධි පූජාවේ නිවැරැදි පිළිවෙත්

**බෞද්ධ ජනතාව, බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් නිරතුරු පුදපූජා පවත්වන පූජාර්හ වස්තූන් අතර දළදා වහන්සේටත් ජයශ්‍රී මහා බෝධීන් වහන්සේටත් හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. 'බෝධි' යන වචනයේ තේරුම නිවැරැදි, පැහැදිලි, සම්පූර්ණ වූ දැනුමයි. අවබෝධයයි. සිද්ධාර්ථ ගෞතම බෝසතාණන් වහන්සේ බුද්ධගයාවේ ඇසතු රුක පාමුලදී සියලු කෙලෙසුන් නසා සම්මා සම්බුද්ධත්වයට පත්වීමෙන් අර්ථවත් වන්නේ ලෝක සත්‍යය පිළිබඳ නිවැරැදි, පරිපූර්ණ වූ දැනුම සහ අවබෝධය ලබා ගැනීමයි.**

ශාසන ඉතිහාසයට අනුව සැවැත් නුවර ජේතවනාරාම විහාර භූමියේ සිදු කළ ආනන්ද බෝධි රෝපණයත් සමග ආරම්භ වූ බෝධි වන්දනාව, කාලයත් සමග වෙනස්කම් රැසකට භාජනය වී ඇත. ඇතැම් වෙනස්කම් සාධනීය වනවා සේ ම ඇතැම් වෙනස්කම් මිථ්‍යාදෘෂ්ටිය වෙත යොමු කරවන බවක් දක්නට ලැබෙයි. එබැවින් බෝධි පූජාවේ සැබෑ අරුත කුමක් විය යුතු ද? බෝධි පූජාවක් ඵලදායක ලෙස සිදුකර ගැනීමට අනුගමනය කළ යුතු දෑ මොනවාද ? යන්න පිළිබඳව සාකච්ඡා කිරීම මේ ලිපියේ අරමුණයි.

බෝසතාණන් වහන්සේ ඇසතු බෝධිය පාමුල ලබා ගත්තේ නිවැරැදි දැක්මයි. ප්‍රඥවයි. ලෞකික ආශාවන්, බලාපොරොත්තු, බැඳීම් සියල්ල නිරර්ථක බව වටහාගෙන ඒ සියල්ල අත්හළ ස්ථානය බෝධියයි.

එසේනම් ඔබ, බෝධීන් වහන්සේ පාමුල සිට ලෞකික බලාපොරොත්තු ඉටු කරවා ගැනීමට පිහිට පතන්නේ නම්, එය බෝධි පූජාවේ සැබෑ අරුත නොසලකා හැරීමක් බව තේරුම් ගත යුතුය.

මෙයින් අදහස් වන්නේ බෝධීන් වහන්සේට වන්දනාමාන කිරීම, පුදපූජාවන් පැවැත්වීම නිරර්ථකය යන වැරැදි අදහස නොවේ. ලෞකික ප්‍රාර්ථනාවන් මුදුන් පමුණුවා ගැනීමට බෝධියට පුදපූජාවන් කරමින් ආයාචනා කිරීම නිෂ්ඵල බවයි.

බෝධි පූජාව යොදාගත යුත්තේ නිරන්තරයෙන් කෙලෙස්වලින් කිලිටි වන සිත්, කුසල් සිතිවිලිවලින් පිරිසුදු කරගැනීමටයි. ඒ පිරිසිදු සිතින් යම් අයෙකුට යහපතක් වේවා, නිරෝගි වේවා, යැයි ආශීර්වාද කරන විට ඔබටත් අන් අයටත් බෝධි පූජාව ඵලදායක වනු ඇත. එසේ නොමැතිව ඊර්ෂ්‍යාව, මානය, අහංකාරකම, ආත්මාර්ථකාමීකම යනාදී අකුසල් සිතිවිලි හිතේ පුරවාගෙන කරන ප්‍රාර්ථනාවන් කිසිසේත් සඵල නොවේ.

උදාහරණ ලෙස විභාගවලින් අනිත් අයට වඩා වැඩි ප්‍රතිඵල ලබා ගැනීමට, නඩුහබවලින් තමන්ට වාසි ලැබීමට බෝධි පූජා සිදු කරන්නේ නම්, අරමුණ අපිරිසුදු නිසා ප්‍රතිඵලයක් නොලැබෙයි. එහෙත් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක වීමට පිරිසිදු සිතින් වත්පිළිවෙත් කර ආශීර්වාද කිරීම වරදක් නොවේ. එය පින්කමකි. අන් අයගේ යහපත ප්‍රාර්ථනා කිරීමකි.

බෝධි පූජාවක් සිදු කිරීමේ දී ඒ සඳහා පෙර සූදානම ඉතා වැදගත්ය. විශේෂයෙන් තුණුරුවන්ට, ත්‍රිවිධ චෛත්‍යයන්ට පූජා කරන දේවල් ඉතා පිරිසුදුව, පිළිවෙලට සකස් කර ගත යුතුය.

පූජා ද්‍රව්‍යයන් වෙළඳසැල්වලින් මිලදී ගැනීමට වඩා තමන්ටම සකස් කරගත හැකිනම් එය වඩාත් ආනිශංසදායක ය. පොල්තෙල් තමන්ට සකසා ගැනීම අපහසු නම් මිලදී ගන්නා විට වෙනත් තෙල් වර්ග මිශ්‍ර නොකළ, විශ්වාසවන්ත තැනකින් ලබාගන්න. හොඳ සුවඳවත් හඳුන්කූරු සපයා ගන්න. ගෙවත්තේ නොමැතිනම් තිබෙන තැනකින් වට්ටියකට මල් නෙළාගන්න. ගිලන්පස සැකසීමේදී ඉතාමත් පිරිසුදු සහ උසස්ම තත්ත්වයෙන් පිළියෙල කර ගන්න.

පූජා ද්‍රව්‍යයන් සකසාගෙන බෝධි පූජාවට යන ඔබ සම්පූර්ණ සුදු ඇඳුමකින් සැරසෙන්න. අප බොහෝ විට දැක ඇත්තේ, ඇතැම් අය සිතාගෙන සිටින්නේ ඇඳුමේ කොතැනක හෝ සුදු පාට ඇති නම් එය සුදු ඇඳුමක්ය යනුවෙනි. එහෙත් සම්පූර්ණ සුදු ඇඳුම යනු වෙනත් පාට කිසිවක් නැති, සංවර ඇඳුමටය. දුටුවන් නෙත්සිත් පහදවන, විලාසිතාවලින් තොරවූ ඇඳුමටය.

සිද්ධස්ථානවලට යන විට වටිනා ආභරණයන් පැළඳීම ඔබේ අරමුණට නොගැලපෙනවා පමණක් නොව ඇතැම් විට අනතුරුදායක ද විය හැකි බැවින් ඒ ගැන සැලකිලිමත් වීම සුදුසු ය.

බෝධි පූජාව සිදු කිරීමට පෙර චෛත්‍යය, බෝධිය, විහාර මන්දිරය තුළ ඇති මල් ආසන පිරිසුදු කිරීම, ඇමදීම ආදී වතාවත් සිදු කිරීම අත්‍යවශ්‍යය.

ඇතැම් අය මල් ආසන මත පරමල් ගොඩ ගැසී ඇතත් ඒවා පැත්තකට තල්ලු කර තමන් ගෙනා මල් පූජා කරති. එබඳු ක්‍රියාවලින් සංකේතවත් වන්නේ සිත අපිරිසුදු බවයි. සිත අපිරිසුදු නම් කරන, කියන දේවල්වලින් පිනක් සිදු නොවේ.

විහාර භූමිය පිරිසුදු කිරීමේ වතාවත් සිදු කිරීමෙන් බෝධි පූජාව, බුද්ධ පූජාව හා සමාන ආනිශංස ලැබෙන බව පැරණි බණකථාවලින් පෙන්වා දී ඇත. පිරිසුදු කිරීමේ වතාවත් නොකර, පවත්වන බෝධි පූජාව අසම්පූර්ණ ය.

වතාවත් සිදු කිරීමෙන් අනතුරුව ඔබ සකස් කරගෙන ආ ගිලන්පස සහ අනෙකුත් පූජා ද්‍රව්‍යයන් ඒ සඳහා වෙන්කර ඇති භාජන පිරිසිදු කර ඒවායෙහි පිළියෙල කරගන්න. පහන්, හඳුන්කූරු ඒවාට නියමිත ස්ථානවල දල්වන්න.

මෙහිදී මතක තබා ගතයුතු කරුණක් නම් හඳුන්කූරු විශාල ප්‍රමාණයක්, පන්දමක් මෙන් දල්වාගෙන හෝ ගිනි කබලකට සුවඳ දුම් ද්‍රව්‍යයන් ඉසිමින් බෝධීන් වහන්සේ වටා යමින් දුම් ඇල්ලීම අවශ්‍ය නැත. එය මිථ්‍යාදෘෂ්ටියකි. වැරැදි පිළිවෙතකි. එසේම බෝධීන් වහන්සේ පාමුල පහන්, හඳුන්කූරු දැල්වීමෙන් බෝධියට හානි සිදුවේ. එබැවින් පහන්,හඳුන්කූරු දැල්වීමට වෙන්කර ඇති ස්ථානවල පමණක් එය සිදු කරන්න.



හෝමාගම, පිටිපන දකුණ මෙත්සිත් අරණ විවේක සෙනසුනේ විහාරාධිපති,
පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනේ
ආචාර්ය,
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති
**ලුණුගම්වෙහෙර නාරද හිමි**

භාජනවල ක්‍රමානුකූල ව සකසා ගත් ගිලන්පස බෝධීන් වහන්සේගේ මල් අසුන් මත තැන්පත් කරන්න. දාගැබට සහ විහාර මන්දිරයට ද ගිලන්පස තැන්පත් කරන්න.

මේ මූලික වතාවත්වලින් පසු තමන්ට පහසු තැනක බෝධීන් වහන්සේ අභියස පහසු ඉරියව්වකින් අසුන් ගන්න. තිසරණ පන්සිල් සමාදන් වී පිළිවෙලින් තෙරුවන් වඳින ගාථා, බෝධි වන්දනා ගාථා කියා මල්,පහන්, සුවඳදුම්, ගිලන්පස බුදුරජාණන් වහන්සේටත්, බෝධීන් වහන්සේටත් පූජා කරන ගාථාවන් කියවන්න.

ගාථා කීමේදී ශ්‍රද්ධා පෙරදැරිව, සන්සුන්ව කියවිය යුතුය. බොහෝ දෙනා බෝධි පූජා ගාථා,කවි අඩංගු මුද්‍රිත පොත් කීපයක් ගෙනැවිත් හැම පොතක්ම මුල සිට අග දක්වාම හඬ නගා කියවීමට පුරුදු වී සිටිති. එසේ කිරීම අවශ්‍ය නැත. අවශ්‍යම ගාථා සහ බෝධි වන්දනා කවි කිහිපයක් කියවීම ප්‍රමාණවත් ය.

ගාථාවන් කියා පූජාව සිදු කිරීමෙන් පසු සිත එකග කරගෙන අවම වශයෙන් මිනිත්තු 10ක්වත් බුද්ධානුස්සති සහ මෙත්තානුස්සති භාවනාවන් වඩන්න. රැස්කර ගත් පින් සිහිපත් කරමින් යහපත් ප්‍රාර්ථනාවන් සමග ආශීර්වාද කළ යුතු අයට ආශීර්වාද කිරීමට අවශ්‍ය චිත්ත ශක්තිය ඒ තුළින් ඔබට ලැබෙනු ඇත. බෝධි පූජාව අවසානයේ භාවනාවක් ලෙස සලකා, සිත සන්සුන් කරගෙන මෙසේ ප්‍රාර්ථනා කරන්න.

සිඳෙන බිඳෙන ලොව ඇති තතු වටහාගෙන ලැබුව නුවණ
ලොව්තුරු බුදුසමිඳුන් වැඩ සිටි හැටි අප සිතෙහි මවන
පින් සිතුවිලි ඇති කර කර දුක් දුරු කර සුවය දෙවන
මගෙ ගත සිත සැනසේවා ලැබගෙන බෝරජුගෙ සෙවණ

ඉරිසියාව වෛරය මානය ඉවතට දමන්නෙමී
මගේ සැපත වගේ අනුන්ගේ සැපතත් සිතන්නෙමී
සතුරාටත් මිතුරාටත් එක සේ මෙත් වඩන්නෙමී
ගතින් කොහේ ගියත් සිතින් බෝ සෙවණේ ම සිටින්නෙමී

බෝ සෙවණේදි සන්සුන්කම හැම තැනදිම රකින්නෙමී
බෝසෙවණේදි පින් සිතුවිලි හැම මොහොතෙම සිතන්නෙමී
බෝසෙවණේදි ලැබුව නුවණ නිරතුරුවම වඩන්නෙමී
බෝසෙවණේදි ලැබුව සුවය මුලූ දිවියෙම ලබන්නෙමී



# පැරැණි බෝධි වන්දනා ගාථා

වජිර සංඝාත සරීරෝ - වජිර ඤාණා නමා කරෝ
යෝ බුද්ධෝ බෝධි මූලම්හි - නිසින්නෝ වජිරාසනේ
සසේන මාරං ජිත්වාන - සත පුඤ්ඤස්ස තේජසා
පඨමේ පුබ්බේනිවාසං - මජ්ඣිමේ දිබ්බචක්ඛුකං
පච්ඡිමේ සබ්බසංඛාරේ - සම්මසං ලක්ඛකෝටියං
ඡත්තිංසාය කෝටි - සතසහස්ස මුඛේන පච්චයං
ඕතාර මහා වජිරේන - සුසම්බුද්ධාසවක්ඛයං
බුද්ධභූමි නිට්ඨංගෝ - සෝ මහාවජිරඤාණසා
බෝධනෙයෝ සුබෝධෙත්වා - බෝධේසිතං නමාමහං

වජිරාසන මත වැඩහිඳ - විදුරු නැණ බලින් සපිරුණු
නුවණ විහිද වූ මුනිඳුන් - සදා වඳිමි මම්
බෝධිමූලයේ සෙවනේදි- පුදා දිවි උතුම් නිවනට
පරදා සේනා ඇති මරු - පින් බලය මතු කළේ
සොයාගත් නිවන් මඟ තුළ - සම්බෝධිරාජ බවට පැමිණ
පුබ්බේනිවාස ඤාණය ලැබ - ප්‍රථම යාමයේ
සුගති දුගතියෙහි ඉපදෙන - ලෝ සතුනගෙ දුක දැනගෙන
දිවැස් නුවණ ලැබූ සේක - මැදුම් යාමයේ
සියලුම සංස්කාර ලොවේ - නුවණින් විමසා බලමින්
ලක්ෂ කෝටි වාර ගණන් - එය මෙනෙහි කළේ
සතිස් කෝටි සිය දහසක් - හේතුඵල දහම් විමසා
මහා විදුරු නැණ බලයෙන් - ඇති තතු වටහා
සම්මා සම්බුදු බව ලැබ - නසා හැම කෙලෙස් පිරිසිඳ
දිනූ සේක මෙහි වැඩ හිඳ - බුද්ධ භූමියේ
මහා විදුරු නුවණින් යුතු - සම්බුද්ධරාජ මුනිඳුන් ලොව
නුවණැති දෙව් මිනිසුන් තුළ - නිවන මතු කළේ
ඒ උතුම් බෝධි නුවණට මම - නැමී වැඳ වැටී සිරසින්
පහන් වූ සිතින් හැමවිට - වන්දනා කරමි. . .



# ලොකු හාමුදුරුවන්ගේ ලියමන

**අප හිතවත් ධම්මානන්ද සථවිරයන් වහන්සේ වෙත,**

එවන ලද ලියුම් කඩදහිය ලැබුණා. එය කියවලා මම මහත් සංවේගයකට පත්වුණා. අපේ විදුහල්පති වික්‍රමතිලක මහත්තයා ඔය කියන ළමයව අතින් අල්ලන් පන්සලට එනවා මට හොඳට මතකයි. කොවිඩ් වසංගතය නිසා මම දැනගෙන හිටියේ නැහැ ළමයාගේ අභාවය ගැන.

වික්‍රමතිලක මහතා ඉතා හොඳින් දහම් පාසලුත් එවලා , හොඳට උගන්නපු ළමයා. ඒත් මෝටර් සයිකලය පාවිච්චි කරල තියෙන්නේ වැරදි විදිහටයි.

දැන් දහම් පාසල්වල මේ කාලීන අභියෝගවලට මූණ දෙන්න දරුවන් යොමු කරන්න ඕන කාලය ඇවිල්ලා. ඕනෑම ගැටලුවකට පිළිතුරු බුදු දහමේ තිබුණත් අපි ඒවා යාවත්කාලීන කරලා භාවිතයට ගන්න උගන්නල නැහැ.

බුදුරජාණන් වහන්සේ සර්වඥයි. උන්වහන්සේ ඉදිරිපත් කළේ අකාලික ධර්මයක් . පෙර නොඇසූ විරූ දහමක්. දරුවෝ වැඩෙන කොට මදයත් වැඩෙනවා. ඒ තමයි යොබ්බන මදය, ආරෝග්‍ය මදය, ජීවිත මදය. මේ මද රූප මදය, කුල මදය, ජාති මදය, භාෂා මදය, බල මදය ආදී සියලු මදවලට වඩා බලවත්, යොබ්බන මදය ඒ කියන්නේ තරුණ කමින් මත් වීම. ඒක නිසා වන විනාශය කියලා නිම කරන්න බැහැ.

තරුණකම ඉතාම හොඳයි . මේ ලෝකේ සියලුම ආගමික නායකයෝ , දාර්ශනිකයෝ බිහි වුණේ තරුණ කාලේ .අපේ බුදුරජාණන් වහන්සේ , ජෛන මහවීර තුමා, ජේසුස් වහන්සේ, කොන්ෆියුසියුස්තුමා. ලාඕට්සේතුමා වගේ ආගමික ශාස්තෘවරු තරුණ කාලේ බිහිවුණේ.

අපේ බෝධිසත්වයෝ ගවේෂණ ආරම්භ කළේ කළු කෙස් ඇති, යෞවන වයසේ සිට කියලා බණ පොතේ තියෙනවා . බටහිර බිහි වුණු සියලු දාර්ශනිකයෝ තේලිස්, අකේසිමැන්ඩල්, අනෙක්සිමීනීස්, පයිතගරස්, ඇරිස්ටෝටල්. සොක්‍රටීස් ආදී සියලු දෙනා හොඳ යෞවනයේ තරුණයෝ ලෙසයි තම මත වාද ඉදිරිපත් කළේ. ඒ නිසා මේ ලෝකේ තරුණකම තරම් හොඳ දෙයක් නැහැ.

ඒත් තරුණකමින් මත්වුණාම වන විනාශය කියල නිම කරන්න බැහැ. පාපැදියෙන් මෝටර් සයිකලයේ වැඩ කරන්න යනවා, මෝටර් සයිකලයෙන් ජෙට් එකේ වැඩ කරන්න යනවා, ත්‍රිරෝද රථයෙන් රේසින් කාර් එකේ වැඩ කරන්න යනවා. දිය ඇල්ල, බෝක්කුවක වතුර පාර වගේ සලකනවා.පාරේ යන බස් ඇඟෙන් හප්පලා පෙරළන්න පුළුවන් කියල හිතනවා. මේක තමයි යොබ්බන මදය.

මතකද? එක දවසක් නමසිය හැත්තෑ ගණන්වල අපි දෙන්න ම ගියා කොළඹ මහා රෝහලට අමරවංස නායක හාමුදුරුවෝ බලන්න. උන්වහන්සේ හිටියේ භික්ෂු වාට්ටුවේ. අපි ඉතින් ගම්බද ඇත්තොනේ . රෝහලේ සේවක මහත්තරුන්ගෙන් අපි ඇහුවා භික්ෂු වාට්ටුව කොහේද කියලා . එතකොට කිව්වා හොන්ඩා වාට්ටුවයි, සුසුකී වාට්ටුවයි පහු කරලා දකුණට හැරිල දිගටම ගියාම 25 වාට්ටුව තියෙනවා කියලා. ඒ කාලේ තමයි මෝටර් සයිකල් වැහි වැස්සේ. ඒ හොන්ඩයි සුසුකියයි තමයි රොහල් වාට්ටු දෙකම පිරෙව්වේ. අලුත් නම් දැම්මේ.

අද ගියත් බලන්න ඒ වාට්ටු තිබුණු තැන තියෙනවා ලොකු උස ගොඩනැගිලි. ඒකට නැග්ගම පේනවා කනත්ත. ඒ කාලෙත් ඒ වාට්ටුවල හිටපු අය කෙළින්ම ගියේ කනත්තට.

අද තරම් තරුණයෝ මැරෙන කාලයක් ලංකාවේ කවදාක්වත් තිබුණේ නැහැ. යුද්දෙට ගිහිල්ලා රට ජාතිය වෙනුවෙන් විශාල තරුණ පිරිසක් මැරුණා , ආබාධිත වුණා. ඒක ජාතික කර්තව්‍යයක්. වීරත්වයට මඟක්. ඒත් අද මහ පාරේ දවසකට 9 ක් 10 ක් මැරෙනවා. වැඩියෙන් ම මැරෙන්නේ මෝටර් සයිකල්වල යන තරුණයෝ. පිරිමි.

ඊළඟට ත්‍රිරෝද රථ තරුණයෝ, කාර් එළවන තරුණයෝ . ඒ ගොල්ලො හිතන්නේ මේ මහා බ්‍රහ්මගේ වාහනය වගේ වගේ සතර පැත්තට විදපු ඊතල බිමට වැටෙන්න ඉස්සෙල්ල අල්ලගන්න හංසය වගෙයි තමන් කියල.

ඒ හැර මත් ද්‍රව්‍යවලින් , මත් වතුර නිසා. දුම්බීමෙන්, දුරාචාරයෙන් මැරෙන පිරිමි සංඛ්‍යාව ලංකාවේ මුළු ප්‍රමාණයෙන් භාගෙටත් වැඩියි. මෙහෙම ගියොත් අපේ රටත් ඉවරයි . ජාතියත් ඉවරයි.

අපේ දහම් පාසල් අධ්‍යාපනය ආයෙ පටන් ගත්තම දරුවන්ට කාලීන ගැටළු ගැන උගන්නන්න ඕන. බුදු දහමේ එක ගාථාවක් වුණත් ඇති මුලු සදාචාරය ම උගන්නන්න. බුද්ධඝෝස ආචාර්යයන් වහන්සේ එක ගාථාවකින් මුළු ථේරවාදී දර්ශනයම කියල දුන්නේ. ඒ නිසා මේ භවය සාර්ථක කරගන්න පාඩම් හදමු.

මට මතක හැටියට ස්විස්ටර්ලන්තේ 2019 අවුරුද්දේ, අවුරුදු 19 දක්වා එක ම ළමයෙක් වත් මාර්ග අනතුරකින් මැරිලා නැහැ. මනුෂ්‍යත්වය දේවත්වයට බ්‍රහ්මත්වයට වඩා උසස්. මේ දහම පිළිගන්න රටක බෝධිසත්ව චර්යාව වඩන්න තරම් කායික මානසික කුසලතා තියෙන දරුවන් මේ වගේ මැරෙන එක වළක්වන්න වැඩ කිරීම පරලොව, දිව්‍යලෝකේ යන්න පින් පමුණුවනවට වඩා හොඳයි.

මගේ බලවත් සංවේගය අපේ වික්‍රමරත්න මහත්තයට දැනුම් දෙන්නේ මැනවි.

වසංගත රෝග තත්වයෙන් මිදෙන්නට ඔබ වහන්සේට තිසරණාධාර වේවා

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069
නිකිණි පුර පසළොස්වක 2021.08.22

## දැස් හැර බැලීම

තථාගතයන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සමයේ සැදැහැති බොහෝ ජනයා දහම් අසනු රිසියෙන් එහි පැමිණෙති. දිවා කල වැඩ කටයුතු නිමවා රාත්‍රියේ දහම් ඇසීමට යෑම බොහෝ අයගේ පුරුද්ද ය. මේ අතර සැදැහැති වෙස්ගත් සොරු ද වූහ. ඔවුහු ධර්මය අසන මුවාවෙන් පැමිණ බණ අසන අයගේ විවිධ බඩු භාණ්ඩ සොරා ගත්හ.

දිනක් මිතුරු සොරු දෙදෙනෙක් එහි ආහ. දහම් අසන බව හඟවමින් පිරිසට එක් වූහ. මේ අතර එක් සොරකුගේ සිත දහමේ ඇළුණි. හේ සෝවාන් ඵලයට ද පත්වුණි. ඔහු සොරකම අමතක කොට දැතේ මහන්සියෙන් දරු පවුල පෝෂණය කරන්නට සිතුවේ ය. ඒ බව තම බිරිඳට ද කීවේ ය. ඒ ඇනගත් ඇය බොහෝ කෝප විය. එදින ඒ නිවෙසේ බත් පිසුණේ නැත. දරුවන් ද කුසගින්නේ ය. ඇය සැමියා ට දෙස් නැගුවේ සොරකමේ ගිය අනෙක් මිතුරාගේ හොඳ කියමින් නුවණැති අයගේ දරුවන්ට බත් හිඟ නොවන බව පවසමිනි.

මේ පුවත බුදුරදුන්ට සැළ කළ අවස්ථාවේ උන්වහන්සේ දේශනා කොට වදාළේ බාලයා හෙවත් අනුවණ පුද්ගලයා තමන්ගේ අනුවණකම දැන ගනී නම් එයින් ම ඔහු පණ්ඩිතයෙක් වන බවය. තමන් පණ්ඩිතයෙකැයි සිතන මෝඩයා ඒකාන්තයෙන් ම මෝඩයෙක් වන බව ය.

වැඩි පිරිසක් ජීවිතය අභාග්‍ය සම්පන්න කර ගන්නේ මේ සොරාගේ බිරිඳ මෙන් වැරැදි ආකල්පයේ ම සිටින නිසා ය. එවැන්නන්ට නිවැරැදි අය පෙනෙන්නේ ද වරදකරුවන් ලෙස ය.

තමන් පමණක් සියල්ල දන්නවා යැයි උඩඟු සිතින් වරද ම කරන එවැන්නෝ තමන් විසින් තමන්ගේ ම විනාශය ළඟාකර ගනිති. මනුෂ්‍ය ජීවිතය දුර්ලභ ව ලබාගත හැකි සම්පතකි. එයින් නිසි ප්‍රයෝජනගත හැකි වන්නේ ද, විනාශය කරා ගෙන යා හැකි වන්නේ ද මිනිසත් බව ලැබූ අපටම ය. නුවණ අවැසි වන්නේ ඒ මඟ තෝරා ගන්නට ය.

තථාගත දේශනාවේ සඳහන් වන්නේ යම් දෙයක් කරන්නට කියන්නට පළමුව තමන් දෙස බලන ලෙසට ය. එනම් කරන කියන දෙයින් තමන්ට යහපතක් සිදුවේ ද, අයහපතක් වේද, කවරාකාරයේ විපාකයන්ට මුහුණ දෙන්නට වේද, ආදී ලෙස හොඳින් විමසා බලන ලෙස ය. අයහපතක් විනාශයක්, අපහාසයක් වේ නම් ඒ ක්‍රියාව නොකළ යුතු බවය.

එහෙත් ඇතැම් කෙනෙක් තෝරාගන්නේ මෙහි අනෙක් පැත්තය. අද අප සමස්තයක් ලෙස මුහුණ දෙන ප්‍රශ්න ගැටලු මේ නිසා ය. වර්තමානයේ අප මුහුණ දෙමින් සිටින ඉතා දරුණු රෝග ව්‍යසනය ම උදාහරණ කොට ගත හැකි ය. ඒ විනාශය අපවෙත ළඟා කර ගනු ලබන්නේ ද අප විසින් ම ය. වෛරසයෙන් බේරී සිටීමට දැන උගතුන්ගෙන් කොතෙකුත් අවවාද, උපදෙස් ලැබේ. එහෙත් දිනෙන් දින රෝගයට ගොදුරු වන්නෝ වැඩිය. ඒ අන් කිසිවක් නොව උපදෙස් නොපිළිපැදීම නිසා ය. තමන් කරන දෙය පිළිබඳ නොසිතා බැලීමේ වරද නිසා ය. එය සුළුපටු වරදක් නොවන්නේ රටක් ජාතියක් ලෙස සමස්තයට ම අනිටු විපාක විඳින්නට වන නිසා ය.

තමන්ගේ ම යැයි බුද්ධියක් විනයක් නොවේ නම් ධර්මයෙහි ඒ තැනැත්තා සමාන කරන්නේ වනයේ හැසිරෙන අන්ධ ගොනකුට ය. සමාජයේ බොහෝ අය හැසිරෙන්නේ ද අන්ධ ගොනුන් සේ වන බව ය. මේ සදුපදේශ අප හොඳින් අවධාරණයට ගත යුතුව තිබේ. පෙනෙන දේ හොඳින් දකින්නට අපට දැස් ලැබී තිබේ. සිතා බලන්නට උසස් මනසක් ලැබී තිබේ. ජීවිතයේ සෑම කටයුත්තක් ම හොඳින් දැස් හැර, විමසා බලා කරන්නටත්, මෙතෙක් වැරැදි සිදු වූවා නම් ඒවා නිවැරැදි කර ගන්නටත් ධර්මයෙහි අපට මඟ පෙන්වා තිබේ. අද නිකිණි පුන් පෝදා ඒ අධිටනින් ජීවිතය සුවපත් කර ගන්නට විරිය වඩමු.

# පෝය දා නිවාඩුවෙන් ප්‍රයෝජන ගැනීමට නම්...

**වර්තමානයේ ශ්‍රී ලංකාවේ කැලැන්ඩරයේ එන දින සටහන් වලට අනුව සෑම පසළෙ ාස්වක පොහොයක්ම නිවාඩු දින ලෙස සටහන් වී ඇත.**

සිංහල බෞද්ධ චින්තනයට අනුව ජන සම්මුතිය විසින් සම්මත කරගනු ලැබූ පෝය නිවාඩු හතරක් මාසයකට තිබුණි. පුර පසළෙ ාස්වක, අව අටවක , අමාවක හා පුර අටවක යන නිවාඩු හතරයි. බෞද්ධයන් මෙවන් නිවාඩු යොදාගත්තේ සාමාන්‍ය ජීවිතයේ වැඩ අත් හැරීමට හා ආධ්‍යාත්මික වැඩවල යෙදීමටයි. ඒ අනුව සිංහල බෞද්ධයෝ පෝය හතරටම සිල් ගත්හ. පන්සල් ගියහ. ආත්මාර්ථයෙන් බැහැර වී ශ්‍රමදාන ආදී පරාර්ථ චර්යාවල යෙදුණ හ. මෙසේ පෝය දින ගත කිරීම බුදු දහමට අනුව සිදු වූවාක් ලෙස සැලකිය හැකි ය.

බුදු දහමට අනුව සියලු ක්‍රියාවලීන් සිදුවන්නේ කරුණු හයක් පදනම් කරගෙන ය. ඒවා ලෝභ,දෝෂ, මෝහ, අලෝභ අදෝෂ හා අමෝහ යනුවෙන් දැක්වේ. මෙහි මුල් කරුණු තුන අකුසල පැත්තේ හෙවත් වැරැදි පැත්තේ ක්‍රියාවන්ට මුල් වේ. ඊළඟ කරුණු තුන කුසල පැත්තේ හෙවත් නිවැරැදි පැත්තේ ක්‍රියාවන්ට මුල්වේ. සාමාන්‍ය ජීවන රටාව තුළ අකුසල් හෙවත් වැරැදි පැත්තේ ක්‍රියාවන්ට මුල් වීම පහසුවෙන් සිදුවේ. එබැවින් බුදු දහමේ ඉගැන්වෙන ජීවන රටාවේ මූලික ලක්ෂණය වනුයේ අකුසල් හෙවත් වැරැදිවලින් වැළකී සිටීමයි. අදවන විට පන්සිල් ගැනීමක් මිස සමාදන් වීමක් සිදු නොවේ. එනම් සිල්පද මැනවින් සිතට ගැනීමක් සිදුවේ යැයි කිව නොහැක. දහම් පාසලේදී දරුවන් පන්සිල් සමාදන් වීමේ පටන් වැඩිහිටියන් ඒ ඒ අවස්ථාවල සිදුකරන පන්සිල් ගැනීම දක්වා සියලු අවස්ථාවල සිදුවන්නේ පන්සිල් සමාදන් වීමක් නොව පන්සිල් ගැනීමකි.

එයින් සිදුවන්නේ පන්සිල් සමාදන් වීමෙන් ගත හැකි ප්‍රයෝජන නොගැනීමයි. එනම් වැරැදි වලින් වැළකී සිටීමට නොහැකිවීමයි.

> **බුදු දහමට අනුව සියලු ක්‍රියාවලීන් සිදුවන්නේ කරුණු හයක් පදනම් කරගෙන ය. ඒවා ලෝභ,දෝෂ, මෝහ, අලෝභ අදෝෂ හා අමෝහ යනුවෙන් දැක්වේ. මෙහි මුල් කරුණු තුන අකුසල පැත්තේ හෙවත් වැරදි පැත්තේ ක්‍රියාවන්ට මුල් වේ. ඊළඟ කරුණු තුන කුසල පැත්තේ හෙවත් නිවැරැදි පැත්තේ ක්‍රියාවන්ට මුල්වේ.**



**බෙංගමුවේ නාලක අනු නා හිමි**

වර්තමානයේ සෑම මසකට ම වරක් යෙදෙන පෝය නිවාඩුව නිසිලෙස ගතකිරීමට බෞද්ධයන් පුරුදු විය යුතුය. භික්ෂූන් වහන්සේ ඒ සඳහා මඟ පෙන්විය යුතු ය. පෝය දිනයේ අටසිල් සමාදන් වූවද සුදුරෙදි ඇඳ පොරවාගෙන භික්ෂූන් වහන්සේ කියන සිල්පද කියනු විනා එම සිල්පද වල අර්ථය සිතට ගෙන කුසල් හි යෙදීමක් පිළිබඳව අදහසක් බොහෝ බෞද්ධයන්ට නොමැත. පන්සිල් සමාදන් වීමේ හා අටසිල් සමාදන් වීමේ අර්ථය කුමක්දැයි භික්ෂූන් වහන්සේ පෝයට පන්සලට පැමිණෙන හා විවිධ ස්ථානවල එකතු වී පින් දහම් රැස්කරන බෞද්ධයන්ට කියා දිය යුතු ය.

පෝයට පන්සල් යෑමේදී සුදු ඇඳුමෙන් සැරසී යෑමද පෙරසිට පැවත එන වැදගත් චාරිත්‍රයකි. එයින් කියාපාන්නේ පිරිසිදු හා චාම් ජීවිතයයි. අද පන්සල් යන බොහෝ දෙනා සුදු ඇඳුමෙන් සැරසී ගියත් එහි අරමුණ කුමක්දැයි දන්නේ නැත. හිරු එළියෙන් එන හානි වළක්වා ගැනීමත්, ශරීරයට ඇතුළු වන විෂබීජ පළවා හැරීමත් සුදු ඇඳුමෙන් අපේක්ෂා කරන වැදගත් කරුණු ය. සුදු ඇඳුම කිළිටි වුවහොත් එය අරමුණු කරගෙන භාවනාවක් ද කළ හැකි ය.. සමහරු ගෙදර තිබෙන ලස්සනම හොඳ ම ඇඳුම ඇඳගෙන ද පන්සල් යති. එසේ පන්සල් යන්නේ පන්සල් යෑමේ අරමුණ නොදන්නා නිසයි. සාමාන්‍ය ජන ජීවිතයේදී අන් අයගේ සිත්ගන්නා බව හෙවත් තෘෂ්ණාවට ලක්වීම පන්සල් යෑමේදී බැහැර කළ යුතු මුත් වර්තමානයේ පන්සලට යන සමහරුන්ට එවන් කිසිදු අවබෝධයක් නොමැති ව යන්නං වාලේ යති. එසේ පන්සල් යෑමෙන් ප්‍රයෝජනයක් අත්විඳිය නොහැක.

අත් හැරීම පුරුදු කිරීම බෞද්ධයන් තුළ තිබිය යුතු මූලික ලක්ෂණයකි. දන්දීම ඉතාම වැදගත් පින්කමක් ලෙස සැලකෙන්නේ එමගින් අතහැරීමට සිත පුරුදු කරන නිසා ය. එහෙත් අද සමහරුන් දන් දෙන්නේ අතහැරීමේ මූලික අරමුණ ඇතිව නොව ලෞකික වෙනත් යමක් අල්ලා ගැනීමේ අරමුණ ඇතිව ය. පෝය දාට පන්සල් යන බෞද්ධයන්ට මෙම කරුණු වටහා දීම තුළින් තෘෂ්ණාවෙන් ද්වේෂයෙන් හා මෝහයෙන් බැහැර වී අතහැරීමට පුරුදු කිරීමට භික්ෂූන් වහන්සේ අනුශාසනා කළ යුතු ය.

මෙරට සංස්කෘතිය තුළ සෑම යහපත් ලෞකික වැඩක් කිරීමේ දී පන්සල හා භික්ෂූන් වහන්සේ මුල් වී ඇත. එමගින් ලෞකික දියුණුව ලබා ගැනීමට යහපත් මාර්ග කියාදෙනු ලබයි. ලෞකික වශයෙන් දියුණු වී සිටීමද නිවනට පදනමක් කරගත හැකි නමුත් ලෞකකිකත්වයෙන් බැහැර වීමට මඟ නොපෙනේ නම් ඔවුන්ට නිවන් ලැබිය නොහැක.

# සමාදන් වූ සිල් බිඳීමෙන් පව් සිදුවෙනවා ද?



ශාස්ත්‍රපති
වාද්දුවේ ධම්මවංස හිමි

**බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ ධර්ම මාර්ගයේ පදනම සීලයයි. පැණවත් මිනිසකු සීලයේ පිහිටා සමාධිය, ප්‍රඥාව වඩමින් සියලු අවුල් නිරවුල් කරන්නේයැ’යි සිදු කළ දේශනාව පදනම් ව ආචාර්ය බුද්ධඝෝස අටුවාචාරීන් වහන්සේ රචිත විසුද්ධි මග්ගය සීලය පිළිබඳ ථේරවාදී සවිස්තර අර්ථ කථා අතරින් උසස් ම කෘතියයි.**

**මෙම දේශනයට පදනම් වු ගැටලුව ගැන නොසලකා සීලය පිළිබඳ විස්තර වශයෙන් දැක්වීම ප්‍රයෝජනයක් නැත. බුද්ධිමත් , උගත් , දෙවියෙක් ව්‍යවහාරික භාෂාවෙන් බුදුරජාණන් වහන්සේගෙන් ඇසූ ගැටලුව සංයුක්ත නිකායේ දේවතා සංයුත්තයේ 23 ජටා සූත්‍රයේ සඳහන් ය.**



අන්තෝ ජටා බහි ජටා ජටාය ජටිතා පජා තං තං ගෝතම පුච්ඡාමි කෝ ඉමං විජටයේ ජටං .

ඇතුළත අවුල් ය. පිටත අවුල් ය. ප්‍රජාව (මිනිස්සු) අවුල්වලින් වෙළී සිටිති. ගෞතමයන් වහන්ස, කවරෙක් මේ අවුල නිරවුල් කර ගත්තේ ද ? ඒ අනුව මිනිසාට බලපාන සන්තානගත ගැටලු සහ සමාජගත ගැටලු මෙහි “ජටා” නම් වෙයි . ඒ සියල්ල විසඳීමට සීලය පදනම් වන බව ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ පෙන්වා දීමයි.

මහාචාර්ය වල්පොල රාහුල ස්වාමීන් වහන්සේ මෙසේ ලියති. සීලය වනාහී බුදුන් වහන්සේගේ ධර්මයේ පදනම වන අප්‍රමාණ මෛත්‍රියත් , මහා කරුණාවත් මත ගොඩනඟන ලද්දකි. බුද්ධ ධර්මය ගැන කතා කරන , පොත් පත් ලියන බොහෝ උගතුන් උන්වහන්සේගේ ධර්මයේ මේ උතුම් අදහස අමතක කර දමා ශුෂ්ක දාර්ශනික විචාරවලට බැසීම සංවේග ජනක ය.

මේ ප්‍රකාශයෙන් හෙළිවනුයේ දැඩි අන්තවාදී හා දුෂ්කර චර්යාවන් ලෙස සීලය පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීම සීලය සඳහා සිත යොමු කරන සැදැහැවතුන් තවත් අවුලකට පත් කරන බවයි. කරුණාවෙන් හා මෛත්‍රියෙන් තොර කිසිම ආධ්‍යාත්මික සංවර්ධනයක් නැත .

සීලය යනු, කය වචන තුළ ඇති කරන හික්මීමයි. මෙහි දී ලෞකික සීල, ලෝකෝත්තර සීල නම් ප්‍රභේදයක් වෙයි. කෙලෙස් සහගත පෘථග්ජනයන් සඳහා අදාළ වන්නේ ලෞකික සීලයයි. සමාජගත ගැටලු සහ මානසික ගැටලු විසඳාලීමේ ලා ලෞකික සීල පිළිබඳ දැනුම ඉතා අවශ්‍ය වෙයි. වාරිත්‍ර සීල හෙවත් යමකින් වැළකීමේ ප්‍රඥප්ති සඳහා වූ සීල පංච සීලය , ගෘහස්ථ දස සීලය , ආජීව අට්ඨමක සීලය, සාමණේර දස සීලය ආදී ‘වේරමණී සික්ඛා පදං සමාදියාමි’ ලෙස සමාදන්වන සීලයන් වාරිත්‍ර සීලයි. මේ දේ නොකළ යුතුය යන්නයි. උපසම්පදා සීලයේ වේරමණී යන පාඨය නොකීවත් එය ද වාරිත්‍ර සීලයකි.

චාරිත්‍ර ශීල සහ ආභිසමාචාරික සීල යනු, උසස් මනුෂ්‍ය හැදියා දක්වන , සමාජයේ ප්‍රියමනාප ව හා චරිතවත් ව ජීවත්වීමට ලබා දෙන උපදේශයි. ඒවා ශික්ෂාපද ලෙස නොකියන ලද මුත් භාවිතයට ගැනීම ගිහි පැවිදි දෙපක්ෂයටම අත්‍යවශ්‍යයි.

සුරු සුරු ගාමින් කෑම නොකන්න. සුරු සුරු කාරකං භුඤ්ජිස්සාමිති සික්ඛා කරණීයා) චපු, චපු ගාමින් තඟඑමරමින් ආහාර නොගන්න . (න චපු චපු කාරකං භුඤ්ජිස්සාමිති සික්ඛා කරණීයා) ආහාර ගන්නා විට ලෙව නොකන්න (න හත්ථ නිල්ලේහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා) මේ උසස් හැසිරීම් ලෙස සලකන ආභිසමාචාරික වත් ය.

ඇඳුම්, ගමන් බිමන් යෑම ආදී සියලු චර්යාවලට අදාළ මෙවැනි සංස්කෘතික හැසිරීම් මේ ගණයට අයත් වෙයි.

බෞද්ධ ඉගැන්වීම් අනුව ප්‍රකෘති සීලය නම් පංච ශීලයයි. අප සමාජයේ බහුලව ම සමාදන්වන සීලය පංච සීලයයි. ගිහි පිරිස් පොහෝ දිනවල අට්ඨාංග සීලය හෝ දස සීලය රකිති . සමහරු නිති ආජීව පාරිශුද්ධ සීලය රකිති.

මේ සීලයන්හී ප්‍රභවය බුද්ධ කාලයට වඩා පැරණි ය. ඊට හේතු දෙකකි. එකක් බුදුවරු පිරිනිවන්පෑවත් උන් වහන්සේලාගේ සමහර දහම් කරුණු නොනැසී පැවතීමයි.

දෙවැනි කරුණ බුද්ධිමත්, කෙලෙස් අඩු,සමාජයේ යහ පැවැත්ම අගය කරන, මිනිසුන් අතර ඇතිවන සාකච්ඡා මගින් සමාජ ගිවිසුම් ඇතිවීමයි. දීඝනිකාය අග්ගඤ්ඤ සූත්‍රය මේ සමාජ සාකච්ඡා පැහැදිලි කරයි.

මහා මායා දේවිය අටසිල් සමාදන් ව සිටිය දී සිදූහත් කුමරු මවු කුස පිලිසිඳගත් බව සඳහන් ය. චක්කවත්ති සීහනාද වැනි සූත්‍රවල සක්විති දහම ලෙස දක්වා ඇත්තේ බෞද්ධ පංචශීලයේ විරති අංශයයි. බෞද්ධ පංච ශීල ඉගැන්වීමේ ක්‍රමවේදය අනුව විරිත් හා සිරිත් අංග දෙකම එම සීලයන්ට බද්ධ වෙයි.

අද සීලය පිළිබඳ ඇති ගැටලුවක් නම් සමාදන් වූ සිල් බිඳීමෙන් පවක් සිදුවේ ද? එය අපායට යෑමට හේතු වේද? යන කරුණයි. ලංකාවේ සංස්කෘතියට වඩාත්ම බලපෑ අංග අතර පංච සීලය එකකි. එනිසා නිබඳව, නිරන්තරව, ගිහියෝ පන්සිල් සමාදන් වෙති. එහෙත් එය නොරකිති. මෙය සාමාන්‍ය ලක්ෂණයක් වී ඇත. පංච සීලය යනු සතර කර්ම ක්ලේශ පදනම් ව සකස් වු චර්යා රටාවකි. එනම් ප්‍රාණඝාත, අදත්තාදාන, කාමේසුමිච්ඡාචාර, මුසාවාදා යන කර්ම ක්ලේශයන් ගෙන් ඈත් වීමයි. සිඟාලෝවාද සූත්‍රයේ (ගිහි විනය) ගෘහපතියා සතර කර්ම ක්ලේශවලින් ඈත් විය යුතු බව නිර්දිෂ්ටයි. මේ වැරදි සිල් සමාදන්ව හෝ නැතිව හෝ සිදුකළ හොත් එය වරදක් මතු නොව පාපයක් ද වෙයි.

සතුන්ට හිංසාකිරීම හෝ මැරීම පවකි. සෑම සමාජයක ම පාහේ පීඩනයට පත්වන සත්වයා මිනිසකු නම් ඔහු මැරීම හෝ හිංසාව රාජ නීතියට ද එරෙහි වෙයි. ඒ අනුව පංච සීලය සමාදන්ව හෝ නැතිව මනුෂ්‍ය ඝාතනය, පීඩාව වරදකි. පවකි. මානවහිතවාදය මතු නොව සර්වසත්වහිතවාදී බුදු දහම කුරා කුහුඹුවාගේ පටන් ඕනෑම සතකු පීඩාවට පත් කිරීම වරදක් පමණක් නොව පවක් ලෙස සැලකේ.

සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී යන සික්ෂාව තමා විසින් තමන්ට අහිත දේ කිරීම ද අකුසලයකි යන න්‍යායට අනුව වරදක් ද පවක් ද වේ.

විකාල භෝජනා වේරමණී යන බ්‍රහ්මචර්යාව සමාදන්වූ අයකු විකාලයෙන් හෙවත් ඉර හැරීමෙන් පසු ආහාර නොගනිමී යන ශික්ෂාව සමාදන් වෙයි. එය යමකු අතින් බිඳුනොත් එය වරදකි. එහෙත් පවක් නොවේ. එබැවින් සතර කර්ම ක්ලේශවලට අයත් නොවන චර්යාවන් සහිත ගිහියන් සමාදන් වන සීලයන් හී සීල් බිඳීම අපාගත වීමක් නොවේ.

දැන දැන ශික්ෂාව බිඳීමේ වරදට එය අයත් වෙයි.

පාපය වන්නේ අනුන්ට ත් තමන්ට ත් දෙපක්ෂයටමත් බාධාවන් ඇති කරවන කාය ,වාග් මනෝචර්යායි. ආභිසමාචාරික වත්වල දැක්වෙන සීලය බිඳීමෙන් පව් සිදු නොවේ . ඇවිද ඇවිද බත් කෑමෙන් , බත් කඩල කන්නා සේ උඩ දම දමා කෑවත් ඉන් සිදුවන පවක් නැත. එහි පුද්ගල පෞරුෂය බිඳවැටෙන නිසාත් , අසංවරය නිසාත් කෞශල්‍යයේ පිරිහීමක් ඇත . එහෙත් අපායට යන පව් නොවේ.

ගැටලුව ඇත්තේ දැන දැන සිල් පද හිතා මතා කැඩීම පිළිබඳවයි. භික්ෂුව සම්බන්ධව මෙය දැඩි ස්වරූපයක පවතී. සත්‍ය වුවත් කතා නොකළ යුතු අවස්ථා ඇති බව අභයරාජ සූත්‍රයේ සූත්‍රයේ බුදුහිමියෝ වදාළහ. ඒ අනුන්ට තමන්ට හිරිහැර වන්නේ නම් ය.

මේ විග්‍රහය භික්ෂූන් වහන්සේලා සඳහා එ ලෙසම අදාළ නොවේ. භික්ෂු විනයේ පාරාජිකාව යනු, භික්ෂුත්වයේ පැරදීමයි. එසේ වූ අයෙක් මේ සසුන තුළ චීවරධාරී ව සිටින්නේ නම් ඔහුට මහා අකුසලයක් අත් වෙයි. මහා කාරුණික හා මහා මෛත්‍රිය බුදුරජාණන් වහන්සේ තම ශිෂ්‍යයන් වහන්සේලාට පරාජය නොවී සිටීමට අවශ්‍ය ලෙස නීති පනවා ඇත. සංඝාධිසේසයන්ට පත් වුව ද අබ්භාන ආදී විනය කර්ම වලින් පසු පිරිසිදු භාවයට පත් විය හැකි ය. සියලු අනෙක් ආපත්ති දිනක් තුළ දෙසා ගැනීමෙන් පිරිසිදු වේ. පිරිසිදු වුවත් අකුසලයක් නම් පවින් මිදීමක් භික්ෂුවට නැත. දැන දැන බොරු කීම, පවිතියකි. එහෙත් බොරු කීම අපාගත වන පවක් බැවින් ඒ පවින් භික්ෂුව නොමිදේ. එහෙත් ආපත්ති දේශනය කර පැවිද්දට පිළියම් ලබා ගත හැකි ය.

සීලය ප්‍රඥප්තියක් ලෙස සිතන සමහරු නඟන තර්කය නම් සිල් බිඳි නැති නම් නැවත නැවත සිල් සමාදන් විම නිශ්ප්‍රයෝජන බවයි. ශ්‍රී ලංකාවේ පහළ වූ සැදැහැවත් පුරවැසියකු වන ආචාර්ය ඊ.ඩබ්ලිව්. අදිකාරම් මැතිතුමා ද මේ මතය දැරීය. ඔහු ඉතාමත් සිල්වත් වූ අයෙකි . එහෙත් සමාදානය සහ සීලය අතර ඇත්තේ ගැඹුරු දර්ශනයකි. මම සතුන්ට හිංසා නොකරමි, නොමරමි, මේ සිතුවිල්ල ම මහා කාරුණික වෙයි. මෛත්‍රී සහගත වෙයි. එය නිබඳව සිතීම භාවනාවකි.

අට්ඨාංග සීලය සමාදන් වන්නෝ බොහොමයක් එය අදාළ දිනයේ නොකඩවා රකිති. එසේ නැවත ද සවසට සිල් අලුත් කරගනිති. නැවතත් සීල සමාදන් වෙති. පසු දින නැවත උදෑසන සිල් අලුත් කර ගනිති. මේ නිසා නිතර සිල් ආවර්ජනය කිරීමේ පින ද භාවනාමය පින ද ලබති.

විරති සිල් දැන දැන කැඩීම අකුසලයකි. වරදකි. එම සිල් තමන් නොදැන කැඩෙන්නේ නම් ගිහියන්ට අකුසල නොවේ. වරද නොවේ. භික්ෂුන්ට සම්මා සතිය මුල්වන බැවින් සතියෙන් තොර සිල් කැඩෙන්නේ වුව ද එය වරදකි.

චේතනාහං භික්ඛවේ කම්මං වදාමි.

එය බුදු දෙසුමයි.

# ප්‍රභාවත් ජීවිතයකට පොරොන්දුවක්



**සැවැත්නුවර වැඩ වසන බුදුරජාණන් වහන්සේ දිනක් අළුයම්හි බුදු ඇසින් ලොව බලන සේක. ජත්ත මානවකයා හට වැළැක්විය නො හැකි බරපතල අකුසල විපාකයක් නිසා සොරුන් ගෙන් මැරුම් කන බව දුටුවහ. ඊට පෙර ඔහු තිසරණ පන්සිල් ගන්වා, ස්වර්ග මාර්ගයෙහි පිහිටුවන අදහස් ඇති වූහ. උන්වහන්සේ කලින් ම වැඩ මානවකයා යන පාර අද්දර රුකක් මුල වැඩ හුන් සේක.**

කහවණු පසුම්බියක් ද රැගෙන යන මානවකයා සමග කෙටි පිළිසඳරක යෙදුණු බුදුරජාණන් වහන්සේ තිසරණගමනයත්, පංච ශීලයත් සමාදන් වීමේ අනුසස් ජත්ත මානවකයාහට පහදා දී එය සරණ යන ආකාරය සහිත ගාථා කිහිපයක් වදාළහ.

එය සිතට ගත් ඔහු පන්සිල් ඉටා ගෙන තෙරුවන් ගුණ සිහි කෙරෙමින් ම නික්ම ගියේ ය. මහා මාර්ගයෙන් යන ඔහු සොරුන් වසන පෙදෙසකට ඇතුළු වී ඔවුන් ගැන නොසිතා පන්සිල් හා තෙරුවන් ගුණ සිහි කෙරෙමින් ම ගියේ ය. එහි දී සැඟවී සිටි සොරකු විසින් විෂ පෙවූ ඊයෙකින් විදින ලදී. ඔහු එතැන ම මැරී වැටුණේ ය. සොරු කහවනු පොදිය ගෙන පළා ගියහ.

මරණයට පත් ජත්ත මානවක, නිදා පිබිදියාක් මෙන් තව්තිසා දෙව් ලොව රන් විමනෙක උපන්නේ ය.

ජත්ත මානවකගේ මවුපිය නෑ මිතුරෝ පැමිණ හඬා වැළපුණහ. මාර්ගය සමීපයේ දර සෑයක් කොට මළ සිරුර ආදාහන කරන්නට ආරම්භ කළහ. බුදුරජාණන් වහන්සේ ද එහි පැමිණ ගසක් මුල හුන් සේක.

ජත්ත මානවක දිව්‍ය පුත්‍රයා ද තමා ලත් සැපතට හේතුව බැලීය. බුදුරජාණන් වහන්සේ නිසා ඒ සා මහත් සැපත් ලත් බව දැක, එහි පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක සිටියේ ය. ඒ දුටු මහජනයා විස්මිත ව භාග්‍යවතුන් වහන්සේ පිරිවැරූහ. මෙහි දී බුදුරජාණන් වහන්සේ දෙව් පුතු ලවා ඔහු ගේ සියලු ප්‍රවෘත්තිය ප්‍රකාශ කරවූහ. ඉක්බිති දහම් දෙසූ සේක. බණ ඇසූ දිව්‍ය පුත්‍රයා ද ඔහුගේ පෙර අත් භවයෙහි මව්පිය නෑදෑ ආදීහු ද සෝවාන් වූහ.

දිව්‍ය පුත්‍රයා භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට භික්ෂු සංඝයා වහන්සේට යටත් පැවතුම් දක්වා දෙව්ලොවට ම ගියේ ය.

ඉහත කථා වස්තුව දැක්වූයේ අප කවුරුත් විසිනුත් දිනපතා ආගමික චාරිත්‍රයක් වශයෙන් කරනු ලබන තෙරුවන් සරණ යෑමේ හා පංචශීලය සමාදන්වීමේ අනුහස් දැක්වෙන ඉතිහාස සිදුවීමක් දක්වනු සඳහා ය.

මෙම කථාව පිළිබඳව සිතීමේ දී ඔබට පුද්ගලික ජීවිතයේ දී පන්සිල් සමාදන් වීමෙන් සිදුවන ආරක්ෂාව ගැන තේරුම් ගත හැකි ය.

එසේම අකුරු කියැවීම, නම් තැබීම, ගෙවල් දොරවල්වලට මුල්ගල් තැබීම, ගෙට ගෙවැදීම, කාර්යාල කටයුතු ආරම්භ කිරීම වැනි අවස්ථාවල දී තිසරණ හා පන්සිල් සමාදන්වීමේ අරමුණු තේරුම් ගත හැකි ය.

ශ්‍රී ලංකාව, බුරුමය, තායිලන්තය වැනි බෞද්ධ රටවල උත්සව ආදිය ආරම්භයේ දී ම පන්සිල් සමාදන්වීමේ ක්‍රියාවලියට පදනම් වන විශ්වීය සාධකය මෙයින් වැටහී යා යුතු ය. මෙය පෙර රජදරුවන්ගේ කාලයේ සිට සිදු වූයේත් දිගින්දිගටම එය අඛණ්ඩව පැවත ආයේත් හුදු මිථ්‍යාවක් නොවේ. සුබවාදී අත්දැකීම් සහිත සත්පුරුෂ ක්‍රියාවක් වන නිසා ය.

බෞද්ධ ඉතිහාසයෙහි දැක්වෙන පරිදි තෙරුවන් සරණ යාම හා පන්සිල් ආරක්ෂා කිරීම නිසා විපතින් ගැලවුණු, යහපත් දිවි පෙවෙතක් ගෙවූ සහ මරණින් මතු ස්වර්ගගාමී වූ මිනිසුන්ගේ සංඛ්‍යාවක් නම් නොමැත. දෛනික ජීවිතයේ දී සහ ආයතනික කටයුතුවල දී පන්සිල් සමාදන්වීමෙන් කටයුතු ආරම්භ කිරීමේ ඇසට නොපෙනෙන එහෙත් විශ්වීය ධර්මතාව සම්බන්ධ පදනම එයයි.

**ජත්ත මානවක දිව්‍ය පුත්‍රයා ද තමා ලත් සැපතට හේතුව බැලීය. බුදුරජාණන් වහන්සේ නිසා ඒ සා මහත් සැපක් ලත් බව දැක, එහි පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක සිටියේ ය. ඒ දුටු මහජනයා විස්මිත ව භාග්‍යවතුන් වහන්සේ පිරිවැරූහ. මෙහි දී බුදුරජාණන් වහන්සේ දෙව් පුතු ලවා ඔහු ගේ සියලු ප්‍රවෘත්තිය ප්‍රකාශ කරවූහ.**

අනෙක් අතින් තෙරුවන් සරණ යෑම හා පන්සිල් සමාදන්වීමේ ආගමික සාමාජික හා දාර්ශනික පසුබිමක් ද පවතී.

සතුන් නො මැරීමෙන් පමණක් කෙනකු ප්‍රාණඝාත ශික්ෂාපදය ආරක්ෂා කරන්නකු නොවේ. බුද්ධ දේශනාව අනුව ඔහු වධ හිංසා කිරීමේ චේතනාවෙන් කැට කැබිලිති, දඬු මුගුරු ආදි කිසිවක් අතින් නො ගන්නෙක් විය යුතු ය. එසේම සියලු සතුන් කෙරෙහි මෛත්‍රී සහගත සිතින් වසන්නෙකු ද විය යුතු ය. එකී පුද්ගලයා ම නියම ආකාරයෙන් ප්‍රාණඝාත ශික්ෂාපදය ආරක්ෂා කරන්නෙක් වේ. එසේම දෙවැනි ශික්ෂාපදය රකින්නා අන් සතු දේ තමා සතු නොකර ගන්නා කෙනෙකු විය යුතු වේ. දෙන දේ පමණක් ගැනීමට කැමති වන හා නො සොර වූ පිරිසුදු සිතින් ජීවත් වන්නෙකු ද විය යුතු ය. පර අඹුවන් හා පර පුරුෂයන් කරා නොයම සහ එමගින් තෘප්තියක් නො ලැබීම නිසා කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුණෙක් වේ.

මුසාවාදයෙන් වැළකෙන තැනැත්තා බොරු නොකීම පමණක් ම නොව සත්‍ය කතා කරන එසේ ම ඇත්තෙන් ඇත්ත ගළපා කථා කරන, කථාවෙන් එකිනෙකා අතර ඝට්ටන ඇති නො කරවන කෙනෙකු ද විය යුතු ය.

සති සම්පජඤ්ඤය අහිමි වන හා මදයට හේතුවන කිසිදු ආකාරයක මත්ද්‍රව්‍යයක් පානය නොකිරීමෙන් සුරාමේරයෙන් වැළකීමේ ශික්ෂාපදය ආරක්ෂා කරන්නෙක් වේ.

ඉහත දැක්වෙන්නේ බුද්ධ දේශිත පරිදි පන්සිල් පද පිළිබඳ සරලම විග්‍රහයයි. ආගමික කාර්යයක් ආරම්භ කිරීමේ දී චාරිත්‍රයක් වශයෙන් හෝ තිසරණය මූලිකව පන්සිල් සමාදන්වීමේ වැදගත්කම අවබෝධ කර ගැනීම පහසු ය.

ආගමික ක්‍රියාවලින් භික්ෂූන් වහන්සේලා සහ ගිහි සමාජය සිදු කරන්නේ අධ්‍යාත්මය පිරිසුදු කිරීමකි. ශීලමය පදනමක් නොමැති නම් කිසිදු ආධ්‍යාත්මික උසස් බවක් ලබාගත නො හැකි ය. සීලය නොමැති නම් සමාධියක් නැතහොත් සිතේ එකඟතාවක් ඇති කර ගත නොහැකි ය. බුදු දහමේ කියැවෙන ප්‍රඥාව කෙලෙසකවත් ලැබෙන්නේ නැත. එබැවින් පංචශීලය ආරක්ෂා නො කරන්නෙකුට අධ්‍යාත්මික දියුණුවක් ලබා ගැනීමට නොහැකි වේ. ඒ නිසා හොර බොරු වංචා නැති පිරිසිදු ආගමික ජීවිතයකට පංචශීලය අත්‍යවශ්‍යම කාරණයකි. මේ ආත්මභාවයේ දී මානසික සුවය, මරණින් මතු දිව්‍ය සම්පත්, සමථ විදර්ශනා භාවනා වැඩීම, ධ්‍යාන මාර්ග සමාපත්ති, සෝවාන් සකදාගාමි ආදී මාර්ග ඵල ආදිය ආගමික ජීවිතයක් මගින් ලැබිය යුත්තක් බැවින් පන්සිල් රැකීමේ අනුසස් ඔබ විසින් තේරුම් ගත යුතු ය. පන්සල් යාම, පන්සිල් සමාදන්වීම, මල් පහන් පිදීම ආදිය ඔබ විසින් කළ යුත්තේ කවර හේතුවක් නිසා දැයි එමගින් වටහා ගන්න.

**මෙම ලිපියේ ඉතිරි කොටස තිකිණි අව අටවක පෝද (30 වැනිදා) පත්‍රයේ පළවේ.**



කැලණිය විශ්වවිද්‍යාලයේ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ
මහාචාර්ය
**මකුරුප්පේ ධම්මානන්ද හිමි**

# සැනසෙන්නෝ

පිනෙහි යෙදෙන්නෝ
ඉන් සැනසෙන්නෝ
එලොව මෙලොව සතුටින්
දිවිය ගෙවාලන්නෝ
සුගතියෙ ඉපදෙන්නෝ

පවෙහි යෙදෙන්නෝ
දුකම විඳින්නෝ
එලොව මෙලොව දුකිනේ
දුගතියටම යන්නෝ
නිරයේ පැසවන්නෝ

දන් සිල් බවුනින්
පින් සපිරීවෝ
මඟ පල ලැබ ගන්නෝ
සක්විති රජකමටත්
වැඩියෙන් අගනා වූ
නිවනින් සැනසෙන්නෝ

ඉද නන්දති පෙච්ච නන්දති
කත පුඤ්ඤෝ උභයත්ත නන්දති
(ධම්මපදය යමක වග්ගය
ඇසුරෙනි)

ආචාර්ය **රත්නපාල වික්‍රමසිංහ**

# Nikini Full Moon Poya Day Message

**Nikini full moon Poya day is regarded by Buddhists all over the world as a day of great significance. This is because it falls during the rainy season period ,which is also known as “Wassana Season”. During this Wassana period all high ordained Buddhist monks are fulfilling their spiritual goals ,whilst helping the lay people to achieve their religious goals in their respective religious paths. Quoted from the Discourses, it is significantly identified that during this period most of the monks have attained Arahathhood or any previous stagesof Arahathhood.**

Further, the first Dhamma Council was held on a Nikini full moon poyaday ,mainly organized and conducted by Venerable MahaKassapaMahaThero after three months from the Buddha Parinibbana. Five Hundred Arahath monks including ,Venerable Ananda Thero and the most Venerable significant Arahath monks attended the first Dhamma Council.They codified and preserved all the Buddha’s noble teachings by dividing the Dhamma into three main segments called “Thripitaka” which includes,Sutta, Vinaya and Abidhamma. It was the responsibility of the Venerable Monks and all the Buddhists to pass down the codified well preserved, Dhamma from generation to generation up until the existence of the Buddha Sasana.

It is our moral duty to practice such preserved Dhamma to obtain the fullest result of the noble teachings of the Buddha. We have to realize the uncertainty of this life. Knowing and realizing such truth ,does not recommend someone to be inactive and negative in their mind process. Once the truth of uncertainty of the journey of life is realized, the life lead towards enlightenment without any delay since the life can end at any unexpected moment, which proves the impermanency of everything around us. The Buddha preached “Nothing is permanent – Everything is impermanent and keep changing”. Though we live this life according to our social norms and existence the truth is that all such existences are impermanent. Therefore conventionally, we have to live within worldly settings with the realization of the principal of impermanency.

Moreover, in the contents of the discourse, the Buddha preached that one should follow the noble teachings to understand how to tame the untamed human mind. The Dhamma will help people to realize that the concept of “certainty” will be definitely followed by pain and sorrow. The truth explained in the Dhamma will solve the sorrow in untamed human mind and the darkness will disappear.

Within this Dhamma, the core teachings of Buddhism, being the Karma, Rebirth and Introspection/ Dependent Origination, is enshrined. This path leads to the end of suffering. These Noble teachings should not only be listened to but also followed as diligently as possible. In doing



Battaramulla
Siri Sudassanarama
sadaham senasuna
**Ven. Dr. Mirisse Dhammika thero**

so,one should realize the difference between the conventional truth and the absolute truth when walking through the path towards super mundane.

Even during this uncertain period of the pandemic, it is important to understand and follow this path as Buddhists by the light of such codified, well preserved noble Dhamma.




# උපසම්පදාව ඉල්ලා සියමට ගිය දූත පිරිස ගමන් ගත් නැව මුහුදු බත්වෙයි

**මිහිඳු මහරහතන් වහන්සේ විසින් හෙළදිවට දායාද කරනු ලැබූ භික්ෂු ශාසනය අනුරාධපුර යුගයේ දී දීප්තිමත් අවධියකට පැමිණෙයි. පොළොන්නරු යුගයේ මුල් භාගයේ දී තවත් වර්ධනය වෙයි. එහෙත් එහි අවසාන භාගයේ දී ක්‍රමයෙන් පරිහානිය වෙත ළඟා වෙයි.**

පළමුවැනි පරාක්‍රමබාහු රජතුමා පොළොන්නරු කතිකාවත හෙවත් ගල්විහාර සෙල්ලිපිය මඟින් තුන් නිකායක් සමඟි කරවා දුසිල්වත් මහණුන් සිවුරු හරවා යැවූ පුවතක් දක්වයි.

ශාසනික ප්‍රතිපදාවලට විරුද්ධවෙමින් කටයුතු කළ පිරිස් අනුරාධපුර යුගයේ සිට ක්‍රමයෙන් බිහිවූ අතර පොළොන්නරු යුගයේ දී උච්චතම අවස්ථාවකට පත් ව තිබූ බව කතිකාවත සාක්ෂි දරයි. දඹදෙණි කතිකාවත ද එය තහවුරු කරයි.

ක්‍රමයෙන් පිරිහෙමින් පැමිණි සංඝ ශාසනය මහනුවර යුගය වන විට දැඩි පරිහානියකට පත්වෙයි. එකල උපසම්පදා භික්ෂුවක් පවා හෙළදිව නොවීය.

රජවරුන්, අමාත්‍යවරුන්, මහා දානපතියන් ඇතුළු සිවුවනක් පිරිස සම්බුදු සසුනේ චිරස්ථිතිය වෙනුවෙන් වෙහෙර විහාර ඉදිකර පූජා කළහ. ඒවා ආරක්ෂා කරමින් දිවි ගෙවන, සිවුරු දරාගත් භික්ෂුත්වය නිරූපණය කළ පිරිසක් පමණක් දහඅට වන සියවස වන විට ඉතිරි වී ඇත.

ශාසනික ප්‍රතිපත්ති අනුගමනය නො කළ ඔවුහු දාගැබ්, සංඝාවාස, විහාර සංකීර්ණ සහ රජවරුන් පූජා කළ කෙත්වතු ඇතුළු පූජා භාණ්ඩ, ධර්ම පුස්තක ආදිය ආරක්ෂා කරමින් දිවි ගෙවූහ. තව ද ඔවුන්ට හැකි අයුරින් අකුරු ශාස්ත්‍රය දරුවන්ට ලබා දීමට ද පියවර ගත්හ. භික්ෂු ජීවිතයේ අරමුණ පන්සල් රැකීම පමණක් විය.

පැවිදි ජීවිතයට ඇතුළත් වන පුද්ගලයා ග්‍රන්ථ ධුරය හෝ විදර්ශනා ධුරය පිරිය යුතු ය. ග්‍රාමවාසී හෝ අරණ්‍යවාසී විය යුතු ය.

එහෙත් භික්ෂු ජීවිතයට අදාළ එකදු ක්‍රියා පිළිවෙතක් හෝ අනුගමනය නො කර ගිහියකුගේ දිනචර්යාව ගත කිරීමට පෙළඹී ඇත. මෙ වැනි පසුබිමක වැලිවිට සරණංකර හිමි බිහි වෙයි. උන්වහන්සේ ක්‍රමයෙන් සිංහල, පාලි ආදිය හොඳින් ප්‍රගුණ කර ධර්මය අධ්‍යයනය කරති. පවතින ශාසනික කටයුතු භික්ෂුත්වයට නො ගැළපෙන, බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ කටයුතුවලින් බැහැරව ඇති බව අවබෝධ කර ගනිති. එහි ප්‍රතිඵලයක් ලෙස සිල්වත් සමාගම පිහිටුවයි.

පිණ්ඩපාතයෙන් දිවි ගෙවීම, ධර්මය අධ්‍යයනය කිරීමට පැවිදි පිරිස යොමු කිරීම, ධර්මය ප්‍රචාරය කිරීම වැනි ශාසනික ප්‍රතිපදා නැවත ක්‍රියාවට නගයි.

එකල පැවැති සමාජ තත්ත්වය සහ ශාසනික පසුබිම සඟරජවත සහ සංඝ රාජසාධු චර්යාව වැනි කෘති සාක්ෂි සපයයි. වැලිවිට තෙරුන් වහන්සේගේ අපරිමිත උත්සාහයේ ප්‍රතිඵල ලෙස ක්‍රමයෙන් සංඝ ශාසනයේ දියුණුවක් ඇති වෙයි. එය පූර්ණය කිරීමට උසම්පදාව පමණක් ඌන විය.

වැලිවිට සරණංකර හිමියෝ ඒ වෙනුවෙන් ද උනන්දු වූහ. පළමු උත්සාහය

> **අවාසනාවකට මෙන් මෙවර ද දූත පිරිස රැගත් ඕලන්ද නැව විපතට පත් වෙයි. දෙරණෑගම මුහන්දිරම්රාළ මේ ගමනේ දී ජීවිතක්ෂයට පත් වන අතර විල්බාවේ දිවිගලවා ගනියි.**

ගත්තේ නරේන්ද්‍රසිංහ රාජ්‍ය සමයේ ය. රජතුමාගේ වෘද්ධ භාවය උපසම්පදාව ගෙන්වීමට එකල බාධාවක් විය. එතුමාගේ රාජ්‍ය සමය අවසන් වනතුරු ඉවසා සිටි තෙරුන් වහන්සේ නායක්කර් වංශික විජය රාජසිංහ රාජ්‍ය සමයේ දී නැවතත් උත්සාහවත් වී රජතුමාගේ කැමැත්ත ලබා ගැනීමට ද සමත් වෙයි. ක්‍රි.ව.

1741 දී දෙරණෑගම මුහන්දිරම්රාළ සහ මාතර මුහන්දිරම්රාළගේ නායකත්වයෙන් දූත පිරිසක් ඕලන්ද නැවකින් රජුගේ අනුග්‍රහය යටතේ සියමය බලා පිටත් කෙරිණ. එහෙත් සියම් රටට එනම් වර්තමාන තායිලන්තයට ළඟාවීමට පෙර මුහුදේ දී නැව විපතට පත් වෙයි.

දූත පිරිසෙන් දෙරණෑගම මුහන්දිරම්රාළ ඇතුළු තිදෙනෙක් දිවි ගලවාගෙන නැවත දිවයිනට පැමිණෙයි. එයින් පසු බට නොවූ වැලිවිට තෙරුන් වහන්සේ දෙරණෑගම මුහන්දිරම්රාළගේ නායකත්වයෙන් යුතු දූත පිරිසක් දෙවැනි වතාවටත් ක්‍රි.ව. 1747 දී උපසම්පදාව ගෙන ඒමේ පරමාර්ථයෙන් පිටත් කර ඇත.

අවාසනාවකට මෙන් මෙවර ද දූත පිරිස රැගත් ඕලන්ද නැව විපතට පත් වෙයි. දෙරණෑගම මුහන්දිරම්රාළ මේ ගමනේ දී ජීවිතක්ෂයට පත් වන අතර විල්බාවේ දිවිගලවා ගනියි.

දැඩි කනස්සල්ලට පත්වුවත් තෙරුන් වහන්සේ තම උත්සාහය අත්හැරීමට අකමැති වෙයි. එහි ප්‍රතිඵලයක් වයෙන් කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේ දී තෙවැනි වතාවටත් සියමය බලා දූත පිරිසක් පිටත් කර හරියි. මෙවර නායකත්වය හිමිවන්නේ පෙරවතාවේ ද අත්දැකීම් සහිත විල්බාවේරාළට සහ පට්ටිපොළ අතපත්තුවේ ලේකම්ට ය.

මොවුන් දෙදෙනා ප්‍රමුඛ කොට ඇහැලේපොළ වෙඩික්කාර ලේකම්, ඊරියගම මුහන්දිරම්, ආයිත්තාලියද්දේ මුහන්දිරම්රාළ යන පස් දෙනාගේ මූලිකත්වයෙන් දූත පිරිස සමන්විත වෙයි.

සරණංකර තෙරුන් වහන්සේ වෙනුවෙන් වල්ලැවේ, ගලටොඹුවේ, ඇලිවල, බෝතලේ සහ ඕගොඩපොළ නමින් පෙනී සිටි පුද්ගලයින් ද දූත පිරිසට එක් වී ඇත. වෙලගෙදර ඇමැති සහ සේවකයන් විසිතුන්දෙනෙක් ද ගමනට එක්වෙයි. රජු වෙනුවෙන් සරණංකර හිමියන් විසින් සකසනු ලැබූ රාජ සංදේශය ද, සරණංකර හිමියන් නියෝජනය වන සේ සැකසූ සංඝරාජ සංදේශය ද, තෙරුන් වහන්සේලාට සහ රජතුමාට ලබා දීමට තුටුපඬුරු ආදිය ද රැගෙන දූත පිරිස ක්‍රි.ව. 1750 ජුලි මස 12 වැනි දින ලන්දේසීන්ගේ “තාර්කා” නමැති නෞකාවෙන් ත්‍රිකුණාමලය වරායෙන් සියම් රටේ අයෝධ්‍යාව බලා පිටත් වී ඇත. ක්‍රි.ව. 1751 නොවැම්බර් මස 14 වැනි දින සියම් වරායට ළඟා වී තිබේ.

ඒ ගමනේ දී පට්ටිපොළ රාළ මිය ගොස් ඇත. සංඝරාජයන් වහන්සේ සහ රාජ්‍ය නිලධාරීන් මෙන් ම රජතුමා බැහැදුටු දූත පිරිස තම අවශ්‍යතාව සංදේශ මඟින් සහ වාචිකව ඉදිරිපත් කරති.

සියම් භික්ෂූන් වහන්සේලා සහ රජතුමා එයින් කරුණු අවබෝධකර ගනිත්. එහි ප්‍රතිඵලයක් ලෙස උපාලි තෙරුන් වහන්සේ ප්‍රමුඛ විසිපස් නමක් ක්‍රි.ව. 1753 ජුනි මස 14 වැනි දින පෙරවරුවේ ත්‍රිකුණාමලය වරායට පැමිණේ. මහා අස්සමි, මහාමුණි, මහාඉන්දජෝති, මහාබුවජෝති, මහාපුඤ්ඤජාතෝ, මහාචන්දසාර, මහාසාරචන්ද, මහාධම්මජෝති, මහාපඤ්ඤස, මහාරට්ඨ, මහාචන්දජෝති, මහාමණිරස, මහාස්වර්ණ, මහාචන්දසුවණ්න, මහාඉන්දසුවණ්ණ, මහාබ්‍රහ්මස්සර, ආරියමුණි යන මහ තෙරුන් වහන්සේලා දාහත්නම සහ සාමණේර හිමිවරු හත්නමක් මේ ගමනට එක් වී ඇත.

ක්‍රි.ව. 1753 ජුලි 19 වැනි දින සියම් දේශයෙන් වැඩම කළ සාමණේර නමක් පළමුව උපසම්පදා කරයි. පසුදින කොබ්බෑවේ උන්නාන්සේ, වැලිවිට සරණංකර සාමණේරයන් වහන්සේ, හලංගමුවේ සාමණේර නම, බඹරදෙණියේ සාමණේර නම, තිබ්බටුවාවේ සාමණේර නම සහ නාවින්නේ සාමණේර නම යන තෙරුන් වහන්සේලා උපසම්පදාව ලබා ගනිති.

සියම් දේශයේ උපාලි තෙරුන් වහන්සේ වෙතින් උපසම්පදාව ලැබූ හෙයින් ස්‍යාමෝපාලි වංශික මහ නිකාය නමින් මහනුවර ප්‍රචලිත විය.

පසුව ක්‍රමයෙන් ලක්දිව පුරා මෙම නිකායික භික්ෂූන් වහන්සේලා ව්‍යාප්ත විය.

ආරණ්‍යවාසී සහ ග්‍රාමවාසී ලෙස අස්ගිරි සහ මල්වතු නමින් පාර්ශ්ව දෙකක් බිහිවෙයි. ඒ ආශ්‍රයෙන් ශ්‍රී ජයවර්ධනපුර කොට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව, ශ්‍රී ලංකා කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව, රන්ගිරි දඹුලු විහාර පාර්ශ්වය, වනවාස පාර්ශ්වය, ශ්‍රී රෝහණ පාර්ශ්වය, ඌව ස්‍යාමවංශික පාර්ශ්වය යනුවෙන් මේ වන විට නිකායන් හයක් ප්‍රභවය ලබා සම්බුද්ධ ශාසනය ආරක්ෂා කරමින් උපසම්පදා විනය කර්ම පවත්වමින් සංඝ ශාසනයේ චිරස්ථිතිය උදෙසා සියම් උපසම්පදාව හෙළදිව ක්‍රියාත්මක වේ.



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනයේ
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

# ලක්දිව සංඝරාජ පදවියේ ඇරඹුම



බුදුරජාණන් වහන්සේ ජීවමාන අවධියෙහි දී සිව්වනක් පිරිස වෙත තනතුරු ප්‍රදානය කළ අන්දම අංගුත්තර නිකායේ ඒතදග්ග පාලියෙහි සඳහන් වෙයි. දෙව්දත් තෙර විසින් සංඝයා වහන්සේගේ නායකත්වය තමන් වෙත පවරන මෙන් සිදු කළ ඉල්ලීම බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප

කිරීමත් තමන් වහන්සේගේ ඇවෑමෙන් ධර්මය සහ විනය ගුරු කොට ගත යුතු බව මහා පරිනිබ්බාණ සූත්‍රයෙහි දක්වා තිබීමත් නිසා භික්ෂු සමාජයෙහි පුද්ගල නායකත්වයත් සඳහා ඉඩක් නොමැති බවට ඇතැම්හු අදහස් දක්වති. එනමුත් මෙයින් ගම්‍ය වන අර්ථය භික්ෂු සමාජයට පුද්ගල නායකත්වයක් නොතිබිය යුතු ය යන්න නොවේ. පවතින නායකත්වය, ධර්මයට හා විනයට අනුගතව සිදු විය යුතුය යන්න ලෙස පිළිගැනීම වඩාත් යෝග්‍ය බව වියතුන්ගේ මතයයි.

සංඝයා වහන්සේගේ සමඟිය, යම් ශාසනික ගැටලුවක් පැන නැඟුණු කල්හි ධර්ම විනයානුකූල ව එකී ගැටලුව විසඳ ගැනීම, දේශපාලන සහ සමාජමය වශයෙන් වැදගත්වන ගැටලුවක් සාකච්ඡා කර ගැනීම සඳහා, බුදුරජාණන් වහන්සේගෙන් පසුව උන්වහන්සේ වෙනුවට භික්ෂූන් වහන්සේලා මෙන්ම මහජනතාවත්, රජයේ ප්‍රභුවරුනුත් හමු විය යුතු උත්තරීතර වූ සංඝ නායකයන් වහන්සේ කවරකු ද යන්න දැන ගැනීමට තත් කාලීන සමාජය ද උනන්දු වූ ආකාරය බෞද්ධ සාහිත්‍යය තුළින් හෙළිවන අවස්ථා හමු වෙයි. බුද්ධ පරිනිර්වාණයෙන් පසු ආනන්ද තෙරුන් හමු වූ වස්සකාර ඇමතිවරයා බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයාගේ පාලනය සඳහා උත්තරීතර නායකයකු පත් කර තිබේ දැයි විමසීම ඊට නිදර්ශනයකි.

බුදුරජාණන් වහන්සේ ජීවමාන අවධියෙහි ම ඡබ්බග්ගිය හිමිවරුන් වැනි පිරිස් සංඝ සමාජයේ ස්වාධීනත්වයකින් කටයුතු කිරීමට උත්සාහ කළ අතර සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු සුභද්‍ර භික්ෂුවගේ අභද්‍ර වචන යනුවෙන් හැඳින්වෙන ප්‍රකාශය තුළින් ද ධර්ම විනයානුකූල වූ පැවැත්මෙන් ඉවත්ව කටයුතු කිරීමට ඇතැම් භික්ෂූන් වහන්සේලා උත්සුක වූ බව සිතීමට හැකි ය. ප්‍රථම, දෙවන සහ තෙවන ධර්ම සංගායනා සඳහා ඒ ඒ තෙරවරුන් මූලිකත්වය ගනිමින් කටයුතු කිරීමත් විශේෂයෙන්, තෙවන ධර්ම සංගායනාවේ දී දුර්ලබ්ධිකයන් සැට දහසක් සසුනෙන් නෙරපීමට කටයුතු සම්පාදනය වීමත් නිසා බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය, පැහැදිලි කිරීමටත්, ධර්ම විනය විරෝධී දිවි පැවතුම් සහිත වූවන් නෙරපීමටත්, රාජ්‍ය තාන්ත්‍රික ගැටලු සාකච්ඡා කිරීමටත් සංඝයාට උත්තරීතර නායකයකු අවශ්‍ය වූ බව බුද්ධ කාලීන ව මෙන්ම ඊට ආසන්න කාලයේ දී ම ගිහි පැවිදි දෙපාර්ශවය ම තේරුම් ගෙන සිටි බව උපකල්පනය කළ හැකි ය.

මහින්දාගමනයෙන් පසු මහාවිහාරය කේන්ද්‍ර කොට ගනිමින් ථෙරිය සම්බුද්ධ ශාසන සම්ප්‍රදාය ලක්දිව ව්‍යාප්ත විය. මිහිඳු හිමියන්ගෙන් පසු ලක්දිව උත්තරීතර සංඝ නායක හිමි නමක් පත් නොවුණි. එකල සාමාජයීය වාතාවරණයත් යටතේ අභයගිරි සහ ජේතවන සංඝාරාම ආශ්‍රිත ව ස්වාධීන ශාසන සම්ප්‍රදායයන් ආරම්භ විය. කාලානුරූපී වෙනස්කම් සමඟ ධර්ම විනය පටහැනි මති මතාන්තර සහ පුද සිරිත් අනුගමනය කිරීමට ද ප්‍රවණතාවයක් ඇති විය.

> මහින්දාගමනයෙන් පසු මහාවිහාරය කේන්ද්‍ර කොට ගනිමින් ථෙරිය සම්බුද්ධ ශාසන සම්ප්‍රදාය ලක්දිව ව්‍යාප්ත විය. මිහිඳු හිමියන්ගෙන් පසු ලක්දිව උත්තරීතර සංඝ නායක හිමි නමක් පත් නොවුණි.

මහා පරාක්‍රමබාහු රජ දවස දිඹුලාගල මහා කාශ්‍යප හිමියන්ගේ මූලිකත්වයෙන් සැදුම් ලත් විනිශ්චය සභාවක් මඟින් දුසිල්වතුන් සසුනෙන් නෙරපා දැමීය. අනතුරුව තුන් නිකාය සමඟි කොට පොළොන්නරු කතිකාවත පිහිටුවීය. සංඝ සමාජයේ සාමාග්‍රීය පිණිස කටයුතු සම්පාදනය කරවන ලදි. මෙම ශාසනික සංසිද්ධියෙන් පසු ශාසන භාරධාරී යතිවරයාණන් වහන්සේලා පිළිබඳ තොරතුරු ලංකා ශාසන ඉතිහාසය තුළින් හමු වෙයි. පොළෙ ාන්නරු යුගයෙන් පසු ථෙරිය ආරණ්‍යවාසී සහ ග්‍රාමවාසී භික්ෂූන් වහන්සේගේ නායකත්වය දරන ලද භික්ෂූන් වහන්සේ මහතෙර නමින් හැඳින්විණි.

එම දෙදෙනා අතරින් තෝරා ගත් හිමි නමක් මහාසාමි පදවියට ද පත් කොට ඇත.

දඹදෙණි සමයේ තුන් සිංහලයේ නායක හිමි නම තත්කාල ශාසනානුශාසක යනුවෙන් හැඳින්වූ බව දඹදෙණි කතිකාවත තුළින් පෙනී යයි. සංඝරාජ යන ව්‍යවහාරය 14 වන සියවසේ දී පමණ ඇති වූ බව ඉතිහාසඥයන්ගේ මතයයි.

ශාසනානුශාසක ලෙසින් හැඳින්වූ මාහිමියන්ට පසුව දෙවැනි තැන හෙබ වූ ග්‍රාමවාසී හා වනවාසී භික්ෂූන් වහන්සේලාගේ නායකත්වය හෙබ වූ මහාථෙර දෙනම හැර අන් කිසිදු හිමිනමක් මහාථෙර ලෙසින් නොහැඳින්විය යුතු යැයි ද දඹදෙණි කතිකාවතෙහි සඳහන් වේ. ඒ අනුව ශාසනයෙහි නායකත්වය මහාසාමි සහ මහාථෙර දෙනම අතර පැවතුණු බව උපකල්පනය කළ හැකි ය.

දඹදෙණි කතිකාවතෙහි මහා කාශ්‍යප හිමියන් මහ ස්ථවිර ලෙසත්, තච්ජිෂ්‍ය ශාරිපුත්‍ර හිමියන් මහා සාමින් ලෙසත් හඳුන්වා තිබේ. මෙලෙසින් මහාසාමි ලෙස හැඳින් වූ පදවිය පසු කාලීනව සංඝරාජ පදවිය දක්වා විකාශනය වූ බව පිළි ගැනීමයි.

ව්‍යවහාර වර්ෂ 1271 දී දෙවැනි පැරකුම්බා රජදවස දහස්තොට උපසම්පදා උත්සවයෙහි දී මහාසාමි ඇතුළු උසස් ශාසනික තනතුරු පිරිනැමූ බව සඳහන් වෙයි. ඒ මෙවැනි ශාසනික තනතුරු උත්සවාකාරයෙන් පිරිනැමූ බවට සාධකයකි. ගලතුරුමූල මාහිමි, තොටගමුවේ රාහුල මාහිමි, කැරගල වනරතන මාහිමි ආදී හිමිවරුන් රාජගුරු යන ගෞරවනාමය භාවිත කොට ඇත. මෙය මෙම වකවානුවෙහි ශාසනික ගෞරව නාම සම්මුතියක් සඳහා උදාහරණයක් වනු ඇත.

ශාසන භාරධාරී හිමිවරුන්ගේ ඇසුර රජතුමා ද නිබඳ අපේක්ෂා කළ බවට නිදසුනකි මහා තෙරවරුන්ට රජ මාලිගාව ආසන්නයේ වාසස්ථාන තනවාදීම. මහා පරාක්‍රමබාහු රජතුමා ශාරිපුත්‍ර හිමියන්ට පොළොන්නරුවේ ජේතවනාරාමයේ තෙමහල් ප්‍රාසාදයක් තනවා දීම, දෙවැනි පරාක්‍රමබාහු රජතුමා අෂ්ටායතනාධිපති හිමිවරුන්ට නගරයේ ප්‍රාසාද තනවා දීම මීට නිදසුන් ය.

උතුරුමූල, දකුණුමූල, කපාරමූල, මහනෙත්පාමූල, වාදුම්මූල, සේනාපතිමූල, විල්ගම්මූල හා ගලතුරුමූල යනුවෙන් ප්‍රධාන පිරුවන් අටක් මුල් කර ගනිමින් හත් වැනි සියවසේ දී පමණ ගුරු කුල වශයෙන් බෙදී යාම ආරම්භ වී එකී ගුරුකුල සමූහය මූල යනුවෙන් ව්‍යවහාරයට පත් වී ඇත.

මූලයෙහි නායකයා මූලාධිපති නමින් සුවිශේෂී තනතුරකින් හැඳින් වූ බව දඹදෙණි කතිකාවතින් පැහැදිලි වෙයි. කෝට්ටේ යුගයේ දී කල්‍යාණී නදී සීමාවේ දී සියම් හා රාමඤ්ඤ දෙරටට ලංකාවේ සිට උපසම්පදාව රැගෙන ගිය බැව් ඉතිහාසයෙන් තොරතුරු හමු වෙයි.

රටෙහි පැවති දේශපාලනික හා සමාජයීය අර්බුද හමුවේ උපසම්පදා භික්ෂූන් වහන්සේලා නොමැති වූයෙන් පළමුවන විමලධර්මසූරිය රජතුමා රක්ඛංග දේශයෙන් ද දෙවැනි විමලධර්මසූරිය රජතුමා අර්කන් දේශයෙන් ද, උපසම්පදාව ගෙන්වා ලක්දිව පිහිටුවීමට කටයුතු කොට ඇත. දිගු කලක් නොගොස් එම උපසම්පදා ද අන්තර්ධාන ව ගිය බව සඳහන් වේ.

**මෙම ලිපියේ ඉතිරි කොටස බුදුසරණ අවඅටවක පෝද පත්‍රයේ පළවේ.**

**දිමුතු පුන්සර කොළඹගේ**

## පිහිට පතයි

අලව්ව ප්‍රදේශයේ පදිංචි සමීර කුරුප්පු (37) නැමැති අය වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. ඔහුට 'ඕ' පොසිටිව් වර්ගයේ වකුගඩුවක් ඉක්මනින් අවශ්‍ය බව වෛද්‍ය නිර්දේශය බව කියයි. පරිත්‍යාගශීලියෙක් වේනම් පහත දුරකථන අමතන ලෙස ඉල්ලා සිටියි. 0768749756, 0716645677

# පුරාණයේ සිට පැවත ආ ධර්ම සාහිත්‍ය කෘති රැක ගත් ගණින්නාන්සේලා

**ලංකා ඉතිහාසයේ මහනුවර සමය දේශපාලන, ආගමික, සාමාජික හා අධ්‍යාපනික අතින් පිරිහුණු යුගයකි.**

විදේශ ආක්‍රමණ බලවත් වීම නිසා සිංහල නරපතියෝ පොළොන්නරුව වාපී ශිෂ්ටාචාරයට අයත් සරුසාර භූමිය අතහැර දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළට හා කෝට්ටේට කේන්ද්‍රණය වීමෙන් පසු සෙංකඩගල අවසාන රාජධානිය වශයෙන් තෝරා ගත්හ.

පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි යන බටහිර ජාතීන්ගේ ආක්‍රමණයත්, නායක්කාර වංශික පාලකයන්ගේ අදූරදර්ශී පාලනයත් මෙම යුගයෙහි රටේ පරිහානිය සඳහා තවත් ප්‍රබල හේතු විය.

භික්ෂු සමාජයේ පරිහානිය කොපමණ දැ යි කිවහොත් ඒ සමය වන විට ලක්දිව උපසම්පදා භික්ෂූන් වෙනුවට ඉතිරිව සිටියේ ගණින්වහන්සේලා සමූහයක් පමණි. ගණින්වහන්සේලා හෝ ගණින්වහන්සේලා යන නමින් හඳුන්වන ලද වුන්ගෙන් ශාස්ත්‍රීය සේවාව හෝ ශාසනික ප්‍රබෝධය සඳහා හේතු වන කිසිදු ක්‍රියාදාමයක් සිදු නො වී ය. විහාර සන්තක දේපළ රැක ගනිමින් ජීවිකාව ගෙන යාම ඔවුන් වෙත පැවරුණු ප්‍රමුඛතම කාර්යය විය.

උඩරට, රුහුණ මෙන්ම සත් කෝරළය ආදී ප්‍රදේශවල විසිරී පැතිරී සිටි මොවුන් ගණින්, ගණින්නාන්සේලා, ගණයෝ ගණින්නැහැ සහ ගණෙල්ලෝ යන නම්වලින් ප්‍රචලිතව, තම ක්‍රියාවලියේ නිරතව සිටි බව හඳුනාගත හැකි ය. රොබට් නොක්ස්, තම කෘතියේ දී මේ පිරිස හඳුන්වා දෙන්නේ, ගණයි' යන නාමයෙනි.

මොවුන් තම විහාරස්ථානය අසලින්ම දරු පවුලේ වාසය සඳහා නිවෙසක් ඉදිකරවා ගත් බවත්, එය එම යුගයේ මූලාශ්‍රවල ගණේගෙදර, විහාරේ වලව්ව, ගණේවලව්ව ආදී නම්වලින් හඳුන්වා ඇති බවත් පොත පතෙහි සඳහන් වේ. මේ ගණින්නාන්සේලාගේ දරුවන් ගණගැටව් ගණගැටයන් ලෙස හැඳින් වූ බව, කොටගම වාචිස්සර හිමියෝ තම කෘතියේ සඳහන් කරති.

ඒ අනුව මොවුන් ජීවත් වූ ප්‍රදේශ ගණේගම, ගණේගොඩ, ගණේමුල්ල, ගණේවත්ත, ගණේගෙදර ආදී වශයෙන් ගණ නාමයෙන් අදත් ප්‍රකට ය.

අධ්‍යාපනික හා ආගමික පරිහානිය සඳහා ගණින්නාන්සේලාගේ ක්‍රියාකාරිත්වය බොහෝ සෙයින් බලපා ඇත. මොවුන් සිවුරක් පොරවා ගෙන ඊට උඩින් බඳපටියක් බැඳ සිටීම සිරිතක් කර ගෙන සිටියහ. සමහර ගණින්නාන්සේලා යටින් කහවස්ත්‍රයක් පොරවා එයට උඩින් රෙද්දක් හැඳ සිටියහ. මේ පිරිස කාමභෝගී ගිහියන් මෙන් වාසය කළහ.

ඓතිහාසික තොරතුරු අනුව විහාරය ආසන්නයෙහි ගෘහයක් නිර්මාණය කර එහි අඹුදරුවන් පවා පෝෂණය කරමින් වාසය කර ඇත. මේ පිරිසෙහි රැකියාව වූයේ විහාරාරාම ඉඩම් පාලනය කරමින් සිය අඹුදරුවන් හා ඥාතීන් සමග ඒවායෙහි ආදායම ලබා ගැනීම ය.

බොහෝ ගණින්නාන්සේලා ධර්මය දේශනා කිරීමේ දී බහුල වශයෙන් භාවිත කළේ ජාතක පොත ය. එමෙන් එම ගණින්නාන්සේලාගේ ආගමික ක්‍රියාකාරකම් මෙසේ වර්ග කළ හැකි ය.

මෙම භික්ෂූන් විසින් දේශිත පරිත්‍රාණ දේශනා හින්දූන්ගේ අභිචාර විධිවලට සමාන වීම.

යක්ෂ ප්‍රලයාදී ගර්හිත විද්‍යාවන්හි ඇලී ගැලී වාසය කිරීම

නානාවිධ දෙවියන් ඇදහීමට

ප්‍රමුඛස්ථානයක් දීම ආදිය අධ්‍යාපනික හා ශාසනික පරිහානියට බලපෑ බව කිව යුතු ය.

එකල පැවති ශාසනික පරිහානිය මුංකොටුවේ රාළ දැක ඇත්තේ මෙසේ ය.

**කෙසර සම්පොරව න**
**මහලු වඳුරන් විලසි න**
**රහත් දද ඇඳගෙන**
**චාටු තපසුන් සසුන් කෙලෙස න**

**සැදැහැත්තන් පුද න**
**නොයෙක් පූජා ලබමි න**
**නැයන්ට බෙදමි න**
**නිමල සසුනේ කසල තවර න**

ඔවුන්ගේ අධ්‍යාපනික ක්‍රියාවලිය දෙස බැලුව ද කිසියම් වූ ශාස්ත්‍රීය සේවයක් භාෂා සාහිත්‍යයේ පෝෂණය සඳහා සිදු වූ වගක් නො පෙනේ.

විශේෂයෙන් පාලි සංස්කෘත ආදී ප්‍රාචීන භාෂා පිළිබඳ අල්ප වූ ද දැනුමක් ඔවුන් තුළ නොවූ බව සරණංකර සාමණේරයන් පාලි භාෂාව හැදෑරීමට ගත් ප්‍රයත්නයෙන් පෙනී යයි.

පොදුවේ ගණින්නාන්සේලාගේ ක්‍රියාකාරකම් මෙසේ වුව ද ඔවුන්ගෙන් සංඝ සංස්ථාවේ ආරක්ෂාවට කාලීන වශයෙන් සිදු වූ සේවය ද සාකච්ඡාවට බඳුන්විය යුතු ය.

තත්කාලීන භික්ෂුව ගණින්නාන්සේ දක්වා පරිහානියට පත් වූයේ ද සම්පූර්ණයෙන් ම පුද්ගල තත්වයන් මත යැයි නිගමනය කළ නො හැකි ය. එම යුගයේ සමාජ ආර්ථික හා දේශපාලනික වශයෙන් උදා වී තිබූ අන්ධකාර තත්වය ගණින්නාන්සේලාගේ බිහි වීමට ද මූලාධාරය සපයා තිබේ. දේශපාලන වියවුල් හේතුවෙන් රටේ සියලුම අංශ පරිහානියට පත්වන විට අධ්‍යාපනය ද පිරිහිණි. අධ්‍යාපන ක්‍රියාවලිය පන්සල හා බැඳී පැවැතුණකි. එම පරිහානිය භික්ෂුවගේ පරිහානියට සෘජුවම බල පෑ අතර එහි ඵලය වූයේ භාෂා ශාස්ත්‍ර හා ධර්මඥානයෙන් වියුක්ත වූ ගණින්නාන්සේලා පිරිසක් බිහිවීමයි. ඒ හරහා පරිහානිකර මුහුණුවරක් ශාසනික ක්‍රියාවලියේ දක්නට ලැබුණ ද කාලීන වශයෙන් තමා ලත් අත්දැකීම් හා උගත් බව භාවිත කොට ගම හා පන්සල අතර තිබූ සබැඳියාව නොකඩවා පවත්වාගෙන යාමට මෙම ගණින්නාන්සේලා කටයුතු කර ඇති බව පෙනේ.

මේ සමයේ ගණින්නාන්සේලාගෙන් සිදු වූ වැදගත්ම සේවාවක් සේ, පුරාණයේ සිට පැවැත ආ ධර්ම සහ සාහිත්‍යාත්මක කෘති ආරක්ෂා කර ගැනීම පෙන්වාදිය හැකි ය. මොවුහු ද, ග්‍රන්ථකරණයේ යෙදුණාහ. එම ග්‍රන්ථ අවසානයේ ඒවා ලිවීමේ සහ ලියවීමේ ආනිසංශ පෙළගැස්වීමට සැලැස්විය. ඒ හරහා ද තම ලාභාපේක්ෂාව බලාපොරොත්තු වූ නමුත්, පැරැණි ධර්ම සහ සාහිත්‍යාත්මක ග්‍රන්ථ ආරක්ෂා වීම සිදු කෙරිණි.

මේ පිරිස අතින්, අතීත රජ දරුවන් පිදූ විහාරාරාම, විහාර සන්තක ඉඩකඩම් සහ පෙති පිළිම ආදිය අනාගත පරපුර උදෙසා රැක ගැනීම සිදු විය. තම පරපුර පූර්ණ වශයෙන් ඒවායේ සම්පත් හා පල ප්‍රයෝජන භුක්ති විඳිමින් වුව ද, ඒවා විනාශවී යාමට ඉඩ නො දී, නිසි පරිදි නඩත්තු කරමින් ආරක්ෂා කර ගැනීමට සමත් විය. එලෙස ආරක්ෂා කර ගැනීම මත, එම උරුමය අද දක්වාම පවතින බව අවිවාදයෙන් යුතුව පිළිගත යුතු ය.

උක්ත කාර්යය ගණින්නාන්සේලාගෙන් ඉටුවූ ඉතාමත් ප්‍රසංශනීය ක්‍රියාවලියක් බව ප්‍රකාශ කිරීම වඩාත් වැදගත් ය. කලාවට වඩාත් හිතකාමී ගණින්නාන්සේලා බොහෝ දෙනෙක්, මහනුවර යුගය තුළ ජීවත් වූවා පමණක් නොව, ඔවුන් තම දක්ෂතා වූ චිත්‍ර කලාව, මූර්ති ශිල්පය, කැටයම් කලාව ප්‍රයෝජනයට ගනිමින්, බුද්ධාලම්භන ප්‍රීතිය වඩවන පූජ්‍ය ස්ථාන බවට විහාරස්ථාන පරිවර්තනය කළහ.

වර්තමානයේ දක්නට ඇත්තාක් සේ, ගම්මානයක ප්‍රමුඛයාගේ වගකීම දරන ලද්දේ ගණින්නාන්සේ විසිනි. මහනුවර යුගයට අයත් බොහෝ රජමහා විහාර විචිත්‍රවත් බිතු සිතුවම්වලින් යුක්ත ය. එම කාර්යයන්ට මඟ පෙන්වා ඇත්තේ මොවුන් විසිනි.

ගණින්නාන්සේලා වෙස්සන්තර ජාතකය පදනම් කරගත් ක්‍රමවේදයක් ඔස්සේ ධර්මය ප්‍රචාරය කළහ. දන්දීම යන සාධකය සෑම විටෙකම මූලිකත්වයට ගෙන කටයුතු කිරීමට උත්සුක විය. තම ධන ලාභ තව තවත් ඉහළ නංවා ගැනීම එහි මුඛ්‍ය පරමාර්ථය වූ නමුත්, ඒ හරහා වුව ද බුද්ධ භාෂිතය ජනගත වීම වැදගත් කටයුත්තක් විය.

යුගාසන ධර්ම දේශනා ක්‍රමය මහනුවර සමයේ දී ජනප්‍රිය විය. එක් ගණින්නාන්සේ නමක් වෙස්සන්තර ජාතකය කවියෙන් ගායනා කළ අතර, අනෙක් ගණින්නාන්සේ තාලයට උඩැක්කිය වයමින් සහය විය. මෙය මුල් බුදු සමය හා සසඳන විට සම්පූර්ණයෙන් එහි ධර්මතා උල්ලංඝනය වන නමුත්, මහනුවර සමයේ දී මේ දේශනා ක්‍රමය මහත් පිළිගැනීමකට ලක් විය.

මේ කාලවකවානුව, හින්දු ආගමික ලක්ෂණවල ආභාෂය ලබමින් පැවැති කාලයක් වූ බැවින්, ගණින්නාන්සේලාද ඒවාට අනුව බෞද්ධ ආගමික ප්‍රතිපත්ති වෙනස් කළ බව හඳුනාගත හැකි ය.

මේ යුගයේ ගණින්නාන්සේලා දේශපාලනික ක්‍රියාවලිය සඳහා ප්‍රබලව දායක වූ ආකාරයක් හඳුනාගත හැකි ය. රජවරුන්ගේ පණිවිඩකරුවන් සේ මාහැඟි කාර්යය රැසක් ඉටු කිරීමට මොවුන් කටයුතු කර ඇත.

දෙවැනි රාජසිංහ රජු ලන්දේසීන් වෙත යැවූ දූත කණ්ඩායමේ ප්‍රමුඛ නිලධාරියෙක් ලෙස කටයුතු කළේ, පෝයමලු විහාරයේ ගලේබණ්ඩාර ගණින්නාන්සේ ය. දිසාපති පදවි මෙන්ම, බස්නායක පදවි ද දැරීමට ගණින්නාන්සේලා කටයුතු කළහ. කොබ්බෑකඩුවේ ගණින්නාන්සේ පුත්තලම දිසාපති පදවියත්, උඩුනුවර දේවාලයන්හි බස්නායක පදවියත් දැරීම මෙයට කදිම නිදසුනකි.

කුලය පදනම් කරගෙන පැවිදි වූ ගණින්නාන්සේලා, තම කුල ක්‍රියා පැවිද්දේ සිටිය ද, පෙර පරිදිම කරගෙන ගියහ. සමහරුන් රජුගේ ආදායම් පාලකවරුන් සේ කටයුතු කරන ආකාරයක් දදිස්වේ. තවත් ගණින්නාන්සේලා පිරිසක් භික්ෂුවගේ අනන්‍ය රාජකාරියක් සේ සැලකෙන ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම කළ අතර, රජුන් සතුටු කරමින්, ඒ හරහා තම පෞද්ගලික සුඛ විහරණය ඉහළ නංවාගනු පිණිස කටයුතු කළ ආකාරයක් ද හඳුනාගත හැකි ය.

දේශපාලනික ආර්ථික හා සමාජීය වශයෙන් අතිශයින්ම අන්ධකාර යුගයක ශාසනයට අයත් දේපළ පාරම්පරිකව සුරක්ෂාකර ගැනීමත්, තථාගත ධර්මය ඇතුළත් ත්‍රිපිටක අටුවා ටීකා ඇතුළු ධර්ම ග්‍රන්ථ හා භාෂා ශාස්ත්‍ර වශයෙන් වැදගත්වන කෘති ආරක්ෂා කර ගැනීමත්, ගමත් පන්සලත් අතර තබූ සංස්කෘතික සබැඳියාව මෙන්ම රටේ රාජ්‍යත්වය හා පැවැති භික්ෂුවගේ ඓතිහාසික සම්බන්ධය රැකගැනීමත් මෙම ගණින්නාන්සේලා අතින් සිදු වූ ප්‍රසංශනීය ම සේවාවව යි. එම සේවාව ඔවුන් අතින් ඉටු නොවන්නට අද ශාසනික තත්වය මීට වඩා වෙනස් වන්නට ද ඉඩ තිබිණි.



මහාචාර්ය
**දුනේෂ් ඉන්ද්‍රරත්න**

**නිවසක කටයුතු කර ගැනීමට නිදහස් කාරුණික කාන්තාවකට ආරාධනා**

**0775744648**

---

## උපසපන් හිමිනමක්

වසා ඇති විහාරස්ථානයක් සොයයි.

**071-7047111**

---

## අභිනවයෙන් ඉදිවෙන ආරාමයේ

බුදු මැදුර තැනීම සඳහා පිංවත් ඔබ සැමගේ දායකත්වය අපේක්ෂා කරමු.

**උප්පලවණ්ණා අභිවර්ධන සමිතිය,**
**නිදන්ගල, තිබ්බටුහේන, කොටවිල, මාතර.**
**0719081967**

---

## සංස්කෘත විෂය සඳහා පැවිදි ගුරුවරයෙකු අවශ්‍යයි.

**විමසන්න**

**071-1933437**

---

## විහාරස්ථානයක් සොයයි

සියලු ආගමික වැඩ කළ හැකි (විශ්‍රාමලත් පරිවෙනාධිපති අවු. 56) නිදහසේ නිදහස්ව සිටීමට විහාරස්ථානයක් සොයයි. (සංවර්ධනය කළ හැක)

**0711861006, 0775481058**

---

## සැමදා නොමිලේ

බෞද්ධයිනි! දිනපතා මේ රටේ ලක්ෂ කෝටි ගණනින් අහිංසක සතුන් මරනු ලබන්නේ ඔබගේ කුස පිරවීම සඳහාය. මාංශ අනුභවය සතර අපා දොර විවර කරයි. නිර්මාංශභෝජී බුදුන් වහන්සේගේ නිර්මල අවිහිංසා ධර්මය නොමිලේ ලබාගන්න.

**071-7679254**

---

**"අයං වස්සාන කාලෝ"**
**"මේ වස් කාලයයි"**

ආර්ථික අපහසුතා ඇති දුෂ්කර විහාරස්ථානයක

**දානය පිළියෙල කර ගැනීම සඳහා බරපැනක් පූජා කළ හැකි සැදැහැවතුන්ට ඒ සඳහා ආරාධනා කරයි.**

**අමතන්න : 078-7889922**

---

## අප විහාරස්ථානයට ප්‍රත්‍ය පහසුකම් ඉතාම හිඟයි.

උදව් කරන්න.

**කඨිණ පිංකමටද අනුග්‍රාහක පිංවතුන් අවශ්‍යයි.**

**077-8325775**

---

## මෙහෙණින් වහන්සේලා දෙනමකට

භාවනායෝගීව වැඩ විසීම සඳහා කුඩා නිවසක් හෝ පර්. 5 පූජා කළහැකි පින්වත් ඔබට ආරාධනා. වැසිගිය ආරාමයක් ඇතොත් දන්වන්න.

**0713788467**

---

## වයස 55-62 අතර භික්ෂුවක් නේවාසිකව පංසලක සිටීමට සොයයි.

ජීවිත අවසානය දක්වා සිටිය හැකිය.

**071-4448445**

---

## පිංවතුනි

අප විහාරස්ථානයේ ධාතු කරඬුව තැම්පත් කරගැනීම සඳහා

**කරඬු ස්ටෑන්ඩ් එකක් සහ ධර්ම ආසනයක්**

මෙවර කඨින පිංකමට පෙර පූජා කර දෙන්න.

**මෙයට - විහාරාධිපති හිමි**

0773671680, 0783628979

---

බුත්තල ඉතා සුවදායක පරිසරයක අරඹන ලද සමිඳු සෙවන වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථානයට සුවසේ විසීමට විශ්‍රාමික, නිරෝගී, ඔත්පල වැඩිහිටියන් බඳවා ගැනේ.

**අංශභාග රෝගීන් වුවද බෙහෙත් කිරීමට භාරගනු ලැබේ.**

සාත්තු සේවක සේවිකාවන් අවශ්‍යයි

**0703318641**
**0775509641**

**අඹ සෙවන,**
**පරණ පාලම පාර, කුඩාඔය, බුත්තල.**

---

## මෙහෙණි ආරාමයක් සඳහා කුඩා නිවෙස් පරිශ්‍රයක් හෝ ඉඩමක් පරිත්‍යාග කිරීමට කැමති පින්වතෙක් වේ නම් කරුණාවෙන් අමතන්න.

**"පින් සිත් පැහැදිව සසර කෙටි කරගනිත්වා"**

**වයඹ පළාතෙන් විශේෂයි**

**076-1709581, 077-6636680**

---

## ආරණ්‍ය සේනාසනයකට පැවිදිවීමට කුලදරුවන්

**කීපදෙනෙකු සහ බණ භාවනාකරමින් ගුණධර්ම පිරීමට කැමති සැදැහැවත්**

**උපාසක මහතකුට**

**ආරාධනා කරමි.**

077-3310973

---

## හොරණ

## නිසංසල පරිසරයක නිදහසේ සිටීමට විශ්‍රාමික දෙමාපියන් සඳහා නේවාසික, පහසුකම් ඇත.

**ඉදිකරමින් පවතින ගොඩනැගිලි සඳහාද ඔබට දායකවිය හැක.**

071-8011656, 071-4220117

---

## සතර පෝදා එළිදකින සදහම් ප්‍රදීපය

බුදුසරණ

---

## වකුගඩුවක් අවශ්‍යයි

**අවුරුදු 54 ක් වයසැති පියෙකුට**

A⁺ B Positive වර්ගයේ වකුගඩුවක් අවශ්‍යයි.

**මේ සඳහා දායක විය හැකි පිංවතකුට කාරුණික ඉල්ලීමයි.**

K.A. සුරසේන සමරනායක

**අංක. 90/1, පාසැල අසල, දොඹවෙල, මහවෙල, මාතලේ.**

071-4638790

---

## වස්සානයේ දුර්ලභ පිංකමක්

චෛත්‍යයක් ඉදි කිරීමට හා බෝධීන් වහන්සේ නමක් රෝපණය කිරීමට රත්ගම මෙත්මග භාවනා මධ්‍යස්ථානයට යාබද පර්. 80 ඉඩම මිලදී ගැනීමට ඔබගේ ආධාරය බලාපොරොත්තු වේ. කොටසක මිල රු. 30,000/- කි. ඔබත් ඉඩම් පූජාවේ මහඟු පිංකමට දයක වෙන්න.

**මෙත්මග සංවර්ධන සභාව / මහජන බැංකුව - රත්ගම**

**136200100036590 / 071-7818222 / 0767098222**

---

# ලුම්බිණි

**රේ:නො: W5510**




**විශ්වාසවත්, පිරිසිදුවත්, විනයානුකූලවත්, අටපිරිකරක් ලබා ගැනීමට ලුම්බිණි වෙළඳසැල වෙතම යන්න.**

*අටපිරිකර සහ පූජා භාණ්ඩ ප්‍රමුඛයෝ*

**ලුම්බිණි ස්ටෝර්ස්**

**65, ඕල්කට් මාවත, පිටකොටුව**

**දුරකථනය: 2324814**

---

## විහාරස්ථානයක් ඉදිකිරීම සඳහා පරිත්‍යාගශීලි පිංවතකුගෙන් ඉඩමක් බලාපොරොත්තු වෙමි.

**සහනදායි මුදලකටද කමක් නැත.**

071-1219299, 076-6695788

---

## මෙත්සවිය

කළුතර අභිනවයෙන් ඉදිකළ මෙත්සවිය සදහම් අරණ සාමනේර භික්ෂු පුහුණු මධ්‍යස්ථානයේ සිල්වත් භික්ෂූන් වහන්සේ නමක් යටතේ

**පැවිදි කිරීම සඳහා වයස 12 - 15 අතර පිරිමි ළමුන් 15 ක් පමණ අවශ්‍ය වේ.**

මහණ කරන සියලු කුලදරුවන් හට හොරණ විද්‍යාරතන පිරිවෙනෙන් අධ්‍යාපනය ලබාදී අවාසනයේ ශාසනයේ චිරස්ථිතිය පිණිස වැසුණු පන්සල් නැවත ඇරීමට සහ භික්ෂූන් වහන්සේලා හිඟ පන්සල් වලට කැමති පරිදි යොමු කෙරේ.

තවද ස්ථානය රැකබලා ගෙන කටයුතු කළ හැකි ඉවුම් පිහුම් දන්නා

**මැදිවියේ හෝ වයසක උපස්ථායක මහතකු ද අවශ්‍ය වේ.**

ආරණ්‍යයෙහි මෝටර් රථය පැදවීමේ හැකියාව අතිරේක සුදුසුකමකි. (මාසික දීමනාව 15/= 25/= අතර)

මෙත්සවිය සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා (දු.ක. 0714800800) අමතා (දහවල් 12.00 - 1.00 හෝ රාත්‍රී 9.00 - 10.00 අතර කාලය තුළ පමණි) දැනුම් දෙන්න.

**විස්තර www.methsaviya.lk වෙබ් අඩවියේද ඇත.**

---

**අරණ්‍යවාසී ස්වාමින් වහන්සේලා දෙනමකට නේවාසිකව භාවනානුයෝගීව වැඩ වාසය කරමින් යෝගාවචරයන් කුඩා කණ්ඩායමකට භාවනා වැඩසටහන් කිරීමට අවශ්‍ය සේනාසනයක් ඉදිකිරීමට සුදුසු පරිසරයක පිහිටි පර්චස් 30 - 40 ප්‍රමාණයේ ඉඩමක් කඩුවෙල අතුරුගිරිය අවටින් පරිත්‍යාග කිරීමට කැමැත්තෙකු වේ නම් පහත දුරකථන අංකයට අමතන්න.**

ඉඩමට නාමික වටිනාකමක් ගෙවීමද සලකා බැලීමට හැකිය.

071-0369145

# දේශයට රැකවරණය සලසන රාජ්‍යත්වයේ සංකේතය

**සම්මා සම්බුදුරජාණන් වහන්සේ පිරිනිවීමෙන් පසු උන්වහන්සේ ආදාහනය කළ කුසිනාරා නුවර මල්ලව රජ දරුවන්ගේ උපවර්තන සල් උයනේ දී අකු ධාතූන් වහන්සේ දෙනමත්, ලලාට ධාතූන් වහන්සේ, ග්‍රීවා ධාතූන් වහන්සේ හා සතර දළදා වහන්සේ පමණක් ඉතිරිවී සෙසු ධාතූන් වහන්සේලා අබ පියල් මුන් පියල් ප්‍රමාණයට කැඩී ඉතිරිවූ බව මහා පරිනිබ්බාණ සූත්‍රය ආදී ඓතිහාසික වාර්තා අනුව සඳහන් වේ.**

එම සතර දළදා වහන්සේ එක නමක් තව්තිසා දෙව්ලොව ද, එකනමක් නාගපුරයෙහි (වර්තමාන නාග්පූර් හි පවුනි ප්‍රදේශයේ ජගන්නාථ විහාරයේ ද(ධාතු වංසයේ සඳහන් වන්නේ නාගලෝකයේ වැඩසිටි බවයි), එකනමක් ගන්ධාර දේශයේ ද, එකනමක් කලිඟුරටේ ද වැඩ වෙසති.

මේ අනුව නාග පුරයෙහි වැඩ විසූ ශ්‍රී දකුණු දළදා වහන්සේ දැනට පොළොන්නරුවේ බුදුරැස් විහිදෙන සෝමවතී චෛත්‍ය රාජයා තුළ ද, එක නමක් වර්තමාන පකිස්තානයේ කෞතුකාගාරයක සුරක්ෂිත ව වැඩ වෙසෙති.

වාම ශ්‍රී දළදා වහන්සේ දැනට රන්, රිදී, මුතුමැණික් වලින් සමන්විත ව සියැසින් දැකබලා ගැනීමේ භාග්‍ය උදාකරමින් මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ වැඩවසන සේක.

සම්මා සම්බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වසර 218 ක් ගතවන මොහොතේ ම ධර්මාශෝක මහ රජතුමා මහකෙළ නාගරාජයා විසින් මවා පෙන්වන ලද සම්බුද්ධ දේහය සියැසින් දැක අසීමිත බුද්ධාලම්භන ප්‍රීතියට පත්විය. එකී සම්බුද්ධ රූපය ප්‍රතිමාවකට නගා බුදුරජාණන් වහන්සේ උදෙසා පාඨලී පුත්‍ර, ඉසිපතන, ලුම්බිණී, කුසිනාරා, සාංචි ආදී බෞද්ධ සිද්ධස්ථානවල පෙරහරක් පැවැත්වූ බව චීන ජාතික පාහියං භික්ෂුවගේ වාර්තාවල සඳහන්ය.

මෙබඳු වාර්තා අනුව අශෝක අධිරාජ්‍ය සමය පටන්ම බෞද්ධ සංස්කෘතියට පෙරහරවල අංගයන් ඇතුළත් වූ ආකාරය දැක්වේ. සංඝමිත්තා මහරහත් ථෙරණිය ද ශ්‍රී මහා බෝධීන් වහන්සේ අනුරාධපුරයට වැඩම කරවීමේ දී පෙරහැර සම්බන්ධ වූ බව සඳහන් කර ඇත. එතැන් පටන් ලක්දිව පෙරහර ද ආරම්භ වන්නට ඇතැයි සැලකේ.



ගජබා රාජතුමාගේ විජයග්‍රහණය නිමිතිකොට ආරම්භ කරන ලද සෝමවතී මහ සෑ දකුණු දළදා පෙරහර නැවතත් වර්තමානයේ ද පවත්වන මොහොතේදී අලි ඇතුන් නොලැබීම නිසා චෛත්‍ය රාජයා තුළින් එළියට පෙරහරක් පැමිණීමෙන් ද, රන්වන් මාල හා හැට්ටයකින් සමන්විත සුදු ඇත් පැටවෙක් චෛත්‍ය රාජයාගේ ගර්භයෙන් එළියට මතුවී කුඩා ළමයකුගේ ඇගේ හැප්පී නැවත චෛත්‍ය රාජයා තුළට ගමන් කරන අයුරින් ගත් ඡායා රූපවලින් ද පෙරහරකට අලි ඇතුන් අත්‍යවශ්‍යම වූ බව පැහැදිලි වී ඒ අනුව මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ ඉන්දිරාජා හස්ථියා රැගෙන ගොස් පෙරහර පටන්ගන්නා මොහොතේ දී කැළය තුළින් එක දළක් ඇති ඇත්පැටවෙක් පැමිණීමෙන් ද, එම ඇත්පැටවා සමඟ සුදු ඇත් පැටවෙක් දර්ශනය වීමෙන් ද ඒ සමඟම චෛත්‍ය ගර්භය තුළින් මතුවූ දළදා වහන්සේ සහිත කරඬුව කොත් වහන්සේ සමීපයෙහි දර්ශනය වීමෙන් පසුව 2007 වර්ෂයේදී පෙරහර ආරම්භ කරනවාත් සමඟම දළ දා වහන්සේ චෛත්‍යරාජයාගේ ගර්භයෙන් ඉවතට මතුවූ ආකාරයත්, විෂ්ණු දෙවියන් ඇතුළු දෙවිවරු චෛත්‍යරාජයා වටා වැඩසිටින ආකාරය ඡායාරූප ගතකර ගැනීම ආදී ආශ්චර්යමත් සිද්ධීන් තුළින් ද දළදා වහන්සේ උදෙසා පවත්වන පෙරහරෙන් අදෘශ්‍යමාන බලවේගයන් සහිත ආශීර්වාදයන් සකල ජනතාවට ම ලබා ගත හැකි බව ප්‍රකට වන්නකි.

මේ අයුරින් පෙරහර බෞද්ධ සංස්කෘතියේ අංගයක් බවට පත්විය. අද මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ වැඩවසන වාම ශ්‍රී දළදා වහන්සේ හේමමලා දන්තකුමරු දෙපළ රාජ්‍ය වර්ෂ 301 දී කිත්සිරිමෙවන් රජුට බාරදුන්හ.

අනතුරුව රජතුමාට ඇතිවූ සැකය දුරලමින් දළදා වහන්සේ අහසට පැන නැග ප්‍රාතිහාර්යය පෑහ. ඒ දැකීමෙන් අසීමිත බුද්ධාලම්බන ප්‍රීතියට පත් රජතුමා දළදා වහන්සේ රජගෙදරට වැඩමවා සිංහාසනයේ වඩා හිඳුවා නොයෙක් පුදපෙරහර පැවත්වීය. මුළු ලක්දිවම තුන්වතාවක් දළදා වහන්සේට පූජා කළේය. මේ බව මහාවංසය ආදී ග්‍රන්ථයන් හි සඳහන් වේ.

එතැන් පටන් අභයගිරියෙහි ද දළදා වහන්සේ වඩා හිඳුවමින් රාජ්‍ය සංකේතය බවට පත් කොට සෑම රජ කෙනෙක් ම ස්වකීය මාළිගාවේ ම තබමින් පුද පූජා පවත්වමාන්, බුද්ධෝපස්ථානය කළ ආකාරය සඳහන් වේ.

අනුරාධපුර යුගයෙන් පසු පොළොන්නරු යුගයේ ද විජයබා, පරාක්‍රමබාහු හා නිශ්ශංකමල්ල ආදී රජවරුද ඒ ආකාරයෙන්ම දළදා වහන්සේ සඳහා පුද පෙරහර පැවැත් වීය. කාලිංග මාඝ චන්ද්‍රභාණු ආක්‍රමණ නිසා දඹදෙණියට රාජධානිය ගෙන ගිය අතර භික්ෂූන් වහන්සේ ද දළදා වහන්සේ හා පාත්‍රා ධාතූන් වහන්සේ කොත්මලේ පුසුල්පිටිය සමීපයෙහි සපුගහක සඟවා බුරුමයට පැන ගියහ.

2 වැනි පරාක්‍රමබාහු රජතුමා ස්වකීය මාළිගාව සමීපයහි ම දළදා මාළිගාවක් සාදා නොයෙක් පුද පූජා පැවැත් වී ය. පරසතුරු ආක්‍රමණ හා රාජ්‍ය තුළ ඇති වූ ගැටුම් නිසා දළදා වහන්සේ කුරුණෑගල, යාපහුව, ගම්පොල, කෝට්ටේ අදී රාජධානිවලට ද ගෙන ගිය අතර, සීතාවක රාජසිංහ රාජ්‍ය කාලය වන විට දළදා වහන්සේ රත්නපුරය කුරුවිට දෙල්ගමුව රජමහා විහාරයේ කුරහන්ගල යට සඟවා තබමින් රහසිගතව පුදපූජා පැවැත් වීය. පළමු රාජසිංහයන් නිසා ඇති වූ සම්බුද්ධ ශාසනයේ විනාශය සමඟ එකදු උපසම්පදා භික්ෂුවක්වත් නැති විය. ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ ද විනාශයට පත් විය. නැවත රා.ව. 1542 දී වික්‍රමබාහු රජතුමා කන්දඋඩරට සෙංකඩගල රාජධානිය පිහිටුවීය. රජ ගේ සමීපයෙහි දෙමහල් පෝය ගෙයක් බඳවා, ඒ සමීපයෙහි දාගැබෙහි පාත්‍රා ධාතූන් වහන්සේ නිදන් කළේ ය. එයට පෝයමලු විහාරය නමින් නම් තැබීය. ඒ අවට වෙහෙර විහාර 86 ක් සාදවා උපසම්පදා භික්ෂූන් වහන්සේ 355 නමක් ඇති කළේය.

පළමු විමලධර්මසූරිය රාජ්‍ය කාලයේ දී දළදා වහන්සේ දෙල්ගමුවේ සිට මහනුවරට වැඩමවීය. එහි මාළිගාවක් සාදවා දළද වහන්සේ තැන්පත් කොට පෝයමළු විහාරයේ හා අස්ගිරි විහාරයේ භික්ෂූන් වැඩමවා පුද පූජා පැවැත්වූ අකාරය ද මැනවින් සඳහන් වේ.

ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය වැඩිදියුණු කළ වැලිවිට ශ්‍රී අසරණ සරණ සරණංකර සංඝ රාජෝත්තමයන් වහන්සේ ඇතුළු මහා විහාරයීය භික්ෂූන් වහන්සේ සියම් රටෙන් උපසම්පදාව වැඩම වූ උපාලි හිමියන් ඇතුළු භික්ෂූන් වහන්සේත් සතර දේවාල පෙරහර බලන අවස්ථාවේ දී දළදා වහන්සේ උදෙසා ද මෙවන් පෙරහරක් පැවැත්වීම සුදුසු යැයි කරන ලද යෝජනා හා අදහස් ද, කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාට ඉදිරිපත් කළෙන් රජතුමා අසීමිත සතුටට පත්ව පෙරහරක් සංවිධානය කරවා සතර දේවාල පෙරහරට පෙරටුව වීදි සංචාරය කිරීමට සැලැස් වීය.



සෝමවති රජමහා විහාරාධිපති
මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ
මල්වතු මහා විහාර පාර්ශ්වයේ
වැඩබලන ලේඛකාධිකාරී
ආචාර්ය **පහමුණේ සුමංගල හිමි**

# ලක්දිව පින්කෙත කිරි උතුරායා



අනුරාධපුර අවධියේ මුල් කාලයෙහි එනම් ක්‍රි.ව හතර වන සියවසෙහි සිරිමෙවන් රජු දවස දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවන ලද්දේ භාරතයෙහි උදේනි පුර රජ කළ උදේනි රජුගේ පුත් දන්ත කුමරුන් හා කලිඟු දේශයෙහි ගුහසිව රජුගේ දියණි හේමමාලා කුමරිය යන දෙදෙනා විසින් බව දළදා ඉතිහාසයෙහි සඳහන් වී ඇත.

එදා මෙදා තුර සියවස් දහ හතකට අධික කාලයක් දළදා වහන්සේ හා බැඳුණු සංස්කෘතිය අතිශයින්ම ගෞරවාන්විත ය.

දළදා වහන්සේ හිමි කාට ද ඔහු රටේ රජු බවට පත්වීමට තරම් මෙම සංස්කෘතිය හෙළ ජන හදවත් තුළ මුල් බැස ගැනීමට එතරම් කාලයක් ගත නොවීය. ක්‍රි. ව. හතර වන සියවසේ රචිත එළු දළදා වංශ කාව්‍ය, පොළොන්නරු යුගයේ ලියවුණ දාඨාවංශ පාලි කාව්‍ය, කුරුණෑගල යුගයේ ලියවුණු දළදා සිරිත හා දළදා පූජාවලිය මහනුවර රචිත දළදා වරුණ, දළදා පූජාවලිය, දළදා හටන, දළදා වංස කාව්‍ය, දන්ත ධාතු විස්තර, දළදා වතුර, දළදා විසිතුර, දංෂ්ට්‍රාධාතු කථා, දළදා සතකය තරම් සුවිසල් සාහිත්‍යයක් දළදා වහන්සේ මුල් කොට රචනා කිරීමට හෙළ සාහිත්‍යකරුවන් පෙළඹී ගියේ දළදා වහන්සේ හෙළයින්ගේ සදාතනික රජු ලෙස සැලකූ නිසා ය.

එසේම විදේශීය සතුරු ආක්‍රමණ සිදුවන හැම විටම රජවරුන්ගේ ප්‍රධානතම කාර්ය වූයේ තම දිවි දෙවෙනි කොට දළදා වහන්සේ ආරක්ෂා කිරීමයි.

අනුරාධපුරයෙන් පොළොන්නරුවට ද පසුව මාඝ ආක්‍රමණයන් නිසා කොත්මලේ, බෙලිගල, දඹදෙණිය, යාපහුව, කෝට්ටේ, දෙල්ගමුව මහනුවර ආදි විවිධ ස්ථානවල ද විසිතුරු විහාර මන්දිර නිර්මාණය කොට දළදා වහන්සේ ආරක්ෂා කිරීමට රජවරු ගත් ක්‍රියා මාර්ග දෙස විමසා බැලීමේ දී පැහැදිලි වන්නේ දළදා වහන්සේ රාජ්‍යත්වයේ සංකේතය ලෙස හෙළයින් පිළිගත් බවයි. බුදුන් වහන්සේ විසින් වදාළ සුවාසූදහසක් ධර්මස්කන්ධවල සෑම අක්ෂරයක් ම ස්පර්ශ කළ වර්තමානයෙහි වැඩ සිටින එකම සාධකය වන්නේ ද දළදා වහන්සේ වීම මෙතරම් ගෞරව සම්මාන ලැබීමට හේතු වන්නට ඇති බවත් පැහැදිලි කරුණකි.

දැනට දළදා වහන්සේ වැඩ සිටින විහාරයට 'දළදා මාලිගාව' යනුවෙන් භාවිත වූයේ ද රජු වාසය කරන මන්දිරය මාලිගාව වන හෙයිනි.

ඉහත සඳහන් කළ පැරණි ගද්‍ය පද්‍ය සාහිත්‍යයේ මෙන්ම වර්තමානයෙහි ද දළදා වහන්සේට ගෞරවය දක්වමින් රචිත ගීත සාහිත්‍යයෙහි ද රසිකයින්ගේ ඉමහත් ප්‍රසාදයට පත් වී ඇත. ප්‍රවීණ ගේය පද රචක අජන්තා රණසිංහ විසින් රචනා කරන ලද ධර්මදාස වල්පොලයන් විසින් ගැයුණු පහත ගීතය ද දළදා වහන්සේගේ ආශිර්වාදය ලක් දෙරණට ලැබී ඇති ආකාරය මැනවින් කියාපා යි.

**උත්තම මුනි දළදා වඩම්මන**
**මොක්පුර රන් නෞකා**
**බලන් සකි සත් සමුදුරු ගැඹරේ**
**උදේනි රජ පුත් දන්ත කුමරුවන්**
**උදේනි රජ දූ මාලි කුමරියන්**
**කෙස් කළඹේ සඟවා හිසින් ගෙන**

දන්ත කුමරු හා හේමමාලා කුමරිය විසින් ක්‍රි. ව. හතර වන සියවසේ සිරිමෙවන් රජ දවස දන්ත ධාතූන් වහන්සේ මෙරටට වැඩම කිරීම ලක්වැසි සැදැහැවතුන්ට නිර්වාණගාමී මාර්ගය සලසා දෙමින් ලෝකෝත්තර විමුක්තිය සමීප කරවන සංසිද්ධියක් ලෙස කවියා සිය රසික මනස සරාගී ලෝකයෙන් විරාගී ලෝකයට ප්‍රවේශ කිරීමට සමත් වෙයි.

එසේම ශ්‍රව්‍යගෝචර කර්ණරසායන මිහිරි පදවැල ශ්‍රාවකයාගේ මනස තුළ තිවුණ සැනහුණ සුන්දර සංවර බවක් ඇති කිරීමට සමත් වී ඇත. වර්තමාන සමාජ පරිසරයෙහි කඨෝර රළු පරළු අමිහිරි ශබ්ද තරංග මගින් ශ්‍රාවකයා තදබල වෙහෙසකට පත් වී එයින් මානසිකව රෝගාතුර වී ඇති බව අමුතුවෙන් කිවයුතු නොවේ. එකී රෝගී රසිකයා සුවපත් කිරීමට මෙවැනි ගීතවලින් ලැබෙන්නේ ඉමහත් පිටුබලයකි.

තඹවන් වැල්ලට මල් වැසි වස්සන
තිසි කල රන් ගොයමේ කිරි වද්දන
උත්තම මුනි දළදා හිසින් ගෙන
කෙස් කළඹේ සඟවා වඩම්මන
**මොක්පුර රන් නෞකා බලන් සකි සත් සමුදුරු ගැඹරේ**

එමෙන් ම බෞද්ධ සංස්කෘතිය මත ගොඩ නැගුණ හෙළදිව ශිෂ්ටාචාරය කෘෂි ආර්ථිකය මත ගොඩ නැගුණ බව කවියා මෙයින් ධ්වනිත කරවයි. පෙරදිග මහා ධාන්‍යාගාරය යන විරුදාවලිය ලබමින් ලෝක ඉතිහාසයේ අභිමානවත් ගමනක පැමිණීමට හෙළයන් සමත් වන්නේ ද නිවැරැදි දැහැමි ආර්ථික රටාවකට හුරුපුරුදු වූ නිසා ය. එකී ආර්ථිකය මෙම

> **බුදුන් වහන්සේ විසින් වදාළ සුවාසූදහසක් ධර්මස්කන්ධවල සෑම අක්ෂරයක් ම ස්පර්ශ කළ වර්තමානයෙහි වැඩ සිටින එකම සාධකය වන්නේ ද දළදා වහන්සේ වීම මෙතරම් ගෞරව සම්මාන ලැබීමට හේතු වන්නට ඇති බවත් පැහැදිලි කරුණකි.**

ලක්පොළොව තුළ නිර්මාණය වීමට බුදු දහමින් ලැබී ඇති සදූප දේශයන් කවියා මෙම ගීතයේ පදවැල් තුළ තැම්පත් කොට ඇත.

**සත් සිය වරුසක් අනුරපුරේයා**
**ලක්දිව පින්කෙත කිරි උතුරායා**
**උත්තම මුනි දළදා හිසින් ගෙන**
**කෙස් කළඹේ සඟවා වඩම්මන**
**මොක්පුර රන් නෞකා**
**බලන් සකි සත් සමුදුරු ගැඹරේ**

දළදා වහන්සේ දීර්ඝ කාලයක් අනුරාධපුරයේ වැඩ වසමින් අපේ ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට ලබා දුන් ආශිර්වාදය නැවතත් කවියා සිහිපත් කරවයි. කෙත්වතු සරුසාර වී රට ස්වයංපෝෂිත ව අතමිට සරු වී නිවහල් චින්තනයකින් නිරෝගී ජීවිත ගත කිරීමට උතුම් දළදා වහන්සේ මහානුභාව සම්පන්න ආශිර්වාදය වූ බව 'ලක්දිව පින්කෙත කිරි උතුරායා' යන පද්‍ය කණ්ඩය තුළින් මැනවින් ප්‍රකට වේ.

මෙම ඇසළ මාසය දළදා පෙරහර පවත්වන කාල පරිච්ඡේදයයි. එය ලක් රජයේ පවත්වන එකම ජාතික ආගමික කලා මංගල්‍යයයි. රාජකීය පෙළහරයි. ජාතියේ නිවහල් බව කියා පාන මහාර්ඝ වූ අභිමානයයි.



පෑලියගොඩ
විද්‍යාලංකාර පිරුවෙන්හි ආචාර්ය
කැලණිය විශ්ව විද්‍යාලයේ
සිංහල අංශයේ අංශාධිපති
ආචාර්ය
**මල්වානේ චන්ද්‍රරතන හිමි**

# රාජධානියෙන් රාජධානියට දළදා සමිඳුන් උදෙසා පැවැත්වූ පෙරහර අසිරිය



**සෙංකඩගලපුර වාර්ෂික ඇසළ පෙරහර පෙරහර මංගල්ලය වූ කලි ජීවමාන බුදුරජාණන් වහන්සේ හා සමකොට සලකන පරම පූජනීය ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ විෂයෙහි මහත් ශ්‍රද්ධා භක්තියෙන් ඉෂ්ට සිද්ධ කරනු ලබන උත්තම පූජෝපහාර මංගල්ලයකි.**

මෙම අසිරිමත් පෙරහර මංගල්ලයේ ආරම්භය අනුරපුර කිර්ති ශ්‍රී මේඝවර්ණ රජු සමයෙහි ක්‍රි.ව. 310 වැන්නේදී සිදුවූ බව දාඨා වංශය, මහාවංසය ආදී මූලාශ්‍රයන්ගෙන් හෙළි වේ. මේ පිළිබඳ සවිස්තර තොරතුරු රැසක් පස්වන සියවසේදී පමණ මෙහි පැමිණි චීන ජාතික ෆාහියං භික්ෂුවගේ දේශාටන වාර්තාවෙහි විස්තර වේ.

එහි එන තොරතුරුවලට අනුව ඇතෙකු පිට නැඟී, රාජ ඇඳුම් ලාගත් රාජ පුරුෂයකු දළදා පෙරහරට පෙර ආ ප්‍රදර්ශනයට දස දිගන්තයට පෙරතුව අණබෙර ගැසීමෙන් මෙසේ විස්තර කරයි. "චිත්වතුති, අද සිට දින දහයක් ගිය තැන බුදුන් වහන්සේගේ දන්ත ධාතුව පිටතට ගෙන අභයගිරි විහාරය කරා වැඩම කරවනු ලැබේ. පින් රැස්කර ගැනීමෙහි කැමති ගිහි පැවිදි සියල්ලෝ මං සම කෙරෙත්වා, නුවර කෝවේ මාවත් සරසත්වා, නැති හැම අයුරකම සුවඳ දුම් මල් ඈ පූජා ද්‍රව්‍ය පිළියෙල කර ගනිත්වා" යි සන්නිවේදනය කරයි.

පෙරහර ගමන් ගන්නා මග බුදුන් වහන්සේගේ බෝධි සත්ව චරිතයෙහි එන ජාතක කතා පිළිබඳ සිතුවම්, ප්‍රතිමා රූපයන් මග දෙපස තැන්පත් කළ බව දැක්වෙයි.

උතුම් දළදා වහන්සේ වඩාහිඳවා තිබූ අනුරපුර ඇතුල්නුවර 'ධම්මචක්කගේහය' හෙවත් 'දාඨාධාතුඝරය' නමින් එවකට හැඳින්වූ දළදා මන්දිරයෙන් පිටතට වැඩමවා ප්‍රධාන මාර්ගය දිගේ අභයගිරි විහාරස්ථ සුදර්ශන ශාලාවෙහි තැන්පත් කොට දින අනූවක් තිස්සේ ප්‍රදර්ශනය කොට පූජා පැවැත්වූහ. ඉන්පසු යළි පෙරහර අනුරපුරයට වැඩමවා දන්තධාතු මන්දිරයේ ධාතූන් වහන්සේ තැන්පත් කිරීමෙන් පෙරහර අවසන් කළහ. මින් විස්තර වන්නේ අනුරපුර යුගයේ පැවති දළදා පෙරහර විදෙස් භික්ෂූන් වහන්සේ නමක් දුටු සත්‍ය පුද පෙරහරක තොරතුරු ය.

අනුරපුරයෙන් ඇරඹුණු දළදා පෙරහර හෙවත් ඇසළ පෙරහර මංගල්ලයේ සුවිශේෂත්වය වන්නේ රාජ නියමයෙන් රාජධානියෙන්, රාජධානියට වසර එක්වා දහස් සත්සිය එකොළොස් වසරක් පුරාවට මෙම උතුම් පෙරහර මංගල්ලය ඉපැරණි පුද සිරිත් අනුව පවත්වාගෙන විත් ජාතියේ උරුමයක් වශයෙන් පැවත ඒමයි. අනුරපුරයෙන් පසු පොළොන්නරු යුගයේදී මහාවංශයේ එන මහා පරාක්‍රමබාහු (1158-1186) රජු දවස ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ විෂයෙහි පැවත්වූ පෙරහර පුද පූජා පිළිබඳ තොරතුරු වඩාත් විචිත්‍රවත් ය.

මෙසේ පෙරහර ගමන් කරන විට අකාල මේඝයක් ඇදහැලී පෙරහර යන මඟ අරුණු කොට අන් සියලු තැන්හි වැව් අමුණු පිරී යන සේ ගංවතුර ගලා ගියේ ය. මේ අනුව වැසි වසින බවට පැවති විශ්වාසය පොළොන්නරු රාජධානි සමයෙහි සිට වඩාත් තහවුරු වෙමින් පැවත ගෙන විත් අදටත් පෙරහර පැවැත්වීමෙහි එක් අරමුණක් වශයෙන් දළදා වහන්සේ විෂයෙහි පූජෝපහාර පෙරහර පැවැත්වීමෙන් කලට වැසි ලැබී රට සමෘද්ධිමත් වන බවට ඇති විශ්වාසයත් තහවුරු වී ඇත.

පොළොන්නරු රාජධානිය එල්ල වූ කුරිරු කාලිංග මාඝ ආක්‍රමණිකයාගේ දරුණු ව්‍යසනයෙන් අනතුරුව තුන්වන විජයබාහු රජුගේ (1232-1236) සමයේදී දඹදෙණි රාජධානිය ඇරඹිණ. දඹදෙණියේ රජ වූ තුන්වන විජයබාහු රජතුමාට, පෙර පැවති කාලිංග මාඝ ආක්‍රමණයේදී දළදා වහන්සේ සහ පාත්‍රා ධාතූන් වහන්සේගේ ආරක්ෂාව පිණිස මහසඟරුවන විසින් ධාතූන් වහන්සේ සඟවාගෙන ගොස් කොත්මලේ පව්වෙහි තැන්පත් කොට ආරක්ෂිත පුවත දැනගන්නට ලැබී මහපෙරහරින් කොත්මලේ පව්වට ගොස් ධාතූන් වහන්සේ දැක මහත් ප්‍රමුදිත වූ සිත් ඇතිව එහි සිට දඹදෙණිය දක්වා එම ධාතූන් වහන්සේලා වැඩම වූ ආකාරය මහාවංශයේ හා රාජාවලියේ විස්තර කරයි.

පෙරහර සම්බන්ධයෙන් දඹදෙණි යුගය, අතිශය වැදගත් සහ වඩාත් ප්‍රමාණාත්මක විස්තර රාශියක් හමුවන යුගයක් ලෙස සඳහන් කළ හැකි ය. දඹදෙණියේ රජ කළ විශිෂ්ඨතම නරපති ලෙස සැලකෙන දඹදෙණියේ දෙවන පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමාගේ සමයේ (1236-1270) දී ඉතා උත්කර්ෂවත් පරිද්දෙන් දළදා පූජෝපහාර පැවැත්වූ වග මූලාශ්‍රයන්ගෙන් හෙළි වෙයි.

දෙවන පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා බෙලිගල පව්වේ පිහිටි දළදා මැදුරේ තැන්පත් කොට තිබූ දළදා වහන්සේ දඹදෙණියට වැඩමවා දළදා පෙරහර අති උත්කර්ෂවත් ලෙස පැවැත්වූ බව සමකාලීන වංශකතා සහ මූලාශ්‍ර මගින් පැහැදිලි වේ.

යාපහුව රාජධානිය කරගත් පළවෙනි බුවනෙකබාහු රජතුමා (1273-1276) ශාසනයේ උන්නතියට මහත් වූ කටයුතු කරමින් දිනපතා ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ විෂයෙහි මහා පූජා පැවැත්වූ වග සඳහන් වෙයි. යාපහුවේ විසිතුරු දළදා මාළිගාවක් ගොඩනංවා දළදා පෙරහර ද අසිරිමත් ලෙස පැවැත්වූ බවත් එම පෙරහරට ඇතුන් මෙන්ම අසුන් ද සහභාගී වූ බවත් ප්‍රකටව පවතී.

දළදා පෙරහරෙහි පැවති සුවිශේෂත්වය වඩාත් ඉස්මතු කෙරෙන රාජධානියක් වනුයේ කුරුණෑගල රාජධානියයි. දෙවැනි භුවනෙකබාහු (1293-1302) රජු ඇරඹූ මෙම රාජධානියෙහි රජ පැමිණි සිවුවන පරාක්‍රමබාහු (1302-1326) රජ සමයෙහි රචිත දළදා සිරිත නමැති ග්‍රන්ථයෙහි සඳහන් ව්‍යවස්ථාවන්ට අනුව එවකට පෙරහර පැවති ආකාරය මෙසේ විස්තර වේ.

"නගරය දෙව්පුරයක් සේ සරහා උතුරුමුළු අයතැන් සිටිතැන් ගණවැසි, කිලිං දෙකුලයෙන් තිස්සත් සමඟ වැඩහුන් කරඬුව ගඳ කිලියෙන් මැත් කොට විසිතුරු කොට සරහන ලද රථයෙහි භද්‍රාසනයට වඩා ගණවැසි කිලිං දෙකුලයෙන් දෙන්නකු කරඬුව වඩා යන ලෙස රථයට නැංවූහ.

සුබ ලකුණෙන් යුත් මහා ඇතකු රථයෙහි යොදා ඒ රථය පළමු කොට ගමන් කරවා සුපිළිපත් මහ සඟන පිළිවෙලින් රථයෙහි බඳ පිරිත් හුය ගෙන පිරිත් කෙරෙමින් වැඩම කරවූහ.

"දළදා සිරිතෙහි එන එම පෙරහර චාරිත්‍ර බොහෝමයක් අඛණ්ඩ ව අද දක්වාත් පැවතගෙන ඒම ජාතියේ අභිමානයට හේතු වේ.

දළදා සිරිතෙහි දළදා පෙරහරට හා ප්‍රදර්ශනයට පළමුව හා පසුව සිදු කළ යුතු වතාවත් රාශියක් ඇතුළත් කර ඇත. එම සිරිත් විරිත් හා වතාවත් පිළිබඳ පැනවූ ව්‍යවස්ථාවන්ට අනුව එකල ද දළදා පුද සිරිත් අසිරිමත් ලෙස පැවැත්වූ බව ඒ අනුව පැහැදිලි වේ. මෙලෙස ඉතා පැහැදිලිව ඒ ඒ අවස්ථාවන්හි දී දළදා වහන්සේ විෂයෙහි කටයුතු කළ යුතු ආකාරය ගැන ව්‍යවස්ථා පනවා තිබීමෙන් කුරුණෑගල යුගයේ දී මනා සංවිධානයකින් යුක්තව පෙරහර හා සෙසු පූජා චාරිත්‍ර මනාකොට පැවැත් වූ බව සලකාගත හැකි ය.

කුරුණෑගල යුගයෙන් අනතුරුව මහනුවර යුගය දක්වා කාලය තුළ රටේ පැවති පරසතුරු උවදුරු හේතුවෙන් දළදා පෙරහරෙහි කටයුතු පෙර තරම් උත්කර්ෂවත් විචිත්‍ර සහ සංවිධානාත්මක ආකාරයෙන් පැවැත්වීමට අසීරු වුවද චිරාගත සම්ප්‍රදායික පෙරහර මංගල්ලය අතිඋතුම් දළදා වහන්සේ විෂයෙහි උත්තම පූජාවක් වශයෙන් අඛණ්ඩව පවත්වාගෙන ආ වග දක්නා ලැබේ. කෙසේ නමුත් අපේ මහ සඟරුවන, ජීවමාන බුදුන් වහන්සේ හා සමකොට ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ විෂයෙහි පැරණියේ පටන් පවත්වාගෙන ආ චිරාගත සම්ප්‍රදායික පූජා චාරිත්‍ර විධි කඩ නොකොට පැවැත්වීමට එවකට සිටි නරපතියන් ද වගබලා ගත්හ.

ගම්පොළ යුගයේදී අලගක්කෝනාර හෙවත් පස්වෙනි භුවනෙකබාහු රජතුමා (1372-1408) ද දළදා වහන්සේ විෂයෙහි මහත් ශ්‍රද්ධාවෙන් කටයුතු කර ඇති බවට තොරතුරු සඳහන් වෙයි. "රිදී සත් දහසකින් කරඬුවක් කරවා එහි දංෂ්ට්‍රා ධාතූන් වහන්සේ වැඩමවා සාදරව අනව රථයෙන් ධාතු පූජා කරනු ලබන්නේ....." යන විස්තරයෙන් පැහැදිලි වන්නේ පෙර සිට පැවත ආ දළදා පෙරහර හෙවත් ඇසළ පෙරහර මංගල්ලය මෙකල ද අසිරිමත් ලෙස පැවති බව ය.

ඉන්පසු කෝට්ටේ රාජධානිය කර ගත් හයවන පරාක්‍රමබාහු රජතුමා (1412-1467) ද බුදුසසුන විෂයෙහිත්, දළදා වහන්සේ විෂයෙහිත් පැවති පුද සිරිත් අසම්භින්නව පැවැත්වූ වගට පැහැදිලි කරුණු වංශකතා මගින් අවධාරණය කර තිබේ.

සීතාවක රාජ්‍ය සමය ලක්දිව ඉතිහාසයේ දේශපාලනික වශයෙන් වියවුල් සහගත වූත් වංශකතා මූලාශ්‍ර ආදිය සම්බන්ධයෙන් වූත් යම් අඳුරු කාලයක් වශයෙන් සැලකිය හැකි ය. සම්බුද්ධ ශාසනයේ උන්නතියට වඩා පරිහානියට මඟ සැලසුණු පරිසරයක් එම යුගය තුළ පැවති බව අධ්‍යයනය කළ හැකි ය. එසේ වුවත් කෙසේ හෝ බුද්ධ ශාසනය අසම්භින්නව පවත්වාගෙන ඒමට කටයුතු කළ රාජ්‍ය නායකයන් හා ප්‍රාදේශීය නායකයන් භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛ කොට ගෙන මේ යුගය තුළ ද දළදා වහන්සේගේ ආරක්ෂාවත් ගෞරවයත් පිළිබඳව කටයුතු කර ඇති බව පැහැදිලි වේ.

සීතාවක රාජසිංහ රජු දෙල්ගමුව රජමහා විහාරයේ සිට දළදා වහන්සේ සපරගමු මහසමන් දේවාලය වෙත වැඩමවා වාර්ෂික දළදා පෙරහර පැවැත්වූ වග 'සමන් වෙහෙර පැරණි ලේකම් මිටියේත්,' 'සමන් සිරිත' නම් ඉපැරණි ග්‍රන්ථයේත් සඳහන් බව කිරිඇල්ලේ ඤාණවිමල හිමි සිය 'සපරගමු දර්ශන' ග්‍රන්ථයේ සඳහන් කරයි.

එහි සඳහන් ආකාරයට දෙල්ගමු විහාරයේ එවකට වැඩසිටි කීර්තිමත් මහතෙර නමක් වූ මහින්දාලංකාර නම් සිල්වත් ස්ථවිරයන් වහන්සේගේ මූලිකත්වයෙන් සීතාවක රාජසිංහයන් (ක්‍රි.ව. 1581-1592) සිය එකොළොස් වසරක රාජ්‍ය කාලය තුළ එකොළොස් වතාවක්ම දළදා පෙරහර පැවැත්වූ බව දක්වයි. එයින් නොනැවතී සමන් වෙහෙරට හා සමන් දේවාලයට ගම් හයක් සහ නෙළුම්දෙණියෙන් නවඅමුණකුත් නින්දගම් දහසයකුත් පිදූ බව ද සඳහන් වේ. ඒ අනුව සීතාවක රාජ්‍ය සමය අතිශය වියවුල් සහගත කාලයක් වුවත් දළදා පෙරහර නොකඩවා පැවැත්වීමට කටයුතු කර තිබීමෙන් පැහැදිලි වන්නේ මෙය සිරිතක් සහ වගකීමක් වශයෙන් සෑම රාජධානියක් තුළම අඛණ්ඩ ව පවත්වාගෙන ඒමට සියලු දෙනා කටයුතු කර ඇති බවයි.

**සෙංකඩගලපුර වාර්ෂික ඇසළ පෙරහර**

ව්‍යවහාර වර්ෂ 1592 දී පළමු වන විමලධර්මසූරිය (1592-1604) රජතුමා ශ්‍රී දළදා වහන්සේ සෙංකඩගල පුර රාජධානියට වැඩම වීමෙන් අනතුරුව ඇසළ පෙරහර මංගල්ලය සෙංකඩගල පුරයෙහි ද පවත්වාගෙන ආ බව සලකා ගත හැකි ය. පෘතුගීසීන් උඩරටින් පන්නා දමා උඩරට සිංහල රාජධානිය ආරම්භ කළ පළමුවන විමලධර්මසූරිය රජතුමා තම රාජ්‍ය උරුමය තහවුරු කර ගැනීම සඳහා එතෙක් දෙල්ගමුව රජ මහවෙහෙරෙහි කුරහන් ගල් කරඬුවෙහි සඟවා තිබූ දළදා වහන්සේ මහපෙරහරින් මහනුවරට වැඩම වූ බව මූලාශ්‍රයන්ගෙන් හෙළි වේ.

දෙවන රාජසිංහ (1635-1687) රජු දවස රොබට් නොක්ස් දුටු පෙරහරේ ඇත්තු 40 ක් පමණ ද, බෙර දවුල් තම්මැට්ටම් වයන්නවුන් ද, නැට්ටුවෝ ද පෙරහරේ ගමන් කළහ. බඳ දෙපස එල්ලෙන මිණි ගෙඩි සහිත අලි ඇතුන් හතළිස් ගණනක් පෙරහරේ ගමන් කරන බවත් පෙර රජ දවස සිටි යෝධයන් හා සමානව සැරසුණු තළුවන් ද ගමන් කරන බවත්, බෙර දවුල් තම්මැට්ටම් සමුද්‍ර ඝෝෂාවට සමාන අයුරින් වාදනය කරන බවත්, නැට්ටුවන්ට අමතරව කළගෙඩි සෙල්ලම් කරන ස්ත්‍රීන් ද දුටු බවත් නොක්ස් සිය විස්තරයේ සඳහන් කරයි.

මුල් කාලයේ දී රජතුමා ද තම සෙන්පතිවරු පිරිවරා පෙරහර පසුපසින් අසු පිට ගමන් කළ බවත් පසුකාලීනව එම සිරිත අනුගමනය නොකළ බවත් නොක්ස් දක්වයි. මෙම ඇසළ උළෙල සකල උත්සවශ්‍රී විභූතියෙන් පැවැත්වූ බව නොක්ස් වැඩිදුරටත් විස්තර කරයි. දළදා වහන්සේ විෂයෙහි පැවැත් වූ වාර්ෂික චිරාගත සම්ප්‍රදායානුගත දළදා පෙරහර පිළිබඳ විස්තර මෙහි හෙළිනොවන නමුත් එවකට දළදා වහන්සේ විෂයෙහි එතෙක් සිදුකරගෙන ආ වාර්ෂික දළදා පෙරහර නොපැවැත්වූවා යැයි එක්වරම නිගමනය කළ නොහැකි ය. එය විචිත්‍රවත් ලෙස පැවැත්වීමට නොහැකි වුවද දළදා මාළිගා අභ්‍යන්තරයෙහි හෝ දළදා සමිඳු විෂයෙහි පූජෝපහාරය පිණිස නොකඩකොට පැවැත්වූවා යයි සලකා ගැනීම උචිත ය.

සෙංකඩගලපුර දළදා පෙරහර වර්තමානයෙහි දක්නා පරිදි සංවිධානය වූයේ කීර්ති ශ්‍රී රාජසිංහ (ක්‍රි.ව 1747 - 1781) රජු දවස ය. ඒ රාජ්‍ය වර්ෂ 1753 වැන්නේ ස්‍යාමොපසම්පදාව සඳහා සියම් දේශයේ සිට වැඩම කළ ප්‍රවර උපාලි මහතෙරුන් වහන්සේ හා බෝධිසත්ව ගුණෝපේත අසරණ සරණ වැලිවිට සරණංකර සඟරජ හිමියන් විසින් කීර්ති ශ්‍රී රාජසිංහ රජුට දෙන ලද උපදෙසට අනුව දළදා පෙරහර පෙරටු කොට නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි සිවුමහා දේවාල පෙරහර ගමන් කරනා පෙරහර ඇරඹීම සිදුවීමයි.

එතැන් සිට අද දක්වාම මෙම පෙරහර මංගල්ලය චිරාගත සම්ප්‍රදායානුකූලව ශ්‍රී දළදා මාළිගාව පෙරටුකොට පැවැත්වීම සිරිතයි. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් සිදුකරනු ලැබූ දළදා පෙරහර පිළිබඳව අසිරිමත් විස්තරයක් මහාවංශයෙන් හමුවේ.

"කීර්ති ශ්‍රී රාජසිංහ නරේශ්වර තෙමේ වර්ෂයක් පාසා පවත්වන්නා වූ ඒ ඇසළ මහා පූජා පෙළහර බුද්ධ පූජා පෙරටු කොට පවත්වන්නට සිතා මංගල හස්තියා පිට ස්වර්ණ කර්මයෙන් සුනිර්මිත සිව්ගෙය මොනවට බැඳ ලෙස ඉතා විචිත්‍රවත් සහ අංග සම්පූර්ණ ගාම්භීර දළදා පෙරහරක් පැවැත් වූ අයුරු දැක්වේ. අදටත් වාර්ෂික ඇසළ පෙරහර මංගල්ලය හා සෙසු පෙරහර මංගල්ලයන් හි මංගල හස්ති රාජයා පිට වැඩමවනු ලබන ස්වර්ණමය පෙරහර කරඬුව, ස්වකීය අගමෙහෙසියගේ මාල පළඳනාවන්ගෙන් විසිතුරුකොට පූජා කළේ මේ රජතුමා ය.

මෑත ඉතිහාසය දක්වාම පෙරහර කරඬුව වැඩමවීම සඳහා ඇතුපිට තැන්පත් කෙරෙන රන්හිලි ගෙය හෙවත් රන්සිවි ගෙය පූජා කළේ ද මෙතුමා විසිනි. මෙම රන්හිලි ගෙය දැනට සිරි දළදා කෞතුකාගාරයේ තැන්පත් කොට ඇත.

මහනුවර කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් පසු මහනුවර අවසන් රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දක්වා ලක්දිව රජ පැමිණි සෙසු නරපතියන් විසින් ද වාර්ෂික දළදා පෙරහර හෙවත් ඇසළ පෙරහර මංගල්ලය අඛණ්ඩව පැවැත්වූහ.

මෙකී සියලු රජ දරුවන් විසින් දළදා වහන්සේ විෂයෙහි පූජෝපහාරය පිණිස දළදා පෙරහර පෙරටු කොට සිවුමහා දේවාලයන්හි දෙවියන් විෂයෙහි පවත්වන භක්ති ප්‍රණාම පෙරහර පූජෝත්සවය අඛණ්ඩව පැවැත්වීම සිරිතක් කොට ගත් බව පෙනේ.

මහනුවර අවසන් රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට පසු ව්‍යවහාර වර්ෂ 1815 මාර්තු 2 වන දින උඩරට ගිවිසුමෙන් සිංහලයේ පාලනය භාරගත් ඉංග්‍රීසීහු ගිවිසුමේ සඳහන් පොරොන්දු කඩ කරමින්, වර්ෂ 1818 ඌව වෙල්ලස්සේ පැවති කැරැල්ල මුල් කොට පෙරහර පැවැත්වීම වසර දහයක් ම තහනම් කළහ. එසේ වුව ද මහසඟරුවන හා දියවඩන නිලමේවරු දළදා මාළිගාව අභ්‍යන්තරයේ හෝ පෙරහර පුද සිරිත් පැවැත්වූහ. මෙම තහනමෙන් පසු යළි පෙරහර වීදි සංචාරය කිරීම ඇරඹුණේ, මුළු රටම මහා නියඟයකින් පීඩා විඳිමට පටන් ගත් විට, ව්‍යවහාර වර්ෂ 1828 දී සර් එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරයාගේ ඉල්ලීමක් මත ය.

මෙසේ රාජධානියෙන් රාජධානියට, පරපුරෙන් පරපුරට පවත්වාගෙන එනු ලබන මෙම විශිෂ්ට සංස්කෘතික දායදය වර්තමානයෙහි සුරක්ෂිත කොට අභිවර්ධනය කර ගැනීමට බොහෝ සෙයින් දායක වූයේ ශ්‍රී දළදා මාළිගාව හා මල්වතු - අස්ගිරි උභය මහා විහාරයයි.

මෙම පූජෝත්සවය උත්තම දළදා වහන්සේ විෂයෙහි කෙරෙන පූජෝපහාරයක් වශයෙන් ද, සිවුමහාදේවාලයන්හි වැඩ සිටින්නා වූ නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි යන දෙවිවරුන් විෂයෙහි සිදුකරනු ලබන්නා වූ භක්ති ප්‍රණාම පූජාවක් වශයෙන් ද, කලට වැසි ලැබ රටේ සමෘද්ධිය හා සෞභාග්‍යය ඇතිකරගනු පිණිස ද, පැවැත්වෙන ආගමික පූජෝත්සව මංගල්ලයක් මෙන්ම හෙළ කලාවේ උදාරත්වය කියාපාන උඩරට නැටුම්, වැයුම්, ගැයුම් කලා ශිල්පීන්ගේ අද්දීන කලා කුසලතාවය ද ලොවට ප්‍රදර්ශනය කරනු ලබන්නක් වේ.

වර්තමාන ඇසළ පෙරහර මංගල්ලය සංවිධානය කෙරෙනුයේ මල්වතු - අස්ගිරි උභය මහා විහාරයේ අතිපූජ්‍ය මහානායක මාහිමිපාණන් වහන්සේලාගේ අනුශාසනා පරිදි, දියවඩන නිලමේතුමන්ගේ සංවිධානත්වයෙන්, ශ්‍රී දළදා මාළිගාවේ නැකැත් මොහොට්ටාල ලවා සකසනු ලබන සුභ නැකැත් පත්‍රයකට අනුව ය.

ඉන් අනතුරුව පළමුව සිරිත් පරිදි සුභ නැකතින් පේකොට තබන ලද පණස වෘක්ෂයේ ශාඛාවක් ගෙන මහනුවර සිවු මහා දේවාලයන් ප්‍රධාන කොට ඇති සියලු විහාර දේවාලයන් පූර්වාභිමත් ව ඇසළ කප් සිටුවීමෙන් පෙරහර ආරම්භ කෙරේ.



ශ්‍රී දළදා මාළිගාවේ තේවාවහාර
**තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ මේධංකර නා හිමි**

එදින සිට අභ්‍යන්තර පෙරහර පහක් ද, වීදි සංචාරය කෙරෙන කුඹල් පෙරහර පහක් ද, රන්දෝලි පෙරහර පහක් ද, දියකැපුම් පෙරහරක් ද, දහවල් පෙරහරක් ද, වළියක් නැටුම ද පැවැත්වීමෙන් පෙරහර සමාප්ත වේ.

ලක්දිවට දළදා වහන්සේ වැඩමවූ තැන් පටන් මහත් ශ්‍රද්ධාව හේතු කොට ගෙන නර ජ්‍යෙෂ්ඨයන් මෙන්ම සාමාන්‍ය ප්‍රජාව කෙරෙහි ද පරම පූජනීය දළදා වහන්සේ විෂයෙහි අසීමිත ගෞරවයක් හා විශ්වාසයක් ගොඩනැඟිණ. එම විශ්වාසයන්ට අනුව රටට නියඟය, දුර්භික්ෂ, රෝග බිය වැනි ව්‍යසන ඇති වූ සෑම අවස්ථාවකම අතිඋතුම් දළදා වහන්සේ විෂයෙහි පූජෝපහාර පුදපූජා පැවැත්වීමෙන් කලට වැසි ලැබී සමෘද්ධිය සෞභාග්‍යය ඇති වී දුර්භික්ෂ, රෝග බිය ආදී ව්‍යසන දුරු වී සුව සෙත ශාන්තිය ඇතිවන බවට පරම විශ්වාසයක් ජන මනස තුළ තහවුරු වී ඇත.

අනුරපුර පළවෙනි උපතිස්ස රජු (ක්‍රි.ව. 367-409) සමයේ දළදා වහන්සේ උදෙසා පූජෝපහාර දක්වා, එවකට ඇතිව තිබූ නියඟය, දුර්භික්ෂය, රෝබිය මඟහරවා ගත්තාක් මෙන් එතැන් පටන් බොහෝ රජුන් දවස පමණක් නොව, බටහිර ඉංග්‍රීසි ආණ්ඩුකාර සර් එඩ්වඩ් බාන්ස් ක්‍රි.ව. 1828 දී එවකට පැවති දරුණු නියංසාය සහ රෝබිය සමනය කර ගැනීම සඳහා දළදා පූජෝපහාර පෙරහර මංගල්ලයක් පැවැත්වූ අයුරු සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් වැසිදියෙන් ගංගා ඇළ දොළ පිරී ඉතිරී නියඟය කෙළවර වී දුර්භික්ෂය රෝග බිය නිමා වූ ආකාරය අතීත ඉතිහාසයෙන් අනාවරණය වේ.

ජනතාව තුළ පවතින එකී පරම විශ්වාසය මුල් කොට ගෙන මෙවර මහාවිහාර වංශික ස්‍යාමොපාලි මහානිකායේ මල්වතු - අස්ගිරි උභය මහා විහාරයන්හි අතිපූජ්‍ය මහානායක මාහිමිපාණන් වහන්සේලාගේ අවවාද අනුශාසනා පරිදි කොවිඩ් - 19 දරුණු වසංගත රෝග බිය හමුවේ, පූජනීය දළදා වහන්සේගේ ආශිර්වාදය ප්‍රාර්ථනා කොට චිරාගත සාම්ප්‍රදායික පුදසිරිත් නොකඩ කොට ජනතා සහභාගිත්වයෙන් තොරව වුවද සෙංකඩගලපුර වාර්ෂික දළදා පූජෝපහාර පෙරහර මංගල්ලය සංවිධානය කොට ඇත.

මෙම පූජනීය දළදා පූජාව හේතුකොට ගෙන සමස්ත ලෝකවාසී ජනතාව මෙන්ම ලක්වැසි ජනතාව ද ශ්‍රී දන්ත ධාතූන් වහන්සේගේ ආශිර්වාදයෙන් සුඛිත මුදිත වී සෙත ශාන්තිය ලබත්වායි ප්‍රාර්ථනා කරමු.

# සෙංකඩගලපුර ඇසළ පෙරහර වරුණ

**ශ්‍රද්ධාභිලාසී බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ වන්නේ ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ ය. මේ අතිඋත්තම ධාතූන් වහන්සේගේ ලංකා ගමනයෙන් පසු උන්වහන්සේට කළ යුතු වතාවත් හා පුද පූජාවන් පිළිබඳ දීර්ඝ විස්තරයක් පෞරාණික "දාඨාවංස" ආදී වංශ කථාවන්හි සටහන් ව ඇත.**

සෙංකඩගල පුරවරයට දළදා වහන්සේ වැඩමවීත් සමඟ ම හින්දු පුද පූජා චාරිත්‍රයන් ද සමඟ සංකලනය වෙමින් දළදා පූජාවන් පැවැත්වීම ආරම්භ වේ. ඒ අනුව වර්තමානයේ දළදා වහන්සේ උදෙසා අලුත් සහල් මංගල්‍යය, අවුරුදු මංගල්‍යය, කාර්තික මංගල්‍යය, (වෙසක්, පොසොන්, ඇසළ) පෙරහර මංගල්‍යය ආදි උත්සවයන් පත්වනු ලැබේ.

වාර්ෂිකව සිදුකරනු ලබන මෙම සතර මංග්‍යයන් අතුරෙන් ඇසළ පෙරහර මංගල්‍යයට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. වාර්ෂිකව සිදුකරනු ලබන මෙම පෙරහර මංගල්‍යයට සහ සම්බන්ධවන පාරම්පරික කලාකරුවෝ, ප්‍රභූවරු මෙන්ම සැදැහැවත් බෞද්ධ ජනතාව පෞද්ගලික හා පොදු අපේක්ෂාවන් පෙරදැරිව පෙළගැසෙති.

ඇතැම් ස්වාමියෝ තම අලි ඇතුන් ද භාරහාර උදෙසා සහභාගි කරවති. හින්දු ජනතාව මෙන් ම වැදි ජනතාව ද තම පෞරාණික චාරිත්‍රයන් ඉටුකරමින් මෙම ඇසළ පෙරහරට සම්බන්ධ වීම විශේෂ ත්වයකි.

මෙරටට දළදා වහන්සේ වැඩමවන්නේ ථේරීය සම්ප්‍රදායට අනුගත මහාවිහාරය හා මහායාන සම්ප්‍රදායට අනුගත අභයගිරි විහාරය අතර ජනප්‍රසාදය උදෙසා යම් උත්සාහයක් පවත්නා කාලවකවානුවක ය. එහිදි දළදා වහන්සේගේ භාරකාරත්වය හිමිකර ගනු ලබන්නේ අභයගිරි භික්ෂූන් ය. එයට පූර්ණ රාජ්‍ය අනුග්‍රහයක් එකල රජ කළ ශ්‍රී මේඝවර්ණ රජතුමාගෙන් ලැබේ.

ශාසනික සම්ප්‍රදායන්හි පිළිගැනීම් පිළිබඳ යම් යම් පරස්පරතාවයන් තිබුණ ද දළදා වහන්සේ උදෙසා කළයුතු පුදපූජා කාර්යයන් ඉෂ්ට සිද්ධ කිරීමට මේ විහාර පාර්ශව දෙකම එකට අත්වැල් බැඳගත් බවක් පෙනේ.

අභයගිරික භික්ෂූහු දළදා වහන්සේ තැන්පත් කළ "ධම්මචක්ඛ" විහාරයේ සිට අභයගිරි විහාරයට උත්සවශ්‍රීයෙන් කලින් කල වැඩමවීමක් සිදුවිය. පසුව මෙම කාර්ය වාර්ෂිකව සිදුකරන ආගමික චාරිත්‍රයක් බවට පත්විය. පසුව එයට රාජ්‍ය අනුග්‍රහය ද ලැබ ඇසළ මාසයේ සිදුවූ හෙයින් "ඇසළ මංගල්‍යයක්" ලෙස ප්‍රකට විය. මෙසේ අභයගිරි නිවාසී භික්ෂූන් වහන්සේලා මහජනතාවගේ ප්‍රසාදය ලබා ගැනීමට සිදුකළ දළදා ප්‍රදර්ශනය පසුකාලයේදී දෙස් විදෙස්හි ප්‍රකට උත්සවයක් බවට පත්ව තිබූ බව "ෆාහියං" නම් චීන භික්ෂූන් වහන්සේගේ ගමන් විස්තරයෙන් පැහැදිලි වේ.

අතීත ශ්‍රී ලංකාද්වීපය කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කොටගත් රාජ්‍යයකි. මේ නිසා ලංකාවාසී ජනතාව කලට වැසි ලබාගෙන ආර්ථික සෞභාග්‍යය ඇති කර ගැනීමටත් තමන්ට සිදුවන්නා වූ අපල උපද්‍රවයන්ගෙන් ආරක්ෂා වීමටත් දළදා වහන්සේගේ ආශීර්වාදය ප්‍රාර්ථනා කළහ.

මේනිසා මෙරට භික්ෂූන් වහන්සේලාගේත් මහජනතාවගේත් දළදා වහන්සේ රැක ගැනීම ප්‍රධාන අරමුණ වූ අතර දළදා වහන්සේගේ හිමිකාරිත්වය යමෙක් දරයි නම් ඔහු තම රාජ්‍යත්වයේ ප්‍රධානියා ලෙස පිළිගැනුනි. එමනිසාවෙන් රාජ්‍යත්වයට දෙස් විදෙස් තර්ජන ඇතිවන හැම විටකම භික්ෂූන් වහන්සේලා දළදා වහන්සේ ලංකාවේ විවිධ ස්ථානවලට රහසිගතව වැඩම කළහ.

මහනුවර අස්ගිරි විහාරවාසී
**අටබාගේ සිරිනන්ද හිමි**

දළදා වහන්සේ මහනුවරට වැඩම කරවනු ලබන්නේ පළමු විමලධර්මසූරිය රජතුමා විසිනි. පසුව ලංකා රාජ්‍ය නායක්කර් වංශිකයන්ට නතුවිය. සෙංකඩගල පුරය මේ වංශිකයින්ගෙන් වර්ධනය විය. දළදා මාලිගය අවට සතර දේවාල ඉදිවිය. මේ දෙවියන් උදෙසා වාර්ෂිකව පෙරහර උත්සව පැවැත්වූ අතර පසුව ඇසළ පෙරහරේ පෙරමුණට දළදා වහන්සේ උදෙසා පෙරහරක් පැවැත්වීමට කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා කටයුතු කළේ

"අවුරුද්දක් පතා මහනුවර සතර දේවාල වල පැවැත්වෙන ඇසළ පෙරහරේ පෙරමුණට දළදා පෙරහරකුත් උවමනා ය" යන රාජ ආඥාව නිකුත් කරමිනි.

ක්‍රමක්‍රමයෙන් එදවස සිට මහනුවර දළදා පෙරහර උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට රජවරු සමත්වූ අතර 1815 මාර්තු දෙවන දින ඉංග්‍රීසීන්ට ලංකා රාජ්‍ය යටත් වූ පසු පෙරහර පැවැත්වීම නවතා දමන ලදී.

ඉන්පසු කලකදී රටේ ඇතිවූ නියං සමය "දළදා වහන්සේට නිසි පූජා නොපැවැත්වීම නිසා ය" යන මතය රටේ පතළ විය. එවකට ලංකාවේ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වූ "එඩ්වඩ් බාන්ස්" මහජන මතයට දළදා ප්‍රදර්ශනයක් පැවැත්වූ අතර නියං සමය දුරු කරමින් ඇදහැළුණු මහා වර්ෂාව ගංවතුරක් බවට පත්විය.

එය අද ද ජනතාව අතර ප්‍රකට ව ඇත්තේ "දළදා වතුර" නමිනි. මේ ආශ්චර්ය සිදුවීමෙන් පසු වර්ෂ 1828 දී උක්ත ආණ්ඩුකාරවරයාගේ අනුමැතියෙන් නැවතී තිබූ පෙරහර නැවත ආරම්භ කර දළදා වහන්සේට අවශ්‍ය පූජා සත්කාර කිරීම සිදු කළහ.

මෙසේ මහජන මතයට ගරු කරමින් 1828 දී නැවත ආරම්භ කරන ලද ඇසළ පෙරහර අද දක්වාම ඉතා සාර්ථකව පවත්වනු ලැබේ.

පෞරාණික ඇසළ පෙරහරේ ගමන් ගන්නා අය අතර කස කරුවෝ නොවූහ. ඔවුන් පෙරහරට එකතු වන්නේ පී. බී. නුගවෙල දියවඩන නිලමෙතුමාගේ කාලයේදී බව පැවසේ. එසේ එකතුවූ කස පුපුරුවන්නෝ සහ පන්දම් කරකවන්නෝ විසින් වර්තමාන පෙරහරේ විශේෂිත අංගයක් සිදුකරනු ලබති. ඔවුනට මහ ජනතාවගේ විශේෂිත ගෞරවයක් හිමිවන අතර මූල්‍යම පරිත්‍යාග ද පෙරහර අවස්ථාවේ ම සිදුකරනු ලබති.

දළදා පෙරහර නුවර වීදි පුරා දින දහයක් වීදි සංචාරය කරන අතර කුඹල් පෙරහර හා රන්දෝලි පෙරහර ලෙස පෙරහර පැවැත්වේ. පෙරහරට සහභාගිවන කලාකරුවෝ බොහෝ දිනක සිට පේවීමකින් පෙරහරට සහභාගි වන අතර මහත් ශ්‍රද්ධාවක් ඔවුන්ගේ සිත්හි තබාගෙන එම කටයුත්ත දළදා වහන්සේ උදෙසා සිදුකරනු ලබති.

දළදා පෙරහර ශ්‍රී ලංකා ද්වීපයේ පමණක් නොව ලෝකයේ ම පැසසුමට ලක්වන මහා සංස්කෘතික මංගල්‍යයකි. ශ්‍රී ලංකාවට ම අවේණික කලා සංස්කෘතික ලක්ෂණ හා වාද්‍ය භාණ්ඩයන්ගෙන් සමලංකෘත ව පවත්වන නිසාවෙන් ඇසළ පෙරහර මංගල්‍යය සංස්කෘතික මංගල්‍යයක් ද වෙයි.

තවද සාම්ප්‍රදායික නැකතට මුල්තැන දෙමින් සියලුම චාරිත්‍ර විධි සිදුකරනු ලබයි. ඇසළ පෙරහරේ අවසන් රන්දෝලි පෙරහර වීදි සංචාරය කොට ශ්‍රී දළදා මාළිගයට ගෙවදී. නැවත මහනුවර අස්ගිරි ගෙඩිගේ විහාරය වෙත කුඩා පෙරහරකින් පෙරහර කරඬුව වැඩමවා අස්ගරි මහ නාහිමියන්ට භාරදී එදින රාත්‍රියේ ගේඩිගේ විහාරයේ පෙරහර කරඬුව තැන්පත් කොට අස්ගිරි විහාරවාසී මහා සංඝ රත්නයට හා අස්ගිරි ග්‍රාමවාසි ජනීජනයාට පුදපූජා පැවැත්වීමට අවකාශ සලසා දෙනු ලබති.

මෙම කටයුත්ත පුරාණ චාරිත්‍රානුකූල ව සිදුකරනු ලැබේ. ඉන් පසුව සෙසු දේවාල පෙරහර ගැටඹේ දිය කපන තොටේදී දිය කැපීම සිදුකොට දවල් පෙරහර අස්ගිරි මහා විහාරයෙන් ආරම්භ කර වීදි සංචාරය කිරීමෙන් පසුව ඇසළ පෙරහර මංගල්‍යය නිමාවට පත්වේ.



# උඩරට නර්තන වාදන කලාවෙන් අසිරිමත් වන සෙංකඩගලපුර ඇසළ පෙරහර මංගල්ලය

**වාර්ෂිකව මහනුවර පැවැත්වෙන ඇසළ පෙරහර මංගල්ලය, මංගල සම්මත රාජපූජිත දළදා පූජෝපහාර මංගල්ලයක් පමණක් නොව, හෙළ සංස්කෘතික අභිමානය ලොවට විදහාපාන මහා සංස්කෘතික මංගල්ලයක් ද වේ.**



එහි මූලික අරමුණ වන්නේ ජීවමාන බුදුන් හා සමකොට සැලකෙන අතිඋතුම් ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ විෂයෙහි පූජෝපහාරය දැක්වීම ය. එමෙන්ම දළදා පූජෝපහාරය පවත්වා කලට වැසි පතා රට සමෘද්ධිමත් කොට සෞභාග්‍යය ඇතිකර ගැනීම ද එහි අරමුණක් වේ. අනතුරුව ව්‍යවහාර වර්ෂ 1753 වැන්නේ සෙංකඩගලපුර කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස සිට ප්‍රධාන වශයෙන් ශ්‍රී දළදා වහන්සේ විෂයෙහි පූජෝපහාරය පිණිසත්, ඊට අමතරව නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි යන සිවු දෙවියන්ට බැති පුද පිණිසත්, කලට වැසි ලබා ගොවිතැන සරුසාර කොට රටේ සමෘද්ධිය හා සෞභාග්‍යය ඇතිකර ගැනීම පිණිසත් හෙළ සංස්කෘතියේ අභිමානය ලොවට විදහා දැක්වීම පිණිසත් මෙම උතුම් පෙරහර මංගල්ලය පැවැත්වීමේ සිරිත ඇරඹිණ. දළදා මාළිගාව පෙරටු කොට නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි යන සිවුමහාදේවාල පෙරහර පෙළගැසීම ද ඇරඹුණේ එතැන් සිටය. අදටත් නොකඩ කොට පැවැත්වෙන සෙංකඩගලපුර ඇසළ පෙරහර මංගල්ලය හෙළ සංස්කෘතියේ උදාරත්වය ප්‍රෞඪත්වය හා ශ්‍රීවිභූතිය විදහා දක්වන කැඩපතක් වන් උඩරට නැටුම් කලාවේ එකම මහාවේදිකාව බඳු ය.

ඇසළ පෙරහර මංගල්ලයේ විචිත්‍රත්වය හා අභිරමණීයත්වය දෙගුණ තෙගුණ කෙරෙන උඩරට නැටුම් කලාවේ ප්‍රභවය පිළිබඳව නිශ්චිතව කිවහැකි මූලාශ්‍ර නොමැති වුවද රාජානුග්‍රහයන් නොමඳව ලබා දිගු ඉතිහාසයක් පුරා චිරාගත සාම්ප්‍රදායික පුදසිරිත් ඇසුරු කොට පවත්වාගෙන එනු ලබන පූජාව හා ශාන්තිය මුල් කොට ගත්, මෙම විචිත්‍ර කලා සම්ප්‍රදාය බොහෝ දෙනා කරුණු කාරණා මැනවින් අධ්‍යනය නොකොට, මහනුවර යුගයේ ඇතිවූවක් ලෙසම අර්ථගැන්වීම යුක්තියුක්ත නොවන බව හැඟේ.

වත්මනෙහි පවත්නා සිංහල නැටුම් කලාවේ ප්‍රභවය විජයාවතරණයට පෙරාතුව පටන් පැවති කලාවන්ගෙන් ද පෝෂණය ලබා මෙරටටම ආවේණික වූ පරිදි සැකසුණු නැටුම් සම්ප්‍රදායන් මත ගොඩනැගුණු බව පෙනේ.

විජය රජුගේ ආගමනයේදී එක්තරා රැයක නැටුම් ගැයුම් වැයුම් හඬින් මහත් ඝෝෂාවක් කණවැකුණු විජය රජු, එම ඝෝෂාව කුමක්දැයි කුවේණියගෙන් විමසූ විට යක්ෂයන්ගේ විවාහ මංගලෝත්සවයකින් නැගෙන ඝෝෂාවකැයි පැවසූ බව වංසකතා මූලාශ්‍රයන්හි සඳහන් වේ.

මින් සිරිලක මුල් වැසියන්ට ඔවුන්ටම ආවේණික වූ නර්තන, ගායන, වාදන කලාවක් හිමිව තිබූ බව මනාව පසක් වේ. පඬුවස් දෙව්රජුට වැළඳුණු දිවිදෝෂය දුරු කිරීමට කෙරුණු ශාන්ති කර්මය, අදටත් උඩරට ප්‍රචලිතව පවත්නා කොහොඹාකංකාරි ශාන්තිකර්මයෙන් නිරූපණය වන්නා වූ නැටුම්, ගැයුම්, වාදන තුළින් ද ඉස්මතුව දක්නා ලැබේ. උඩරට වෙස් නැටුම ද එහි එක්තරා අවස්ථාවකි.

සම්බුද්ධ වර්ෂයෙන් 236 වැන්නේ මහින්දාගමනයෙන් අනතුරුව සංඝමිත් මහතෙරණිය විසින් ශ්‍රීමහාබෝධිය වැඩම කළ අවස්ථාවේ, දේවානම්පියතිස්ස රජු බෝධිපූජා කළ අයුරු දැක්වෙන සිංහල බෝධිවංශයට අනුව “ශක්‍රදේවේන්ද්‍රයන්ගේ රඟමඬලක් මෙන් සිත්කලු වූ නැටීම්, ගීකීම්, ගැසීම්, පිඹීම් සංඛ්‍යාත වූ චතුරංග සංගීතයෙන් අතොරක් නැතිව පැවති බව” සඳහන් වේ.

මේ අනුව ද ශ්‍රීමහාබෝධිය වැඩමවීමට පෙරාතුව සිට ලක්දිව තූර්යවාදන හා නර්තන කලාවක් පැවති බව තහවුරු කෙරේ. සිංහල බෝධිවංශයට අනුව ශ්‍රී මහාබෝධින් වහන්සේගේ දක්ෂිණ ශාඛාව සමග මෙහි පැමිණි බෝධිගුප්ත, සුමිත්ත, චන්ද්‍රගුප්ත, දේවගුප්ත, ධර්මගුප්ත, සූරියගුප්ත, ගෝතම හා ජුතින්ධර යන රාජ කුමාරවරු අට දෙනාගෙන් “චන්ද්‍රගුප්ත කුමාරයෝ මහබෝ මඟුලෙහි රන් බෙර ගසත්වයි” කියා මලය රජ තනතුරදී විල්බා දනව්ව ඕ හට ප්‍රවේණි කොට දුන්නේ ය යනුවෙන් ද, බෝධිය සමග පැමිණි අවශේෂයන් අතර, ගන්ධර්ව කුලයේ ප්‍රධානියාට පළවාන තනතුරදී (පළවානා/ මහපළවනා/ පටාහවාදක නම් ප්‍රධාන තනතුර) මහබෝධියට තුන්වරු හේවිසි පූජා කිරීම ඔහුට පැවරිණ. “පළවානා යටතේ ගන්ධර්ව (ගඳව්) කුලයට අයත් හේවිසි වාදකයෝ බෝධියට තුන්වරු හේවිසි පූජා පැවැත් වූහ” යනුවෙන් සඳහන් වේ.

ශ්‍රීමහබෝධින් වහන්සේ වැඩමවීමෙන් අනතුරුව පංචතූර්ය නාද හේවිසි පූජා පැවැත් වූ පිරිස්ම ව්‍යවහාර වර්ෂ 310 වැන්නේදී දළදා වහන්සේ වැඩමවීමෙන් අනතුරුව දළදා වහන්සේ විෂයෙහි ද හේවිසි පූජා පැවැත්වීමේ සිරිත සිදුකළැයි සිතාගත හැකි ය.

දළදා වහන්සේ වනාහි ශාරීරික සර්වඥ ධාතුන් වහන්සේ අතුරෙන් අග්‍ර වූ ශාරීරික ධාතුන් වහන්සේ නමක් වන හෙයින් මෙම චාරිත්‍රය නොකඩ කොට පැවැත්විණ.

ලක්දිව රාජධානි මාරුවීමත් සමඟ රාජධානියෙන් රාජධානියට පරපුරෙන් පරපුරට පවත්වාගෙන ආ මෙම හේවිසි පූජා චාරිත්‍ර පළමුවන විමලධර්මසූරිය :ක්‍රි.ව. 1592 – 1604 රාජ්‍ය සමයේ සෙංකඩගලපුර වෙත දළදා වහන්සේ වැඩමවීමත් සමඟ පෙර පැවති පුද සිරිත් සමඟ එලෙසම පැවැත්වූ බව පෙනී යයි.

මහනුවර රාජ සමය වනවිට දඹදෙණි කුරුණෑගල රාජධානි වලදී ගම්වරදී පත්කරන ලද හේවිසි පරම්පරා වලින් ඉහළ දෙලොස්පත්තුව (කුරුණෑගල මාවතගම ඇතුළු ප්‍රදේශ) පහළ දෙලොස්පත්තුව (හිරියාල හත්පත්තුව ඇතුළු ප්‍රදේශ) දුම්බර මාතලේ ආදි ගම්වර ලැබූ හේවිසි පරම්පරාවන්ගෙන් පැවතගෙන එන අය අදටත් සෙංකඩගලපුර දළදා හේවිසි පූජාවන්හි යෙදෙති.

එම ඉපැරණි හේවිසි පරම්පරා හා සම්බන්ධ මාලගම්මන (චමින්ද මාලගම්මන), ඉහළවෙල (පී.කේ.ජී.එම්. ඉහළවෙල) මොළගොඩ (ඒ.ජී. ජේම්ස්), උඩුවෙල (ඕ.පී. කරුණාදාස) යන හේවිසි පරම්පරාවන්ගෙන් පැවත එන්නෝ අදටත් දළදා මාළිගාවේ තේවාවන්හි දී හා උත්සව මංගල්ලයන්හි දී හේවිසි පූජා නො කඩ කොට ඉටු කිරීමට දායක වෙති. රජුන් විසින් පත්කරන ලද ඔවුනට දෙන ලද ගෞරව නිල නාමය පණික්කි යනුයි. ප්‍රධානියා මහපණික්කියා නම් විය.



මම ලිපියේ තවත් කොටසක් තිකිණි අව අටවක පෝද(30 වැනිද) පත්‍රයේ පළවේ.

ශ්‍රී දළදා මාළිගාවේ
බෞද්ධ කටයුතු කාර්යාංශයේ ලේකම්
**කේ. මීගහකුඹුර**

# කලාකරුවන් ජෛව බුබුළක් ලෙස පවත්වා ගනිමින් මෙවර ඇසළ පෙරහර ආරක්ෂිතව සිදු කරනවා

## - ප්‍රදීප් නිලංග දැල දියවඩන නිලමේ තුමා



**හෙළයේ විචිත්‍රවත්ම කලා මංගල්‍යය ලා සැලකෙන මහනුවර ඇසළ පෙරහර මංගල්‍යය පසුගිය 09 දින සතර මහ දේවාලයන්හි සුබ නැකතට කප් සිටුවීමෙන් ආරම්භ විය.ප්‍රථම කුඹල් පෙරහර 13 දා වීදි සංචාරය කළ අතර රන්දෝලි පෙරහර ආරම්භ වූයේ අගෝස්තු මස 17 දින ය.අවසන් රන්දෝලි මහ පෙරහර නිකිණි පුන් පොහෝ දිනය යෙදෙන 22 දින වීදි සංචාරය කිරීමට නියමිත ය.**

කලාකරුවන් දහසකට අධික පිරිසක් සමඟ අලි ඇතුන් 65 දෙනෙකු පමණ සහභාගී වෙමින් දින එකොළහක් පුරා පවත්වාන්නා වූ මෙවන් සංස්කෘතික මංගල්‍යයක් ලොව කිසිදු රටක දක්නට නොමැත.එක් පසෙකින් සංස්කෘතික මංගල්‍යයක් වුව ද තවත් පසෙකින් මෙය
දළදා සම්බුදුන් උදෙසා මෙන්ම සතර මහ දෙවිවරුන් වෙනුවෙන් පවත්වන්නාවූ පූජෝපහාරයකි.පැරණි රජ දවස පටන් රාජ්‍යය අනුග්‍රහය ලබමින් පැවැත්වූ පෙරහැර මංගල්‍යය අදද පවත්වන්නේ රාජ්‍යය උත්සවයක් ලෙසිනි.ඇසළ පෙරහර පෞරාණික චාරිත්‍ර ගරුකරමින් විචිත්‍රවත්ව පවත්වා අවසන් කිරීමේ ප්‍රධාන වගකීම පැවරෙන්නේ මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිළමේ තුමන්ට ය.වසර 2005 දී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ධූරයට පත්ව නිල කාලය අවසන් වූ පසු යළිත් 2015 වසරේ දී එම තනතුරට පත් ප්‍රදීප් නිලංග දැල මහතා මෙවර මහනුවර ඇසළ පෙරහර සංවිධානය කරන්නේ 17 වන වරට ය.මෙවර පෙරහරේ සංවිධාන කටයුතු සම්බන්ධව ඒ මහතා සමඟ කළ සාක්චිඡාවකි මේ...

.

**ශ්‍රී දළදා මාලිගාවේදී දළදා වහන්සේ වෙනුවෙන් වාර්ෂිකව මංගල්‍යයන් හතරක් පවත්වනවා.මේ අතරින් දළදා පෙරහර සුවිශේෂී වනවා නේද?**

දළදා මාලිගාවේ අලුත් සහල් මංගල්‍යය,අලුත් අවුරුදු මංගල්‍යය,කාර්තික මංගල්‍යය හා ඇසළ පෙරහර මංගල්‍යය ලෙසින් වසරකදී මංගල්‍යයන් හතරක් පවත්වනවා.දළදා වහන්සේ වෙනුවෙන් පවත්වන මේ සියලු මංගල්‍යයන් අතරින් ජනතාවගේ වැඩිම අවධානය දිනා ගන්නේ ඇසළ පෙරහරයි.

විදේශ රටවල ජනතාව පවා පෙරහර මංගල්‍යය ගැන අවධානයෙන් සිටිනවා. ශ්‍රී දළදා මාලිගාවේ පෙරහර සමඟ පිළිවෙළින් නාථ,විෂ්ණු,කතරගම හා පත්තිනි යන දේවාළ පෙරහර දින 11 ක් පුරා වීදි සංචාරය කරන්නේ කලා කරුවන් දහසකට වැඩි පිරිසක් සමඟයි.ලෝකයේ කොහේවත් මෙපමණ කලාකරුවන් පිරිසක් එක දිගට දින 11 ක් පෙළහර දක්වන උත්සවයක් නැහැ.ශ්‍රී ලංකාවේ අභිමානය ලෝකයට ගෙනයන ප්‍රබලතම අවස්ථාවක් ලෙස මහනුවර ඇසළ මංගල්‍යය පෙන්වා දෙන්න පුළුවන්.

**මහනුවර ඇසළ පෙරහර නැරඹීමට දෙස් විදෙස් ජනතාව දක්වන්නේ විශාල උනන්දුවක්.වාර්ෂිකව ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් පෙරහර නරඹනවා.දැන් අඛණ්ඩව වසර තුනක් පෙරහර සියැසින් දැක බලා ගැනීමේ අවස්ථාව ජනතාවට අහිමි වුණා නේද?**



පාස්කු ප්‍රහාරයෙන් පසුව 2019 දී ජන සහභාගිත්වයක් නොමැතිව පෙරහර කරන්න සිදුවුණා. ආරක්ෂක අංශවල උපදෙස් අනුව තමයි පෙරහර ඒ විදිහට සංවිධානය කළේ.පසුගිය වසරේදී කොවිඩ් නිසා අපිට නැවතත් පෙරහර කරන්න සිද්ධ වුණේ ජන සහභාගිත්වයක් නොමැතිවයි.මෙවර කෙසේ හෝ ජනතාවට පෙරහර නරඹන්න අවස්ථාව දෙන්න ඕන කියලා හිතලා තමයි අපි මූලික සංවිධාන කටයුතු කළේ.

නමුත් නොසිතු ලෙස කොවිඩ් රෝගීන් වාර්තා වීම ඉහළ ගිය නිසා සෞඛ්‍ය අංශවල උපදෙස් මත මහනායක ස්වාමින්ද්‍රයන් වහන්සේලා දෙනමගේ ද අවවාද අනුශාසනා ලබා ගනිමින් පෙරහර ජනතාවට නරඹන්න අවස්ථාව නොදී පවත්වන්න තීරණය කළා.

**පෙරහරට දහසකට වැඩි කලාකරුවන් පිරිසක් සම්බන්ධ වෙනවා.ආරක්ෂක කටයුතු වලට පොලිස් නිලධාරීන් ඇතුළු ත්‍රිවිධ හමුදාවේ 3000 ක් පමණ සහභාගි වෙනවා.මෙතරම් විශාල පිරිසක් ඒකරාශී වීම තුළ කොවිඩ් ව්‍යාප්ත වීමේ අවධානමක් මතුවෙන්න පුළුවන් නේද?**

මහනුවර ඇසළ පෙරහර කියන්නේ දළදා වහන්සේ සහ සතර මහ දෙවිවරු වෙනුවෙන් කරන පූජෝපහාරයක්.පෙරහර නොපවත්වා ඉන්න බැහැ.පෞරාණික චාරිත්‍ර ගරුකරමින් අපි පෙරහර මංගල්‍යය පවත්වන්නේ සෞඛ්‍ය නිර්දේශ උපරිම ලෙස ගරුකරමින්.පෙරහර ආරම්භ වීමට මාසයක් තිබියදී පෙරහරට සම්බන්ධ වන කලාකරුවන් ඇතුළු සියලු දෙනාට කොවිඩ් එන්නත ලබා දුන්නා.ආරක්ෂක කටයුතු වලට සම්බන්ධ වන පොලිස් නිලධාරීනුත් එන්නත්කරණයට ලක්කර තිබෙනවා. කලාකරුවන් ජෛව බුබුළක් ලෙස පවත්වා ගන්න අපි පියවර ගත්තා.මේ අකාර ආරක්ෂිත පියවර රැසක් අනුගමනය කරමින් තමයි අපි පෙරහර සංවිධානය කළේ.

**පෙරහර මංගල්‍යයන් සඳහා අවශ්‍යය හීලෑ අලි ඇතුන් හිඟය කලක පටන් පවතිනවා.මෙවරත් එය තදින්ම දැනෙනවා නේද?**

දැනට අපට ඉන්නේ හීලෑ අලින් 105 ක පමණ සංඛ්‍යාවක් පමණයි.මේ අය අතරින් බොහෝ දෙනකු දැන් ඉන්නේ වයස් ගතවයි.සමහරු පෙරහර කාලෙට මද කිපෙනවා.මේ කාරණා සියල්ල බැලුවම ඇත්තටම පෙරහරේ ගමන් කරන්න පුළුවන් තත්ත්වයේ ඉන්නේ අලි ඇතුන් 75 ක පමණ සංඛ්‍යාවක් පමණයි.

1995 වසර වනවිට ලංකාවේ හීලෑ අලි 225 ක් පමණ හිටියා.අද ඒක 105 ක් දක්වා අඩු වෙලා.වසර 25 ක් තුළ අලි 120 ක් පමණ මිය ගිහින්.ඉන්න අලි සංඛ්‍යාව අඩු නිසා ඒ සත්තු ටික රටේ වෙනත් පෙරහරවලට හැම තැනම ගෙනියන්න ඕන.මේ නිසා ඒ අය රෝගී වෙන්න තියෙන ඉඩ වැඩියි.මේවා ගැන අපි අවධානය යොමු කරලා තීරණ ගන්න ඕන.

**මෙවර දළදා මාලිගා පෙරහරේ සධාතුක කරඬුව වැඩම කරන්න නැඳුන්ගමුවේ රාජා වසර දෙකකට පසු යළිත් සම්බන්ධ වෙනවා නේද?**

ඔව්.මම 2005 දියවඩන නිළමේ ලෙස පත්වුණාට පස්සේ මහනුවර පෙරහරට නැඳුන්ගමුවේ රාජා සම්බන්ධ කර ගත්තා. පහුගිය අවුරුදු දෙකේදී ම මේ ඇතා පෙරහරට ආවේ නැහැ.මෙවර නැඳුන්ගමුවේ ඇතාගේ පැමිණීමත් එක්ක අපිට සධාතුක කරඬුව වැඩම කරන්න ලංකාවේ ඉන්න සුදුසුම ඇතුන් තිදෙනාගේම සේවය ලබා ගැනීමට අවස්ථාව ලැබුණා.කතරගම පෙරහර නිමාවී තිබෙන නිසා කතරගම වාසනාත් මෙවර නුවර පෙරහරට සහභාගි වුණා.මාලිගාවේ ඇත් පන්තියේ ඉන්දිරාජා කරඬුව වැඩම වන අනිත් ඇතා.

**මහනුවර පෙරහරේදී උඩරට වෙස් නැටුමට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයක්.අදවන විට මේ පාරම්පරික කලා ශිල්ප අභාවයට යමින් තිබීම අනාගතයේ පෙරහර පැවැත්වීමට ගැටලුවක් වේවි නේද?**

මහනුවර ඇසැළ පෙරහරේ සියලු නර්තන උඩරටට ආවේනික ඒවායි.පහතරට හා සබරගමු සම්ප්‍රදායට අයත් කිසිදු නර්තනයක් මේ පෙරහරට එකතු කරන්නේ නැහැ.ඒක සම්ප්‍රදායක්.

පාරම්පරික කලා ශිල්පීන්ගේ පවුල්වල වර්තමාන පරම්පරාව මේ කලා ශිල්ප වලින් ක්‍රමයෙන් ඈත්වන බවත් පෙනෙන්නට තිබෙනවා.ඔවුන් ආර්ථික වශයෙන් ප්‍රතිලාභ ඇති වෙනත් රැකියාවලට යොමු වෙනවා.

තවත් පැත්තකින් මේවාහි අගය තේරුම් ගත් අලුත් පරම්පරාවේ තරුණයින් උඩරට වෙස් නැටුම හදාරනවා.ඔවුන් පාරම්පරික කලා පවුල්වල අය නොවෙයි.නර්තනය වසරක් දෙකක් හදාරලා වෙස් බඳින්න බැහැ. අද පාසල්වල මේක කෙරෙනවා.මම එය අනුමත කරන්නේ නැහැ. දළදා මාලිගාවේ බෞද්ධ විශ්ව විද්‍යාලයට අනුබද්ධිතව උඩරට නර්තන පීඨයක් අපි ආරම්භ කළේ මේ රික්තකය පිරවීමටයි.

**මෙවර පෙරහර වීදිවලට රැස්ව සියැසින් දැක බලා ගැනීමට නොහැකි වුවත් ජනතාවට රූපවාහිනී නාළිකා ඔස්සේ බලන්න අවස්ථාව උදාකරලා තියෙනවා නේද?**

දේශීය හා විදේශීය වශයෙන් අපි පෙරහර වීදි සංචාරය කරන සියලු දිනවල සජීවීව විකාශනය කරනවා.රූපවාහිනී නාලිකා වලින් පමණක් නොව අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය ඔස්සේ පෙරහර නරඹන්න පුළුවන්.

සාකච්ඡා කළේ
**අසේල කුරුළුවංශ**



# ඉතිහාසයේ රසබර තොරතුරු කියන අභිලේඛන සාහිත්‍යය

**අභිලේඛන උරුමය පිළිබඳ විමසා බලද්දී ශ්‍රී ලංකාවේ අතීත සමාජය පිළිබඳ හමුවන විශ්වසනීය තොරතුරු රාශියකි. එක්තරා යුගයක සමාජය විමසන සමාජ විද්‍යාත්මක මූලාශ්‍රයක් ලෙස ද අභිලේඛන හැඳෑරීමට ගත හැකි ය. විශේෂයෙන් පැරැණි ලක්දිව පැවති විවිධ සමාජ සංවිධාන පිළිබඳවත්, සමාජය මෙහෙය වූ විවිධ බලවේග මෙන් ම සමාජ සිරිත් විරිත් පිළිබඳවත් වටිනා කරුණු රාශියක් විමසීම මෙහි දී සිදු කෙරෙයි.**



කොළඹ විශ්වවිද්‍යාලයේ
සිංහල අධ්‍යයන අංශයේ
මහාචාර්ය
**අගලකඩ සිරි සුමන හිමි**

**ලංකාවේ එවකට අපරාධ අවම කරලීම සඳහා රජවරුන් දැඩි දඬුවම් පනවා තිබුණු අයුරු අභිලේඛන පෙන්වා දෙයි. වේවැල්කැටිය පුවරු ලිපිය මෙයට ඉතා වැදගත් ම නිදසුන වෙයි. එල්ලා මැරීම , අත්පා කැපීම, හංවඩු ගැසීම, රත් කළ යකඩ පාවහන් පැළඳවීම, දඩගැසීම හා පිටුවහල් කිරීම වැනි දඬුවම් නියම කර තිබුණි.**

පැරැණි පුරාවිද්‍යාත්මක කැණීම් රාශියක් අනාවරණය කළ වැදගත් කරුණක් වන්නේ ලංකාවේ ඉපැරැණි රෝහල් සම්බන්ධ තොරතුරු ය. රෝහල් පිළිබඳ තොරතුරු කැණීම්වලින් හමුවෙද්දී ඊට අදාළ වෘත්තීන් පිළිබඳ තොරතුරු අභිලේඛනයන්හි දැක්වේ.

දහ වන සියවසට අයත් කිරිබත් වෙහෙර ටැම් ලිපිය පෙන්වා දෙන්නේ රෝහලේ නඩත්තුව සඳහා ඉඩකඩම් පවරා දී තිබූ බවයි. එමෙන් 'වෙද්හල්', 'බෙහෙත් ගේ,' 'මහවෙද්නා', සුළු වෙද්නා, 'වෙද්හල් සම්දරුවන්, 'වෙද්හල් කැමියන්, වෙද්හල් දසුන්' වැනි වෛද්‍ය වෘත්තියට අදාළ ස්ථාන සහ තනතුරු නාම රාශියක් ම බොහෝ අභිලේඛනවල හමු වීමෙන් පෙනෙන්නේ පැරණි සමාජයේ සෞඛ්‍ය සම්පන්න බව කෙරෙහි සමාජයේ පැවති ආකල්පයයි.

ජලය හා බැඳුණු සංස්කෘතියක් පැවති අයුරු බොහෝ අභිලේඛන පෙන්වා දෙන කරුණකි. දිඹුලාගල සමීපයෙන් සොයාගත් මෝලාහිටියවෙලේගල ගිරි ලිපියෙන් අනාවරණය කරන්නේ "සොවණ කොතුරු තියතෙ" යනුවෙන් ස්වර්ණ වූ කෙණ්ඩියකින් ජලය වත් කොට විහාර නඩත්තුව පිණිස ඇළක් භික්ෂූන්ට පූජා කළ බවයි. මෙම සම්ප්‍රදාය වත්මන තුළ අපට දැකිය හැකි වන්නේ, දේපළක් විහාරාරාම සන්තකව පූජා කිරීමේ දී මෙම ක්‍රමය අනුගමනය කිරීමෙනි.

එහි දී ජලය හුවමාරු සංකේතයක් ලෙස පිළිගැනේ. අනුරපුර පෙරුමියම්කුලම් ගිරි ලිපියෙහි දැක්වෙන්නේ "දකපති' සහ 'මජිබක' යනුවෙන් රජුට හිමි ජල බද්ද සහ මාළු බද්ද හවනා ගෘහයක් ප්‍රතිසංස්කරණය සඳහා විහාර සන්තක කළ බවයි. ජලය සංස්කෘතික මෙන් ම ආර්ථික සම්පතක් වූ අයුරු එයින් පෙනෙයි.

ලංකාවේ එවකට අපරාධ අවම කරලීම සඳහා රජවරුන් දැඩි දඬුවම් පනවා තිබුණු අයුරු අභිලේඛන පෙන්වා දෙයි. වේවැල්කැටිය පුවරු ලිපිය මෙයට ඉතා වැදගත් ම නිදසුන වෙයි. එල්ලා මැරීම , අත්පා කැපීම, හංවඩු ගැසීම, රත් කළ යකඩ පාවහන් පැළඳවීම, දඩගැසීම හා පිටුවහල් කිරීම වැනි දඬුවම් නියම කර තිබුණි. මෙහි දී මිනීමැරීමේ වරදට දඬුවම් පනවා ඇතත් එය තීරණය කළ යුත්තේ දසගම් ප්‍රධානීන් එකතු වී සාකච්ඡා කොට නඩුව විචාරා සියලු තොරතුරු ලියා තැබීමෙන් පසුව ය.

රාජ නියෝගයකින් මරණ දඬුවම ක්‍රියාත්මක නොවූ බව එයින් පෙනේ. සොරකමට දඬුවම ක්‍රියාත්මක නොවූ බව එයින් පෙනේ. සොරකමට දඬුවම නඩුව අසා නියම කරවා අයිතිකරුට අයත් කොට ද සොරු එම ගමින් නෙරපා හැරීමයි. මේ නිසා අපරාධකරුවන්ට සැඟවී සිටීමට නොහැකි විය.

මිනී මැරීමට අනුබල දීම මිනීමැරීම තරම් බරපතළ වරදක් සේ පිළිගැනුණි. ඔහුට රත්‍රං කලං පනහක් දඩ ගැසිය යුතු වූ අතර එය ගෙවිය නොහැකි වූ විට ගෙය රාජ සන්තක කිරීමට හෝ අත් කපා දැමීමට හෝ නියෝග කර තිබුණි.

ගවයා පැරැණි යුගයේ වටිනාම ආර්ථික සම්පතක් සේ පිළිගැනුණු අතර ගවයා මැරීම මරණ දඬුවම ලැබීමට තරම් වරදක් ලෙස වේවැල්කැටිය ලිපියෙහි නියෝගකර තිබෙයි. ගවයින් සොරකම් කරන්නන් අල්වා කිසිල්ලේ හංවඩු ගැසීමට නියෝග කර තිබීමෙන් පෙනෙන්නේ ගව සම්පත ආරක්ෂා කර ගැනීම කෙරෙහි තිබූ රාජ්‍ය මැදිහත් බවයි.

මෙම නීති උල්ලංඝනය කළවුන් අල්වා රත් කළ යකඩ පාවහන් පැළඳවීමට නියම කර තිබීමෙන් පෙනෙන්නේ නීතියේ තිබූ දැඩි බවයි. නීතිය ලිහිල්ව ගිය සමාජයක සාමකාමී සහජීවනය අපේක්ෂා කළ නොහැකි බවට පැරැන්නන් තුළ පැවති විශ්වාසයේ අගය වර්තමානය හා සමඟ සසඳ බලද්දී අපට පෙනෙයි.

පෝෂණීය ආහාර වේලක තොරතුරු තෝනිගල ගිරි ලිපියෙන් පෙනෙයි. මෙයට අනුව වී, උඳු, මුං, කව්පි, තල ආදිය ප්‍රධාන නිෂ්පාදිතයන් වූ අතර ජනතාවගේ ප්‍රධාන ආහාර වේල බවට මේවා පත් විය.

මෙයට අමතරව දීකිරි, මීපැණි, කැවිලි වර්ග, පැනි, දුන්තෙල් හා පලාවර්ග ද බුලත් ද ආහාර වේලෙහි අංග විය. සෞඛ්‍ය සම්පන්න පෝෂණීය ආහාර වේලකට අවශ්‍ය ද මෙහි අන්තර්ගත ය.

දහ වන සියවස පමණ වන විට පොහොය දිනය ලංකාවේ නිවාඩු දිනයක් ව පැවති බවට බදුලු ටැම් ලිපිය අනාවරණය කරයි. පෝදා වෙළඳම් කරන්නෙකු වෙතින් තෙල් බද්දක් දඩය වශයෙන් නියම කර ඇති අතර එම තෙල් වැය කොට මහියංගණ විහාර භූමියෙහි පහන් දැල්වීමට නියම කර තිබුණි.

දඬුවම නියම කෙරුණේ නැවත එවන් වැරැද්දක් නොවන ලෙස ආගමික පසුබිමක ගත කිරීමට ය.

තිඹිරිවැව ලිපියට අනුව රාජ කාර්යයන් සඳහා දින නියම කර තිබූ අතර පෝ දිනයෙහි කිසිදු රාජකාරියක් නියම කර නොතිබුණි. මේ අනුව පෙනෙන්නේ ආගමික කටයුතු සඳහා පොහොය දිනය වෙන්ව තිබූ බවයි.

අල්ලස් ගැනීම දහ වන සියවස වන විට මුළුමනින් ම තහනම් කර තිබුණි. බදුලු ටැම් ලිපියෙහි දැක්වෙන්නේ "ගවට් ආ රදෙලන් රහමස්දී ගිතෙල් නොගන්නා ඉසා" යනුවෙනි. එයින් කියවෙන්නේ රාජ්‍ය නිලධාරීන් ගම්වලට වැද රා මස් ආදිය අල්ලසට දී ගිතෙල් ලබා නොගත යුතු බවය.

හතර වන මිහිඳු රජු පැනවූ මිහින්තලා පුවරු ලිපියෙහි ද දැක්වෙන්නේ විහාර රාජකාරී වෙනුවෙන් ලබන වැටුප්වලට අමතරව වෙනත් කිසිවක් නොලද යුතු බවයි. අල්ලස් ගැනීමට එරෙහි ව පැරණි සමාජයේ පැවති තහංචි රාශියක් අභිලේඛන රාශියක ම දැක්වෙයි.

ලොව ඉතා සාධාරණ වෙළෙඳ ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාවේ පැවති බවට තොරතුරු හෙළි කරන්නේ ද බදුලු ටැම් ලිපියකි. පාරිභෝගිකයා මෙන් ම නිෂ්පාදකයා ද ආරක්ෂා වන පරිදි එහි පැනවීම් රාශියක් කර තිබෙයි.

මෙයින් පාරිභෝගිකයා කෙතරම් ආරක්ෂා කර තිබේ ද යන්න පෙන්වා දෙන්නේ බුලත්, පුවක් වැනි ක්ෂණික ආහාර ආවරණයකින් තොරව විකිණීම තහනම් කර ඇති බැවිනි. නූතන වෙළඳ සමාජය හා සංසන්දනය කිරීමේ දී මෙවන් වෙළඳ ප්‍රතිපත්ති අතීත සමාජය කෙතෙක් සෞඛ්‍ය සම්පන්න කළා ද යන්න පෙන්වයි.

එමෙන් ම සාධාරණ කිරුම් මිනුම් ක්‍රම එකල භාවිත කිරීමට නියෝග කිරීමෙන් පාරිභෝගිකයා සුරක්ෂිත කෙරිණි. "ගණ ලහස්සෙන් මිසැ සෙසු ලහසියෙන් නොමනනු" යන නියෝගය තුළ පෙනෙන්නේ සම්මත ලාසුවෙන් ම ධාන්‍ය මැනිය යුතු බවයි. හොර තරාදි, හොර පඩි භාවිතය වැළැක්ම සඳහා ඒවා සීල් තැබීමේ ක්‍රමයක් ද පැවතුණි. භාණ්ඩ විකිණීමට සුදුසු ස්ථාන නියෝග කර තිබීමෙන් නුසුදුසු ස්ථානවල වෙළඳමෙන් පාරිභෝගිකයාට වන අනර්ථය වළකා තිබෙයි. නූතන වෙළඳ සමාජය මෙ අතීතයෙන් පාඩම් උගත යුතු ව තිබෙයි.

මෙසේ මෙම ඓතිහාසික මූලාශ්‍ර පරීක්ෂා කිරීමේ දී ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ රසබර තොරතුරු රාශියකින් ම අප දැනුවත් කෙරෙයි. මේවා මතාන්තර යයි කිසිවෙකුටත් බැහැර කළ හැකි ද? ක්‍රමවත් පරිපාලනයක් හා සමාජ රටාවක් එකල සකස්ව පැවති බවට මොන තරම් සාක්ෂි අභිලේඛන සාහිත්‍ය අපට අනාවරණය කරයි ද?

# මිනිසුන් අතර මෙතරම් වෙනසක් ඇයි?

**බුදුරජාණන් වහන්සේගේ තථාගත දසබල ඥාණ වලින් එකක් තමයි, කර්මය සහ කර්ම විපාක පිළිබඳව උන්වහන්සේ තුළ ඇති අවබෝධය. කර්මය පිළිබඳව වන එම පරිපූර්ණ අවබෝධය බුදුරජාණන් වහන්සේට පමණක් පිහිටන සුවිශේෂී ඥානයක්. බුදුරජාණන් වහන්සේ කර්මය ගැන පෙන්වා වදාළේ " මහණෙනි, කර්මය කියා කියන්නේ චේතනාවයි.**

චේතනා පහළකොට තමයි කයෙන්, වචනයෙන්, මනසින් කර්ම කරන්නේ. (චේතනාහං භික්ඛවේ කම්මං වදාමි. චේතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා) මේක තමයි භාග්‍යවතුන් වහන්සේගේ කර්මය පිළිබඳ මූලික විග්‍රහය.

ඒ වගේම බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා "මහණෙනි, කර්මය හටගන්නේ කොහොමද? ස්පර්ශය හටගැනීමෙන් කර්මය හටගන්නවා (ඵස්සෝ භික්ඛවේ කම්මානං නිදාන සම්භවෝ) එනම් ඇස, කන, නාසය, දිව, කය, මනස කියන අභ්‍යන්තර ආයතන හය රූප, ශබ්ද, ගඳ–සුවඳ, රස, පහස, අරමුණු යන බාහිර ආයතන සමඟ විඥ්ඤාණය ඔස්සේ සම්බන්ධවීම කියන ස්පර්ශය තුළින් තමයි කර්මය හටගන්නේ.

එම නිසා භාග්‍යවතුන් වහන්සේ කර්මය ගැන අර්ථවත් උපමාවක් මේ විදිහට දේශනා කොට වදාළා. "කර්මය සත්ත්වයා සිරකර තිබෙන්නේ කරත්ත රෝදය මැද්දට දාපු කඩ ඇණය වගේ යනුවෙන් කරත්ත රෝදය ගැලවී විසිවන්නේ නැත්තේ කඩ ඇණය නිසයි. කඩ ඇණය ගැලෙව්වොත් කරත්තයට යන්න බෑ. රෝදය ගැලවී විසිවෙනවා. ඒ නිසයි බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙන්නේ සත්ත්වයන් කර්මයෙන් බැඳී සිටින්නේ කඩ ඇණයෙන් රෝදය සිර කර තියෙනවා වගේ කියා.

## එකම දායාදය

තෝදෙය්‍ය බ්‍රාහ්මණ පුත්‍ර සුබ මානවකයා දිනක් බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ විමසා සිටියා."

භාග්‍යවතුන් වහන්ස, අපට මනුෂ්‍යයන් අතර ලොකු විවිධත්වයක් දකින්න ලැබෙනවා. ඒ තමයි මේ ලෝකයේ දුප්පත් අය, පොහොසත් අය, නිරෝගී අය, රෝගී අය, දීර්ඝායුෂ ලබන අය, අඩු වයසෙන් මැරෙන අය, ලස්සන අය, කැත අය, උසස් කුලයේ අය, පහත් කුලයේ අය, ප්‍රසිද්ධ අය – අප්‍රසිද්ධ අය, ඥාණවන්ත අය – මෝඩ අය ජීවත්වෙනවා. භාග්‍යවතුන් වහන්ස මේ විවිධත්වයට හේතුව මොකක් ද? කියා. එවිට බුදුරජාණන් වහන්සේ මෙසේ පිළිතුරු දී වදාළා.

"තරුණය සත්ත්වයෝ වාසය කරන්නේ කර්මය තමාගේ දේ කරගෙනයි. උපත සකස්කර දෙන්නේ කර්මයයි (කම්ම යෝනි). කර්මය ඥාතියායි (කම්ම බන්ධු). කර්මය තමයි පිළිසරණ. කල්‍යාණ හෝ වේවා පාපී හෝ වේවා යම් කර්මයක් කරනවා නම් ඒක තමයි දායාදය වන්නේ. සත්ත්වයන් මේ විදිහට හීන – ප්‍රණීත ලෙස බෙදන්නේ කර්මය විසිනුයි. බුදුරජාණන් වහන්සේගේ මේ විග්‍රහය අනුව අපේ ජීවිතවලට කර්මයේ බලපෑම මොන තරම් ද කියා මනාව පැහැදිලි වෙනවා.

## වෙනස් වන හැටි

සියල්ල දන්නා, සියල්ල දක්නා සර්වඥතා ඥාණයෙන් යුතු භාග්‍යවතුන් වහන්සේ කර්මයේ ඇති විවිධත්වයන් මෙසේ පෙන්වා දුන් සේක.

"පින්වත් මහණෙනි, නිරයේ විඳිය යුතු කර්ම තියෙනවා. තිරිසන් ලෝකයේ විඳිය යුතු කර්ම තියෙනවා. ප්‍රේත ලෝකයේ විඳිය යුතු කර්ම තියෙනවා. මිනිස් ලෝකයේ විඳිය යුතු කර්ම තියෙනවා. දිව්‍ය ලෝකයේ විඳිය යුතු කර්ම තියෙනවා.

ඒ වගේම බුදුරජාණන් වහන්සේ කර්ම විපාකයන්ගේ ස්වභාවයන් මෙසේ පහදා දී තිබෙනවා. "මහණෙනි, කර්මය විපාක දෙන ආකාර තුනක් තිබෙනවා. ඒ තමයි දිට්ඨධම්මවේදනීය හෙවත් මේ ජීවිතයේදීම විපාක දෙන කර්ම. උපපජ්ජවේදනීය හෙවත් ඊළඟ ජීවිතයේදී විපාක දෙන කර්ම. අපරාපරියවේදනීය හෙවත් නිවන් දකින තුරු සසර පුරාවට විපාක දෙන කර්ම කියායි.

ඒ වගේම බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා "කර්මය පිළිබඳව විග්‍රහය දැනගත යුත්තේ සසර පිළිබඳව අවබෝධයෙන් කළකිරීමටයි." යනුවෙන්,

## හේතු–ඵල දහම තුළ කර්මය

පටිච්ච සමුප්පාද විග්‍රහයේ දී කර්මය ඇතුළත් වන්නේ "භවය" කියන කොටසටයි. එක්තරා අවස්ථාවක ආනන්ද ස්වාමීන් වහන්සේ මෙසේ විමසා සිටියා. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, "භවය භවය" කියා කියනවා. මේ භවය කියන්නේ කුමක් නිසා ද?" "ආනන්දය, කාම ධාතුවෙහි විපාක විඳීම පිණිස කර්මයක් නොතිබෙන්නේ නම් කාම භවයක් තිබෙනවා ද? නෑ ස්වාමීනි. එම නිසා ආනන්ද, කර්මය තමයි කුඹුර. (ඉති඲ෝ ආනන්ද කම්මං ඛෙත්තං) විඥ්ඤාණය තමයි පැළවෙන දේ. (විඥ්ඤාණං බීජං) තණ්හාව තමයි වතුර (තණ්හා සිනෙහො) එවිට හීන ධාතුවෙහි විඥ්ඤාණය පිහිටියා. ප්‍රාර්ථනාව පිහිටියා. චේතනාව පිහිටියා. මෙසේ කාම භවයෙහි විපාක පිණිස කර්ම රැස්වීමෙන් කාම ලෝකයේ උපදින බවත්, රූප භවයෙහි විපාක පිණිස කර්ම රැස්වීමෙන් රූප ලෝකයෙහි උපදින බවත්, අරූප භවයෙහි විපාක පිණිස කර්ම රැස්වීමෙන් අරූප ලෝකයෙහි උපදින බවත් භාග්‍යවතුන් වහන්සේ ඉතා පැහැදිලිව පෙන්වා වදාළා.

එලෙසින් පුණ්‍ය සංස්කාර රැස් කරමින් සුගතියේත්, අකුසල කර්ම රැස් කරමින් දුගතියේත් ඉපිද සැප–දුක් විපාක ලබමින් සත්ත්වයා සසරේ දුක්ඛිත බිහිසුණු ගමනක යෙදී සිටිනා ආකාරය චුතූපපාත ඥානයෙන් භාග්‍යවතුන් වහන්සේ දැන වදාළේ මෙලෙසිනි. "තථාගතයන් වහන්සේ මිනිසුන්ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුත වන්නාවූත් උපදින්නාවූත් සත්ත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන – ප්‍රණීත වූත්, යහපත් – අයහපත් වූත්, සුගති දුගති වල සිටින්නා වූ සත්ත්වයන් දකිනවා. "අහෝ මේ භවත් සත්ත්වයන් කයින් – වචනයෙන් – මනසෙන් දුශ්චරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස කරලා, මිසදිටු වෙලා, මිසදිටු දේවල් සමාදන් වෙලා ඉඳලා තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මතු අපාය නම් වූ, දුගතිය නම් වූ නිරයේ ඉපදී ඉන්නවා. ඒ වගේම මේ භවත් සත්ත්වයන් කයින් – වචනයෙන් – මනසෙන් සුචරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස නොකොට, සම්දිටු වෙලා, සම්දිටු දේවල් සමාදන් වෙලා ඉඳලා තියෙනවා.

ඔවුන් කය බිඳී මරණින් මතු සුගතිය නම් වූ ලෝකයෙහි ඉපදී සිටිනවා. මෙසේ භාග්‍යවතුන් වහන්සේ කර්මානුරූපව සුගති – දුගති ලෝකවල ඉපිද සැප–දුක් විඳින සත්ත්වයන් දැක වදාළා. එම නිසා ස්ත්‍රියක් වේවා පුරුෂයෙක් වේවා, ගිහියෙක් වේවා, පැවිද්දෙක් වේවා නිතර නිතර මේ කර්මානුරූප ධර්මතාවය නුවණින් සිහිකළ යුතු බවත්, ශාස්තෘන් වහන්සේ අනුශාසනා කොට වදාළේ මෙලෙසිනි. මම කර්මය තමාගේ දෙය කරගෙන සිටිමි. කර්මය දායාද කරගෙන සිටිමි. කර්මය ඥාතියා කරගෙන සිටිමි. කර්මය උත්පත්ති ස්ථානය කරගෙන සිටිමි. කර්මය පිළිසරණ කරගෙන සිටිමි. එහෙයින් යහපත් වූ හෝ අයහපත් වූ හෝ යම් කර්මයක් මා විසින් සිදු කරන්නේ නම් එහි විපාකය මට දායාදය හැටියට ලැබෙන්නේ ය යනුවෙනි. නිතර නිතර මෙසේ නුවණින් මෙනෙහි කරන ශ්‍රාවකයා සිත කය වචනය දුසිරිතට නොයොදා සුචරිතවත් පැවැත්මක් ඇතිකර ගන්නා බව භාග්‍යවතුන් වහන්සේ පෙන්වා වදාළා. කෙනෙක් උපතක් ලබන විට ඔහුට ලැබෙන්නේ ඇස, කන, නාසය, දිව, කය, මනස යන ආයතන හයකි. එය තනිකරම කර්ම විපාකයකි. ඒ තුළින් ඔහුට සිදුවන්නේ තම තමන්ගේ කර්මානුරූපව සැප දුක් වේදනා විඳීමට ය. බුදුරජාණන් වහන්සේ ඒ පිළිබඳව මෙසේ වදාළ සේක. පින්වත් මහණෙනි, පුරාණ කර්මය යනු කුමක්ද? ඇස – කන – නාසය – දිව – කය – මනස පුරාණ කර්මයකි. විශේෂයෙන් සකස් වූ දෙයකි. චේතනාත්මකව සකස් වූ දෙයකි. විඳීම තුළින් දැනගන්නා දෙයකි. මේ වනාහි පුරාණ කර්ම යැයි කියනු ලැබේ.

## කර්මයෙන් නිදහස් වන්නේ කෙසේ ද ?

මෙම කර්මයෙන් අපට නිදහස් විය නොහැකිද? කර්මය යනු නිත්‍ය වූ දෙයක් ද කියා කෙනෙකුට සිතෙන්නට පුළුවනි. කිසිසේත්ම නැත. සැබැවින්ම අපට කර්මයෙන් නිදහස් විය හැකිය. කර්මය වනාහි අනිත්‍ය වූ දෙයකි. නිරුද්ධ වන දෙයකි.

බුදුරජාණන් වහන්සේ ඒ පිළිබඳව මෙසේ වදාළ සේක. පින්වත් මහණෙනි, කර්මය නිරුද්ධ වීම යනු කුමක්ද? කාය කර්ම, වචී කර්ම, මනෝ කර්ම යන කර්ම නිරුද්ධ වීමෙන් විමුක්තිය ස්පර්ෂ කරයිද, මෙය වනාහි කර්ම නිරුද්ධ වීම යැයි කියනු ලැබේ.

ගෞතම බුදු සසුනේ උතුම් අරහත්වය ශාක්ෂාත් කළ ඒ නිකෙලෙස් මුනිවරුන් පරිපූර්ණ ලෙසම කර්ම නිරුද්ධ කළ සේක. අනාගාමී උතුමන් යළි කාම ලෝකයෙහි උපදින කර්ම ක්ෂය කළ අතර සෝවාන්, සකදාගාමී ශ්‍රාවක පිරිස සතර අපායේ විඳිය යුතු කර්ම ක්ෂය කර ඇමූහ. ඒ සඳහා වන ප්‍රතිපදාව ශාස්තෘන් වහන්සේ මහා කරුණාවෙන්, විස්මිත ප්‍රඥාවෙන් මෙසේ පෙන්වා දුන් සේක.

පින්වත් මහණෙනි, කර්මය නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව කුමක් ද? එය වනාහි මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ම ය. එනම් සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි වේ. මෙය වනාහි කර්ම නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව යැයි කියනු ලැබේ.



මහමෙව්නා භාවනා අසපු සංවිතයේ නිර්මාතෘ සහ අනුශාසක
**කිරිබත්ගොඩ ඥාණානන්ද හිමි**

# ජීවාට අද්භූත ඊ - මේල් පණිවිඩයක්

## ජීවාගේ ලෝකය

**බටුවන්ගල රාහුල හිමි ලියන යොවුන් නවකතාව**



**ජීවා පරිගණකයේ වැඩක් කර කර හිටියා. ඒ අතර එයාට ඕන වුණා එයාගෙ නමට විද්‍යුත් ලිපි තියෙනවා ද කියලා දැන ගන්න. මොකද? ඇය අන්තර්ජාලයේ මිතුරු ඇසුරක් පටන් අරගෙනයි තිබුණේ.**

ඒක නිසා ජීවාට නිතර ම යාළුවෝ විද්‍යුත් ලිපි එව්වා. තමන් කෙරුවේ මහ මෝඩ වැඩක් කියලත් එයාට නො හිතුණා නොවෙයි. ඒ තමන්ගෙ වයස, නම ඇතුළු පෞද්ගලික තොරතුරු අන්තර්ජාලයට එකතු කිරීම එච්චර හොඳ නැති බව මේ ලිපි කියවද්දි තේරුණ නිසා. ඒත් දැන් මොනවා කරන්න ද? ඊ - මේල් ලිපිනය වෙනස් කරන එක හැර එයාට වෙන දෙයක් තිබුණෙ නෑ.

කොහොම හරි ජීවාට එක අතකින් පාලුව මකා ගන්නත් මේ ලිපි කියවීම උපකාරයක් වුණා. සමහරු හොඳ මිතුරෝ. සමහරුන්ට මහ පුදුම ජාතියෙ ආසාවල් තියෙන්නෙ. ඒ අයගෙ යෝජනා, විවිධ කතා, කියවන කොට ජීවාට හිනාත් යනවා.

එදා ජීවාට තිබුණු ලිපිය හරි අමුතුයි. ඒක එවාපු කෙනාගෙ නම සීමන්... එයා ඉංග්‍රීසි ජාතිකයෙක් වෙන්න බැ කියලා හිතුණේ එයාගෙ ලිපිනය ලංකාවෙ එකක් නිසා. වෛරස් එකක් ද කියලා ජීවාට බවයි. නාඳුනන අයගෙන් එන විද්‍යුත් ලිපි විවෘත කිරීම හරිම මෝඩ වැඩක්. ඒ වගේ ම හරි භයානක දෙයක්. ඒත් ජීවාගෙ හිත කියන්නෙ ඒක විවෘත කරලා බලන්න කියලාමයි. ඕන දෙයක් වෙද්දෙන් කියලා හිතේ තිබුණු කුතුහලය හින්දා ම ජීවා ඒ ලිපිය විවෘත කරා.

“ජීවා ඔබ පිරිසිදු ද?

එච්චරයි ඒ ලිපියෙ තිබුණේ “පිස්සෙක්“ ජීවා තමන්ට ම කියා ගත්තා. එහෙම කියලත් ජීවා දන්නවා. දෙපාරක් උසස්පෙළ කරලා දෙමව්පියන්ගෙ බලාපොරොත්තු ඉෂ්ට කරන්න බැරි වුණ එකට ජීවා හිටියෙ තමන් එක්ක ම තරහෙන්.

ජීවා පරිගණකය නිවා දමා ඇඳට ගියා. කේන්ති ගියහම ජීවාගේ කම්මුල් මහත් වෙනවා. ඇස්වලට අලුතින් ලේ පිරිලා වගේ ජීවා කොට්ටෙ මූණට තද කරගෙන ඇස් දෙක පියා ගත්තා.

“ඩිංගක් නින්ද යනවා නම්“ හිත හිති ගත්තා ම නින්ද යන්නෙ නෑ. ජීවාට ඒක තේරිලා තිබ්බත් ඇය උත්සාහ කෙරුවා ඒක බොරු කරලා නිදා ගන්න. ඒ අතර එයාගෙ සැහැල්ලුවක් නෑ. එක එක මනස්ගාත ඔළුවට එනවා. තුනිවැනි පාරට විභාගෙ ගන්න ඕන. ඒත් ඒක කාගේ උවමනාවක් ද? කවුරු සතුටු කරන්න ද? මේසෙ පොත් ගොඩ බෝතල් පත්තර එකතු කරන කඩයක් වගේ. ඇඳ උඩ පොත් ටිකයි. මේසෙ උඩ තැනින් තැන පොත්. පොත් රාක්කෙ මකුළු දැල් දූවිලි පිරිලා.... “මං කිසි පිළිවෙළක් නැති කෙල්ලක්“ ජීවාට එහෙම හිතුණා. ඒත් එයාට කාමරේ අස් කරන්න කිසිම ආසාවක් නෑ. ජීවාට එක පාරට ම සීමන් මතක් වුණා. දෙයියනේ එයා අහලා තියෙන්නේ මේවා ගැන ද? ඒත් ඒ මනුස්සයා මගෙ කාමරේට ආවද...? මේ ප්‍රශ්නයක් අහන්න සීමන් කවුද? අනික එයාට තියෙන උවමනාව මොකක් ද? ජීවා ලිපිය මකලා දැම්මා. ඒත් ඒ

ප්‍රශ්නෙ ජීවාට හරි ප්‍රශ්නයක් වෙලා. මිතුරු හවුලෙ සාමාජිකයෙක් නො වන සීමන් එහෙම ප්‍රශ්නයක් ඇහුවෙ ඇයි....? ඒකෙන් එයා අදහස් කෙරුවෙ මොකක් ද? සමහරක් වෙලාවට එයාට දැනගන්න ඕන වෙලා ඇත්තෙ මා කන්‍යාවක් ද? කියලා වෙන්න ඇති.

“අනේ දෙයියනේ..... ඇයි එහෙම කෙනෙක් මගෙන් මේ වගේ ප්‍රශ්න අහන්නෙ...“ එහෙම නැත්නම් නාලා හොඳට පිරිසිදු ව ඉන්නව ද? කියන එක ද? කොහොම ඇහුවත් ඒකට දෙන්න ඕන පිළිතුර “ඔව්“ කියන එක. ඒත් ඉතින් ඇයි මං නො දන්න කෙනෙකුට එහෙමවත් උත්තරයක් ලියන්නෙ.

ජීවාගෙ හිත ටිකක් කලබල වෙලා. කොහොමත් හැම වැඩකදි ම ජීවා ටිකක් කලබලයි. අම්මා එක්ක කන්න ගියත් රන්ඩු තාත්ත එක්කත් රන්ඩු. තමන්ට ගුරුවරු දීලා තියෙන චරිත සහතිකේ එච්චර හොඳ නෑ ජංගම දුරකථනයට පණිවුඩයක්. ජීවා ඇඳ අයිනෙ තිබ්ච්ච දුරකථනය අරගෙන බැලුවා. කාගෙන් ද කියලා පණිවුඩය...

“ඇයි උත්තර නො දෙන්නෙ ජීවා..... ඊ - මේල් එකට උත්තරයක් එවනකම් මං බලා ඉන්නවා“

“ඇත්තට ම ඒ මනුස්සයට පිස්සු ද? ජීවා ඉක්මනින් දුරකථනය දිගේ ම මේ පුද්ගලයාට උත්තරයක් දෙන්න හිතුවා. ඇ ඉක්මනින් ටෙක්ස් බොක්ස් එකට ගිහින් ටයිප් කළා මෙහෙම.

“මං හැම අතින් ම පිරිසිදුයි...“

ජීවා පිළිතුර දුරකථනයේ තිබ්ච්ච අංකයට යැව්වා. ඒ පණිවිඩය ගිය බවට සංඥවක් නිකුත් වුණා.

“මට පිස්සු......... ඇයි? මං ඇයි ඒ මනුස්සයාට පිළිතුරක් යැව්වෙ.

එදා රෑ වෙනකම් ජීවාගෙ හිත අතරෙ අම්මා ජීවාට කන්න කතා කළා අම්මාගෙ වචන ජීවාට ගෙනාවේ අසතුටක්, කේන්තියක්. ඒ ඇයි කියලා ජීවාට තේරෙන්නෙ නෑ. අම්මාගෙයි තමාගෙයි අතර මොකක්දෝ නොගැලපීමක් තියෙනවා කියලා ජීවාට දැනෙනවා. තාත්තා නිශ්ශබ්දයි. ඒක ඊට වඩා එපා වෙනවා. තාත්තා තමාට කිසි වරදක් නොකළත් තාත්තා පිට කෙනෙක් විදියටයි ජීවාට දැනෙන්නේ. “අනේ මන්ද මට දැන් මා ළඟින් ම ඉන්න අයව පෙන්නන්න බැරි තරං“ ජීවාට ගෙදර පරිසරය එපාවෙලා වගේ.

ජීවා අන්තර්ජාලයෙ මිතුරු ඇසුරක් සෙව්වේ ඒ නිසා වෙන්නැති. එයාට සමීප වෙච්ච අය ගැන එපා වෙලා. ජීවාට කොට්ට උරෙන් එන පුස් ගඳ අපුලයි. “අම්මා මගේ කොට්ට උරේ හෝදලා නෑ. ෂි ජීවාගෙ ඇස් ආයිත් ඉදිමිලා.

ජීවා කෑම මේසෙට ගියේ තියෙන ඔක්කොම කනවා කියලා හිතා ගෙන. ඒත් හදලා තිබ්ච්ච ව්‍යාඤ්ජන දැක්කහම කෑම එපා වුණා. සලාද, පරිප්පු, අල, මාළු මේවා සේරම දැන් එයාට එපා වෙලා.

සලාද කොළ අස්සෙන් එළියට ආපු කෙස්ගහ දැක්ක ගමන් ජීවාට හරි අප්පිරියාවක් ඇති වුණා.

“ඇයි ය... සලාදෙ කෙස් “ජීවා කෑම පිගන මේසෙ එහාට තල්ලු කරලා නැගිට්ටෙ කේන්තියෙන්.

සීමන්ට අර ප්‍රශ්නෙ අහන්න තිබුණෙ මගෙන් ද? අම්මාගෙන්. මං අපිරිසිදු නම් මට කෙස් ගහ අප්‍රිය වුණේ කොහොම ද? අනේ මටත් පිස්සු... ඒ මනුස්සයාගෙ ලියුම ගැන ඇයි මං මෙච්චර හිතන්නෙ.“

ඇත්තටම ජීවාට තමන්ගේ හැම ක්‍රියාවක් එක්ක ම ඒ ලියුම මතක් වෙන්න පටන් අරගෙන. අන්තර්ජාලයේ මුණ ගැහිච්ච කිසිම මිතුරකුගෙන් එවැනි ලියුමක් ලැබිලා නෑ. ඒ ලියුම්වල තිබෙන යාංහැලි ජීවාට කිසිම මතකෙකුත් නෑ. ඒත් මේ පුංචි ප්‍රශ්නෙ....... නිතර ම දැං හිතට වද දෙනවා.

ජීවා ශීතකරණයෙන් ඇපල් ගෙඩියක් අරගෙන ඒක කටින් කඩා ගෙන කකා නැවත කාමරේට ගියා.

පරිගණකය විවෘත කරගත්ත ජීවා තමන්ගේ විද්‍යුත් තැපැල් පෙට්ටිය පරීක්ෂා කරා. ඒකට තවත් ලියුමක්. “අර පුද්ගලයාගෙන් අම්මපා ඒ මනුස්සයට වෙන වැඩක් නැතුව ද..?

**ජීවා ඔයා හරි අපිරිසුදුයි**

**මීළඟ කොටස තිකිණී අව අටවක පෝදා (30) පත්‍රයේ පළවේ.**



# මාතෘභූමිය ත්‍රස්තවාදීන්ගෙන් ආරක්ෂා කිරීමට අන්තර්ජාතික මතවාද පරාජයට දායක වුණා



**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ අමරපුර මම්මවංශාභිධජ සිරිසද්ධම්මයුක්තික මහා නිකායේ හිටපු මහා ලේඛකාධිකාරී බත්තරමුල්ල කොස්වත්ත KIU ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයේ උපදේශක කොළඹ හත්බෝධි විහාරාධිපති බොරැල්ල සුසුමයවර්ධන විද්‍යාලයේ ආචාර්ය ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත**

**අතිපූජ්‍ය ගලගම ධම්මරංසී නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.**

**කෙලිදෙළෙන් ගත කළ ළමා කාලයේදීම පුණ්‍යවන්ත පැවිදි ජීවිතය ඇලුම් කළ ඔබ වහන්සේ උසස් ජීවන දර්ශනයක් ගොඩනඟාගත් යතිවරයාණන් වහන්සේ නමක් වශයෙන් ප්‍රකටයි. ඔබ වහන්සේ ආ ගමන්මඟ පිළිබඳ අතීතාවර්ජනයක යෙදෙමින් සාකච්ජාවට ප්‍රවේශවෙමු අපේ හාමුදුරුවනේ,**

දකුණු පළාතේ මාතර ප්‍රදේශයේ පරවාහැර නමින් හඳුන්වන බොහොම සුන්දර ගැමි පරිසරයක උප්පත්තිය ලැබුවා. එමලින් බෝගහවත්ත සහ ජෝන් යන සදාදරණීය මව්පියන් බොහොම ශ්‍රද්ධා බුද්ධිසම්පන්න ගුණවත් මව්පිය දෙපළක්. ඒ වගේම අපේ පවුලේ මා ඇතුළුව දරුවන් හත් දෙනෙක් සිටියා. ඔවුන් සියලු දෙනාම දැන උගත් පිරිසක්.ඥතිවරුන් කිහිප දෙනෙකුම පැවිදිවී සිටි නිසා පැවිදි ජීවිතය කෙරෙහි ඇතිවුණ ආකර්ශනයත්, ගෞරවනීය මහා සංඝරත්නය කුඩා කල සිට ඉතා සමීපව ඇසුරු කිරීමත් නිසා පැවිදි වීමට ආසාවක් ඇති වුණා.

ඒ අනුව දෙවිනුවර ගන්දරාවත්තේ ශ්‍රී නිග්‍රෝධාරාමාධිපතිව වැඩ විසූ අමරපුර මම්මවංශාභිධජ සිරි සද්ධම්මයුක්තික මහා නිකායේ අධිකරණ සංඝනායක නරවැල්පිට සිරි පියරතන නායක හිමිපාණන් වහන්සේගේත්, කොළඹ නාරාහේන්පිට සිරි හත්බෝධි විහාරාධිපති අමරපුර සද්ධම්මයුක්තික මහා නිකායේ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වශයෙන් වැඩ විසූ රාජකීය පණ්ඩිත නරවැල්පිට ධම්මරතන මහානායක මා හිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් වලස්මුල්ල ඕලුආර ශ්‍රී පූර්වාරාම මහා විහාරාධිපතිව වැඩ විසූ කණුමුල්දෙණියේ සිරි සෝරත මහානායක මා හිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් 1974 වර්ෂයේදී දෙවිනුවර ගන්දරාවත්ත ශ්‍රී නිග්‍රෝධාරාම මහා විහාරස්ථානයේදී ගලගම ධම්මරංසී යන උත්තරීතර ශාසනික නාමයෙන් සංසාරගත පුණ්‍යශක්තියට අනුව උතුම් පැවිදි ජීවිතයට එළඹුණා.

අනතුරුව වත් පිළිවෙත් පුරුදු පුහුණු වෙමින් මාතර වෙහෙරහේන පූර්වාරාම රාජමහා විහාරස්ථ ශ්‍රී රේවත පිරිවෙන , මාතර සුදර්ශී පිරිවෙන යන පරිවේණාස්ථානයන් තුළින් ප්‍රාචීන භාෂා ශාස්ත්‍රය ඉගෙන ගෙන 1980 වර්ෂයේදී කොළඹ විශ්ව විද්‍යාලයට ඇතුළත්ව ශාස්ත්‍රවේදි උපාධිය ලබා ගත්තා. අධ්‍යාපන කටයුතු සිදුකළ කාලවකවානුවේදීම තිසි වයස් සම්පූර්ණ වීමත් සමඟ මා පැවිදි කළ ආචාර්යපාදෝත්තමයාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් හා එම උපාධ්‍යායන් වහන්සේගේම උපාධ්‍යායත්වයෙන් 1983 වර්ෂයේදී ගාල්ල ගිං ගඟනදී උදකුක්ඛේප සීමාමාලකයේදී උතුම් අධිශීල සම්පත්තිය ලැබීමට පුණ්‍යවන්ත වුණා.

1988 වර්ෂයේ සිට 1992 දක්වා ලිබියාවේ අල්පාතා විශ්ව විද්‍යාලයෙන් දේශපාලන විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමාව ලබා ගැනීමට කටයුතු කළ එම කාල වකවකවානුවේදී ම ලෝක නායකයින් හමුවී සාකච්ඡා කරමින් විවිධ අත්දැකීම් ලබා ගත්තා. නැවතත් ලංකාවට වැඩම කරමින් කොළඹ විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවත්,පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියත් ලබා ගැනීමට කටයුතු කළා.

**ඔබ වහන්සේගේ ධර්ම ශාස්ත්‍රීය සේවයත්,ජාතික, ආගමික, සාමාජික සේවයත් සිදුවුණේ කුමන ආකාරයෙන්ද ? හාමුදුරුවනේ,**

මට විශ්ව විද්‍යාල අධ්‍යයන කටයුතු අවසන් කිරීමට සිදුවුණේ 1988,1989 වැනි භිෂණ කාලයක. විශ්ව විද්‍යාලය තුළ ජාතික ශිෂ්‍ය ව්‍යාපාරවල කටයුතු කළ නිසා ම එම කාල වකවානුව තුළ විශාල වශයෙන් ජීවිත තර්ජන තිබුණා. අපිත් සමඟ සිටි කිහිප දෙනකුම මරණයට පවා පත්වුණා. එම කාලයේදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින් මා ලිබියාවට වැඩම කරවනු ලැබුවා. එහිදී ලිබියාවේ අල්පාතා විශ්ව විද්‍යාලය තුළ අධ්‍යාපනය ලැබූ කාලයේදී කර්නල් අල් ගඩාෆි, නෙල්සන් මැන්ඩෙලා, සැම් හුජුමා, යසර් අර්පත් , ඩැනියෙල් ඔටේගා, චාල්ස් ටේලර් වැනි ලෝක නායකයන් හමුවී සාකච්ඡා කොට විවිධ අත්දැකීම් ලබා ගත්තා. එහිදී ලෝක ජාතික විමුක්ති ව්‍යාපාරයේ සිටි බොහෝ නායකයන් මුණගැසීමේ අවස්ථාව උදාවුණා. මහින්ද රාජපක්ෂ මැතිතුමා මන්ත්‍රීවරයකුව සිටියදී යසර් අර්පත් පලස්තීන සහයෝගීතා ව්‍යාපාරයේ සභාපතිව කටයුතු කළා. මමත් එයට සහයෝගය ලබාදෙන ව්‍යාපාරයක සභාපති ලෙස කටයුතු කළා. මහින්ද රාජපක්ෂ මහතා සමඟ බල්ගේරියාවට, ලිබියාවට වැඩම කරමින් යම් යම් සංවිධාන සමඟ සාකච්ඡා කරමින් පලස්තීන ව්‍යාපාරයට සහයෝගය ලබා දුන්නා. එම කාලයේදී ම අපේ මාතෘභූමිය විනාශ කරමින් සිටි දෙමළ ත්‍රස්තවාදී කණ්ඩායම ත්‍රස්තවාදී කණ්ඩායමක් මිස සැබෑ විමුක්තිකාමීන්




නොවන බවත් ඔවුන් වෙත පැහැදිලි කරදෙමින් එම මතවාදය ජාත්‍යන්තරය තුළ රැගෙන යාමට මා තුළ පැවතුණ සම්බන්ධතාවය එම අවස්ථාවට ප්‍රයෝජනවත් වුණා. දෙමළ ත්‍රස්තවාදයට සහයෝගය ලබානොදෙන ලෙස මතවාදය රැගෙන ගියා. මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වශයෙන් බලයට පැමිණීමත් සමඟ දෙමළ ත්‍රස්තවාදය තුරන් කිරීමේ අරමුණින් පලස්තීනය, බල්ගේරියාව, ලිබියාව යන රටවල සහයෝගය බලාපොරොත්තුවෙන් එතුමා එම රටවලට ගිය අවස්ථාව සම්බන්ධීකරණය කිරීමට කටයුතු කළා. දෙමළ ත්‍රස්තවාදීන්ගෙන් මාතෘ භූමිය මුදවාගැනීමේ අවස්ථාවන්හි ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් ජාත්‍යන්තරව කළ හැකිව තිබූ සියලු දේ මගේ ශක්ති ප්‍රමාණයට සිදුකළා.

විදේශගත විහාරස්ථාන සම්බන්ධතා මත පදනම්ව ලංකාවේ සුභ සාධන,අධ්‍යාත්මික, අධ්‍යාපනික, සංවර්ධන වෙනුවෙන් අපරිමිත සේවයක් කිරීමට හැකියාව ලැබුණා. ඒ අනුව සුනාමි ව්‍යසනයේදී නිවාස 500 කට අධික ප්‍රමාණයක් ඉදිකිරීමටත්, මුහුදුතීරයේ සම්පූර්ණව නටඹුන්ව පැවැති විහාරස්ථාන 36 ක් නැවත නඟා සිටුවීමටත්, පාසල් දරුවන් 500 කට අධික ප්‍රමාණයකට අවශ්‍ය පාසල් උපකරණ ලබාදීමටත්, කටයුතු කළා. කොරෝනා වසංගතය හමුවේදීත් බොහෝ ජනතාව වෙනුවෙන් වියළි ආහාර ලබාදීමට කටයුතු කළා. අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් මහන මැෂින් 100 කට අධික ප්‍රමාණයක් ලබාදීමටත් කටයුතු කළා. බත්තරමුල්ල කොස්වත්ත **KIU** ජාත්‍යන්තර විශ්ව විද්‍යාලය ආරම්භ කිරීමේදී ඒ සඳහා පුරෝගාමීව කටයුතු කළ බවත් සිහිපත් කළ යුතුයි.

ජපානය,තායිලන්තය,මාලදිවයින,සිංගප්පූරුව,ඉන්දියාව,පාකිස්ථානය,ස්විට්සර්ලන්තය ආදී පෙර අපරදිග රටවල් තිහක පමණ ධර්මදූතයකු, පරිසරවේදියකු ලෙස කටයුතු කළා.

ශාස්ත්‍රීය ලේඛන වශයෙන් ශ්‍රී ලංකාවේ සියම් අරගලය,ජනවාර්ගික අර්බුදයට විසඳුම්,පංචශීල ප්‍රතිපත්තිය,මා පිය සංග්‍රහය,කාන්තා විමුක්තිය ආදී ග්‍රන්ථ රචනා කිරීමටත්,සතිපට්ඨානය හා භාවසන්නස ග්‍රන්ථ නැවත සංස්කරණය කිරීමටත් කටයුතු කළා. ඒ වගේම මරදාන සංඝරාජ විද්‍යාලය,තිබ්බිරිගස්යාය විද්‍යාතිලක විද්‍යාලය යන පාසල් තුළ ආචාර්යවරයකු ලෙස සේවය කළා. බොරැල්ල සුසීමයවර්ධන විද්‍යාලයේ ආචාර්යවරයකු වශයෙන් සේවය කරනවා. වලස්මුල්ල සිරිදේව සිංහාරාමය,ගන්දරාවත්ත ශ්‍රී නිග්‍රෝධාරාමය,කඹුරුපිටිය සුභද්‍රාරාමය, යන විහාරස්ථාන මගේ අධීක්ෂණය යටතේ එහි වැඩසිටින ස්වාමීන් වහන්සේලා ජාතික,සාමාජික,ශාසනික කටයුතු සිදුකරගෙන යනවා.

**සුපේෂල ,ශික්ෂාකාමී,බහුශ්‍රැත ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වශයෙන් දේශීයව හා විදේශීයව ලබාගත් දැනුම් සම්භාරය ආශ්‍රයෙන් හැදෙන වැඩෙන ස්වාමීන් වහන්සේලාට ලබාදෙන උපදෙස් මොනවගේද ?හාමුදුරුවනේ**

ආගමික,ජාතික වශයෙන් විශාල කාර්යභාරයක් භික්ෂූන් වහන්සේලා වෙත පැවරිලා තිබෙනවා. ලංකාවේ භික්ෂූන් වහන්සේලා හුදෙක් පාංශුකූලයට, දානයට, බණට, පිරිතට පමණක් සීමාවෙලා සිටිය යුතු නැහැ. එවැනි ශාසනික ඉතිහාසයක් අපට තිබ්ලත් නැහැ. අපේ රටේ භික්ෂූන් වහන්සේලා ආත්මාර්ථකාමිත්වයෙන් තොරව පරාර්ථකාමී ලෙස සුවිශාල ශාසනික කාර්යයක නියැළෙන බුද්ධ පුත්‍රයන් වහන්සේලායි. ජාතියේ මුරදේවතාවුන් වහන්සේලායි. තායිලන්තය බුරුමය වැනි රටවල භික්ෂූන් වහන්සේලා අතර එවැනි පළල් බවක් දකින්න අපහසුයි. සංසාරික විමුක්තිය සඳහා අවශ්‍ය අධ්‍යාත්මික පරිසරය ගොඩනගමින් බොහෝ ජාතික,ආගමික, ශාසනික කාර්යභාරයක් කළ හැකියි. විහාරස්ථානයකට පමණක් කොටුවෙලා සිටීමෙන් පාසලට හෝ විහාරස්ථානයට පමණක් එම සේවය සීමාවෙන්න පුළුවන්. ජාත්‍යන්තර වශයෙන් පවා ස්වාමීන් වහන්සේලා වෙත ශක්තිය ලබාදෙන කණ්ඩායම් විවිධ සැදැහැවතුන් සිටිනවා. එම නිසා රට ජාතිය වෙනුවෙන් බොහෝ සේවයක් කළ හැකියි. භික්ෂුවගේ කාර්යභාරය අධ්‍යාපනික විමුක්තිය සහ පරාර්ථකාමිත්වයෙන් තොරව භික්ෂු භූමිකාවක් ඇත්තේ නැහැ

**හේමමාලා රන්දුනු**

# අනුන්ගේ දුකේ දී හදවත කම්පාවීම මිනිසත්කමයි

**සත්වයන් අතර දියුණු ම ජීවියා මිනිසා ය. ලද මිනිස් ජීවිතය එතරම් ම දුර්ලභ ය. එය වැටහීමට නම් අසම්පූර්ණ ජීවිතයක් හෝ තිරිසන් ආත්මයක් ලද යුතු ය. බුද්ධ දේශනාවට අනුව මිනිස් වෙසින් සිටින ප්‍රේත, තිරිසන්, යක්ෂ කොට්ඨාශ ද ඇතැම් විට සිටිය හැකිය. වඩා වැදගත් වන්නේ මිනිස්කම අවභාවිත නොකරන මිනිසකු වී ඉපිද ඒ ගෞරවය සහිතව මිය යෑමට හැකියාව සකසා ගැනීම යි. ඇතමුන් ට මේ තත්වය තේරුම් ගැනීමට නොහැකිවීම කනගාටුවට කරුණකි.**



මේ පවතින තත්වය මිනිස්කම ප්‍රදර්ශනය කළ හැකි හා මිනිස්කමට වැඩි වටිනාකමක් ලබා දිය හැකි කාලසීමාවකි. එය ආකාර දෙකකින් සිදු කළ හැකි ය.

එහි පළමු පැත්ත වනුයේ පුරවැසියෙක් ලෙස පුරවැසි යුතුකම් මනාව හඳුනාගෙන රජයට අවනත වීමයි. මෙහි දී එන්නත ලබා ගැනීම ප්‍රමුඛ වේ. එපමණක් නොව ඒ කාලසීමාවේ දී හෝ මත්පැන් , දුම්වැටිවලින් සම්පූර්ණයෙන් ම ඉවත් විය යුතු ය.

මිය ගිය බහුතරය පිරිමින් වේ. එයින් ද මත්ද්‍රව්‍ය, දුම්වැටිවලට ඇබ්බැහි වූවන්ගේ ප්‍රමාණය වැඩි ය. එවන් තත්වයක දී එන්නතෙන් නියමඵල නෙළා ගැනීමට හැකියාව ඇතිවන්නේ නැත.

තවද තමන් රෝග වාහකයෙක් නොවී ඉතා පොඩි වෙනසක් දැනුන විගස ස්වයං නිරෝධායනයට යොමුවීම ඉතා වැදගත් ය. අත්‍යවශ්‍ය නොවන හැම විට ම නිවසින් බැහැර නොයාමට වගබලා ගැනීම ඉතා වැදගත් වේ. එවන් දෑ සිදු වූයේ නම් එම අඩුපාඩුව සකසා ගෙන දහමෙහි දක්වන ආයතිසංවරය සකසා ගැනීමට වගබලාගත යුතුය.

මෙහි අනෙක් කාරණය වන්නේ කිසිවෙකු මෙවැනි රෝගයක් ආසාදනය වීමට කැමැත්තක් නොදක්වයි. එසේ ආසාදනය වූවකු දිහා වෛරයෙන්, ක්‍රෝධයෙන්, සැකයෙන් නොබැලීම මනුස්ස ගතියයි.

අපේ මිනිසත්කම උපරිමයෙන් පෙන්වීමට මෙය කදිම අවස්ථාවකි. රෝගියෙක් හෝ ආශ්‍රිතයෙකු වීම නිසා ඔවුන් මානසිකව ඇදවැටේ. එය සාමාන්‍ය තත්වයකි. ඒ අසරණ බව ඇතැම්විට වචනයෙන් කිවහැකි නොවේ. මෙවන් අවස්ථාවක අනෙකාගේ කරුණාව උදව්ව අවශ්‍යය. එවන් මොහොතක ඔවුන් ත්‍රස්වාදීන් ලෙස සැලකීම යුතු නොවේ. රෝගය වැළදෙන සියල්ලෝ ම මරණයට පත් නොවේ. හෙට දවසේ ඔවුන් සුවය ලද විට ඔවුන් සමග ගනු දෙනු කිරීමට සිදුවේ. එහෙයින් තමාගේ ආරක්ෂාව සලසාගෙන ඔවුන්ට කළහැකි යමක් ද එය සිදු කිරීමට මැලි නොවිය යුතු ය.

මන්දයත් ජීවිතය කුමකින් හෝ අවසානයකට පත්වේ. මේ කාලය තුළ ඊට අදාළ ගමන් වියදම් සකසා ගැනීම ඉතා වැදගත් වේ.

බුදුරදුන් නියම බුද්ධ පූජාව ලෙස සඳහන් කළේ රෝගීන්ට සැලකීමයි. රෝගීන්ට සැලකීම තමන් වහන්සේට සැලකීම හා සමාන බව බුද්ධ දේශනාවේ සඳහන් වේ. හමුවී කතා කිරීමට, උදව්කිරීමට මෙය අවස්ථාව නොවුණු ද දුරකතනයෙන් හෝ අවශ්‍යතා විමසා හැකි පමණින් උදව් කළ හැකි ය. ඇතැම් විට පවුල්වල මරණ පවා සිදු වී ආශ්‍රිතයන් මහත් වේදනාවෙන් කල්ගත කරයි. එවන් විටක මිනිසා ගේ යුතුකම තම හැකියාව මත ඔවුන්ට වචනයෙන් හෝ උදව් කිරීම යි. දහමෙහි පරාර්ථචර්යාව ලෙස විස්තර වන්නේත් සතර සංග්‍රහවස්තු තුළ අර්ථචර්යාව වශයෙන් දක්වන්නේත් මේ කාරණය යි.

> **ජීවිතය කුමකින් හෝ අවසානයකට පත්වේ. මේ කාලය තුළ ඊට අදාළ ගමන් වියදම් සකසා ගැනීම ඉතා වැදගත් වේ.**

අපට කායිකව, මානසිකව, භෞතිකව, සිතුවිලි තුළින් මේ කාර්ය සිදුකළ හැකි ය. මේ කළමනාකරණයකින් වුව ද, අනෙකාට පිහිට වීම ඉතා වැදගත් වේ. පර අර්ථය සැලසීම හැමෝට ම කළ හැක්කක් නොවේ. ඒ සඳහා කරුණාව හා මෛත්‍රිය අවශ්‍යය.

මෙහි දී කරුණාව යනු, අන් දුකේ දී හදවත කම්පාවීම පමණක් නොව ඔවුනට ඒ වෙනුවෙන් කළ හැකි යමක් ද එය සිදු කිරීමයි. මෛත්‍රය යනු, හිතවත්කමයි. එසේත් නැති නම් , මිත්‍රත්වයයි. මිත්‍රව ආකල්ප සකසා ගත හැකි වීම ඉතා වැදගත් ය. එහි දී අනෙකාට තමන්ගේ ලෙන්ගතුකම ප්‍රදර්ශනය කළ හැකි ය. බොහෝ පිරිස් අනෙකාට අකෘතඥ අකාරුණික ලෙස සැලකීමට පෙළඹෙන්නේ මෙම ආකල්ප නැති නිසාවෙනි.

එහෙයින් තමාගේ සිතට එබී තමන් තුළ කොතරම් ප්‍රමාණයකට මේ ගුණයන් ඇති ද කොපමණ ප්‍රමාණයකින් දියුණු කරගත යුතු ද යන්න සොයා බැලීම තුළ ආත්මලාභය හා ආත්ම තෘෂ්ණාව නැති වී යයි. එවන් තත්වයක දී මේ පවතින තත්වය නිවැරදිව තේරුම් ගැනීමට සමත් වේ. දිවාරෑ පින් වැඩෙන පින්කම් අතර පර අරමුණු වෙනුවෙන් තමන්ගේ කාලය, ශ්‍රමය, ධනය යොමු කිරීම එකකි.

විශේෂයෙන් සම්බුද්ධ චරිතය තුළින් ඒ සඳහා බොහෝ ආදර්ශ ගත හැකිවේ. නියම ලෙස බුදුන් සරණ යනවා යනු, උන්වහන්සේ පෙන්වා වදාළ මාර්ගය අනුගමනය කිරීමයි. තථාගතයන් වහන්සේ වසර හතළිස් පහක් පුරාවට දින 16425 නොකඩවා පරාර්ථය වෙනුවෙන් කැප කළහ. සැම දිනයක් ම බෙදා ගනිමින් ඒ ඒ අවස්ථා ව බොහෝ පිරිසකට යහපත වෙනුවෙන් හැසිරුනාහ.

උන්වහන්සේගේ පාදස්පර්ව අප රටේ බහුතරය මේ ගුණයන් මත සිරවීම එක් අතකින් නිවැරදි විශ්ව ශක්තිය රටට සහ ජනතාවට ලැබීමට ඉවහල් වේ. මෙවැනි අවස්ථාවක අපේ සිතිවිලි ධාර්මික, අසාහසික සිතිවිලි වීම ඉතාම වැදගත් ය. යම් සත්‍ය ක්‍රියාවක් හෝ සිදු කළ හැක්කේ එවන් පසුබිමක පමණි.

රෝගීවීම සියල්ලන්ට ම පොදු වේ ගිරිමානන්ද සූත්‍රයට අනුව කාරණා හයක් මත අප රෝගී වේ. උදාහරණයක් ලෙස සෙම ශරීරයේ කොටසකි. එය සියල්ලන් තුළම ඇතුළත් ය. එම සෙම කෝපවීම නිසා ලෙඩ ඇතිවේ. එහෙයින් සෙම ඇති සියල්ලෝ ම මෙය තේරුම්ගත යුතුව ඇත.

අනෙක් ඉන්ද්‍රියන් ද එසේ ම ය. ඒ ඒ ඉන්ද්‍රියන් සියල්ලෝට ම ඇති නිසා රෝග වැළඳීම සිදුවේ. එය තේරුම්ගෙන ආරෝග්‍ය මදය අඩු කර ගැනීමට කටයුතු කිරීම වැදගත් වේ.

කෙනෙකු අකාරුණික වී අනෙකා ඔහුගේ රෝගී තත්ත්වය හෑල්ලුවට ලක් කරනුයේ මෙම ආරෝග්‍ය මදය නිසා ය. බුදු දහමට අනුව සෞඛ්‍ය සම්පන්න යනු කායික නීරෝගීභාවය පමණක් නොවේ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ වර්තමාන විවරණය ද ඊට සමාන ය. එනම් කායික, මානසික සාමාජීය, ආධ්‍යාත්මික සමතුලිත භාවයයි.

එහෙයින් ආරෝග්‍ය මදය සකසා ගැනීම අර්ථවත් නොවේ. සමාජයට කරුණාව, දයාව, ලෙන්ගතුකම් අවැසි වෙලාවක එසේ නොකර සිටීම මිනිස්කමට නිගරුවකි. පූතිගත්තතිස්ස හිමියන්ට බුදුරදුන්ගේ උපස්ථානය මෙහි දී අප සිහියට නගා ගත යුතු ය.



කොළඹ මහානාම විද්‍යාලයේ
ආචාර්ය
කොලොන්නාව පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**

# නිවැරැදිව සංඝික දානයක් දෙන්නේ මෙහෙමයි

**දන්දීම බොහෝ ශාස්තෘන් වහන්සේලාගේ දහම් තුළ හඳුන්වා දී ඇත. එහෙත් ඒවායේ පරමාර්ථ විවිධ ය. බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළ දේශනා කොට ඇත්තේ දන් දෙන්නා සතු යම් වස්තු තිබේ ද සාධාරණව උපායගත් ඒවා කෙරෙහි ඇති ලෝභකම ටිකෙන් ටික තුනීකර ගැනීමට දන් දිය යුතු බව ය.**

මක්නිසා ද? ලෝභකම හෙවත් ආසාව – තණ්හාව – තෘෂ්ණාව යමෙකුට දුකට හේතුවන බවත් දන්දීම සැපයට කාරණයක් වන බවත් සලකා ය. එහෙයින් සියල්ලෝ සැපයට කැමැති වන හෙයින් බුද්ධ දේශනාවේ පින්කම් අතර “දානය“ ප්‍රථම ස්ථානයෙහිලා දේශනා කළ සේක.

බුද්ධෝත්තමයකු වසර කල්ප කෝටි ගණනකට වරක් මිනිස් ලොව පහළවන්නේ, ලැබූ ජීවිතය පුරා හෝ සසර පුරා හෝ මිනිසුන් විඳින කිසියම් දුකක් වේ ද ඒවායින් මුදවා ගෙන සැප ලබාදෙන දහම් ඇතුළත් අනුශාසනා කියාදීමට ය. එසේ දේශිත ධර්මයේ උත්තම සැපය වනුයේ නිවන් සැපය ම වේ. යමෙකු මේ පරමනෂ්ඨාවට (අන්තිම කෙළවර) යාමට සිත ඇත්තේ නම් පළමු කොට කළ යුත්තේ යහපත් අරමුණු ඇතිව දන්දීම පුරුද්දක් කර ගැනීම ය. දන්දීමට කැමැත්තක් – පුරුද්දක් නැත්තේ නම් කය – වචනය සංවර කරගන්නා ශීලය නොරැකේ. දාන – සීල දෙක නැත්තේ නම් කෙනෙක් භාවනා කළත් සිත සන්සුන් කිරීමට උත්සාහ කළත් එය පහසු නොවේ.

බුද්ධ දේශනාවේ ඇති අනුපිළිවෙල කථාවේ ද අංක එක වනුයේ දාන කථාය. ත්‍රිපිටක දේශනාව පුරාම ඒ ඒ අවස්ථාවන්ට හා පුද්ගලයන් අරභයා බුදුරජාණන් වහන්සේ දේශනා කළ දාන කතා ඇතුළත් විවිධ දේශනා රාශියක් ඇතිමුත් දැන් අපි මාතෘකාවට අදාළ සරල කෙටි සටහනක් මෙසේ දක්වමු.

බුදුරජාණන් වහන්සේගේ කිරි මව් මහා ප්‍රජාපතී ගෝතමිය වරක් බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් ම සිවුරු පිළියෙළ කිරීමට සුදුසු අලුත් වස්ත්‍ර දෙකක් තමා විසින් ම කපු ගෙනවිත් නූල් සාදා ගැනීමේ පටන් ම වියා ගොතා සකසා ගෙනවිත් මට අනුකම්පා පිණිස පිළිගන්වා” සේක්වා'යි බුදුරජාණන් වහන්සේට පූජා කළා ය.

“ගෞතමී මැණියනි. එය සංඝයාට පූජා කරන්න. සංඝයා විෂයෙහි දුන් කල එය මට ද පුදන ලද්දෙමි වෙමි'යි. සංඝයාට ද පුදන ලද්දේ වේ යැයි, වදාළ සේක. ස්වාමිනී, වස්ත්‍ර යුගල භාග්‍යවතුන් වහන්සේ ම උදෙසා මවිසින් ම වියන ලද්දකි. මට අනුකම්පා පිණිස එය පිළිගන්නා සේක්වායි“ දෙවන වරද සැල කළාය. බුදුරජාණන් වහන්සේ දෙවන වරද පළමු සේ ම වදාළ සේක. තෙවන වරද එසේ ම වූයේ ය. මෙසේ වූයේ මක් නිසා ද? ඒ පළමු සුළු මැණියන්ට වැඩියෙන් පින් රැස් කර ගැනීම සඳහා ය. නැතිනම් එය පුද්ගලික දානයක් වී ලැබෙන පින් අඩුවෙන බව බුදුරජාණන් වහන්සේ අපට කියාදුන් තැනකි මේ.

මෙය ද සිහිපත් කළේ අපි දෙන බොහෝ සාංඝික දාන දැන් පුද්ගලික දාන බවට පත් වී ඇති බව දන් දෙන ශ්‍රද්ධාවත් බහුතරයක්නොදැන සිටින බව පෙන්වා දීමට ය. ඒ කෙසේ ද? තමන් නිවෙසට වඩම්මවා සංඝගත දක්ෂිණාවක් දීමේ දී බොහෝ දෙනා කැමැති තමන් දන්නා හඳුනන සමීප ව අසුරු කරන ස්වාමීන් වහන්සේලා, ඒ දානයට වැඩියොත් හොඳ යන්න ය.

මේ අතර තමන් නොදන්නා ස්වාමීන් වහන්සේලා, පුංචි සාමණේර ස්වාමීන් වහන්සේලා මෙන් ම තමා පුද්ගලිකව දැන සිටින සිල්වත්කමින් අඩු ස්වාමීන් වහන්සේලා තමන්ගේ නිවසේ දානයට වැඩමකර සිටී නම් ඔහු කළකිරීමට පත්වේ. මෙයින් වන්නේ පුද්ගලික දානයක් කොට අඩුකර ගත් පින තවත් අඩු කර ගැනීම ය.

එහෙයින් මෙහි දී ද බුදුරජාණන් වහන්සේගේ දේශිත ධර්මයෙහි සඳහන් වන්නේ ඔබේ නිවසට ආරාධිතව දානයට වැඩම කරන්නේ බුදු පියාණන්ගේ බුද්ධ පුත්‍ර රත්නයක් සේ සලකන ලෙස ය. එසේ ඔබ සලකා දන් දුනහොත් ඔබ ඔබේ දානවස්තු පූජා කොට ඇත්තේ රහතන් වහන්සේ නමකට ය. එවිට අපට ලැබෙන පින අතිමහත් ය.

බුදුරජාණන් වහන්සේ ඇයි මෙසේ අනුශසනා කොට ඇත්තේ? වසර පන්දහසක් කල් පවතින මේ බුද්ධ ශාසනය බුදු වී වසර 45 වැඩ සිටි බුදුරජාණන් වහන්සේ පිරිනිවීමෙන් පසු තුන් කල් හිම ආරක්ෂා කරන්නෝ බුද්ධ චීවරය නම් වූ අරහත් ධජය දරන මේ බුද්ධ පුත්‍රයෝම ය. අනෙකක් නැත.

එමෙන් ම අපේ ගමේ පන්සලේ අද වැඩ සිටින කුඩා සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේ නමක් වේ ද කුමන අඩුපාඩු තිබුණත් මේ සියල්ලෝ බුද්ධ පුත්‍ර කොණ්ඩඤ්ඤ – සාරිපුත්‍ර – මොග්ගල්ලාන අරහත් සංඝ පරම්පරාවේ අවිච්ින්න නියෝජනය දරන්නාහු ය.

මේ නිසා භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ,

ඔබේ නිවසට දානයට වැඩමකර සිටින්නේ රහතන් වහන්සේ නමක් සේ සලකා උපස්ථාන කරන්නේ නම් අපට ලබා ගත හැකි පුණ්‍ය සම්භාරය බෙහෝ වන බව වදාළේ ය.

මෙසේ ගත් විට වැඩම කළ භික්ෂූන් වහන්සේගේ සිල්වත් – දුසිල්වත් බව දන් දෙන්නාට අදාළ නැත. ඒවායේ ආනිසංස උන්වහන්සේලා සතු ය. බුදුරජාණන් වහන්සේ වදාළේ දන්දෙන දායකයාට වැඩි ආනිසංසයක් ලැබෙන අයුරු වේ.

අපි මෙතෙක් කතා කළේ සාංඝික දානයක් දීමට පෙර හෝ දීමට තීරණය කරගත් දින සිට අපගේ සිත සකසා ගත යුතු අයුරු ය. එය දාන කතා විස්තරවල පූර්ව චේතනාව ලෙස සඳහන් වේ.

දන් දෙන අවස්ථාවේ දාන වස්තු කෙරෙහි තමාගේ තිබූ ලෝභකම්. ආසාව අත්හැරීම මුඤ්චන චේතනාව ලෙසත් දානය දීමෙන් පසු ඇති කරගත යුතු සිත අපර චේතනා ලෙසත් නම් කර ඇත.

අප සංඝගත දක්ෂිණාවක් දීමේ දී දිනයක් තීරණය කොටගෙන ගමේ පන්සලට ගොස් විහාරාධිපති ස්වාමීන් වහන්සේ හමුව සතුට දනවන කෙටි පිළිසඳරකින් පසු බුලත් කොළ 10 කට වැඩි ප්‍රමාණයක් පිළිගන්වා වැඳ දිනය දන්වා අවශ්‍ය ස්වාමීන් වහන්සේලා ගණන කියා තම නිවසේ දානයට ආරාධනා කළ යුතු ය. එතැන් සිට දාන දිනය දක්වා තමන්ට හැකි උසස් ම අයුරින් ඒ සඳහා සූදානම් විය යුතු ය.

මෙසේ දානයක් දීමේදී වස්තු සම්පත් තුනක් මැදිහත් වේ.. දන් ලබන්නා, දන් පුදන්නා, දාන වස්තු වශයෙනි.

ඔබෙන් දන් ලබන්නා, කවරෙක් ද යන්න පිළිබඳ ඔබේ සිත සකස් කර ගත යුතු අයුරු ආරම්භයේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කළෙමු. එහෙයින් තමාට හැකි අයුරින් උසස් ම පූජාර්හ පූජාවකට දානයේ පූර්ව කටයුතු සඳහා සූදානම් විය යුතු ය. දාන වස්තුව (දෙය්‍ය ධම්ම) මෙහිලා ඉතා වැදගත්වන අතර එය සාධාරණ ව උපයාගත් ධනයකින් පිළියෙල වූවක් වීම ද පින මහත්වීමට උපකාරක වේ.

එනිසා තරගකාරී දාන නොව තමන්ට හැකි උපරිම අයුරින් සැකසීම ප්‍රමාණවත් වේ. දුන් දානයේ විපාක දනිමු යන පිරිසුදු වූ සිතින් පූජා බුද්ධියෙන් යුතුව දානය හා ඒ හා බැඳි හැම කටයුත්තක් ම අනුන්ලවා නොව තමන් ම මැදිහත් ව පිළියෙළකොට කරන්නේ නම් එය සකසා දන්දීම“ යනුවෙන් ද කියැවේ.

දානය දිනයේ දී විහාරයේ බුදුගෙට බුද්ධ පූජාව නිවසින් සකස් කොටගෙන ගොස් ස්වාමීන් වහන්සේ නමක් මුල්කොට එම පූජාව පවත්වා, ගෞරව පෙරදැරිව හැකිනම් උඩුවියන් සහිතව සර්වඥ ධාතු සහිත කරඬුව පෙරටුකොට මහ සඟ රුවන පෙරහරින් නිවසට වැඩම කළ යුතු ය.

නිවස සමීපයේ දී හෝ අනිවාර්යයෙන් උඩුවියන් – පාවඩ සූදානම් කොට ගෙහිමියා පෙර මඟට ගොස් වැඳ වැඩම කරන ස්වාමීන් වහන්සේලා පිළිගෙන පා සෝදා අසුන් ගැන්විය යුතු ය. උඩුවියන් – පාවඩ – මුතුකුඩ – පන්සලෙන් ලබා ගත හැක.

අනතුරුව මෙය බුද්ධ ප්‍රමුඛ දානයක් ලෙස සලකා වඩම්මවාගත් කරඬුව විශේෂ ආසනයක වඩා හිඳවා පිළියෙල කළ දානයේ අග්‍ර කොටස ලෙස බුදුරජාණන් වහන්සේ වෙත ශ්‍රද්ධා සිත් ඇතිව ආහාර සහිත පරිෂ්කාර පූජාව ප්‍රථමයෙන් පූජා කළ යුතු ය. අනතුරුව නිතර දන් දී පුරුදු අයගේ සහාය ලබාගෙන ස්වාමීන් වහන්සේලා වෙත අනුපිළිවෙළින් පූජා වස්තු පිළිගැන්වීම සිදු කළ යුතු ය.

බුද්ධ කාලයේ බොහෝ දන් දෙන ගෙවල්වලට අනේ පිඬු සිටුතුමා හෝ විශාඛාවෝ හෝ කැඳවාගත් බව සඳහන් ව ඇත. සැරියුත්, මුගලන් අරහත් මහ සඟ පරපුරේ වර්තමාන නියෝජනය ගෙදරට වැඩම කළ එක් සාමණේර භික්ෂුවගෙන් වුව පරිපූර්ණ වේ. එනමුත් සම්මත වශයෙන් සිවු නමක්වත් දානයට වැඩම කර සිටීම ප්‍රමාණවත් වේ.

මෙසේ ශ්‍රද්ධා සිත් ඇතිව දාන කටයුතු පිරිකර පූජා කොට අවසන් කිරීමෙන් පසු එක් ස්වාමීන් වහන්සේ නමක් භුක්තානු මෝදනා දහම් දෙසා දුන් දෙයට විපාක ඇති අයුරු දක්වමින් දානානිසංස දක්වා වදාරති. මනාව එයට සවන් යොමු කොට සිත් සතුටු කර ගැනීමට දන් දුන් දායකයා වග බලා ගත යුතු ය.

මේ සතුට මරණය තෙක් නැවැත නැවැත සිහිපත් කිරීමෙන් කරගත් පින්කම ටිකෙන් ටික වැඩි දියුණු වේ. අවසානයේ දී සෙත් පිරිත් දෙසා පිටත් ව යන ස්වාමීන් වහන්සේලා පසු පස මද දුරක්වත් ගොස් ගෞරව කිරීම තමන්ට පින් රැස් කර ගැනීමට කළ උපකාරයට කෘතවේදී වීමක් සේ සැලැකේ.



> **තරගකාරී දාන නොව තමන්ට හැකි උපරිම අයුරින් සැකසීම ප්‍රමාණවත් වේ. දුන් දානයේ විපාක දනිමු යන පිරිසුදු වූ සිතින් පූජා බුද්ධියෙන් යුතුව දානය හා ඒ හා බැඳි හැම කටයුත්තක් ම අනුන්ලවා නොව තමන් ම මැදිහත් ව පිළියෙළකොට කරන්නේ නම් එය සකසා දන්දීම“ යනුවෙන් ද කියැවේ.**

සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයේ ලේකම්
(බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව)
**කේ.කේ. සුගතපාල**

**සාංඝික යන වචනය කන වැකෙත්ම බොහෝ දෙනා සිතන්නේ භික්ෂූන් වහන්සේලා නිවසට වැඩම කරවා සිදුකරනු ලබන ආහාර පූජාව හා සම්බන්ධ සකල විධ ක්‍රියාකලාපයයි.**



# දානයක් සාංඝික කිරීමට උපසම්පන්න එක් නමක් වුණත් ප්‍රමාණවත්

එනිසාම එය කටවහරේ දී සාංඝිකය වේ. “අපේ ගෙදර සාංඝිකයක් තිබෙනවා” යැයි කෙනකු ප්‍රකාශ කළහොත් අසන පුද්ගලයා නිසැකව ම එයින් තේරුම් ගන්නේ ඉහත කී අර්ථයයි. මේ, වචනයෙහි අර්ථය පටු කොට ගැනීමකි. සාංඝික යන්නෙහි අර්ථය වන්නේ සංඝයා වහන්සේට අයත් යන්නයි. සංඝයා අයත් දෑ ආහාර පමණක් ම ද? නැත. සාංඝික කොට පූජා කරන ලද, විනයානුකූල ව භික්ෂූන් වහන්සේට කැපසරුප් සියලු දෑ ඊට අයත් වේ.

මෙහිදී අප සලකා බලනුයේ මෙම සාංඝික කිරීම හෙවත් සංඝයා සතුකොට යමක් පූජා කිරීමට භික්ෂූන් වහන්සේලා කොපමණ සංඛ්‍යාවක් සිටිය යුතු ද? යන්නට පිළිතුරක් සපයා ගැනීමයි. මන්ද යත් වර්තමානයේ සමහර ගිහි බෞද්ධ ජනතාව මෙන්ම භික්ෂූන් වහන්සේලා ද මෙරට වැඩිපුරම සඟසතුව කෙරෙන පූජාව වන දානමය පින්කම (ආහාර) සම්බන්ධ ක්‍රියාවලියට උපසම්පදාව ලත් භික්ෂූන් වහන්සේලා හතර නමක් අනිවාර්යයෙන් සිටිය යුතුය යන අදහසක් පිළිගෙන ප්‍රකාශ කරන නිසා ය.

මෙම මතයේ සත්‍යා අසත්‍යතාව දැන ගන්න නම් ත්‍රිපිටක දහම උපයෝගී කරගත යුතු ය. බුදුරජාණන් වහන්සේ ජීවමාන අවධියේදී බොහෝදුරට දායක පක්ෂය විසින් සාංඝික ව පූජා කළේ සිවුරු හෝ සිවුරු සඳහා වස්ත්‍ර ය.

ආහාර පාන මෙකල මෙන් සඟසතු කිරීමේ ක්‍රියාවලියක් එකල එතරම් ම ජනප්‍රිය ව තිබී නැති බව ද පෙනී යයි. බොහෝ ධනවතුන් තම හැකියාව පරිදි මහ දන් පිරිනමා තිබේ. වැඩිපුරම භික්ෂු මහා සංඝයා වහන්සේ පිණ්ඩපාතික ව යැපී ඇති බව ත්‍රිපිටක සාහිත්‍ය පරිශීලනයේදී පෙනී යයි. එහෙයින් එකල චීවර පූජාව හා සම්බන්ධ ව තිබෙන කතා ප්‍රවෘත්ති අනුව මේ පිළිබඳ ව නිගමනයකට එළඹීම කළ හැකි ය.

මහාවග්ගපාලි නම් විනය ග්‍රන්ථයේ චීවරක්ඛන්ධකයේ “තෙන ඛෝ පනසමයේන අඤ්ඤතරෝ භික්ඛු ඒකෝ වස්සං වසි තත්ථ මනුස්සා සංඝස්ස දේමාති චීවරානි අදංසු... තේන ඛෝ පන සමයේන අඤ්ඤතරෝ භික්ඛු උතුකාලං ඒකෝ වසි තත්ථ මනුස්ස සංඝස්ස දේමාති චීවරානි අදංසු... තේන ඛෝ පන සමයේනතයෝ භික්ඛු රාජගහේ වස්සංවසක්ති තත්ථ මනුස්සා සංඝස්ස දේමාති චීවරානි දෙන්ති” යනුවෙන් භික්ෂූන් වහන්සේ එක නමක් විසූ තැනත්, දෙනමක් විසූ තැනත්, සංඝයාට දෙමු’යි (සංඝස්ස දේමාති) දායකයෝ චීවර පූජා කළ බව සඳහන් වේ.

බුදුරජාණන් වහන්සේ ඒවා සංඝික නොවේ යැයි වදාළේ නැත. ආහාරය දවසේ උදෑසන වරුව තුළ පරිභෝජනය කරන (යාවකාලික) දෙයකි. චීවරය වනාහි එබන්දක් නොවේ. එහෙයින් චීවරය හා සම්බන්ධව ද නොපැනවූ සම්මුතියක් ආහාරය සම්බන්ධ ව පැනවීමට ඉඩක් නැති බව පෙනී යයි.

ඒ හැරත් විනයානුකූල ක්‍රියාවලට වැඩිපුරම බඳුන් වන්නේ චීවරය බව අමුතුවෙන් කිව යුතු නොවේ. එහෙයින් චීවරය පිළිගැනීම හා සම්බන්ධයෙන් නොපැන වූ සංඛ්‍යා නියමයක් ආහාර පිළිගැනීම සම්බන්ධ ව කිසිසේත් පනවනු ඇතැයි සිතිය නොහැකි ය.

මෙම හතර නමක් අවශ්‍ය යැයි පිළිගැනීමක් ඇති වන්නට හේතුව භික්ෂූන් වහන්සේ හා සම්බන්ධ විනය කරුණුවලදී ඊට අදාළ අවම ඝන පූරණය හතර නමක් වීම නිසා බව අනුමාන කළ හැක. දානය වනාහි විනය කර්මයක් නොවේ. එහෙයින් ද දන් පූජා කිරීම හා සම්බන්ධ ව මේ පිළිගැනීම කිසිදු අර්ථයක් නැති එකක් බව පෙනී යයි.

අපේ ථෙරවාද මහා විහාර භික්ෂූන් වහන්සේලා ඉතා දැඩි ලෙස විනයගරුක වූ බව නොරහසකි. ලංකා ඉතිහාසය පුරාමත් ඒ සඳහා සාධක විසිරී පවතී. විනයට දැක්වූ එකී අවධානය, ප්‍රමුඛත්වය මතින් ගොස් වැඩි හොඳට දානයක් සඟසතු කිරීම සඳහා ද උපසපන් භික්ෂූන් වහන්සේලා හතර නමක් සිටිය යුතු යැයි සම්මතයක් ජන මනසට ඇතුළු කළා විය හැකි ය. එහෙත් එහි බුදුරජාණන් වහන්සේගේ අනුමැතියක් නැති බව ඉහත දැක්වූ මහාවග්ගපාලි පුවතින් පෙනෙයි.

සාංඝික කිරීම පිළිබඳ මේ පිළිගැනීම එන්නට තවත් සමීප හේතුවක් අපට දන් පලක දී දැක ගත හැකි ය. එනම් භික්ෂූන් වහන්සේ විසින් “ඉමං භික්ඛං භික්ඛු සංඝස්ස දේම” යනුවෙන් දායකයන් ලවා කියවන පූජා කිරීමේ පාඨයයි. මෙය නොකියවුවහොත් දානය සාංඝික නොවන බව බොහෝ දෙනාගේ පිළිගැනීම වන තරමට ම ප්‍රබල ව ඇත. ඇරත් මෙම වාක්‍යය උපසම්පදා භික්ෂූන් වහන්සේ නමක් ම කියවිය යුතු බව සමහර භික්ෂූන් වහන්සේ ද පිළිගනී. ඒ මෙහි අර්ථය වටහා නොගැනීමෙන් උපන් වැරැදි අදහසකි.

එම පාඨයෙන් කියැවෙනුයේ මෙම දානය භික්ෂු සංඝයාට පූජා කරමි යන්නෙන් මෙය දායකයා නොදන්නා නිසා භික්ෂූන් වහන්සේ විසින් කියවන්නකි. භික්ෂූන් වහන්සේට දාන පිළිගැනීමට විනා පූජාකරවා ගැනීමට අයිතියක් විනයානුකූල ව නැත. එලෙස දානය පූජා කිරීම හෝ නොකිරීම දායකයන්ගේ කාර්යයකි.

මෙකරුණින් ද දන් පූජා කිරීම භික්ෂූන් වහන්සේ හතර නමකගේ වැඩක් නොව දායකයන්ගේ ක්‍රියාවක් බව පැහැදිලි ය.

තවද ඉන්දියාවේ මධ්‍ය දේශයේ එකල භික්ෂූන් වහන්සේ දහස් ගණනින් වැඩ සිටි අතර, මධ්‍ය දේශයෙන් පිටත මෙම තත්ත්වය මීට හාත්පසින් ම වෙනස්වූ බව පෙනේ. උපසම්පදා විනය කර්මයකට භික්ෂූන් වහන්සේ දහ නමක් සොයා ගැනීමට දුෂ්කර වූ අස්ථාවක් පිළිබඳ එන විනය පිටකාගත වාර්තාවකින් ඒ බව පැහැදිලිවේ. එනිසාම තථාගතයන් වහන්සේ මධ්‍ය දේශයෙන් පිටත උපසම්පදා විනය කර්මයක් සිදුකිරීමට භික්ෂූන් වහන්සේ පස් නමක් ප්‍රමාණවත් කොට ශික්ෂා පද සංශෝධනය කර වදාළහ.

තථාගතයන් වහන්සේ ශාසනයේ ජීවය බඳුවූ උපසම්පදාව වැනි වැදගත් විනය කර්මයකටත් බුරුලක් දුන්නේ භික්ෂූන් වහන්සේගේ හිඟකම නිසා ය. එහෙත් විනය කර්මයක් නොවන දානමය පූජාවකට උපසම්පන්න භික්ෂූන් වහන්සේ හතර නමක් අවශ්‍ය යැයි පැනවීමක් කළහොත් භික්ෂූන් වහන්සේලා හිඟ ප්‍රදේශවල සැදැහැතියකුට දානයක් පූජා කිරීමට අපහසු වනු ඇත. අද අප මේ මතය දරනුයේ ද ලංකාවේ භික්ෂූන් වහන්සේලා ගණන පිළිබඳ සිහිය තබාගෙන ය. නමුත් එකල තත්ත්වය එසේ නොවේ. මේ ගැන අපේ රටේ ධර්මධර උතුමන් වහන්සේලා දෙනමකගේ අදහස් ද මෙහි දක්වන්නේ මෙම මතයේ ඇති සාවද්‍යතාව පෙන්වා දෙනු පිණිස ය.

“යමක් සඟ සතුකොට පූජා කිරීම සංඝයා වහන්සේගේ වැඩක් නොවේ. එය දායකයින්ගේ ක්‍රියාවකි. සංඝයා වහන්සේගේ නියෝජිතයන් එහි පෙනී සිටීම පමණක් ඒ සඳහා ප්‍රමාණවත් ය. එම නිසා එක උපසපන් භික්ෂූන් වහන්සේ නමක් සිටීම ප්‍රමාණවත් වේ.” හේන්පිටගෙදර ඤාණසීහ නාහිමි, ඛන්ධක විනය පිටුව – 303

“එක භික්ෂුවක් දෙනමක් තුන් නමක් ඇති තැන්වලදී සාංඝික කළ චීවර සාංඝික වන්නාක් මෙන් ආහාරපානා දී කිනම් දෙයක් වුවත් සාංඝික කළහොත් සාංඝික වන බව කිව යුතු ය. එහි සැක කළ යුත්තක් නැත” – රේරුකානේ චන්ද්විමල මහ නාහිමි, ධර්ම විනිශ්වය – පිටුව 56

ඉහතින් දැක්වූ සියලු කාරණාවන් විමසා බැලීමේදී දානයක් සාංඝික කිරීම සඳහා උපසපන් භික්ෂූන් වහන්සේලා හතර නමක් සිටිය යුතුය යන සම්මතය ථෙරවාදීන්ගේ විනය ගරුකත්වය නිසා ඇතිවූවක් බව සිතිය හැකි අතර එකී කාර්යය උදෙසා උපසම්පන්න එක් නමක් පමණක් සිටීම වුව ද ප්‍රමාණවත් බව ද පැහැදිලිව පෙනී යයි

> **යමක් සඟ සතුකොට පූජා කිරීම සංඝයා වහන්සේගේ වැඩක් නොවේ. එය දායකයින්ගේ ක්‍රියාවකි. සංඝයා වහන්සේගේ නියෝජිතයන් එහි පෙනී සිටීම පමණක් ඒ සඳහා ප්‍රමාණවත් ය. එම නිසා එක උපසපන් භික්ෂූන් වහන්සේ නමක් වුවත් සිටීම ප්‍රමාණවත් වේ.**

බෙල්ලන්විල රජමහා විහාරවාසී
ආචාර්ය
**උඩුගම්පොළ හේමරතන හිමි**

# මව්පිය දූ දරු ගැටුම් ඔවුනොවුන් තේරුම් නොගැනීම නිසයි



**"සෙත්මිණ" වැඩිහිටි නිවාසයට අප ගොඩ වුණේ එහි වෙසෙන පියවරුන් වෙනුවෙන් පින්කමක් කිරීමේ අදහසිනි. ඒ සඳහා තව කාලය තිබූයෙන් වටපිට බැලීමි. එක් පියකු හමුවේ මගේ දෑස නතර විය.**

සේපාලිකා ගස යට හිඳගෙන ඈත බලා සිටින ඒ පියා වෙත මම සෙමෙන් ළං වුණෙමි. භීතිය, දුක, සංතාපය, ශෝකය කැටි වූ ඒ දෑස මා ළඟට එනතුරු ම නො දුටුවා ය.

ඔහු සිටි කුඩා බංකුවට මම ද බර වුණෙමි. මා දෙස බැලූ ඔහුගේ දෑසේ පිරී තිබුණු කඳුළු මහ රළ පහරක් වෙරළට වේගයෙන් ගසා එන්නා සේ කම්බුල දිගේ රුරා වැටුණි. ඒ කඳුළු හලන්නට කිසිදු බාධාවක් නැත. ඉතාමත් වේගයෙන් ගලන කඳුළු දෙස මම බලා සිටියෙමි

"ඇයි මේ?" මම හඬ අවදි කළෙමි

"මට මගේ දරුවෝ මතක් වුණා."

ඒ පියාගේ සිතේ ගුලි වී, කැටි වී, හිර වී තිබුණ දුක, කඳුළු අතරින් මුදා හළ බවක් මට සිතුණි.

'දරුවෝ'.... මව්පියන්ගේ ලේ, ඇට, මස්, නහර, කිඳු බැසගෙන තිබෙන එක් සුන්දර වූ බලාපොරොත්තුවකි. ඉතාමත් දුකසේ ඇති දැඩි කරන දරුවන් ටිකෙන් ටික උස් මහත් වනවිට මව්පියන් මදිපුංචි වන්නේ ඇයි? ඔවුන් නුරුස්සන්නේ ඇයි? ඒ හඬට කන් නො දෙන්නේ ඇයි?

## ගැටුමේ ආරම්භය...

අද සමාජය වේගයෙන් පරිහානියට යමින් පවතී. පවුලක දරුවන්, මව්පියන් අතර, යම් අරගලයක් පවතී. උස් මහත් වන දරුවන් ඔවුන් ගැන සොයනවාට කැමැති නැත. නමුත් දරුවන් සිතන්නේ අප දැන් රැකියාවක් කරන සමාජයේ අත්දැකීමක් ඇති පිරිසක් බව ය. අම්මා, තාත්තා අවවාදයක් කළවිට ඔවුන් කිපේ. දොර වේගයෙන් වසයි. රවා බලයි. එකටෙක කියයි. "මම දැන් පොඩි එකෙක් නෙමේ. මගේ පස්සෙන් එන්න එපා. මම මගේ වැඩ ගැන බලා ගන්නම්" යැයි කියයි. සමාජය පුරා උඩුදුවමින් යන පවුලක් තුළ ඇති ගැටුම එතැනින් ඇරඹෙයි.

පුතා විවාහ කරගෙන නිවසට එන ලේලිය සාම්ප්‍රදායික සිරිත් විරිත් සුරකින්නට මැලිබවක් දක්වයි. බොහෝ විලාසිතාවලට කැමැති ඇය, යහළු මිතුරන් ද බොහෝ සේ ඇසුරු කරයි. ප්‍රිය සාද ඇයගේ ජීවිතයේ බහුල ය. තමන් සමාජයේ යම් ස්ථාවරයක සිටින බව සිතයි. ඇයගේ සිතිවිලි මහලු මව්පියන්ට නොතේරේ. ඔවුන් සොයනුයේ ඉතාමත් නිරහංකාර ප්‍රියමානප සියුමැලි ගති ඇති, තම ඥතීන්ට ගරු බුහුමන් කරන දියණියකි. එහෙත් තරුණ ලේලියට එය හිසරදයකි. එතැනින් ද ගැටුම හට ගනියි.

තව විටෙක රූප පෙට්ටියේ පෝලිමට යන නාට්‍ය පෙළ අපගේ කාලය මෙන්ම පවුලේ සමගිය ද සොරාගෙන ඇත. බත්පත බෙදා ගන්නා තාත්තා ප්‍රවෘත්ති බැලීමට ද, කුඩා දරුවා කාටූන් බැලීමට ද, වැඩිමහල් දරුවා ක්‍රිකට් හෝ නාට්‍ය බැලීමට ද, අම්මා ඉවුම් පිහුම් හෝ වෙනත් දෙයක් නැරඹීමට ද සැරසී සිටියි. එනිසා ම අනා ගන්නා බත්පිඩ කටට යනවා ඔවුන් නො දනී. නිවසට කෙනෙක් පැමිණ කතා කළ ද ඔවුන් නො දනී. තමන් ඇබ්බැහි වී ඇති රුචි දෙය දෙස ඇස පොපියා සිටින ඔවුන් නිදිමත වූ විට එතැනින් නැගිට ඇඳට වැටී නිදා ගැනීමට හුරු වී සිටිති. ඒ නිවසේ දරුවන් මව්පියන් අතර සුහද ගනුදෙනුවක් ඇති වන්නේ නැත. තම තමාගේ තොරතුරු කීමක් හෝ විමසීමක් නැත. දරුවන් ඔවුන්ගේ ලෝකයේ තනි වේ. මව්පියන් තමන්ගේ ලෝකයේ තනි වේ. එතැනින් ද පවුලේ සමගිය බිඳ වැටී අර්බුද හට ගෙන ඇත.

## මා බාල කාලේ...

අද අපේ සමාජයේ බොහෝ වැඩිහිටියන්ගේ තවත් මැසිවිල්ලක් තිබේ. ඒ අපට තිබුණ බාල අවදිය අපේ දරුවන්ට නැතිබව කියමිනි. තමාගේ බාල කාලයේදී වෙල් ඉපනැල්ලේ දුව පැනපු ආකාරය, ගඩා ගෙඩි කඩාගෙන කෑ ආකාරය, ඔංචිලි පැද්ද ආකාරය, මිදුල පුරා දුව පැන නැටූ ආකාරය, ඔවුන්ගේ සිත්වල සිහිනයක් මෙන් මතකයක් ඇත. තම දරුවාට නො මැති, ඒ විවේක සුවය පිළිබඳව ඔවුන්ට කණස්සල්ලක් ඇත. නමුත් ජංගම දුරකතනය මෙන් ම නොයෙක් තාක්ෂණ උපකරණවලට සිර වී ඇති දරුවා ගැන ලොකු වැටහීමක් ද මව්පියන්ට නැත. තරඟකාරි සමාජයේ නො දීම බැරි දෙයක් ලෙස සිතා දුරකතනය දරුවාගේ අතේ තබන්නේ ද මව්පියන් ය. ඉන්පසු මැසිවිලි නඟන්නේ ද ඔවුන්ම ය. තාක්ෂණ ය මේ වනවිට අප වටකොට හමාර ය. එයින් බේරී පලායාමක් සිතනු මෝඩකමකි. නමුත් තාක්ෂණය නිසි ලෙස පරිහරණය කිරීමට දරුවා හුරු කිරීම මව්පියන් සතු වගකීමකි. මෙවලම් භාවිතය නිසා දරුවා නොමඟ ගියා යැයි කීමට මපියන්ට අවසරයක් නැත. ඒ දරුවාට නිසි රැකවරණය ඔවුන් නො දුන් නිසා ය. පවුලේ අර්බුදය මේ හේතුව නිසා ද ඇති වේ.

මේ සියලු ගැටුම්වලට මව්පියන් මෙන්ම දරුවෝ ද වගකිව යුත්තෝ වෙති. දරුවන් කුඩා කාලයේදී තරගයට දුවන රැල්ලට තල්ලුකරන වැඩිහිටියෝ විෂය දැනුම පමණක් ඔවුන්ට දීමට සැරසී සිටිති. එහා ගෙදර දරුවාට වඩා තමන්ගේ දරුවා එක ලකුණකින් හෝ ඉදිරියෙන් සිටිනවා නම්, එය මහමෙරකි. පංති.. පංති.. පංති. ඉරිදා දහම් පාසලකට නොයන දරුවා අමතර පංති යැවීමට මව්පියන් කටයුතු කරන්නේ එනිසා විය හැකි ය. දහමින් කිසිදු පෝෂණයක් ලබා නොදී තරගයකට යොමු කරන දරුවා නොතේරෙන වයසේ සිට තරගයට දුවයි.

එලෙස උස් මහත් වන දරුවා සමාජගත වීමේදී යම් යම් ගැටුම් ඇති වේ. ගුණයෙන්, දහමින් පෝෂණය නො කිරීම මව්පියන් කළ වරදකි. එයට සියුම් ලෙස දඬුවම් විඳින්නේ ඔවුන් වයසට යාමත් සමඟම ය. තමාගේ දරුවා කුඩා කාලයේ සිට ම ළඟට ගෙන "පුතේ අපි මේ ඉපදෙමින් මැරෙමින් යන සසර ගමනක් යන්නේ. දුක් විඳිමින් නොයෙක් නොයෙක් ලෝකවල අපට ඉපදෙන්නට සිදු වෙන්නේ ඒ නිසයි. ඒ නිසා මේ ලැබුණ මිනිසත් ජීවිතයෙන් ප්‍රයෝජනයක් ගමු". කියා දරුවන්ට කියා දෙන මව්පියන් අපට හමුවන්නේ ඉතාමත් කලාතුරකිනි.

## දරුවා ගුණයෙන් පෝෂණය කරමු...

ඒ වගේම පාසල් යනවිට දන නමා මව්පියන්ට වන්දනා කරන්නට කියා නො දෙන ඔවුන් බායි... බායි කියමින් අත වනන්නට පුරුදුව සිටියි. නිවසේ වැඩ සිටින බුදුපිළිම වහන්සේට වන්දනා කොට අම්මා, තාත්තා, ආච්චි, සීයාට වන්දනා කොට නිවසෙන් පිටවෙන දරුවෝ අද ඉතාමත් ම සීමිත ය. තරගය ඔවුන් පසුපස හඹා එන නිසා දෝ ඔවුන් ද ඒ තරගයට දිවීමට සැරසී සිටිති.

අද සමාජයේ එකින් එකට පෙළ ගැසී ඇත්තේ එක් එක් ආකාරයේ ගැටුම් ය. මෙය තවදුරටත් සමාජගත වීමට පෙර වර්තමානයේ ජීවත්වන අප විසඳුම් සෙවීමට උත්සුක විය යුතු ය. ඒ සඳහා ඇති එකම විසඳුම බුදු දහම යි. තම දරුවා තිසරණය සමාදන් කොට පංචසීලය රැකීමටත්, දහමෙන් පොහොසතකු කිරීමටත් ගුණවතකු කිරීමටත් කටයුතු කිරීම මව්පියන් සතු කාර්යයකි. ඒ වගේම දිනපතා පවුලේ සියලු දෙනාම එකතුව බුද්ධ වන්දනාවට කාලයක් වෙන්කර ගැනීමත්, නිවසේ සිටින වයෝවෘද්ධ අම්මා, තාත්තා, ජීවතුන් අතර සිටීනම් කුඩා දරුවන්ට දැනෙන සේ ඒ වයෝවෘද්ධ වැඩිහිටියන් රැකබලා ගැනීමත් කළ යුතුව ඇත. එසේ නොමැතිව වයසක වැඩිහිටියන්ට පොඩි දෙයටත් කෑ ගසමින්, බැණ වදිමින්, අපහාස කරමින්, ඔවුන්ගේ සිත බොහෝ සේ තලාපෙළා දමයි නම්, ඔවුන්ට ද ඒ විපාකය බොහෝ විට දිට්ඨධම්මවේදනීය කර්මයක් ලෙස ගෙවීමට සිදුවනු ඇත. මරණින් මතු දුගතිය හිමිවනු ඇත.මේ සියලු දෙයින් අපට පසක් වනුයේ එක් දෙයකි. එනම් භාග්‍යවතුන් වහන්සේ වදාළ ඒ අමාදම් වැස්සෙන් අප තවමත් තෙමී නැති බව ය.

නයනා නිල්මිණී

# රජ පෙළපතක වගතුග

**සිංහල ජාතියත්, සම්බුද්ධ ශාසනයත් රැක ගැනීම උදෙසා අතීතයේ පෙරමුණට පැමිණි ශ්‍රේෂ්ඨතම සිංහල වීර කාන්තාව ලෙසින් විහාර මහා දේවිය හඳුන්වනු ලැබේ.**
**විහාර මහා දේවියගේ ජීවිත කතාව ගොඩනැඟී ඇත්තේ පුත් දුටුගැමුණු නම් මහ රජතුමාගේ ශ්‍රේෂ්ඨ ජීවිත කතාවත් සමඟ බවයි සඳහන් වන්නේ.**



## රජ පෙළපත

විහාර මහා දේවියගේ පියා වූයේ කැලණිතිස්ස මහ රජතුමා ය. විහාර මහා දේවියගේ ස්වාමියා වන්නේ කාවන්තිස්ස මහ රජතුමා ය. කැලණිතිස්ස මහ රජතුමාගේ හා කාවන්තිස්ස මහ රජතුමාගේ රජ පෙළපත් පිළිබඳ මේ ආකාරයෙන් සඳහන් වේ.

ක්‍රි.පූ. 307 දී අනුරාධපුර රාජධානියේ රජකම් කළේ දේවානම්පියතිස්ස නම් මහ රජතුමා ය. පුරා සතළිස් වසරක් අනුරාධපුර රාජධානියේ රජ්ජු වූ බව සඳහන් ය. දේවානම්පියතිස්ස මහ රජතුමාට වැඩිමහල් සොහොයුරකු සහ බාල සොහොයුරෝ අට දෙනෙක් සිටි බව කියැවේ. දේවානම්පියතිස්ස මහ රජතුමාගේ සොහොයුරන් දෙදෙනකු වූ උත්තිය හා මහානාග කුමාරවරු රජ්ජුගේ යුව රජවරු ලෙස කටයුතු කළ බව ද කියැවේ.

දේවානම්පියතිස්ස මහ රජතුමාගේ මරණින් පසු උත්තිය කුමරුට රජකම හිමිවේ.

## යටාලතිස්ස කුමරු

මහානාග කුමරු කුමන්ත්‍රණයකින් බේරීම සඳහා රජ රටින් පලායෑමට තීරණය කළේ ය. මහානාග කුමරුගේ බිසව ඒ අවස්ථාව වන විට ගැබ්ගෙන සිටියාය. තම බිසවත් සමඟින් රජ රට සිට රුහුණු රටට පැන යමින් සිටිය දී "යටාල" නම් ග්‍රාමයේ දී ඇයට පුත් කුමරකු ලැබුණි.

එම පුත් කුමරාට උපන් ගම සිහිවීම සඳහා "යටාල' නාමයත්, සිය වැඩිමහල් සොහොයුරා වූ දේවානම්පියතිස්ස රජතුමා සිහිවීම සඳහා "තිස්ස" නාමයත් එකතු කොට මේ කුමරු ට "යටාලතිස්ස" නමින් නම් තැබූ බව කියැවේ.

රුහුණු රට මාගම්පුරය සිය රාජධානිය පිහිටුවාගෙන කාලයක් එහි රජ්ජු වූයේ මහානාග රජතුමා ය. මහානාග රජතුමාගේ අභාවයෙන් පසු ඔහුගේ පුත් "යටාලතිස්ස" කුමරුට රජකම ලැබුණි. ගෝඨාභය කුමරු යටාලතිස්ස රජතුමාගේ පුතා බව කියැවේ. යටාලතිස්ස රජතුමාගේ අභාවයෙන් පසු ගෝඨාභය කුමරු එහි රජකමට පත් වූ බව ද සඳහන් ය. ගෝඨාභය රජතුමාගේ පුත්‍රයා වූයේ කාවන්තිස්සය. විහාර මහා දේවියගේ ස්වාමිපුරුෂයා වූ කාවන්තිස්ස මහ රජතුමා ය.

දේවානම්පියතිස්ස මහ රජතුමාගේ එක් සොහොයුරකු වූ උත්තිය රජතුමාගේ පුතාගේ පුතකු එනම්, දේවානම්පියතිස්ස රජතුමාගේ මුණුපුරකු වූයේ කැලණිතිස්ස රජතුමා ය. එතුමා කැලණිය අගනුවර කොටගෙන මායා රටෙහි රජ්ජු වූයේ ය.

## කැලණිතිස්ස මහ රහතන් වහන්සේ

එම කැලණිතිස්ස මහ රජතුමා සමඟ මිත්‍රකම් පැවැත් වූ "කැලණිතිස්ස" නමින් ම හැඳින් වූ මහ රහතන් වහන්සේ නමක් කැලණියෙහි වැඩ විසූහ. කැලණිතිස්ස මහ රජතුමාටත් එතුමාගේ ආර්ය උත්තිය නම් බාල සොහොයුරාටත් කුඩා කල ශිල්ප ශාස්ත්‍ර කියා දුන්නේ "කැලණිතිස්ස" මහ රහතන් වහන්සේ ය.

කාලයත් සමඟ ආර්ය උත්තිය කුමරු තම වැඩිමහල් සහෝදරයාගේ, කැලණිතිස්ස මහ රජතුමාගේ බිසව සමඟ අයුතු හාදකමක් පැවැත් වූ බව කියැවේ. ඒ හේතුවෙන් ආර්ය උත්තිය කුමරු මාලිගයෙන් පළවා හැරුණි. එසේ මාලිගයෙන් බැහැර කළ ද ආර්ය උත්තිය කුමරු එකී බිසව සමඟ පැවැත් වූ අයුතු හාදකම දිගින් දිගට ම පවත්වාගෙන යෑමට හැකි සෑම උත්සාහයක් ම ගත් බව කියයි.

කුමරු විසින් කුලියට ගත් එක්තරා තරුණයකුගේ හිස බූ ගා ඔහුට සිවුරක් අන්දවා පාත්‍රයක් අතට දී භික්ෂුවකගේ වෙස් ගැන් වූ බව කියැවේ.

තල් පතක තම තතු ලියූ පෙම් පතක් කැලණිතිස්ස රජතුමාගේ බිසව අතට පත් කරවන්නට කුමරුට වුවමනා විය. ඒ සඳහා යෙදූ කූට උපාය වූයේ මේ වෙස් ගැන් වූ භික්ෂුවයි.


විහාර මහා දේවිය

කැලණිතිස්ස මහ රජතුමාගේ හිතවත් කැලණිතිස්ස නම් වූ මහ රහතන් වහන්සේ රජතුමාගේ රාජ මාලිගාවට දන් පිණිස වැඩම කරන අවස්ථාවක් බලා, තල්පතක ලියූ පෙම් පත ද වෙස් ගැන් වූ භික්ෂුව අතට දී මහරහතන් වහන්සේ සමඟ ම මාලිගයට යන්නට අවස්ථාව සලසා දුන් බව කියැවේ. මහරහතන් වහන්සේ සිතුවේ මේ භික්ෂුව රජතුමා දන්නා හඳුනන භික්ෂුවක් විය හැකි බවයි. කැලණිතිස්ස රජතුමා මේ භික්ෂුව ගැන සිතුවේ මහ රහතන් වහන්සේ සමඟ ම වැඩම කළ තවත් මහරහතන් වහන්සේ නමක් විය හැකි බව යන්නයි.

දන් වැළඳීමෙන් අනතුරුව රජ මාලිගයෙන් පිටතට වඩින මහරහතන් වහන්සේ සමඟ රජතුමා පසු ගමන් කළේය. බිසව ද එසේ ම දෙරටුව තෙක් පැමිණ භික්ෂූන් වහන්සේලා ආපසු වඩින අයුරු බලා සිටියාය.

මේ අවස්ථාවේ දී භික්ෂුවක් ලෙස වෙස් ගත් තැනැත්තා තම ඉණෙහි සඟවාගෙන පැමිණි තල්පතක ලියූ පෙම් පත බිසවට පමණක් පෙනෙන ලෙසින් බිම දැමීය. තල්පතක් බැවින් එය බිම පතිත වන විට සුළු ශබ්දයක් නිකුත් වූයේ ය. තල්පත දුටු මහ රජතුමා එය අහුලා කියවා බැලුවේ ය. කියවීමෙන් පසු රජතුමාගේ සිතේ ඇති වූ වේදනාව කියා නිමකළ නොහැකි විය. සිතේ හටගත් මහා කෝපයෙන් රජතුමා දැවෙන්නට විය. කළ යුත්තේ, නොකළ යුත්තේ කුමක් ද කියා වටහා ගැනීමට තරම් කැලණිතිස්ස රජතුමාට සිහි කල්පනාවක් නොවී ය. ඒ වගේ ම තල්පතක ලියූ පෙම් පත බිම හෙලුවේ කවර භික්ෂුව දැයි කැලණිතිස්ස රජතුමාට තේරුම් බේරුම් කර ගත නොහැකි විය.

තල්පතෙහි තිබෙන අත් අකුරු කාගේ දැයි තේරුම් ගැනීමට කැලණිතිස්ස රජතුමාට නොහැකි වූයෙන්, තල් පතෙහි තිබූ අත් අකුරු කැලණිතිස්ස මහ රහතන් වහන්සේගේ ම අත් අකුරුවලට සමාන වූ නිසා එතුමා තම කල්‍යාණ මිත්‍ර මහ රහතන් වහන්සේ කෙරෙහි වැඩියෙන් ම සැක පහළ කළේ ය. ඒ වගේ ම තම සොහොයුරා වූ ආර්යඋත්තියට කුඩා කල ශිල්ප ශාස්ත්‍රය කර වූයේ මේ කැලණිතිස්ස මහරහතන් වහන්සේ නිසා උන්වහන්සේගේත් තම බාල සොහොයුරාගේත් අත් අකුරු එක හා සමාන බව මහ රජතුමාට ඒ අවස්ථාවේ දී අවබෝධ නොවී ය. බුර බුරා නඟින්නා වූ කෝපයෙන් වෙව්ලන්නට වූ රජතුමා තම හිතවත් නිර්දෝෂී මහරහතන් වහන්සේ උතුරන තෙල් කටාරමක දමා ජීවිතක්ෂයට පත් කළ බව සඳහන් වේ.

## මුහුද ගොඩ ගලයි

කැලණිතිස්ස රජතුමා අතින් සිදු වූයේ මහා බියකරු අපරාධයකි. කෙලෙස් ප්‍රහාණය කළ කැලණිතිස්ස මහ රහතන් වහන්සේ තෙල් කටාරමක දමා ජීවිතක්ෂයට පත් කිරීම මහ පොළොව නො උසුලන පාපතර ක්‍රියාවක් විය. මෙම ක්‍රියාවෙන් මිහිකත කම්පාවට පත්ව වෙව්ලන්නට වූවා ය. ඒ සමඟ ම මහා බියකරු හඬක් නංවමින් මහ මුහුද ගොඩ ගලන්නට පටන් ගත්තේ ය. කැලණිය ප්‍රදේශයේ සිට හලාවත දක්වා වූ ප්‍රදේශය වට කරගෙන මුහුද ගලා ආ බව වංශ කතාවල සඳහන් ය.

මුහුද ගොඩ ගැලීම හේතුවෙන් මිනිස් ජීවිත දහස් ගණනින් විනාශ වන්නට විය. ගෙවල් දොරවල් කඩා වැටෙන්නට විය. ගව ආදී සතුන් හා කෙත් වතු ද මහා විනාශයකට පත් විය.

## රජමාලිගය වැටලීම

මුහුදු ගොඩගැලීමෙන් බියට පත් රටවැසියෝ රජ මාලිගය වට කළහ. "රජතුමනි මුහුද ගොඩ ගලනවා. එය වහා නවත්වා රටත් රටවැසියාත් බේරා ගැනීම සඳහා පිළියම් යොදන්න' යැයි ජනතාව මහ හඬ නඟා කෑ ගැසූහ. බියටත්, කලබලයටත් පත් කැලණිතිස්ස රජතුමා වහා නිමිති කියවන්නන් කැඳවා මීට හේතුව විමසීමට කටයුතු කළේය.

ඉතා නිර්දෝෂී මහරහතන් වහන්සේ නමක් නිරපරාදේ උණු තෙල් කටාරමේ දමා මරණයට පත් කිරීමේ අපරාධය නිසා මුහුදු රකුසා කෝප වීම හේතුවෙන් මහ මුහුද ගොඩ ගලන්නට පටන් ගෙන ඇති බවත්. මුහුද ගොඩ ගැලීම නැවතීමට නම් රජතුමාට දාව උපන් දරුවකු මුහුදු රකුසාට බිලි කළ යුතු බවත් නිමිති කියවන්නෝ ප්‍රකාශ කළ හ.

දීපා පෙරේරා

3 පිටුවෙන්...

# සිහි නුවණ තිබේ නම්...

මෙනිසා වෛරසය මිනිසුන් අතර වේගයෙන් ව්‍යාප්ත වෙමින් තිබේ.

මේ මොහොතෙහි සිහිනුවණ ඇති අයකුට වෛරසයෙන් බොහෝ දුරට බේරී සිටිය හැකි ය. එළඹ සිටි සිහිය හා නුවණ විසින් ඇති කෙරෙන සුරක්ෂිත බව තමාගේ ද අන්‍යයන්ගේ ද ආරක්ෂාව තහවුරු කරයි.

අහේතුකව ගමන් බිමන් යාමෙන් වැළකිය යුතුය යන්න තවත් වෛද්‍ය උපදේශයකි. ගිහි විනය යනුවෙන් හැඳින්වෙන සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන අවේලාවේ වීථි සංචාරයේ යෙදීමෙන් වැළකීම ද වසංගතයෙන් තමාත් තම පවුලත් ආරක්ෂා කරගැනීමේදි අනුගමනය කළ හැකි තවත් බෞද්ධ උපදේශයකි. එහි දැක්වෙන පරිදි නොකල්හී ගමන් බිමන් යන පුද්ගලයකුට විඳීමට සිදුවන උවදුරු පහකි. අවේලාවෙහි තැනින් තැන සංචාරයේ යෙදෙන පුද්ගලයාට තමන්ගේ ආරක්ෂාව අහිමි වේ. නැතහොත් අනාරක්ෂිත අයකු බවට ත් වේ. මෙය පළමු වැනි උවදුරයි.

දෙවැනි උවදුර නම් තම පවුලේ ආරක්ෂාව අහිමිවීමයි. තමා සතු යම් ධනයක් වේ නම් එයද විනාශයට පත්වීම තෙවැන්නයි. සැක කටයුතු අයකු බවට පත්වීම සිව්වැන්නයි. පස්වැන්නට අනුව ඔහු විවිධ චෝදනා ලත් අයකු බවට පත්වෙයි. සයවැන්න හෙවත් අවසන් ආදීනවය නම් බොහෝ දුක්වේදනාවන්ට ලක්වීමයි. පුද්ගල සදාචාරය අරමුණුකරගත් මෙම උපදේශය ඍජුවම වංසගත පාලනයට ආදේශ කළ නොහැකි වුව ද මෙම අවස්ථාවෙහි එය අනුගමනය කිරීමෙන් වසංගතයෙන් වුවද වැළකිය හැකි ය.

මෙම කරුණු හයෙන් පළමුවන, දෙවන හා සයවන ආදීනව ඍජුවම වසංගතය හා සම්බන්ධ කළ හැකි ය. මෙම වසංගත සමයේ අත්‍යාවශ්‍ය නොවන ගමන් බිමන්වල නිරත වන්නකුට ස්වභාවයෙන්ම ආත්මාරක්ෂාව මෙන්ම ස්වකීය පවුලේ සාමාජිකයන්ගේ ආරක්ෂාවත් අහිමිවේ. එයට හේතුව තමා සමග වෛරස් ද ගමන් ගන්නා බැවිනි.

කාය විවේකය යනුවෙන් හැඳින්වෙන හුදකලා වාසය ද මෙම උවදුරු අවදියේ බහුලව පුහුණු කළ යුතු පිළිවෙතකි. මනසින් ඔවුනොවුන් කෙරෙහි මෙත් සිත පතුරුවමින් කයින් හැකිතාක් දුරස්ථව වාසය කිරීම හුදකලා වාසයත් සමගම පුහුණු කළ යුතු මානසික අභ්‍යාසය යි. ආතතිය පදනම් කරගත් ක්ෂණික කෝපය,කළකිරීම හා වෙනත් මානසික අසහනකාරී තත්වයන් වර්ධනය වීම සාමාන්‍ය කරුණකි. මෙම පසුබිම යටතේ මනස සංසුන් කෙරෙන මානසික අභ්‍යාසවල නිරත වීම බෙහෙවින්ම වැදගත් වේ. බුදුරදුන් විසින් නිර්දේශිත මානසික අභ්‍යාස රැසක් සමථ හා විපස්සනා භාවනා ක්‍රම යටතේ හඳුන්වා දෙනු ලැබ තිබේ. කෝපය පාලනය කිරීම සඳහා මෙත් සිත වැඩීම බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. එයින් එක් අතකින් කෝපය නිසා ඇතිවෙන විවිධ මානසික අවපීඩන තත්වයන් පාලනය කරගත හැකිවන අතර කායික නීරෝගීකම හා ප්‍රතිශක්තිය ද වර්ධනය කරගත හැකි ය.

එසේම අප හා අවට වෙසෙන රෝගී හා නිරෝගී පුද්ගලයන්ට ද අප වෙනුවෙන් කැපවී සිටින වෛද්‍යවරුන් හෙදියන් ඇතුළු කාර්ය මණ්ඩල කෙරෙහි ද එසේම විවිධ අයුරින් සත්කාර කරන කවරකුට වුව අසීමාන්තිකව නීරෝගී සුවය පිණිස ඉවහල් වන මෙත්තා සහගත කුසල චිත්තවේගය බාධාවකින් තොරව පැතිරවිය හැකි ය.

කායානුපස්සනාව පදනම් කරගත් විපස්සනාවෙහි නිරත වී තමාගේ මෙන්ම අන්‍යයන්ගේ රූප කාය මූලික කරගත් ස්කන්ධ ධාතු ආයතන පිළිබඳ විශේෂ දැක්මක් ඇතිකර ගැනීම ජීවිතය පිළිබඳ යථාවබෝධය ලැබීමට හේතුවේ.

මේ වනාහි බුදුරදුන් වදාළ ජරා ව්‍යාධි මරණ මූලික කරගත් සමස්ත ජීව ලෝකයම මුහුණ දෙන අනවරත සංසාර දුක්ඛයෙහි යථා ස්වභාවය නොවේ ද? මෙසේ කායිකව දුරස් ව වෙසෙමින් මානසිකව සමීප වෙමින් මෙත් සිත පැතිරවීමත් තමාගේ මෙන්ම අන්‍යයන්ගේ ද ජීවිතයේ යතා ස්වභාවය වටහා ගනිමින් සසර දුක දකිමින් නිවන අරමුණු කරගැනීම වසංගතය හේතුවෙන් ඇති වී තිබෙන මානසික අවපීඩනය පාලනය කර ගැනීමට උපකාරී වේ.

ගිලානෝපස්ථානය බුද්ධෝපස්ථනයක් හා සමාන බව තථාගතයන් වහන්සේ අනුදැන වදාළහ. ගිලනුන්ට හා වැඩිහිටියන්ට සැලකීම සිංහල බෞද්ධයන්ගේ ජීවිතයේ ම කොටසකි. එහෙත් මේ උතුම් සත්ගුණය වසංගතයත් සමග ඇතැම් පුද්ගලයන්ගේ සන්තානයෙන් ගිලිහී ගොස් ඇති අයුරු දක්නට ලැබේ.

රෝගී හා නීරෝගී වැඩිහිටියන් රැක බලා ගැනීම වෙනුවට ඔවුන් මහමඟ අතරමංකර යාම මෙම වංසගත සමයේ අසන්නට ලැබීම බෙහෙවින් කනගාටු දායක කරුණකි.

වසංගතයත් සමගම මිනිසුන්ගේ සාධු ගුණ ද අතුරුදහන් වෙමින් පවතින බවට මෙය කදිම නිදසුනකි. වසංගතය හේතුවෙන් ජීවිතය ඉල්ලා සටන් කරන එමෙන්ම අවිනිශ්චිත හැඟුම්වලින් හද පුරවාගත් අසරණ බවේ පතුලටම බැස සිටින මෙම අසරණ වැඩිහිටියන්ට දයාවෙන් පිහිට වීම යනු බුදුරදුන්ට කරන මහත් උපස්ථානයක් බඳු ය. කරුණාව වඩන්නට ලෝකයට දයාව දක්වන්නට තිබෙන මෙවැනි අවස්ථා අත් නොහැර ලොකු කුඩා තරුණ මහලු දුප්පත් පොහොසත් ඇති නැති භේද නොසලකා සම මෙත් කරුණා ගුණය ලොවට දායද කළ යුතු සුදුසුම කාලය මෙයයි. ගිලන් ව මළ මූත්‍ර ගොඩක වැතිරී සිටි පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේට තථගතයන් වහන්සේගේ කරුණාව ලැබුණ අයුරු සිහිපත් කර එය තම ජීවිතයේ ද කොටසක් කර ගන්න.

මේ අනුව නීරෝගී බව උතුම් ලාභය සේ දැන දැක, තමන් හා අන්‍යයන් ද මේ උවදුරෙන් ආරක්ෂා වී, සිහිය හා නුවණ දියුණු කර සතර ඉරියව්වෙහි සංවරව, මෙත් සිත හා විදසුන් සිත වඩමින් ලොවට දයාව දක්වන, සසර දුක දකිමින් නිසි පිළිවෙත් අනුගමනය කරන්නකුට මෙම උවදුරින් ගැලවිය හැකි ය.

5 පිටුවෙන්...

# භික්ෂූන් වහන්සේ...

සැරියුත් හා මුගලන් යන අග්‍රශාවක දෙනමගෙන් ම විමසා සිටියා එදා තමන් වහන්සේ මේ විදියට එම භික්ෂූන් වහන්සේලාට මේ ස්ථානයේ නොවැස පිට වී යන ලෙස කී බව දැනුණු විට කුමක් සිතුණේ ද කියා.

මේ භික්ෂූන් වහන්සේලා හදා වඩා ප්‍රියශීලී බවට පත් කොට ඉදිරිපත් කිරීමේ වගකීම තමන් වහන්සේලාගේ ත් වගකීමක් නිසා ඒ අනුව ඉදිරියට කටයුතු කරන බවට ගිවිස ගත්තා.

මේ අවස්ථාවේ දී අප තිදෙනා ම එකතු වී භික්ෂූන් වහන්සේලා නිසි මාවතට ගැනීමට කටයුතු කරමු කියා බොහොම සරල ලෙස එකඟ වී බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා මේ පැවිදි ජීවිතයට ඇතුළත් වී පැවිද්දේ ඇල්ම හෙවත් අභිරතිය ඇති කරගෙන මහණදම් පිරීමට සූදානම් වෙන වකාවානුවේ දී ඇති වන අභියෝග සතරක් "භය" ලෙස ඇති වන හැටි විශාල ජලාසයක් උපමා කරමින් පෙන්වා දුන්නා.

පළමු වැන්න මේ ජලාසයට බසින්ට සූදානම් වන පුද්ගලයා එහි රළවේගය දැක්කහම භය වෙනවා. ඒ වගේ ම තමා ගිහි අයෙකු සසුනට ඇතුළු වන්නේ කෙලෙස් නසා ජාති ජරා මරණ දුක් දෙම්නස්වලින් මිදෙන්ට හිතල යි. ඒ පුද්ගලයා මේ අදහස පෙරදැරි ව සසුනට ඇතුළු වූ පසු පෙර දී පැවිදි වූ වයසින් බාල හා වැඩිහිටි භික්ෂූන් මේ අලුත මහණ වූ අයට නොයෙක් කරුණු පිළිබඳ යම් යම් සීමා ඇති කොට අවවාද අනුශාසනා කරනවා.

ඒ වෙලාවේ මේ නවක භික්ෂූන්ට මෙම සසුන ගැන භයක් තරහක් වැනි අමනාපයක් ඇති වෙනවා. "මෙච්චර නීති රීති ගොඩක් මැද තමන්ට ත් වඩා වයසින් බාල අය අවවාද ත් දෙනවා. මේක හරි කරදරයක් කියා මහණකම එපා වෙනවා. මෙය ක්‍රෝධ සහගත සිතිවිල්ලක්. මෙය ජලාසයේ එකින් එක මතු වෙවී උඩට නැගෙන රළවේගය වගේ කියා බුදුරජාණන් වහන්සේ උපමා කරනවා.

දෙවනුව ජලාශයේ ළඟින කිඹුලන්ගෙන් ඇති වන භය යි. මේ සසුනට ඇතුළත් වුණහම නොයෙක් සීමා පැනවෙනවා. දන් වළඳන වේලාව මේක යි. මේ වේලාව දානයට විකාලය යි. වැළඳිය යුතු මේවා යි. නො වැළඳිය යුතු දේ මේවා යි. මෙහෙම නීති තහංචි වැටෙන කොට හිතෙනවා ගිහිගේ ඉද්දි නම් මෙහෙම එකක් නැහැ. ඕන ඕන වේලාවට ඕන ඕන දේවල් කනවා. කෑම බීමට තහංචි සීමා නැහැ. මේකට කියනවා "ඌමිභය" කියලා ඒ නිසා මහණකම එපා වෙලා ගිහිවෙනවා. මෙය මේ සසුනෙහි කිඹුල් භය හෙවත් "කුම්භීල භය"


ඊළඟට භයක් තිබෙනවා "ආවට්ට භය" කියලා. එයින් කියන්නේ ජලාශයේ ඇති මාරක දිය සුළි පිළිබද භය යි. ඒවගේ ම මහණකමේ ඇති ආවට්ටභය වන්නේ පැවිදි වූ පසු පිඩු පිණිස සැරිසරන විට ගිහි සැප විඳින නොයෙක් ස්ත්‍රී පුරුෂ පිරිස් දකින්ට ලැබෙනවා. අපිට එහෙම නිදහසේ එවැනි ගිහි සැප විඳින්න දැන් ක්‍රමයක් නැහැනේ කියා තමන්ට පස්කම් සැප සිහිවෙනවා. ඒවා විඳීමේ ආශාව ඇඩි වෙනවා.

අනිත් භය ලෙස ජලාශයේ ඉන්න රුදුරු මත්ස්‍යයන් නිසා ඇති බව භය හෙවත් "සුසුකාභය" දක්වා තිබෙනවා. ජලාශයේ නපුරු සැඩපරුෂ මත්ස්‍යයන්ගෙන් අතිවන භය. ඒ කියන්නේ ගම්දනම් සැරි සරන භික්ෂුවට ගමේ පළාතේ නොයෙක් හැඩට වැඩට ඇඳ පැළඳ ගෙන යන එන සුරූපි කාන්තාවන් දකින්නට ලැබෙනවා. ඉතින් පරණ කම් සැප විඳපු අයුරුත් මතක් වෙනවා. ඉතින් ඒවා ගැන සිත පාලනය කරගත නො හැකි ව සිවුරු හැරලා යනවා.

මේ සැඩපරුෂ මසුන්ට උපමා කෙරෙන්නේ ස්ත්‍රිය යි.

මේ විදියට බුදුරජාණන් වහන්සේ පැවිදිවන නවක භික්ෂුව මුහුණ පාන භය හතර දක්වා මේ මහණකම ආරක්ෂා කර ගෙන මහණකමින් අපේක්ෂා කරපු අරමුණ වන දුක්දෙම්නස් ශෝකපරිදේව දුරලා නිවන් පසක් කර ගැනීමේ මාර්ගයට එළඹෙන භික්ෂුව කොතරම් දමනය වන මනසක් ඇති කරගතයුතු ද යන්න මේ සූත්‍රයෙන් පෙන්වා දෙනවා. ඒ නිසා භික්ෂුව මේ සමාජය තුළ ආරක්ෂා කර ගැනීම හරිම අමාරු කටයුත්තක්.

ඒ අමාරු වැඩේ කරන්නට නම් ගිහි පැවිදි දෙපක්ෂය ම එක සිතින් එක් වෙන්ට ඕන. අනවශ්‍ය ලෙස භික්ෂුව කොටු කරන්නට ගියොත් එතනින් ම භික්ෂුව සසුනෙන් ඉවත්වෙනවා.




# දීඝාභය කුමරු ගැන එළාර රජු පැහැදෙයි

**චරපුරුෂ සේවය සඳහා මාගමට යැවූ සිරිනාග ආපසු පැමිණ සිටියේ ය. ඔහුට අනුරාධපුර ඇතුළු නුවරින් නිවසක් ලබා දීමට මිත්‍ර සෙනෙවිට හැකි විය. සිරිනාග ඒ පළිබඳ සිය ස්තූතිය පල කළේ ය. එහෙත් ඔහුගේ ප්‍රධාන අරමුණ වන අනුරාධපුර රාජධානියේ වෙසෙන ආගන්තුකයන් පිළිබඳ සොයා බැලීමෙන් පසුව නව නිවසේ පදිංචියට යන බව මිත්‍ර සෙනෙවිට පැවසී ය. එහෙත් ඒ තීරණය පිළිබඳ ඔහුගේ කැමැත්තක් නොවීය.**

"සිරිනාග ඔබට තනතුර ලැබුණු වහාම නිල නිවාස භාරගත යුතුයි. තනතුර බබළන්නේ සුදුසු පරිසරයක සිටිනා විටයි".

"මහා සෙනෙවිතුමනි, ඉතා ඉක්මණින්ම මා නිල නිවසේ පදිංචියට යනවා. මා දැනට නතර වී සිටින්නේ ජයනාථ සිටුතුමා ළඟයි. එතුමා මට තාත්තා කෙනෙකු වගෙයි. එකවරම එතුමාගේ නිවසින් ඉවත්වීමට මගේ හිතට හොඳ මදි."

මිත්‍ර සෙනෙවි අමනාපයෙන් ඉවත බලා ගත්තේ ය. තමාගේ රූපයෙන් මදකුත් වෙනස් නොවන මේ කඩවසම් තරුණයා තමා වෙත රඳවා ගන්නට බැරි ඇයිදැයි කල්පනා කළේ ය. ඔහුට අතීතය සිහිපත් විය.

සිරිනාගගේ මව වූ විමලී කුමරිය තමාගේ අවන්හලේ පාලන කටයුතු සඳහා උදව් කිරීමට කැඳවාගත් ආකාරය මතකයට නැගිණි. අවන්හලේ අයිතිය ඇයට පවරන බව ප්‍රකාශ කර ඇයව මුළාකර තමන්ගේ වසඟයට ගත් ආකාරය මනසේ නාට්‍යයක් මෙන් රඟ දැක්වෙන්නට විය.

කුමරියගේ කුසෙහි දරුවකු පිළිසිඳුණු පසු බියට පත් වූ තමා ඒ කිසිවක් නොපවසා ජයනාථ සිටුතුමා මඟින් ඇය බෝධිනාගට සරණපාවා දෙන්නට යෝජනා කළේ ය. මේ බව ආරංචි වූ විමලී කුමරිය සියදිවි හානිකර ගැනීමට තීරණය කර තිබිණි. විමලී කුමරියගේ පියා වූ සුමන මහා සිටුතුමා මේ නිසා බොහෝ අසරණ තත්ත්වයට පත්විය.

අවසානයේ සුමන මහා සිටුතුමා වෙනුවෙන් විමලී කුමරියගේ ආරක්ෂකයා වීමට බෝධිනාග කැමැත්ත ප්‍රකාශ කළේ ය. මහත් උත්සාහයකින් ඇගේ කැමැත්ත ද ලබා ගැනිණි. චාම් උත්සවයකින් සරණ මංගල්‍යය පැවැත්විණි.

මේ සිදුවීමෙන් පසුව තමාගේ නොමනා ක්‍රියාවන් බෝධිනාග මාර්ගයෙන් අනාවරණය වෙතැයි බියට පත් වූ නිසා ඔහු කෙරෙහි තමා තුළ පැවති වෛරය තවත් වැඩි වූ බව සිහිපත් විය. තමාගේ තවමත් පවතින දූෂිත මිලේච්ඡ පැවැත්ම ගැන කල්පනා කළ මිත්‍ර සෙනෙවි ඉදිරි කටයුතු වලදී සිරිනාග දුරස්ව තබා ගත යුතු යැයිද එහෙත් ඔහුගෙන් හැකිතරම් ප්‍රයෝජනය ගත යුතු යැයිද තීරණය කළේ ය.

"සිරිනාග, ඉක්මණින් වැඩ ඉවර කරන්න. මට නම් හිතෙන්නේ සැක කටයුතු ආගන්තුක පිරිස් දැන් අනුරාධපුරයේ නැහැ."

"දිඝජන්තුගේ කෲර දඬුවම් වලට බයේ සියලූ දෙනාම පැනලා ගිහින්"

"හොඳයි, වැඩ ඉවරවුණු ගමන්ම මම නිල නිවාසයට යන්නම්. එතනට සපයා ඇති ඇතැම් ගෘහ භාණ්ඩ ගැන මගේ එතරම් සතුටක් නැහැ. පන්සල්වලින් කොල්ලකාපු ගෘහ භාණ්ඩවලට නම් මම කොහෙත්ම කැමති නැහැ."

"ඒක පැරණි සිටුවරයෙකුගේ ගෙයක්. ඔහු පරිහරණය කළ උපකරණ දැනුත් තියෙන්නේ මේල්දේව මහ සෙනෙවියාගේ නිල නිවසේ. ඔහුගේ මරණයෙන් පසුව එය ලැබෙන්නේ සිරිනාගටයි. ඔබ එහි පදිංචියට ගිය පසු නවීණ ගෘහභාණ්ඩ කිහිපයක් ගෙන්වා දෙන්නට පුළුවන්."

අනුරාධපුර යුද සම්මන්ත්‍රණ ශාලාව ඉදිරිපිටදී හමු වී කතාබහේ යෙදුනු දෙදෙනා වෙනස් වී ගියේ හොඳ හිතකින් නොවෙයි. මිත්‍ර සෙනෙවි සම්මන්ත්‍රණ ශාලාව දෙසටත් සිරිනාග ශ්‍රී මහා බෝධිය දෙසටත් ගමන් කළහ.

ඒ සමගම මහමෙවුනාව දෙස සිය අසු වේගයෙන් මෙහෙය වන දීඝාභය මහා සෙනෙවි, ශ්‍රී මහා බෝ මළුව තුළට යන සිරිනාග දුටුවේ ය.

අසු නතර කර ඔහු දෙස බලා සිටි දීඝාභය එදා යුද්ධ මණ්ඩල රැස්වීමේදී ඔහු දුටු බවත්, ඉන්පසුව ඔහුව හමුවීමට උත්සාහ ගත් සෑම අවස්ථාවකදීම එය අසාර්ථක වූ බවත් කල්පනා කළේ ය. ඒ සෑම තැනකදීම ඔහු තමා වෙතින් පැන යෑමට උත්සාහ ගැනීම දිඝාභයගේ සැකයට හේතු විය.

"අද මෙතැනදී මොහු සමඟ කතා කිරීම වඩාත් හොඳයි. පැනයන්නට නොදී කෙසේ හෝ හමුවන්ට ඕනේ." සිතූ දීඝාභය කුමරු අසු මත හිඳගෙනම බලා සිටියේ ය.

බෝ මලුව තුළට ගිය සිරිනාග බෝධීන් වහන්සේට වැඳ නමස්කාර කර බෝමලුවෙන් පිටතට පැමිණ අසු පිටට නගින්නට සූදානම් වුවා පමණි. එතැනට පැමිණි දීඝාභය මහා සෙනෙවි අසු පිටින් බසිත්ම කතා කළේ ය.

"සිරිනාග"

දීඝාභය මහා සෙනෙවි මුණ නොගැසී පැන යන්නට සිතුවත් එයට අවස්ථාවක් නොලැබෙන බව වැටහිණි. මද සිනහවකින් යුතුව දීඝාභයට ළං විය.

"මහා සෙනෙවිතුමනි, රාජකාරි බොහොමයක් ඇති නිසා යන්නටයි සූදානම් වුණේ. ඔබතුමා රජ වාසලට යන ගමන්ද?"

"නැහැ, සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වෙන ආරක්ෂාව තර කිරීමේ සාකච්ඡාවට යන ගමන්"

"එහෙනම්, මිත්‍ර මහා සෙනෙවිතුමාත් මහවැලි ගං ඉවුර දෙසට ගියේ ඒ නිසා වෙන්නට ඇති."

"ඔව් ඒ සඳහා මහවැලි ගං තීරයේ ආරක්ෂක සෙනෙවිවරුත්, මහා සෙනෙවිවරුන් කිහිප දෙනාත් පමණයි සහභාගී වෙන්නේ.

"මහ සෙනෙවිතුමනි, මට යන්නට අවසර"

"සිරිනාග, නුඹ සමග කතා කිරීමට මා කිහිප වරක් උත්සාහ ගත්තත් නුඹ මා කෙරෙන් පලා යන බවක් මට හැඟුණා."

"නැහැ, මහා සෙනෙවිතුමනි, මටත් ඔබතුමා හමු වී කතාබහ කිරීමේ වුවමනාව තිබුණා. නමුත් "

"ඇයි සිරිනාග, කතාව අතරමැද නැවතුණේ?"

සිරිනාග කිසිවක් නොකියා බලා සිටියේ ය.

"නුඹ, දුටුගැමුණු සේනාංකයට බැඳී සිටිනවාද?"

"ඔව්, එය මිත්‍ර සෙනෙවිගේ යෝජනාවක්"

"නුඹ , මාගමට ගියේ "සිවනාග " නමින් නේද ?

"එසේය , මහා සෙනෙවිතුමනි"

"ඔබ මා වෙත කුණ්ඩල බ්‍රාහ්මණ තුමා එවූයේ කුමන කරුණක් නිසාද?"

දීඝාභය කුමරුනි, සමාවනු මැනවි. එය එක්තරා පිරිසකගේ කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් "

"මා එය දැනගතහොත් ඔබට ගැටලුවක් වේවිද?

" දැන් ඔබතුමා අපේ පිලේ නිසා භයක් නැහැ."

"එසේනම් තොප මාගම රාජධානියට යාමේ හේතුව චරපුරුෂ සේවයද?"

"කුමාරයාණනි, දූගී මගී වෙස් ගෙන අපේ චර පුරුෂයන් දහස් ගණනක් මාගම රාජධානියේ සිටියා. දුටුගැමුණු කුමාරයාගේ මෙහෙයවීමෙන් නන්දිමිත්‍ර යෝධයා ඇතුළු කිහිප දෙනෙක් ඔවුන්ට හිරිහැර කළා. ඇතැමුන් සිරකර තොරතුරු දැන ගත්තා. මේ නිසා මිත්‍ර මහා සෙනෙවිතුමා නැව් දෙකක් කිරින්දට යවා ඒ සියලූ දෙනාම ගෙන්වා ගත්තා."

"ඔහුගේ කීම මත මම කුණ්ඩල බ්‍රාහ්මණතුමා හමුවුණා. හමු වී එළාර රජුගේ සේනාංකයේ උප සෙනෙවියා බව පැවසුවා. නමුත් සොළී නිලධාරීන් සිංහලයන්ට කරන අකටයුතුකම් හා ශ්‍රී මහා බෝධියට කරන නිග්‍රහ නිසාත් තමා සොළින් කෙරෙහි කලකිරී සිටිනා හෙයින් දුටුගැමුණු කුමාරයාට සේවය කිරීමට කැමති බවත් කීවා."

"එතුමා මගේ කීම විශ්වාස කළා. කුණ්ඩල බ්‍රාහ්මණතුමා ඔබ වෙත මා එවූයේ එයින් පසුවයි. උත්තර මහා ඇමතිතුමා ඔබේ නිර්දේශය මත මා නන්දිමිත්‍ර මහා සෙනෙවිතුමාට භාර කළා. "

"මා චූලන්ගණියේ සේවය කරන විට අශ්වයකු පිට නැගී යුද කඳවුරුවලට අවි කම්හල්වලට යමින් යුද්ධ සම්මන්ත්‍රණ වලට කන් දෙමින් තොරතුරු එක්රැස් කළා. ඒ තොරතුරු පරෙවියකු මගින් මිත්‍ර සෙනෙවිතුමාට දැන්වුවා."

"ඉතින් නුඹ ආපසු ආවේ ඇයි ?"

"මා අනවසරයෙන් යුද්ධ සම්මන්ත්‍රණයකට කන්දෙමින් සිටින විට සුරනිමලගේ අතටම අසුවුවා. නන්දිමිත්‍ර බොහෝ කාලයක සිට මා ගැන විමසිල්ලෙන් ඉඳ තිබෙනවා. මට චෝදනා රාශියක් එල්ල වුණා."

"ඒ චෝදනා බොරුද ?"

"නැහැ සියල්ලම සත්‍ය"

"ඔබ තුළ ගැමුණු කුමාරයා කෙරෙහි කලකිරවන්නට කේලාම් කීම සඳහා පුද්ගලයන් පස් දෙනෙකුට මුදල් දුන්නා"

"තිස්ස කුමාරයා කළකිරවීමටත් මේ ආකාරයෙන්ම උපායක් යෙදුවා. නමුත් අවසානයේදී ඒ සඳහා ඔබතුමාව යොදා ගන්නට අප තීරණය කළා."

"නුඹෙන් මට තවත් කරුණක් දැනගන්නට වුවමනායි. අනුරාධපුරයේ චරපුරුෂ සේවය මගෙන් සිදුවුණු බව නුඹ දැන ගත්තේ කෙසේද?"

"මාගම යුද්ධ සම්මන්ත්‍රණ ශාලාවේදී නන්දිමිත්‍ර වේළුසුමන දෙදෙනාගේ සාකච්ඡාවකට රහසේ කන්දී අසන්නට ලැබුණු තොරතුරු අනුව ඒ මට ඇති වූ සැකයක් පමණයි."

"නුඹ වෙත මොනවාද දන්නේ ?"

"මාගම රාජ්‍ය ඔබතුමාට ලබා දෙන්නයි එළාර මහරජතුමාට වුවමනා කරන්නේ. මහවැලි ගඟෙන් එතෙර කඳවුරු තරකොට රුහුණට පිටවෙන්නට ක්‍රමෝපායක් යොදන්නෙත් ඒ නිසායි."

අයන්ති විතාන

## කුරුන්දි පුරාවිද්‍යා භූමියේ සංරක්ෂණ කටයුතු අරඹයි

පබ්බතාරාමයක් ලෙස සැලකෙන මෙම ඓතිහාසික පුරාවිද්‍යා ස්ථානයේ කැනීම් කටයුතු රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක මහතාගේ ප්‍රධානත්වයෙන් සහ බෞද්ධාලෝක පදනමේ සභාපති ජගත් සුමතිපාල මහතාගේ අනුග්‍රහයෙන් ආරම්භ කෙරුණි.

2021 අප්‍රේල් මස කැනීම් තුළින් එහි පිහිටි ස්ථූපයක නටඹුන් ඉස්මතු වූ අතර එය මෙම භූමියේ ඉපැරණි විහාර සංකීර්ණය බව තහවුරු විය. එහි සංරක්ෂණ කටයුතු බෞද්ධාලෝක පදනමේ පූර්ණ අනුග්‍රහයෙන් යුද හමුදා 24 වන බල ඇණියේ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සහාය ලබා ගනිමින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නොබෝදා ආරම්භ කරන ලදී.

මහේෂ් සේනාධීර



## මුරුංගාගස්යායේ ඤාණිස්සර නාහිමියන්ගෙන් දිළිඳු පවුල් දෙකකට හිසට සෙවණක්

ප්‍රංශයේ ප්‍රධාන අධිකරණ සංඝනායක, පැරිස් ජේතවනාරාමාධිපති මුරුංගාගස්යායේ ඤාණිස්සර නාහිමිගේ ධන පරිත්‍යාගයෙන් අනුරාධපුරයේ දිළිඳු පවුල් දෙකකට අංගසම්පූර්ණ නව නිවාස දෙකක් පරිත්‍යාග කෙරේ. කොරෝනා වෛරසය හේතුවෙන් ආර්ථික අපහසුතාවන්ගෙන් පීඩාවට පත්ව සිටි අනුරාධපුර දිස්ත්‍රික්කයේ තන්තිරිමලය, විලච්චිය, උපතිස්සගම, දූනුමඩලාව හා ඇලපත්ගම යන ගම්මානවල පවුල් 412 කට අත්‍යවශ්‍ය වියළි ආහාර ද්‍රව්‍ය හා මුදල් පරිත්‍යාග කිරීම පසුගියද උන්වහන්සේගේ අනුග්‍රාහකත්වයෙන් සිදුකළ අතර එම පවුල් අතරින් තෝරාගත් දිළිඳු පවුල් දෙකකට මෙලෙස නව නිවාස දෙකක් පරිත්‍යාග කෙරේ. මේ වන විට ලංකාවේ විවිධ ප්‍රදේශවල උන්වහන්සේගේ ධන පරිත්‍යාගයෙන් ඉදිවූ නිවාස ප්‍රමාණය විසිපහකට අධික ය.



## කොටපොල අමරකිත්ති නා හිමිපාණන් වහන්සේට සංඝනායක ධුරයක් පිරිනැමෙයි

සේරුවිල මංගල රජමහා විහාරයේ විහාරාධිපති තනතුර කොටපොල අමරකිත්ති මාහිමිපාණන් වහන්සේට ප්‍රදානය කොට ඇත.

සමස්ත ලංකා අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහානායක, ශ්‍රී කල්‍යාණිවංශ පාර්ශවයේ අතිගරු මහා නායක, අග්ගමහා පණ්ඩිත, දෙඩම්පහළ චන්ද්‍රසිරි මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන විධායක සංඝ සභාව නොබෝද මෙමතීරණය ගෙන ඇත. සේරුවිල රජමහා විහාරයට අයත් මංගල ධර්ම කීර්ති, ශ්‍රී නැගෙනහිර තමන්කඩුව දෙපළාතේ ප්‍රධාන සංඝනායක ධුරය ද, මේ සමගම කොටපොල අමරකිත්ති නා හිමිපාණන් වහන්සේට ප්‍රදානය කොට ඇත.

## යළි පිබිදෙන කූරගල පුදබිම

**කාලයේ වැලිතලාවෙන් වැසී යන්නට ගිය, අන්‍ය ලබ්ධිකයන් පිරිසකගේ ග්‍රහණයට හසුව බෞද්ධ උරුමයන් විනාශ වෙන්නට ගිය උදාරතර පින්බිමක් යළිත් ප්‍රතිනිර්මාණය වී සැදැහැවත් බොදු දනන්ගේ වන්දනාමානයට පත්වන දිනය, දම් සුවඳින්, සිල් සුවඳින් සුගන්ධවත් වන දිනය වැඩි ඈතක නොවේ. ඒ, මහා වන බිමක, වසර දෙදහස් දෙසීයකටත් එහා ප්‍රෞඪ ඉතිහාසයකට උරුම කියන කූරගල මහා පුදබිමයි.**

සසුන් වැඩ කැමැති සංඝ පීතෘන් වහන්සේගේ, බෞද්ධ ගිහි සුධීමතුන්ගේ අප්‍රතිහත ධෛර්යයෙන් හා කැපවීමෙන් මේ මහා පුදබිම් යළි පිබිදෙමින් සිටී. එහි වත්මන් තියමුවාණන් වහන්සේ, නෙල්ලිගල හාමුදුරුවන් වහන්සේ ලෙස අප හඳුනන අපේ වතුරකුඹුරේ ධම්මරතන ස්වාමීන් වහන්සේ ය.

තරුණ භික්ෂූන් වහන්සේ නමක් ලෙස උන්වහන්සේගේ එඩිතර බව, උනන්දුව, ඕනෑකම හා කැපවීම නොවන්නට කූරගල පුදබිමට යළි පිබිදෙන්නට ඉඩක් නොවන්නට තිබුණි.

මහා වගකීමක්, අසීරු කාර්යභාරයක් හිස මත දරා ගනිමින්, පැවිදි ගිහි පිරිස් ඒකරාශී කර ගනිමින් උන්වහන්සේ මේ මහා කර්තව්‍ය දැතට ගෙන තිබේ. නිරන්තරයෙන් මුව මත රැඳුණු කාරුණික සිනහව, ප්‍රිය වචනය, නිරහංකාර බව සේ ම උන්වහන්සේගේ ප්‍රතාපවත් බවද මහා කළුගල් සමඟ පොරබදිමින් මේ පින්බිම ගොඩනගන්නට ශ්‍රමය කැප කරන, ධනය කැප කරන සියලු දෙනාට උද්‍යෝගය, ශක්තිය සේ ම හෙට දිනයේ මල්ඵල ගැන්වෙන උදාරතර නිමැවුමකට බලාපොරොත්තු ගෙන දෙන්නේ ය.

බ්‍රාහ්මී අක්ෂරයන්ගෙන් යුතු ශිලා ලේඛන ඇතුලු ඓතිහාසික උරුමයන්ගෙන් පිරුණු කූරගල පුදබිම ඈත අතීතයේ මහරහතන් වහන්සේ සමාධි සුවයෙන් වැඩ සිටි පින්බිමකි. එමෙන්ම 'අගත අනගත චතු දිශ සගස දිනේ' ආදී වශයෙන් අතීත, අනාගත සතර දිශාවෙන් පැමිණියා වූ ද, නොපැමිණියා වූ ද මහා සංඝයා වහන්සේට මෙම පින්බිම පූජා කළ බව ශිලා ලේඛන වලින් කියැවෙන්නේ ය.

ජනප්‍රවාදයකට අනුව තථාගතයන් වහන්සේ තෙවැනි ලංකාගමනයේ දී දිවා විහරණය කළ දිවාගුහාව වන්නේ ද මේ පුණ්‍ය භූමියයි. පැරැණි රජ දවස තණ්ඩලේය්‍ය පබ්බත හා දන්ත ශෛල පබ්බත යන නාමයන්ගෙන් ව්‍යවහාර වූයේ ද කූරගල පුද බිමයි. අනුරාධපුර යුගයෙන් පසුව සිදු වූ සතුරු ආක්‍රමණ නිසා මේ භූමිය මිනිස් වාසයෙන් තොර වූ බව කියැවේ. නැවත අවධානයට ලක් වනුයේ විකිළියේ ශ්‍රී නාරද නාහිමිපාණන් වහන්සේගේ සහ රාජකීය පණ්ඩිත විමලකීර්ති ධම්මරතන වටද්දර ශ්‍රී ඤාණිස්සරාභිධාන නාහිමිපාණන් වහන්සේගේ අප්‍රතිහත ධෛර්යයේ හා කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස ය.

හැත්තෑව දශකයේ මුල් භාගයේ පමණ වටද්දර ඤාණිස්සර නාහිමියන්ට අදහාගත නොහැකි සිදුවීමක් දක්නට ලැබුණි. ඒ කොළඹ දෙස සිට බලංගොඩට පැමිණෙන අන්‍ය ආගමිකයන් රැගත් විශාල බස්රථ ප්‍රමාණයකි. උන්වහන්සේ මේ ගැන වඩාත් විමසිලිමත් වූහ. එහිදී මේ පිරිස් බලංගොඩ කූරගල පුදබිමට එක්රොක් වී මහා උත්සවයක් පවත්වන බව දැන ගත්හ. ඒ අනුව වහාම සංවිධානය වී අන්තවාදී පිරිස්වල ග්‍රහණයෙන් කූරගල බෞද්ධ උරුමය සුරක්ෂිත කිරීමෙහිලා ජාතික ව්‍යාපාරයක ආරම්භය සිදුවුණි. පසුව උන්වහන්සේගේ වයෝවෘද්ධ බව හා කාර්ය බහුලත්වය නිසා ඉදිරි කටයුතු පැවරෙන්නේ ශාස්ත්‍රවේදී පණ්ඩිත දෙල්ගොඩ ධම්මජෝති හිමියන්ට ය. උන්වහන්සේ වසර දහයක පමණ කාලයක් බොහෝ වෙහෙස වී පුදබිමෙහි අභිවෘද්ධිය වෙනුවෙන් ඇප කැප වූහ. ඒ අනුව නිතිපතා පිරිත් සජ්ඣායනය කිරීම, වස් සමාදන්වීමට සුදුසු පරිදි වටද්දර ලෙන පිළියෙළ කිරීම, කඨින චීවර පූජා මහෝත්සව පැවැත්වීම, පහත මලුවේ සිට දාගැබ දක්වා පියගැටපෙළක් නිර්මාණය කිරීම ආදී බොහෝ සේවාවන් සිදු කළ බව පැවසේ.

කූරගල මහා පුදබිම ප්‍රතිනිර්මාණය කොට මතුපරපුරට දායාද කිරීමේ උදාර අරමුණෙන් එහි භාරකාරත්වය මහනුවර අස්ගිරි මහා විහාරවාසී නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ නිර්මාතෘ වතුර කුඹුරේ ධම්මරතන හිමියන්ට පැවරෙන්නේ මේ වසරේ



තරුණ දයකත්වය






**වසර දහස් ගණනක ඉතිහාසයකට නෑකම් කියන කූරගල මහා පුදබිම පිහිටා තිබෙන්නේ සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කූරගල ග්‍රාම නිලධාරී වසමේ ය. ක්‍රි.පූ. දෙවැනි සියවසට අයත් ශිලා ලේඛන මෙම පුදබිමේ පෞරාණික බව හා ශාසනික සම්බන්ධතාවය මොනවට හෙළි කරයි.**

# අසහාය නිමැවුමක් ජාතියට අභිමානයක් හෙට දිනේ සිල් සුවඳ හමා යන පින්බිමක්

පෙබරවාරි මස හතරවැනිදා, නිදහස් දිනයේ දී ය. ඉන්පසු එළඹි මැදින් පුර පසළොස්වක පොහෝ ද ත්‍රෛ නිකායික මහා නායක, සානුනායක මහා සංඝරත්නයේ සහභාගීත්වයෙන් කූරගල මහා පුදබිමේ අසදිසි ශාක්‍ය සුගත මහා සෑරදුන් වහන්සේ ඉදිකිරීමට මංගල ශිලා ප්‍රතිෂ්ඨාපනය සිදු කෙරිණි.

වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කළ අවධියේ කූරගල පුදබිම අන්තවාදී පිරිස්වල දැඩි ග්‍රහණයට හසුව පැවතිණි. ඒ අනුව එතුමා මෙහි තිබූ අනවසර ඉදිකිරීම්වලින් 80%ක් ඉවත්කර ශුද්ධ කොට පුරා විද්‍යා රක්ෂිතයක් ලෙස අපේ බෞද්ධ ජනතාවට නිදහසේ කටයුතු කිරීමට අවස්ථාව සලසා දුන්නේ ය.

වර්තමානයේ පින්බිමේ අක්කර 85 ක භූමි ප්‍රමාණයක වෙහෙර බිමකට අවැසි සියලු විහාරාංග නිමාවෙමින් තිබේ. වඩාත් සුවිශේෂී වන්නේ ගෙවුණු වසර 700 –800 ක පමණ කාලය තුළ සියලු විහාරාරාම සහිත ව එකවර ගොඩනැගෙන ලංකාවේ දැවැන්තම හා එකම පුදබිම කූරගල පුදබිම වීමය.

වතුරකුඹුරේ ධම්මරතන හිමියන් පවසන්නේ “මේ බිම කාලයකට ඉහත සත්ව ඝාතනය කළ මුඩු බිමක්. අද සුපිරිසුදු බෞද්ධ පූජනීය ස්ථාන ඉදිකරන වැඩ බිමක්.” යනුවෙනි. උන්වහන්සේ පවසන ලෙස සියලු විහාරාරාංග ඉදි කෙරෙන්නේ පුරාවිද්‍යා සාධක නැති කළුගල් මත පමණි. යළි පුරාවිද්‍යාත්මක කැණීම් කිරීමට හැකි පස් පමණක් තිබෙන ස්ථානවල නව ඉදිකිරීම් සිදු නොවන බව ය.

සැබැවින්ම කූරගල පුදබිම අද මහා වැඩ බිමකි. යුද හමුදාවේ, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රම දායකත්වයෙන් සේ ම රටේ විවිධ ප්‍රදේශවලින් පැමිණෙන සැදැහැති පිරිස්වල ශ්‍රමයෙන් ගලින් ගල ගොඩනැඟී මහා පුදබිමක් නිමැවෙමින් තිබේ.

බෞද්ධයකු ලෙස පළමු වතාවට හෝ ඒ දසුන නැරඹිය යුතු ම ය. ජීවිතයේ තවත් අවස්ථාවක් ඒ පින්බර අවස්ථාව උදාකරගත යුතුම ය. ඒ මේ විස්කම් නිමැවුම් අවසානයේ ය.

මෙහි එක් විශ්ව කර්මයක් වන්නේ පුදබිමට පිවිසෙන ලැගුම්ගල පාමුල සිට ඉදිවන අඩි 25 ක් පළල අඩි 100 ක් උස දැවැන්ත පියගැටපෙළ ය. එහි ආරම්භයේදීම පියගැටපෙළ මධ්‍යයේ ඉදිවන සිංහ රුවකි. ඒ 1971 වසරේ සිට 2021 වසර දක්වා කූරගල පුදබිම රැක ගැනීමට ඇප කැප වූ සංඝ පීතෘන් වහන්සේ හා ගිහි බෞද්ධ පින්වතුන් සිහිවීම පිණිස ය.

අසදිසි ශාක්‍ය සුගත සුගන්ධ කුටිය (ධාතු මන්දිරය) ප්‍රදේශයේ ඉදිවන විශාලතම අසදිසි බුද්ධ ප්‍රතිමා වහන්සේ, බෝධි මණ්ඩපය, එක්වර එක්දහස් පන්සියයකට දෙදහසකට පමණ සිල් සමාදන් විය හැකි දම් සභා මණ්ඩපය, සංඝාවාසය ඇතුළු විහාර සංකීර්ණයේ වැඩ කටයුතු සිදු කෙරෙමින් පවතින්නේ තවත් මාස දහයක පමණ කෙටි කාලයකින් වැඩ නිමකොට බොදු ජනයාට උරුම කර දීමට ය. ඒ අනුව ලබන වසරේ රාජ්‍ය වෙසක් උත්සවය පැවැත්වීමට යෝජිත වන්නේ ද කූරගල පුණ්‍ය භූමියේ සිට ය.

ඉහත විහාරාරාම සංකීර්ණයට අමතරව වැවක් හා උද්‍යානයක් ඉදි කිරීමට ද නියමිත ය. තන්ජන් තැන්න විද්‍යාලයේ පුස්තකාලය ප්‍රතිනිර්මාණය කිරීම, අවට පිහිටි දුෂ්කර විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම, ප්‍රදේශයේ පිහිටි අෂ්ටඵල බෝධීන් වහන්සේගෙන් එක් නමක් වන සඳගිරි බෝධිය නැවත ප්‍රතිසංස්කරණය කිරීමට ද කටයුතු යොදා තිබේ.



කර්මවාගාචාර්ය
වතුරකුඹුරේ ධම්මරතන හිමි

"මේ රටේ ඉදිරි සංඝ පරම්පරාවට, බෞද්ධ ජනතාවට යළි කූරගල වෙනුවෙන් අරගල කරන්නට ඉඩ හරින්නේ නෑ. අපි ආගමික සහජීවනය කවදත් අගය කරනවා. පාරම්පරික මුස්ලිම් ජනතාවට ඔවුන්ගේ විශ්වාසයත් සමඟ වන්දනා කිරීමට අවස්ථාව ලැබෙනවා."

කූරගල මහා පුදබිමේ නිර්මාතෘ වතුරකුඹුරේ ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ පවසන්නේ එලෙසිනි.

මේ පුණ්‍ය භූමියේ සියලු ඉදිකිරීම් සිදු කෙරෙන්නේ රට පුරා පරිත්‍යාගශීලීන්ගේ උපකාරයෙනි. පින්කැමති ධනවත් ව්‍යාපාරිකයන්, රාජ්‍ය නිලධාරීන්ගේ දායකත්වයෙන් ද මේ වන විටත් බොහෝ නිර්මාණ ඉදිවෙමින් තිබේ. මේ මහා පින්බිමට වැලි කැටයකින් හෝ දායක වන්නට පින්වත් ඔබට ද අවස්ථාව හිමි ය. ශ්‍රම දායකත්වයෙන්, මූල්‍යමය වශයෙන්, අමුද්‍රව්‍ය ලබාදීමෙන් ඒ සඳහා දායක විය හැකි ය. මේ පිළිබඳ වැඩි විස්තර 011 7373731 දුරකථන අංකයට ඇමතීමෙන් ලබාගත හැකි ය.

රමණී සුබසිංහ

ඡායාරූප සුලෝචන ගමගේ





විහාරාරාම ඉදිවෙන අයුරු




වර්ෂ 2021 ක් වූ අගෝස්තු 22 ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.